# ආර්ථික සංගණනය 2013/ 14

# වතු අංශය

# අවසන් වාර්තාව



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

# ආර්ථික සංගණනය

# 2013/14




## අවසන් වාර්තාව

## වතු අංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

2018 ජුනි

ISBN 978-955-702-101-0

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි ඇතිවී ඇති ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සංගණන ඉතිහාසයේ ප්‍රථම වරට 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරන ලදී. මෙම සංගණනය ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකාර්මික, කර්මාන්ත, වෙළෙඳ හා සේවා යන සියළුම අංශ ආවරණය කෙරෙන පරිදි පැවැත්විණ. මෙම සංගණනය අදියර හතරකින් සිදු කරන ලද අතර, ප්‍රථම අදියර යටතේ සියළු වතු (අක්කර 20ට වැඩි) ලැයිස්තු ගත කරන ලදී. එය 2013 ජූලි මාසයේදී සිදු කළ අතර, දෙවන අදියර යටතේ කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතුවල නියුතු සියලුම ආර්ථික ඒකකයන් 2013 සැප්තැම්බර්-ඔක්තෝබර් මාසවලදී ලැයිස්තු ගත කරන ලදී. තෙවන අදියර යටතේ කුඩා ගොවි කාණ්ඩ (අක්කර 20ට අඩු) හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර, එය 2014 ජුනි-අගෝස්තු මාසවලදී සිදු කරනු ලැබිණි. සිව්වන අදියර යටතේ ලැයිස්තුගත කර්මාන්ත, වෙළෙඳ හා සේවා ආයතනවලින් තෝරාගත් නියැදි ආයතනවලින් විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර, එය 2014 නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී සිදු කරනු ලැබිණි.

මෙම වාර්තාව එකම කාරක තත්ත්වයක් යටතේ හා එකම භුක්තියක් යටතේ වන භූමි ප්‍රමාණයකින් අවම වශයෙන් එක් බිම් කැබැල්ලක්වත් අක්කර 20 ක් හෝ ඊට වඩා වැඩි වන වතු අංශය පිළිබඳ තොරතුරු විශ්ලේෂණයෙන් පිළියෙල කරන ලද වාර්තාවකි. මෙය 2013/14 ආර්ථික සංගණනයේ වතු අංශයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළත් අවසන් වාර්තාව වේ.

වතු අංශය පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ අදියර සාර්ථක කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මෙන්ම දෙපාර්තුමේන්තුවෙන් පරිබාහිර වෙනත් රජයේ නිලධාරීන් ද සහභාගි කර ගන්නා ලදී. විශේෂයෙන්ම ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික කටයුතු ගණන් ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් වූ මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලද අතර එම කමිටුවේ දායකත්වය වතු අංශය පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඉවහල් විය.

වතු අංශය යටතේ තොරතුරු රැස් කිරීමේදී, අධීක්ෂණ නිලධාරීන් ලෙස කටයුතු කළ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරු, කජු සංවර්ධන නිලධාරීන්, පොල් සංවර්ධන නිලධාරීන්, අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්, සත්ත්ව නිෂ්පාදන පරීක්ෂකවරු ඇතුළු අනෙකුත් නිලධාරීන්ට ද ගණන් ගන්නා නිලධාරීන් ලෙස කටයුතු කළ ග්‍රාම නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්, මහවැලි ඒකක කළමනාකරු, සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් රජයේ නිලධාරීන් ද තොරතුරු ලබා දුන් වතු හිමියන්, කළමණාකරුවන්, වතු අධිකාරිවරුන් හා වතු භාරකරුවන් විසින් ලබා දුන් සහයෝගය වෙනුවෙන් ද ස්තූතිවන්ත වෙමි.

සංගණනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පත් කළ සංගණන කොමසාරිස්, නියෝජ්‍ය සංගණන කොමසාරිස්, සහකාර සංගණන කොමසාරිස්වරුන් සහ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයෙන් ලබා දුන් අඛණ්ඩ සහායද මෙම කාර්යය සාර්ථකව අවසන් කිරීමට ඉවහල් විය.

පරිලෝකන කටයුතු සඳහා දායකත්වය ලබාදුන් කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රධාන කොට දිස්ත්‍රික්කවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ටද ස්තුතිවන්ත වන අතර, පරිලෝකනය කරන ලද දත්ත සංස්කරණය හා නිවැරදි කිරීමේ කටයුතු සිදු කරන ලද කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරුන්, සංඛ්‍යාලේඛනඥවරුන්, සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර නිලධාරීන්ටද මාගේ ස්තුතිය පලකර සිටිමි. තවද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් අයි.ඒ.එම්. ප්‍රනාන්දු මහත්මියගේ මඟපෙන්වීම යටතේ දත්ත වගු ලබාගැනීමේ කටයුතු මෙහෙයවූ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී.ඩී.ඩී. පීරිස් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ද ස්තුතිවන්ත වෙමි.

වතු අංශය පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී එක් රැස් කළ තොරතුරු ඇසුරෙන් මෙම වාර්තාව සකස් කිරීමේ කටයුතු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පී.එම්.පී. අනුර කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ අධ්‍යක්ෂ ඒ.එම්.යූ.කේ. අලහකෝන් මහතාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ.පී.කේ. දිසානායක මහතාගේ මග පෙන්වීම යටතේ, කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ ජයසම්පත් ලියනගේ, සංඛ්‍යාලේඛනඥ දීපානී ජයසේකර, සංඛ්‍යාලේඛන සහකාර සුමුදු රාජපක්ෂ, සංවර්ධන නිලධාරීන් වන ලහිරු ප්‍රභාත්, ඉන්දික වික්‍රමරත්න, තාරක වෙළගෙදර, තිලාන් විජේසේකර සහ මනෝජා මිරිහාන යන නිලධාරීන් විසින් සිදු කරන ලදී.

එමෙන්ම මෙම වාර්තාව සාර්ථකව නිම කිරීම සඳහා සිතියම් නිර්මාණය සංඛ්‍යාලේඛනඥ ප්‍රියලාල් අර්සකුලරත්න මහතා විසින් සිදුකරන ලද අතර මුල් කවර නිර්මාණය සංඛ්‍යාලේඛනඥ ලක්මාලි ජයරත්න මහත්මිය විසින් සිදුකරන ලද අතර ඔවුන්ට ද මාගේ කෘතඥතාව පලකරනු කැමැත්තෙමි.

මෙම වාර්තාවේ ඇතුළත් කරුණු වතු අංශය පිළිබඳව තොරතුරු භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරමි.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
නො. 306/71, පොල්දූව පාර,
බත්තරමුල්ල.
2018 ජූනි

# පටුන


**1 පරිච්ඡේදය - හැඳින්වීම, සංකල්ප හා අර්ථ දැක්වීම් 1**

**1.1** හැඳින්වීම

**1.1.1** ආර්ථික සංගණනයේ තොරතුරු රැස්කිරීම **1**

**1.1.2** ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීම **1**

**1.1.3** කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීමේ ඉතිහාසය **1**

**1.1.4** කෘෂිකාර්මික තොරතුරු වල ප්‍රයෝජන **2**

**1.1.5** කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම **2**

**1.1.6** වතු අංශය යටතේ තොරතුරු රැස් කිරීම **2**

**1.1.7** සංගණන ආඥාපනත **3**

**1.1.8** සංගණන සංවිධානය හා මෙහෙයුම **3**

**1.2** සංකල්ප හා අර්ථ දැක්වීම් **4**

**1.2.1** ආර්ථික සංගණනය **4**

**1.2.2** ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම **4**

**1.2.3** වත්ත අර්ථ දැක්වීම **4**

**1.2.4** උපකොටස අර්ථ දැක්වීම **6**

**1.2.5** ගොවිකාරකයා **6**

**2 පරිච්ඡේදය - වතු හා වතු කාරකයන් පිළිබඳ තොරතුරු 8**

**2.1** වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය **8**

**2.2** අයිතිය අනුව වතු වල ව්‍යාප්තිය **12**

**2.3** වතු කාරකයින් පිළිබඳ තොරතුරු **13**

3 පරිච්ඡේදය - වත්තේ නේවාසික ජනගහනය සහ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 18

| | | |
|---|---|---|
| 3.1 | වත්තෙහි නේවාසික ජන ගහනය | 18 |
| 3.2 | වත්තේ නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාව | 20 |

4 පරිච්ඡේදය - තේ වගාව පිළිබඳ තොරතුරු 22

| | | |
|---|---|---|
| 4.1 | අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය | 22 |
| 4.2 | දිස්ත්‍රික්ක සහ අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය | 23 |
| 4.3 | වගාවේ තත්වය අනුව තේ වගාකර ඇති වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය | 25 |
| 4.4 | ක්ලෝන වර්ගය අනුව තේ වතු හා බිම් ප්‍රමාණයන්හි ව්‍යාප්තිය | 29 |
| 4.5 | තේ දළු නෙළීමේදී භාවිතයට ගන්නා බහාළුම පිළිබඳ තොරතුරු | 30 |

5 පරිච්ඡේදය - රබර් වගාව පිළිබඳ තොරතුරු 33

| | | |
|---|---|---|
| 5.1 | අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002, 2014 | 33 |
| 5.2 | දිස්ත්‍රික්ක හා අංශ අනුව රබර් වගාකර ඇති බිම් ප්‍රමාණය | 34 |
| 5.3 | වගාවේ තත්ත්වය අනුව රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | 36 |
| 5.4 | රබර් වගා කර ඇති බිම් කාණ්ඩ අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | 39 |
| 5.5 | ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | 41 |

6 පරිච්ඡේදය - පොල් වගාව පිළිබඳ තොරතුරු 44

| | | |
|---|---|---|
| 6.1 | අංශ අනුව පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002, 2014 | 44 |
| 6.2 | පොල් වගා කර ඇති වතුවල ව්‍යාප්තිය | 45 |
| 6.3 | ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | 48 |

| | | |
|---|---|---|
| 6.4 | විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා පොල් ගස් ප්‍රමාණය | 49 |
| 6.5 | වගා කර ඇති පොල් ගස් වර්ග අනුව වතු සංඛ්‍යාව හා ගස් ගණන | 51 |

**7 පරිච්ඡේදය - වෙනත් ස්ථිර බෝග වගාව පිළිබඳ තොරතුරු** **54**

| | | |
|---|---|---|
| 7.1 | අපනයන කෘෂිකර්ම බෝග වගාව පිළිබඳ තොරතුරු | 54 |
| 7.2 | පළතුරු බෝග වගාව පිළිබඳ තොරතුරු | 65 |
| 7.3 | වෙනත් ස්ථිර බෝග වගාව පිළිබඳ තොරතුරු | 80 |

**8 පරිච්ඡේදය - කාලීන බෝග පිළිබඳ තොරතුරු** **84**

| | | |
|---|---|---|
| 8.1 | වී වගාව | 84 |
| 8.2 | වෙනත් කාලීන බෝග වගාව | 88 |

**9 පරිච්ඡේදය - පොහොර, පලිබෝධනාශක සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය** **97**

| | | |
|---|---|---|
| 9.1 | දිස්ත්‍රික්ක අනුව පොහොර භාවිතය | 97 |
| 9.2 | කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය | 100 |

**10 පරිච්ඡේදය - සත්ව පාලනය පිළිබඳ තොරතුරු** **104**

| | | |
|---|---|---|
| 10.1 | ගව පාලනය පිළිබඳ තොරතුරු | 104 |
| 10.2 | එළුවන් පාලනය පිළිබඳ තොරතුරු | 109 |
| 10.3 | ඌරන් පාලනය පිළිබඳ තොරතුරු | 110 |
| 10.4 | කුකුළු පාලනය පිළිබඳ තොරතුරු | 112 |

**11 පරිච්ඡේදය - ඉඩම් භාවිතය පිළිබඳ තොරතුරු** **116**

| | | |
|---|---|---|
| 11.1 | දිස්ත්‍රික්කය සහ භාවිතය අනුව ඉඩම් ප්‍රමාණය | 116 |

## ආර්ථික සංගණනය 2013/14, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

## ප්‍රධාන තොරතුරු

*ශ්‍රී ලංකාව ආර්ථික සංවර්ධනයේ තිරසාර ගමනක යෙදෙන අවධියක එහි ප්‍රගති සමාලෝචනය සඳහා සාම්ප්‍රදායික සංගණන රටාව මදක් වෙනස් කරමින් කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා යන ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ආර්ථික සංගණනයක් 2013/14 වර්ෂයන් කේන්ද්‍ර කරගනිමින් පළමු වරට සිදු කරන ලදී.*

*ආර්ථික සංගණනය 2013/14, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම සහ කර්මාන්ත, වෙළෙඳ හා සේවා පිළිබඳ ගණන් ගැනීම යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත විය. ආර්ථික සංගණනය 2013/14, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම අදියර 2 කින් පවත්වන ලද අතර එහි ප්‍රථම අදියර වූයේ ශ්‍රී ලංකාවේ  අක්කර 20 ට වැඩි බිම් ප්‍රමාණයෙන් යුතු සියලුම වතු ලැයිස්තුගත කිරීමයි. එහි දෙවන අදියර යටතේ එනම් කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේ අදියරයේදී ශ්‍රී ලංකාවේ සියලු කුඩා ගොවිකාණ්ඩ එනම්, ප්‍රමාණයෙන් අක්කර 20 ට අඩු කෘෂිකාර්මික ඒකක (තවදුරටත් පර්චස් 40 කට අඩු හා  පර්චස් 40 ට වැඩි ලෙස කොටස් 2ක් වන පරිදි වෙන්කර) සහ ලැයිස්තුගත කරන ලද සියලුම වතු වලින් විස්තරාත්මක තොරතුරු 2014 ජූලි, අගෝස්තු මාස වලදී රැස්කරන ලදී.*

*ආර්ථික සංගණනය 2013/14 වතු අංශයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේ අදියරයේදී වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය, වතු කාරකයින් පිළිබඳ තොරතුරු, වත්තේ නේවාසික ජනගහනය, නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාව, ප්‍රධාන භෝග හා කාලීන භෝගයන්හි වගා බිම් ප්‍රමාණ, පොහොර, පලිබෝධනාශක සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය, සත්ත්ව පාලනය හා ඉඩම් භාවිතය පිළිබඳ තොරතුරු රැස් කරන ලදී.*

*2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු වතු සංඛ්‍යාව 7,447 ක් වන අතර ඉන් 3% රජයේ, 3% අර්ධ රජයේ, 7% වැවිලි සමාගම්, 7% පුද්ගලික සමාගම්, 68% පුද්ගලික තනි හා 11% පුද්ගලික හවුල් යටතට අයත් වේ. බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව වතු සංඛ්‍යාව සැලකූ විට අක්කර 30 ට අඩු 40%, අක්කර 30-49 අතර 26%, අක්කර 50-99 අතර 19%, අක්කර 100-249 අතර 6% හා අක්කර 250 හා ඊට වැඩි 9% වේ.*

*මුළු වතු සංඛ්‍යාවට අයත් බිම් ප්‍රමාණය අක්කර 999,001 වන අතර ඉන් 5% රජයේ, 13% අර්ධ රජයේ, 46% වැවිලි සමාගම්, 11% පුද්ගලික සමාගම්, 20% පුද්ගලික තනි හා 5% පුද්ගලික හවුල් යටතට අයත්වේ. බිම් කාණ්ඩයෙහි විශාලත්වය අනුව බිම් ප්‍රමාණය සැලකූ විට අක්කර 30 ට අඩු 8%, අක්කර 30-49 අතර 9%, අක්කර 50-99 අතර 12%, අක්කර 100-249 අතර 11% හා අක්කර 250 හා ඊට වැඩි 60% වේ.*

*මුළු වතු කාරකයින් සංඛ්‍යාව 7,447 ක් වන අතර ඉන් 93% පුරුෂ වතු කාරකයින්ද 7% ස්ත්‍රී වතු කාරකයින්ද වේ. මුළු වතු කාරකයින් සංඛ්‍යාවෙන් 37% ක් වතු අයිතිකරුවන්, 9% ක් වතු අධිකාරීන්, 22% ක් වතු කළමනාකරුවන් හා 32% ක් වතු භාරකරුවන් වේ.*

*වතු කාරකයින්ගේ වයස් කාණ්ඩ සැලකූ විට අවුරුදු 25 ට අඩු 1% ක්, අවුරුදු 25-34 අතර 9% ක්, අවුරුදු 35-44 අතර 21% ක්, අවුරුදු 45-54 අතර 27% ක්, අවුරුදු 55-64 අතර 27% ක් සහ අවුරුදු 65 ට වැඩි 16% ක් ලෙස වාර්තාවී ඇත.*

*වතු කාරකයින්ගේ අධ්‍යාපන මට්ටම සැලකීමේදී, කිසිදා පාසල් ගොස් නැති 1% ක්, 5 හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත් 6% ක්, 6 – 10 ශ්‍රේණියක් සමත් 16% ක්, අ.පො.ස. (සා.පෙ.) හෝ සමාන විභාගයක් සමත් 23%ක් , අ.පො.ස. (උ.පෙ.) හෝ සමාන විභාගයක් සමත් 38% ක් හා උපාධිය හෝ ඊට ඉහළ විභාගයක් සමත් 17% ක් ලෙස දැක්විය හැකිවේ. මුළු වතු කාරකයින්ගෙන් 41% කට පමණක් වෘත්තීය සුදුසුකම් ඇති අතර එම 41%, කෘෂිකර්මය ආශ්‍රිත පමණක් 20% ක්, පරිපාලන හා කළමණාකරණය ආශ්‍රිත පමණක් 14% ක්, කෘෂිකර්මය සහ පරිපාලන හා කළමණාකරණය ආශ්‍රිත පමණක් 1% ක් හා වෙනත් 6% ක් ලෙසින් දැක්විය හැකිවේ.*

*ආර්ථික සංගණනය 2013/14 ට අනුව වතු අංශය යටතේ නේවාසික ජනගහණය 1,037,883 වන අතර ඉන් 49.5% පුරුෂයින් හා 50.5% ස්ත්‍රීන් වේ. මුළු වතු ජනගහනයෙහි පුමිතිරි අනුපාතයෙහි අගය 98 ක් වන අතර ළමා ජනගහනයෙහි එම අගය 94 ක් ද වයස්ගත ජනගහනයෙහි එම අගය 104 ක් ද වේ.*

*වතු අංශය යටතේ නේවාසිකව හා අනේවාසිකව සේවය කරන සේවක සංඛ්‍යාව 297,316 ක් වන අතර ඉන් 51.0% ක් ස්ත්‍රීන් වේ. වතු අංශයේ රැකියා ක්ෂේත්‍ර සැලකීමේදි 78% ක ප්‍රතිශතයක් අයත් වනුයේ ක්ෂේත්‍ර කම්කරු යටතට ය. රැකියාවේ නියුතු මුළු ස්ත්‍රී සංඛ්‍යාවෙන් 85% ක හා මුළු පුරුෂ සංඛ්‍යාවෙන් 70% ක ප්‍රතිශතයක් ක්ෂේත්‍ර කම්කරු යටතෙහි නිරත වේ.*

*කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේ අදියරයේදී, වතු අංශයෙහි වාර්තා වී ඇති තේ වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය අක්කර 337,138 ක් වන අතර එම බිම් ප්‍රමාණය රිකිලි තේ සඳහා 43% ක ප්‍රතිශතයක් ද, ඇට තේ සඳහා 26% ක ප්‍රතිශතයක් ද, තේ වගාව සඳහා බිම සූදානම් කරමින් තිබූ ප්‍රතිශතය 18% ක් ද, තේ වගාව සඳහා යොදවා ගෙන දැනට අත්හැර දමා ඇති ප්‍රතිශතය 12% ක් හා තවාන් සඳහා යොදා ඇති ප්‍රතිශතය 1% ක්ද ලෙසින් දැක්විය හැකිවේ.*

*රිකිලි තේ වගා කර ඇති වතු වල ක්ලෝන කාණ්ඩය අනුව වගා කර ඇති බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශත ක්ලෝන 2000 කාණ්ඩය 63%, 3000 කාණ්ඩය 7%, 4000 කාණ්ඩය 7%, වෙනත් ක්ලෝන වර්ග 12% සහ ක්ලෝන වර්ගය නොදන්නා 11% ලෙස දැක්විය හැකිවේ.*

*වතු අංශය යටතේ රබර් වගාව සිදු කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 154,575 ක් වන අතර ඉන් ක්ලෝන වර්ග අනුව වගා කර ඇති ප්‍රතිශතය 94% ක් ද, ක්ලෝන වර්ගයන්ට අයත් නොවන වගා ප්‍රතිශතය 1% ක් ද, රබර් වගාව සඳහා යොදවා ගෙන දැනට අත්හැර දමා ඇති ප්‍රතිශතය 4% ක් හා තවාන් සඳහා යොදා ඇති ප්‍රතිශතය 1% ක් ද ලෙසින් දැක්විය හැකිවේ. ශ්‍රී ලංකාවේ භාවිතා වන ක්ලෝන විශේෂ ලෙස RRIC 121 (35%), RRIC 102 (7%), RRIC 100 (26%), PB 86 (16%) හා වෙනත් ක්ලෝන (16%) ලෙස දැක්විය හැකිවේ.*

*වතු අංශය යටතේ වාර්තා වී ඇති පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 171,499 ක් වේ. පොල් වගාව, ක්‍රමවත් වගාව සහ විසිරි වගාව ලෙස වර්ගීකරණයකට ලක් කොට තොරතුරු එක් රැස්කර කරන ලද අතර ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය, ඵල දරන බිම් ප්‍රමාණය හා ඵල*

*නොදරන බිම් ප්‍රමාණය යටතේ නැවත වර්ග කොට දැක්විය හැකිවේ. එල දරන බිම් ප්‍රමාණය අක්කර 136,213 ක් ලෙස වාර්තාවී ඇත. එල නොදරන බිම් ප්‍රමාණය යන්න අළුත් වගාව (අක්කර 22,205) හා යටි වගාව (අක්කර 13,081) ලෙස නැවත වර්ග කර දැක්විය හැකිවේ.*

*ශ්‍රී ලංකාවේ විසිරි වගාව යටතේ වාර්තා වී ඇති මුළු පොල් ගස් ගණන 1,415,448 ක් වන අතර ඉන් පොල් ගස් 1,108,516 ක් එල දරන පොල් ගස් ද පොල් ගස් 306,932 ක් එල නොදරන පොල් ගස් ද වේ.*

*වතු අංශය යටතේ සුළු අපනයන බෝග ලෙස ප්‍රධාන වශයෙන් ගම්මිරිස්, කෝපි, කුරුඳු, කොකෝවා, කරදමුංගු, කරාබුනැටි, සාදික්කා, බුලත් හා පුවක් පිළිබඳව තොරතුරු, ක්‍රමවත් වගාව සහ විසිරි වගාව යටතේ එක් රැස් කරන ලදී. එමගින් අනාවරනය වූ තොරතුරු වලට අනුව එක් එක් බෝගයෙහි ක්‍රමවත් වගාව යටතෙහි සමස්ථ වගා බිම් ප්‍රමාණය අක්කර 250 ට වැඩි බෝග ලෙස ගම්මිරිස්, කෝපි, කුරුඳු, කොකෝවා, කරදමුංගු හා කරාබුනැටි දැක්විය හැකිවේ.*

*ගම්මිරිස් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 3,114 ක් හා ඉන් 72.5% එල දරණ බිම්, කෝපි වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 712 හා ඉන් 78.2% ක් එල දරණ බිම් ද ලෙස දැක්විය හැකිවේ. කුරුඳු වගාව සැලකිමේදී අක්කර 8,220 ක බිම් ප්‍රමාණයක් වගා කර ඇති අතර ඉන් 78% ක් එල දරණ බිම් ලෙස වාර්තාවී ඇත. කොකෝවා වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 1,358 ක් ද ඉන් 93% ක් එල දරණ බිම් , කරදමුංගු වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 2,330 ක් ද ඉන් 93% ක් එල දරණ බිම් හා කරාබුනැටි වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 250 වන අතර ඉන් 95% ක් එල දරණ බිම් ද ලෙස දැක්විය හැකිවේ.*

*වතු අංශයේ විසිරි වගාව යටතේ වගා කර ඇති සුළු අපනයන බෝග ලෙස ප්‍රධාන වශයෙන් ගම්මිරිස් (වැල් 4,160, එල දරණ වැල් 69%), කෝපි (ගස් 577,827, එල දරණ ගස් 81%), කුරුඳු (ගස් 1,309,187, එල දරණ 71.42%), කොකෝවා (ගස් 183,893, එල දරණ ගස් 77.67%), කරදමුංගු (ගස් 59,569, එල දරණ ගස් 52.32%), කරාබුනැටි (ගස් 35,853, එල දරණ ගස් 89%), සාදික්කා (ගස් 6,374, එල දරණ ගස් 32%), බුලත් (වැල් 40,576, එල දරණ වැල් 91.1%) හා පුවක් (ගස් 242,684, එල දරණ ගස් 53%) වාර්තාවේ.*

*ශ්‍රී ලංකාවේ වතු අංශයේ ක්‍රමවත් වගාව යටතේ වගා කර ඇති පළතුරු බෝග ලෙස ප්‍රධාන වශයෙන් අඹ (අක්කර 1,862, එල දරණ 69.5%), කෙසෙල් (අක්කර 3,252, එල දරණ 84.65%), පැපොල් (අක්කර 265, එල දරණ 72.4%), අන්නාසි (අක්කර 1,659, එල දරණ 69.5%), රඹුටන් (අක්කර 722, එල දරණ 86.4%) හා දොඩම් (අක්කර 165, එල දරණ 36.36%) දැක්විය හැකි වේ.*

*විසිරි වගාව යටතේ වගා කර ඇති පළතුරු බෝග ලෙස ප්‍රධාන වශයෙන් අඹ (ගස් 68,413, එල දරණ ගස් 78.65%), කෙසෙල් (පඳුරු 216,564, එල දරණ පඳුරු 69.33% ), පැපොල් (ගස් 44,673, එල දරණ ගස් 36.82%), අන්නාසි (පඳුරු 549,306, එල දරණ පඳුරු 57.24%), රඹුටන් (ගස් 15,889, එල දරණ ගස් 65%), දෙළුම් (ගස් 9,677, එල දරණ ගස් 53.82%), අලිගැටපේර (ගස් 6,622, එල දරණ ගස් 68.16%), කිලෝපේර (ගස් 13,118, එල දරණ ගස් 60.46%), දූරියන් (ගස් 3,002, එල දරණ ගස් 29.98%), දොඩම් (ගස් 15,316, එල දරණ ගස් 61.4%), දෙහි (ගස් 13,041, එල දරණ ගස් 60.1%), මැංගුස් (ගස් 1,734, එල දරණ ගස් 80%) හා මිදි (වැල් 943, එල දරණ වැල් 66.7%) දැක්විය හැකිවේ.*

*වතු අංශයේ ක්‍රමවත් වගාව යටතේ වගා කර ඇති වෙනත් ස්ථිර බෝග ලෙස ප්‍රධාන වශයෙන් කජු (අක්කර 8,238, ඵල දරණ 69%), උක් (අක්කර 4,881, ඵල දරණ 91.5%) හා කොස් (අක්කර 360, ඵල දරණ 85.8%) දැක්විය හැකි අතර විසිරි වගාව යටතේ වගා කර ඇති වෙනත් ස්ථිර බෝග ලෙස ප්‍රධාන වශයෙන් කජු (ගස් 102,359, ඵල දරණ ගස් 78.4%) හා කොස් (ගස් 163,248, ඵල දරණ ගස් 41%) දැක්විය හැකිවේ.*

*ශ්‍රී ලංකාවේ වගා කර ඇති කාලීන බෝග ප්‍රධාන වශයෙන් වී, වෙනත් ධාන්‍ය වර්ග, ඇට වර්ග, අල වර්ග, අනෙකුත් තාවකාලික බෝග, පලා හා එළවළු ලෙසින් දැක්විය හැකිවේ. වතු අංශය තුළ කාලීන බෝග වගාව කෙරෙහි එතරම් නැඹුරුවක් දක්නට නොමැති බව කෘෂිකාර්මික කටයුතු පිළිබඳව එක්රැස් කරනු ලැබූ තොරතුරු මගින් අනාවරණය විය. එම තොරතුරු වලට අනුව වතු අංශයේ කාලින බෝග යටතේ ප්‍රධාන ලෙසින් වගා කර ඇති බෝගයක් ලෙස වී වගාව දැක්විය හැකිවේ. ඒ අනුව 2013/2014 වගා වර්ෂය තුළ වී වගාව සඳහා අස්වද්දන ලද බිම් ප්‍රමාණය අක්කර 6,175 වන අතර 2013/14 මහ කන්නය තුළ වගා කරන ලද බිම් ප්‍රමාණය අක්කර 5,961 ක් හා 2014 යල කන්නය තුළ වගා කරන ලද බිම් ප්‍රමාණය අක්කර 4,061 ක් ලෙසින් වාර්තා වී ඇත..*

*2013/2014 වගා වර්ෂය තුළ එනම් 2013/14 මහ කන්නය හා 2014 යල කන්නයේදී වතු අංශය තුළ ප්‍රධාන වශයෙන් වගා කර ඇති කාලීන බෝගයන් ලෙස මඤ්ඤෝක්කා (අක්කර 3805), මිරිස් (අක්කර 1154), තල (අක්කර 437) හා බඩඉරිඟු (අක්කර 375) වගාවන් දැක්විය හැකිවේ.*

*වතු අංශය යටතේ 2013/2014 වගා වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් වගා කර ඇති එළවළු වර්ග ලෙස වම්බටු (අක්කර 2797), බණ්ඩක්කා (අක්කර 2730), තක්කාලි (අක්කර 2227), මාළුමිරිස් (අක්කර 1764) හා වට්ටක්කා (අක්කර 1039) දැක්විය හැකි අතර එම කාල වකවානුව තුළ වතු අංශය යටතේ පලා වර්ග වල සැලකිය යුතු බිම් ප්‍රමාණ දක්නට නොලැබේ.*

*වතු අංශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු වතු සංඛ්‍යාවෙන් 79% ක් පොහොර භාවිතා කර ඇති බවත් වව්නියාව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල ඇති සියළුම වතු පොහොර භාවිතා කර ඇති බවත් දැක්විය හැකිවේ. පොහොර භාවිතා කර ඇති වතු සංඛ්‍යාව සැලකීමේ දී එම වතු සංඛ්‍යාවෙන් 66% ක ප්‍රතිශතයක් භාවිතා කර ඇත්තේ රසායනික පොහොර පමණක් වන අතර 7% ක් කාබනික පොහොර ද 27% ක් රසායනික හා කාබනික යන පොහොර වර්ග දෙකමද භාවිතා කර ඇත.*

*කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු වතු සංඛ්‍යාවෙන් 84% ක් පළිබෝධනාශක භාවිතා කර ඇති බවත් වව්නියාව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල ඇති සියළුම වතු පළිබෝධනාශක භාවිතා කර ඇති බවත් දැක්විය හැකිවේ. පළිබෝධනාශක භාවිතා කර ඇති වතු සංඛ්‍යාව සැලකීමේ දී එම වතු සංඛ්‍යාවෙන් 89% ක ප්‍රතිශතයක් භාවිතා කර ඇත්තේ රසායනික පළිබෝධනාශක පමණක් වන අතර 1% ක් කාබනික පළිබෝධනාශක ද 10% ක් රසායනික හා කාබනික යන පළිබෝධනාශක වර්ග දෙකම ද භාවිතා කර ඇත.*

*වතු අංශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ භාවිතා කළ ආකාරය පිළිබඳව තොරතුරු රැස් කිරීමේදි අණාවරනය වූ කරුණක් වනුයේ, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි යන්ත්‍රෝපකරණ භාවිතා කළ වතු සංඛ්‍යාව විශාල අගයක් ගන්නා බවය.*

*ඒ ඒ වතු සතුව 2014.06.30 දිනට තිබූ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව පිළිබඳව සොයා බැලීමේදී වැඩි වශයෙන්ම වතු සතුව තිබූ යන්ත්‍රෝපකරණ ලෙස අතින් ක්‍රියා කරන දියර ඉසින යන්ත්‍ර, වතුර පොම්ප (කෘෂිකාර්මික කටයුතු සඳහා), තේ දළු තෙලන යන්ත්‍ර, රෝද හතරේ ට්‍රැක්ටර්, තණකොළ කපන යන්ත්‍ර (කෘෂිකාර්මික කටයුතු සඳහා), බලයෙන් ක්‍රියා කරන දියර ඉසින යන්ත්‍ර හා රෝද දෙකේ ට්‍රැක්ටර් දැක්විය හැකිවේ.*

*ආර්ථික සංගණනය 2013/14 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේ අදියරයේදී වතු අංශය යටතේ සත්ත්ව පාලනය සම්බන්ධ තොරතුරු වලට අනුව වාර්තා වී ඇති මුළු ගවයින් සංඛ්‍යාව 36,838 ක් වේ. එයින් දේශීය ගවයින් සංඛ්‍යාව 16,935 ක් හා වැඩි දියුණු කළ ගවයින් සංඛ්‍යාව19,903 ක් වේ. මුළු ගවයින් සංඛ්‍යාවෙන් එළ ගවයින් සංඛ්‍යාව 28,326 (77%) ක් ලෙස ද මී ගවයින් සංඛ්‍යාව 8,512 (23%) ක් ලෙස ද වාර්තා වී ඇත.*

*එළ ගවයින්ගෙන් ගැහැණු සතුන් සංඛ්‍යාව 22,313 ක් ද පිරිමි සතුන් සංඛ්‍යාව 6,013 ක් ද වාර්තා වී ඇති අතර ගැහැණු සංඛ්‍යාවෙන් දැනට කිරි ගනිමින් සිටින සතුන් සංඛ්‍යාව 7,048 ක් ලෙස වාර්තා වී ඇත. මී ගවයින් යටතේ පිරිමි සතුන් 2,175 ක් ද ගැහැණු සතුන් 6,337 ක් ද වාර්තා වී ඇත. ගැහැණු සතුන් සැලකිල්ලට ගතහොත් එයින් දැනට කිරි ගන්නා සතුන්ගේ සංඛ්‍යාව 1,825 ක් ලෙස වාර්තා වී ඇත.*

*ශ්‍රී ලංකාවේ වතු අංශය තුළ සිදු කරන ලද එළු පාලනයට අදාල මුළු සතුන් සංඛ්‍යාව 6,444 ක් වන අතර ඉන් 70% ක් ගැහැණු සතුන් වන අතර 30% ක් පිරිමි සතුන්වේ. මුළු එළුවන් සංඛ්‍යාවෙන් 56% දේශීය එළුවන් වන අතර 44% ක් වැඩි දියුණු කරන ලද එළුවන්වේ.*

*වතු අංශය යටතේ සත්ත්ව පාලනය සම්බන්ධ තොරතුරු වලට අනුව වාර්තා වී ඇති මුළු ඌරන් සංඛ්‍යාව 9,705ක් වේ. ඉන් 55% ක් තර කිරීම සඳහාත් 31% ක් බෝකිරීම (අභිජනනය) සඳහාත් 14% ක් වෙනත් කටයුතු සඳහාත් ඇති කළ බවට වාර්තා වී ඇති අතර මුළු ඌරන් සංඛ්‍යාවෙන් 43% ක් දේශීය සතුන්ද 57% ක් වැඩි දියුණු කළ සතුන් ද වේ.*

*වතු ආශ්‍රිතව රැස්කරන ලද කුකුළු පාලනය පිළිබඳ තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති මුළු කුකුළු ගහණය මිලියන 6.5 ක් වන අතර ඉන් 70.4% මස් පිණිස වැඩි දියුණු කරන ලද සතුන් ද, 29.5% ක් බෝකිරීම සහ බිත්තර සඳහා වැඩි දියුණු කරන ලද සතුන් හා 0.1% ගම්බද නිදැල්ලේ ඇති කරන සතුන් ද වේ.*

*වතු ආශ්‍රිතව කුකුළු පාලනය සිදු කිරීමේදී සත්ත්ව ආහාර සපයාගත් ආකාරය පිළිබඳව රැස් කර ඇති තොරතුරු වලට අනුව මුළු වතු සංඛ්‍යාවෙන් 84% ක් සත්ත්ව ආහාර සපයාගෙන ඇත්තේ වත්ත තුළම මිශ්‍රකර සකසා ගැනීමෙන් වන අතර 10% ක් සෘජුවම වෙළඳ පොළෙන් මිලට ගෙන ඇති බවට වාර්තාවී ඇත.*

*වතු අංශයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 72.1% ක් ස්ථිර බෝග වගාව සඳහා ද 1% ක් පුරන් කුඹුරු සහ අස්වද්දන කුඹුරු සඳහා ද 2.8% ක් වෙනත් කාලීන බෝග සඳහා ද 10.4% ක් කැළෑ, ලඳු කැළෑ සහ තණ බිම් සඳහා ද 3.5% ක් ආර්ථික වන වගාව සඳහා ද 4.3% ක් පාරවල් සහ ගොඩනැගිලි සඳහා ද 3.7% ක් වෙනත් ඉඩම් සඳහා ද 2.2% ක් නිෂ්ප්‍රයෝජනවත් ඉඩම් ලෙසට ද පැවති බව වාර්තාවී ඇත .*

# 1 පරිච්ඡේදය හැඳින්වීම, සංකල්ප හා අර්ථ දැක්වීම්

## 1.1 හැඳින්වීම

ජන සංගණනයක් පැවැත්වීමෙන් පසුව එළඹෙන වර්ෂවල කෘෂිකර්ම සංගණනය හා කර්මාන්ත සංගණනය පැවැත්වීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය සම්ප්‍රදාය වේ. ශ්‍රී ලංකාව ආර්ථික සංවර්ධනයේ තිරසාර ගමනක යෙදෙන යුගයක එහි ප්‍රගතිය විමසා බැලීමට සාම්ප්‍රදායික සංගණන රටාව මදක් වෙනස් කරමින් 2013/14 වර්ෂයන් කේන්ද්‍ර කරගනිමින් පළමු වරට ජාතික වැදගත්කමකින් යුතු ආර්ථික සංගණනයක් පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

මෙම ආර්ථික සංගණනය, සාමාන්‍යයෙන් ජන හා නිවාස සංගණනයට අනතුරුව පැවැත්වෙන කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් යන සංගණන දෙකෙහි එකතුවකි. ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා යන අංශ ආවරණය කරමින් පවත්වන ගණන් ගැනීමේ කටයුතුවලදී කෘෂිකර්ම අංශයේ තොරතුරු ලබා ගැනීම ප්‍රශ්නාවලීන් කිහිපයක් භාවිතා කරමින් වෙනම කොටසක් වශයෙන් සිදු කෙරිණි. ඒ අනුව ආර්ථික සංගණනය 2013/14, “කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම” සහ “කර්මාන්ත, වෙළෙඳ හා සේවා පිළිබඳ ගණන් ගැනීම” ලෙස කොටස් දෙකකින් යුක්තය.

### 1.1.1 ආර්ථික සංගණනයේ තොරතුරු රැස්කිරීම

ආර්ථික සංගණනය තුළින් රටෙහි ආර්ථික ක්ෂේත්‍රය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කර තොරතුරු රැස්කිරීම කරනු ලැබිය. එනම් කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීම සහ කර්මාන්ත, වෙළඳ හා සේවා කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීම වශයෙනි.

ඉහත සඳහන් අංශ දෙකටම අදාලව අදියර දෙකකින්, එනම් ලැයිස්තු ගත කිරීමේ අදියර හා දත්ත එක්රැස් කිරීමේ අදියර වශයෙන් සංගණන කටයුතු සිදු කරන ලදී.

### 1.1.2 ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීම

තොරතුරු රැස් කිරීමේ ඒකකය ලෙස ගොවි කාණ්ඩය පදනම් කර ගනිමින් රාජ්‍ය අනුග්‍රහය යටතේ එක් වගා වර්ෂයක් තුළ කෘෂිකර්ම ව්‍යුහයට අදාල ප්‍රමාණාත්මක තොරතුරු දීප ව්‍යාප්තව එක් රැස් කිරීමේ ක්‍රියාවලිය ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීම ලෙස හැඳින්වේ.

### 1.1.3 කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීමේ ඉතිහාසය

1921 වසරේ පවත්වා ඇති නිෂ්පාදන සංගණනය කෘෂිකර්ම ඉතිහාසයේ හමුවන පළමු ගණන් ගැනීමයි. අනතුරුව 1924 සහ 1929 වර්ෂවලදී ද අර්ධ සංගණන දෙකක් පවත්වා ඇති අතර එම සංගණනයන්හි විශේෂ ලක්ෂණය වූයේ වගා කළ බිම් ප්‍රමාණය, සත්ත්ව සංඛ්‍යාති, නිෂ්පාදන ප්‍රමාණයන් ගම් මට්ටමින් රැස් කිරීමයි. මෙම අර්ධ සංගණන දෙකෙන් පසුව 1946, 1952, 1962, 1973, 1982 සහ 2002 වර්ෂ වලදි පූර්ණ කෘෂිකර්ම සංගණන පවත්වා ඇත.

වසර 10 කට වරක් කෘෂිකර්ම සංගණනයක් පැවැත්වීම සම්ප්‍රදාය වුවත් රටේ ඇතැම් ප්‍රදේශ වල පැවති අයහපත් වාතාවරණය නිසා 1992 වර්ෂයේ දී කෘෂිකර්ම සංගණනය පැවැත්වීමට නොහැකි විය. අනතුරුව 2002 වර්ෂයේදී වසර 20 කට පසුව එනම් 1982 න් පසුව 9 වන කෘෂිකර්ම සංගණනය පවත්වන ලදී. මෙම කාලසීමාවේ දී රටේ ඇතැම් ප්‍රදේශ වල අභ්‍යන්තර ගැටුම් පැවති අතර එම ප්‍රදේශ වල ද කෘෂිකාර්මික තොරතුරු සංගණනය මඟින් රැස් කරන ලදී. නමුත් එම ප්‍රදේශ මෙම කාලසීමාවේ දී බොහෝ දුරට කෘෂිකර්මාන්තයෙන් ඈත්ව තිබෙණු දක්නට ලැබුණි.

2009 වර්ෂයේ දී අභ්‍යන්තර ගැටුම් අවසන් වීමත් සමඟ උදාවූ සාමකාමී පරිසරය තුළ ජනතාව විශාල වශයෙන් කෘෂිකර්මාන්තය කෙරෙහි යොමු වීමක් දක්නට ලැබුණි. මෙම තත්ත්වය තුළ 2014 වර්ෂයේ දී පවත්වනු ලැබූ ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික කටයුතු ගණන් ගැනීම 1982 න් පසුව සාමකාමී ශ්‍රී ලංකාවක් තුළ සංගණනයක් මඟින් කෘෂිකාර්මික තොරතුරු රැස් කිරීමේ පළමු අවස්ථාව ලෙස හැඳින්විය හැක.

### 1.1.4 කෘෂිකාර්මික තොරතුරු වල ප්‍රයෝජන

කෘෂිකාර්මික තොරතුරු රැස් කිරීමක් මඟින් ලබාගන්නා තොරතුරු ප්‍රධාන වශයෙන් පහත අවශ්‍යතා සඳහා ප්‍රයෝජනවත් වේ.

- කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන ව්‍යුහාත්මක වෙනස්කම් පදනම් කරගෙන අනාගත කෘෂිකර්ම සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම.
- සංවර්ධන යෝජනා ක්‍රමයන්හි ඇතිවී තිබෙන ප්‍රගතිය ඇගයීම.
- ඉදිරියේදී පැවැත්වීමට අරමුණු කර ඇති සමීක්ෂණ සඳහා නියැදි රාමුව සකසා ගැනීම.
- කෘෂිකාර්මික බෝග වගාව, සත්ත්ව පාලනය, ඉඩම් භාවිතය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය පිළිබඳ ප්‍රාදේශිය මට්ටමින් තොරතුරු ලබාගැනීම.

### 1.1.5 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ දී  කෘෂිකාර්මික ඉඩම් ප්‍රධාන අංශ දෙකකට බෙදා තොරතුරු ලබාගැනීම සිදුකරනු ලැබීය. එනම්,

I. කුඩා ගොවි කාණ්ඩ අංශය
II. වතු අංශය

කුඩා ගොවි කාණ්ඩ අංශය සම්බන්ධයෙන් තොරතුරු එම ගොවි කාණ්ඩ වල කාරකත්වය දරණ ගොවි කාරකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ලබාගනු ලැබූ අතර සංවිධානය වී ඇති වතු අංශය සම්බන්ධයෙන් තොරතුරු ග්‍රාම නිලධාරි වසම් අනුව ග්‍රාම නිලධාරීන් විසින් කොට්ඨාස භාර සංඛ්‍යාලේඛන නිලධාරීගේ/ සංඛ්‍යාලේඛන සහකාරගේ/ දෙපාර්තමේන්තුවේ වෙනත් අධීක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ වතු වලට ගොස් වතු අයිතිකරු, වතු අධිකාරී/කළමනාකරු හෝ භාරකරු හමුවී ඔවුන් සමඟ සම්මුඛ  සාකච්ඡා පැවැත්වීමෙන් එක්රැස් කරගනු ලැබීය.

### 1.1.6 වතු අංශය යටතේ තොරතුරු රැස් කිරීම

වතු අංශය යටතේ තොරතුරු රැස් කිරීම ප්‍රධාන අදියර දෙකක් යටතේ සිදුකරනු ලැබීය. එනම්,

I. වතු ලැයිස්තු ගත කිරීම
II. වතුවල තොරතුරු රැස් කිරීම

වතු ලැයිස්තු ගත කිරීම තුළින් වත්ත යන්නෙහි අර්ථ දැක්වීමට අනුව සෑම දිස්ත්‍රික්කයකම පිහිටි වතු අංශයට අයත්වන ඉඩම් වල නාම ලේඛනයක් සකස්කරනු ලැබූ අතර මෙම කාර්යය ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් කොට්ඨාස භාර සංඛ්‍යාලේඛන නිලධාරීගේ/ සංඛ්‍යාලේඛන සහකාරගේ/ දෙපාර්තමේන්තුවේ වෙනත් අධීක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ග්‍රාම නිලධාරීන් විසින් 2013 ජූලි මාසයේ දී සිදු කරනු ලැබීය.

එලෙස හඳුනාගත් වතු ඇසුරින් තොරතුරු රැස් කිරීම ද ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් කොට්ඨාස භාර සංඛ්‍යාලේඛන නිලධාරීගේ/ සංඛ්‍යාලේඛන සහකාරගේ/ දෙපාර්තමේන්තුවේ වෙනත් අධීක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ග්‍රාම නිලධාරීන් විසින් 2014 අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස වලදී සිදුකරනු ලැබීය.

### 1.1.7 සංගණන ආඥාපනත

සංගණන ආඥා පනතේ 143 වන අධිකාරිය යටතේ ආර්ථික සංගණනය පවත්වනු ලැබූ අතර මෙම ආඥාපනතට අනුව සෑම පුද්ගලයකුම සංගණනයේ දී සංගණන නිලධාරීන් විසින් අසනු ලබන ප්‍රශ්නාවලියට අදාල සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට නීතියෙන් බැඳී සිටී. එමෙන්ම සංගණන ආඥා පනත අනුව සංගණන නිලධාරීන් ද සංගණන අධිකාරී විසින් ඔවුන් වෙත පවරන සංගණන රාජකාරි කටයුතු තමාගේ උපරිම හැකියාව අනුව ඉටුකිරීමට බැඳී ඇත. මෙවැනි පසුබිමක් තුල ලබාගත් තොරතුරු වඩාත් නිවැරදි තොරතුරු බව පැහැදිළිවේ.

### 1.1.8 සංගණන සංවිධානය හා මෙහෙයුම

| | |
|---|---|
| **සංගණන අධිකාරි**<br>*අධ්‍යක්ෂ ජනරාල්*<br>*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව* | |
| **සංගණන කොමසාරිස්**<br>*කොමසාරිස් ජනරාල් - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව*<br>*අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*<br>*අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය*<br>*දිස්ත්‍රික් ලේකම්/ දිසාපති* | **අතිරේක සංගණන අධිකාරි**<br>*අතිරේක අධ්‍යක්ෂ ජනරාල්*<br>*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව* |
| **නියෝජ්‍ය සංගණන කොමසාරිස්**<br>*නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව*<br>*නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*<br>*කෘෂිකර්ම අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය*<br>*ප්‍රාදේශීය ලේකම්/ උප දිසාපති*<br>*අතිරේක දිස්ත්‍රික් ලේකම්/ අතිරේක දිසාපති*<br>*නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි කලාපය* | **නියෝජ්‍ය සංගණන අධිකාරි**<br>*අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ*<br>*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව* |
| **සහකාර සංගණන කොමසාරිස්**<br>*සහකාර දිස්ත්‍රික් ලේකම්*<br>*සහකාර ප්‍රාදේශීය ලේකම්* | **සහකාර සංගණන අධිකාරි**<br>*ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ* |
| **ප්‍රාදේශීය සංගණන නිලධාරි**<br>*කෘෂිකර්ම උපදේශක*<br>*ගොවිජන සංවර්ධන නිලධාරි* | **ප්‍රාදේශීය සංගණන නිලධාරි**<br>*කොට්ඨාස භාර සංඛ්‍යාලේඛන නිලධාරි*<br>*කොට්ඨාස භාර සංඛ්‍යාලේඛන සහකාර* |
| **ගණන් ගන්නා නිළධාරි**<br>*ග්‍රාම නිලධාරි*<br>*කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර*<br>*රජයේ ඒකක කළමනාකරු* | |

## 1.2 සංකල්ප හා අර්ථ දැක්වීම

### 1.2.1 ආර්ථික සංගණනය

ශ්‍රී ලංකාවේ දේශසීමාව තුළ ක්‍රියාත්මක වන සියළුම ආර්ථික කටයුතු වල නියුතු ඒකකයන් ආවරණය වන පරිදි නියම කරනු ලබන කාලසීමාවක් තුළ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතු වල තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, ඇගයීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමේ හෝ බෙදාහැරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය "ආර්ථික සංගණනය" ලෙස හැඳින් වේ.

### 1.2.2 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

තොරතුරු එක්රැස් කිරීමේ ඒකකය ලෙස ගොවි කාණ්ඩය පදනම්ව, කෘෂිකාර්මික ව්‍යුහයට අදාල ප්‍රමාණාත්මක තොරතුරු එක් වගා වර්ෂයක් තුළ දී රාජ්‍ය අනුග්‍රහය සහිතව දීපව්‍යාප්තව එක්රැස් කිරීමේ ක්‍රියාවලිය "කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම" ලෙස හැඳින්වේ.

### 1.2.3 "වත්ත" අර්ථ දැක්වීම

**I.** **<u>එකම කාරක තත්ත්වයක්</u> යටතේ හා <u>එකම භුක්තියක්</u> යටතේ වන භූමි ප්‍රමාණයකින් අවම වශයෙන් එක් <u>බිම් කැබැල්ල</u>ක්වත් අක්කර 20 ක් හෝ ඊට වඩා වැඩි වන්නේ නම් එම <u>ගොවි කාණ්ඩය</u> වත්තක් ලෙස සලකනු ලැබේ. මෙහිදී වත්තේ සේවය කරනු ලබන කම්කරුවන්ගේ ප්‍රමාණය පිළිබඳව සැලකිල්ලට ගනු නොලැබේ.**

#### I. එකම කාරක තත්ත්වය

වත්ත යන්න නිර්වචනය කිරීමේදී කාරක තත්ත්වයට විශේෂ ස්ථානයක් හිමිවන අතර වතු ඇසුරින් ප්‍රධාන වශයෙන්ම කාරක තත්ත්වයන් 4 ක් හඳුනාගත හැකිය. එනම්,

- තමා විසින්ම වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- රජයේ ආයතනයක්, වෙළෙඳ සමාගමක් හෝ කළමනාකරණ නියෝජිත ආයතනයක් වෙනුවෙන් වැඩකටයුතු මෙහෙයවන අධිකාරී, කොන්දොස්තර වැනි වැටුප් ලබන සේවකයන්
- පුද්ගලික අයෙකු හෝ පිරිසක් වෙනුවෙන් වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- තවත් හවුල්කරුවන් සමඟ වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්

වත්තක් වීම සඳහා ඉහත සඳහන් කරන ලද කාරක තත්ත්වයන් ඇසුරින් **එකම කාරක තත්ත්වයක** එම වත්ත හෝ එහි කොටස් පැවතිය යුතුය.

#### II. එකම භුක්තිය

යම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට භූමිය අයිතිව ඇති අවස්ථාවක එම පුද්ගලයා හෝ ආයතනය මෙන්ම වෙනත් පුද්ගලයකු හෝ ආයතනයක් එම භූමිය තුළ වගා කටයුතු සත්ත්ව පාලන කටයුතු කරමින් එහි අස්වැන්න හෝ නිෂ්පාදනය ලබාගනී නම් එය එම භූමිය භුක්ති විදීම වන අතර එය භුක්තිය ලෙස හඳුන්වයි.

වත්තක් තුළදී මෙම භුක්තිය ප්‍රධාන වශයෙන් ස්වරූප 6 ක් යටතේ හඳුනාගත හැකිය. එනම්

<u>**රජයේ**</u>

අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට අයිතිව ඇති ඔවුන් විසින් වගාව නඩත්තු කරන වතු , රජයේ වතු ලෙස හැඳින්වේ.

උදා: කෘෂිකර්ම අමාත්‍යාංශයට අයිති වතු, ශ්‍රීලංකා යුධ හමුදාවට අයිති වතු

<u>**අර්ධ රජයේ**</u>

අයිතිය අර්ධ රාජ්‍ය ආයතන සතුව පවතින වතු අර්ධ රජයේ වතු ලෙස හැඳින්වේ.

උදා: තේ පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය, ජන වසම, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල ප්ලාන්ටේෂන්ස්

<u>**වැවිලි සමාගම්**</u>

1992 වසරේදී ක්‍රියාත්මක වූ රාජ්‍ය වතු පෞද්ගලීකරණ වැඩසටහන යටතේ බදු දී ඇති ආයතන වැවිලි සමාගම් සතු වතු ලෙස හැඳින්වේ.

උදා: බොගවන්තලාව ප්ලාන්ටේෂන්ස්, බලංගොඩ ප්ලාන්ටේෂන්ස්, හපුගස්තැන්න ප්ලාන්ටේන්ස්

<u>**පුද්ගලික සමාගම්**</u>

පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් එකතු වී, සමාගම් නීතිය යටතේ ලියාපදිංචි කොට ඇති ඔවුන් සතු වතු පුද්ගලික සමාගම් සතු වතු ලෙස හැඳින්වේ.

උදා: හැටන් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම, කැලණිවැලි ප්ලාන්ටේෂන්ස් (ෆේලීස්)

<u>**තනි පුද්ගල**</u>

කිසියම් තනි පුද්ගලයෙකු සතු වතු පුද්ගලික තනි වතු ලෙස හැඳින්වේ.

<u>**පුද්ගලික හවුල්**</u>

පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් විසින් හවුල් අයිතිය ඇතිව නඩත්තු කරනු වතු පුද්ගලික වතු ලෙස හැඳින්වේ.

භුක්තිය කවර ආකාර වුවද ආර්ථික සංගණනයේ වතු නිර්වචනයට අනුව වත්තක් වීම සඳහා වත්තක සියළුම කොටස් **එකම භුක්තියක්** යටතේ විය යුතුය.

**III. ගොවි කාණ්ඩය**

එකම කාරක තත්ත්වයක් යටතේ, කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ගොඩ, මඩ, සතුන්, ජලජීවී වගා කටයුතු සිදුකරන කෘෂිකාර්මික බිම්, **ගොවි කාණ්ඩයක්** වශයෙන් හැඳින්වේ.

**IV. බිම් කැබැල්ල**

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්, එම ගොවිකාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් සම්පූර්ණයෙන්ම මායිම්වී ඇත්නම් එය **බිම් කැබැල්ලක්** ලෙස

හැඳින්වේ. එකම භුක්තිය යටතේ එකිනෙකට යාව පිහිටි බිම් කොටස් කිහිපයක් එකම කැබැල්ලක් ලෙස සැලකේ.

### 1.2.4 "උපකොටස" අර්ථ දැක්වීම

**විශාල ගොවිකාණ්ඩයක්, ගොවිකාණ්ඩයේ පරිපාලන පහසුව සඳහා කොටස් කිහිපයකට වෙන්කොට එම කොටස් වෙන වෙනම නම්කර ඇති අවස්ථාවක දී එලෙස නම් කරන ලද කොටස් "උපකොටස්" (Sub Division) ලෙස හැඳින්වේ. මෙම උපකොටස් වල එකතුව වත්තක් වන අතර වත්තක උපකොටස් එකිනෙකට යාබදව මෙන්ම එකිනෙකට ඈත්වද පිහිටිය හැකිය. උපකොටස් කෙලෙස පිහිටිය ද උපකොටස් වල විශේෂ ලක්ෂණය වනුයේ ඊට අදාල පරිපාලන කටයුතු නිශ්චිත එක් ස්ථානයකින් සිදු වීමයි.**

ගොවිකාණ්ඩයක් බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවක දී එම බිම් කැබලි එකිනෙකට යාබද නොවන අයුරින් පිහිටිය හැක. එවැනි අවස්ථාවක එම කැබලි අතර අක්කර 20 ට වැඩි කැබලි මෙන්ම අක්කර 20 ට අඩු කැබලි ද තිබිය හැක. මෙම කැබලි උපකොටස් ලෙස වෙන්කොට ඇත්නම් පමණක් ඒ අතර ඇති අක්කර 20 ට අඩු කැබලි ද වතු ගණයට අයත් වන අතර උපකොටස් ලෙස නම්කර නොමැති නම් වතු ගණයට අයත් නොවේ.

මෙම උදාහරණ දෙක මගින් පැහැදිලි වන්නේ ගොවිකාණ්ඩයක් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථා වලදී එම කැබලි පරිපාලනයේ පහසුව පිණිස උපකොටස් ලෙස නම් කර ඇත්නම් කැබැල්ලක බිම් ප්‍රමාණය අක්කර 20 ට අඩු වුව ද වතු වන අතර උපකොටස් ලෙස නම්කර නොමැති අක්කර 20 ට අඩු කැබලි කුඩා ගොවිකාණ්ඩ අංශයට අයත් වන බවත්ය.

### 1.2.5 ගොවිකාරකයා

පහතින් දැක්වෙන ක්ෂේත්‍ර පිළිබඳ වගකීම් දරමින් එකී කටයුතු එකක් හෝ කිහිපයක් සම්බන්ධව ගොවි කාණ්ඩය තුළ ප්‍රධාන තීරණ ගන්නා තැනැත්තා "ගොවි කාරකයා" වේ.

- කෘෂිකාර්මික බෝග වගා කිරීම
- මස්, කිරි හෝ බිත්තර නිෂ්පාදනය සඳහා සතුන් ඇති කිරීම
- මිරිදිය/ කිවුල්දිය (කලපු) / කරදිය මසුන් බෝ කිරීම හෝ වගා කිරීම

මෙහිදී ඔහු/ ඇය ඉහත කටයුත්තක් හෝ කටයුතු

- තමා විසින් කරන්නකු හෝ
- අන් අයගේ සහාය ඇතිව කරන්නකු හෝ
- එම කටයුතු වලට අදාලව කායික වැඩක් නොකර මෙහෙයවමින් තීරණ ගන්නා තැනැත්තෙකු හෝ විය හැකිය.

ගොවි කාරකයෙක් ස්වකීය වගා කටයුතු/ සත්ත්ව පාලනය/ ජල ජීවී වගාවන් වෙන් වෙන් වශයෙන් හෝ සියල්ලම හෝ තමාම කරන්නකු විය හැකි ය. එසේත් නැතිව කෘෂිකර්මයට අදාළ කායිකව වැඩ නොකර එම කටයුතු මෙහෙයවන්නෙකු පමණක් ද විය හැකිය. තවද ඔහු ඉඩම් හෝ කෘෂිකාර්මික සතුන් හෝ ජල ජීවී වගාවන් අයිතිකරුවකු හෝ නොවිය හැකි ය. එනම් හිමිකම කාරකත්වය සඳහා සුදුසුකමක් නොවේ.

කෘෂිකාර්මික සතුන් ඇති කිරීමේ දී එම සත්ත්ව පාලනයේ වගකීම භාරව වැඩ කරන්නා ගොවි කාරකයෙකු වේ. එම සතුන් ඔහුට අයිති විය හැකි ය. නැතහොත් කුලියට හෝ බද්දට හෝ අන්ක්‍රමයකට ගෙන ඇති කරනවා විය හැකි ය.

ගොවිකාරකයකු වීමට ඔහු තම ශ්‍රමය යොදා ඉඩම් වගා කිරීම, කෘෂිකාර්මික සතුන්ගේ (කිරි දෙවීම,තණ කැවීම වැනි) එදිනෙදා කටයුතු, ජල ජීවී වගාව ආශ්‍රිත එදිනෙදා කටයුතුවල නියැලී සිටීම අවශ්‍ය නොවේ. ඉඩම් වගා කිරීම, සතුන් ඇති කිරීම, ජල ජීවී වගා කටයුතු යන අංශ එකක හෝ කිහිපයක එදිනෙදා තීරණ ගැනීම ප්‍රමාණවත් වේ.

ගොවි කාණ්ඩයේ ප්‍රධානියා වන්නේ "ගොවි කාරකයා" ය. කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම පිළිබඳ ප්‍රධාන ආර්ථික හා තාක්ෂණික වගකීම ඔහු සතු ය.

# 2 පරිච්ඡේදය වතු හා වතු කාරකයන් පිළිබඳ තොරතුරු

## 2.1 වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය

2014 වර්ෂයේ පැවැත්වූ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ අදියරේදී වතු පිළිබඳ ලබා ගත් තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති මුළු වතු සංඛ්‍යාව 7,447 වන අතර බිම් ප්‍රමාණය අක්කර 999,001 වේ. 2002 කෘෂිකර්ම සංගණනයේදී එම අගයන් පිළිවෙලින් 6,577 හා 950,947 ක් ලෙස වාර්තා වී ඇත. 2002 වර්ෂය සමඟ සසඳන විට මෙවර වතු සංඛ්‍යාව 13.2% ක ප්‍රතිශතයකින් හා බිම් ප්‍රමාණය 5.1% ප්‍රතිශතයකින් වැඩිවී ඇති බව දැක්විය හැකිවේ.

**වගු අංක 2.1.1**

**දිස්ත්‍රික්ක අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය - 2002 හා 2014**

| දිස්ත්‍රික්කය | 2002 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
| | | අක්කර | හෙක්ටයාර | | අක්කර | හෙක්ටයාර |
| කොළඹ | 67 | 13,195 | 5,340 | 125 | 16,968 | 6,867 |
| ගම්පහ | 404 | 18,951 | 7,669 | 445 | 20,795 | 8,415 |
| කළුතර | 346 | 67,728 | 27,409 | 333 | 68,044 | 27,536 |
| මහනුවර | 323 | 70,421 | 28,499 | 356 | 81,197 | 32,859 |
| මාතලේ | 299 | 43,903 | 17,767 | 281 | 39,234 | 15,877 |
| නුවරඑළිය | 206 | 151,950 | 61,493 | 256 | 158,922 | 64,314 |
| ගාල්ල | 309 | 39,381 | 15,937 | 264 | 33,514 | 13,563 |
| මාතර | 402 | 35,715 | 14,454 | 300 | 37,879 | 15,329 |
| හම්බන්තොට | 141 | 14,265 | 5,773 | 119 | 12,189 | 4,933 |
| යාපනය | - | - | - | 13 | 762 | 308 |
| මන්නාරම | - | - | - | 8 | 7,350 | 2,974 |
| වවුනියා | - | - | - | 9 | 339 | 137 |
| මුලතිව් | - | - | - | 42 | 2451 | 992 |
| කිළිනොච්චිය | 1 | 40 | 16 | 176 | 9,740 | 3,942 |
| මඩකලපුව | 12 | 1,239 | 501 | 57 | 3,911 | 1,583 |
| අම්පාර | 1 | 469 | 190 | 33 | 6,594 | 2,668 |
| ත්‍රිකුණාමලය | - | - | - | 7 | 3903 | 1,579 |
| කුරුණෑගල | 2,017 | 121,804 | 49,293 | 1,826 | 106,015 | 42,903 |
| පුත්තලම | 943 | 55,758 | 22,565 | 1,373 | 66,990 | 27,110 |
| අනුරාධපුරය | 23 | 5,807 | 2,350 | 70 | 7,979 | 3,229 |
| පොළොන්නරුව | 22 | 9,764 | 3,951 | 62 | 11,844 | 4,793 |
| බදුල්ල | 186 | 101,017 | 40,881 | 223 | 97,880 | 39,611 |
| මොණරාගල | 23 | 11,288 | 4,568 | 101 | 17,278 | 6,992 |
| රත්නපුර | 506 | 97,595 | 39,496 | 614 | 98,752 | 39,964 |
| කෑගල්ල | 346 | 90,657 | 36,688 | 354 | 88,471 | 35,803 |
| **ශ්‍රීලංකාව** | **6,577** | **950,947** | 384,843 | **7,447** | **999,001** | 404,282 |

**සිතියම් අංක 01 - වතු අංශය යටතේ දිස්ත්‍රික්ක අනුව මුළු බිම් ප්‍රමාණය**



## 2.1.1 දිස්ත්‍රික්ක අනුව වතු සංඛ්‍යාව - 2002 හා 2014

දිස්ත්‍රික්ක අනුව වතුවල ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කරන විට 2002 වර්ෂය මෙන්ම මෙවරත් වැඩිම වතු සංඛ්‍යාව කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. එම සංඛ්‍යාව 1,826 කි. නමුත් 2002 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වතු සංඛ්‍යාව 2,017 ක් ලෙස වාර්තාවී ඇති අතර මෙවර වතු සංඛ්‍යාව 191 කින් පහත වැටී ඇත. එනම් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 9.5% වේ. 2002 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 30.7% ක ප්‍රතිශතයක් තිබූ අතර 2014 දී එම ප්‍රතිශතය 24.5% බවට පත්ව ඇත.

දෙවනුවට වැඩි වතු සංඛ්‍යාව පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර එම සංඛ්‍යාව 1,373 කි. නමුත් 2002 වර්ෂයේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ වාර්තාවී ඇති වතු සංඛ්‍යාව 943 ක් වන අතර මෙවර වතු සංඛ්‍යාව 430 කින් ඉහල ගොස් ඇත. එනම් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 45.6% වේ. 2002 වර්ෂයේ දී පුත්තලම දිස්ත්‍රික්කයෙහි වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 14.3% ක ප්‍රතිශතයක් තිබූ අතර 2014 දී එම ප්‍රතිශතය 18.4% බවට පත්ව ඇත.

2002 වර්ෂයේදී එක් වත්තක් පමණක් වාර්තා වී තිබූ කිළිනොච්චි දිස්ත්‍රික්කයෙහි 2014 වර්ෂයේ දී වතු 176 බවට වාර්තා වී ඇත. මීට ප්‍රධාන හේතුව අයහපත් වාතාවරණය නිසා අත්හැර ගිය ප්‍රදේශවල නැවත පදිංචි වීමට අවසර ලබාදීම නිසා අත්හැර දමා තිබූ වතු නැවතත් ජනතාව විසින් නඩත්තු කිරීම ආරම්භ කිරීමයි. 2014 වර්ෂයේ දී කිළිනොච්චි දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2.4% වේ.

**රූප සටහන 2.1.1.1**

**දිස්ත්‍රික්ක අනුව වතු සංඛ්‍යාව - 2002 , 2014**




## 2.1.2 දිස්ත්‍රික්ක අනුව බිම් ප්‍රමාණය - 2002 හා 2014

දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කරන විට 2002 වර්ෂය මෙන්ම මෙවරත් වැඩිම බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. එම බිම් ප්‍රමාණය 2002 වර්ෂයට ව වඩා අක්කර 6,972 කින් වැඩිවී ඇති අතර ප්‍රතිශතයක් ලෙස ගත් කළ 4.6% කි. නමුත් 2002 හා 2014 වර්ෂයන් වලදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ වාර්තාවී ඇති බිම් ප්‍රමාණය මුළු බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කළ වර්ෂ දෙකෙහිදීම 16% කි.

2002 සංගණනය සමග සසඳන විට 2014 වතු සංඛ්‍යාව යටතේ ඇති බිම් ප්‍රමාණයේ සැලකිය යුතු පහත වැටීමක් සිදුව ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එම දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේ දී අක්කර 121,804 ලෙස වාර්තාවී ඇති වතු යටතේ ඇති බිම් ප්‍රමාණය 2014 දී අක්කර 106,015 ලෙස වාර්තාවී ඇත. මෙම සංඛ්‍යාව අක්කර 15,789 කින් එනම් 13.0 % ක අඩුවීමක් සිදුව ඇත.

## රූප සටහන 2.1.2.1

### දිස්ත්‍රික්ක අනුව බිම් ප්‍රමාණය - 2002 හා 2014




2002 වර්ෂය හා සසඳන විට වතු යටතේ ඇති බිම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවූ දිස්ත්‍රික්කයක් ලෙස කිළිනොච්චි දිස්ත්‍රික්කය වාර්තාවී ඇත. 2002 වර්ෂයේ දී අක්කර 40 ක් ලෙස වාර්තාවී ඇති මෙම බිම් ප්‍රමාණය 2014 වර්ෂයේ දී අක්කර 9,740 ක් ලෙස වාර්තා වී ඇත. එය මුළු බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1% කි.

## 2.1.3 බිම් කාණ්ඩයෙහි විශාලත්වය අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

### වගු අංක 2.1.3.1

### බිම් කාණ්ඩයෙහි විශාලත්වය අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය - 2014

| බිම් කාණ්ඩයෙහි විශාලත්වය | වතු | | බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| අක්කර 30 ට අඩු | 2,948 | 39.6 | 82,837 | 8.3 |
| අක්කර 30 - 49 | 1,940 | 26.1 | 91,282 | 9.1 |
| අක්කර 50 - 99 | 1,435 | 19.3 | 115,307 | 11.5 |
| අක්කර 100 - 249 | 460 | 6.2 | 106,248 | 10.6 |
| අක්කර 250 ට වැඩි | 664 | 8.9 | 603,327 | 60.4 |
| **මුළු ගණන** | **7,447** | **100.0** | **999,001** | **100.0** |

වැඩිම වතු සංඛ්‍යාවක් අයත් බිම් කාණ්ඩය වනුයේ අක්කර 30 ට අඩු බිම් කාණ්ඩයයි. එම කාණ්ඩය යටතට අයත් වත්තක සාමාන්‍යය විශාලත්වය අක්කර 28.1 වේ. එමෙන්ම වැඩිම බිම් ප්‍රමාණය පවතිනුයේ අක්කර 250 ට වැඩි බිම් කාණ්ඩයේය. එම කාණ්ඩය යටතට අයත් වත්තක සාමාන්‍යය විශාලත්වය අක්කර 908.6 වේ.

## 2.2 අයිතිය අනුව වතු වල ව්‍යාප්තිය

ආර්ථික සංගණනය 2013/14 යටතේ වතු අංශයේ තොරතුරු රැස්කිරීමේදී, ශ්‍රී ලංකාවේ වතු ප්‍රධාන වශයෙන්ම වතුවල අයිතිය අනුව වර්ග කිරීම් 6ක් යටතේ හඳුනාගන්නා ලදී. එය රජයේ, අර්ධ රජයේ, වැවිලි සමාගම් සතු වතු, පුද්ගලික සමාගම් සතු වතු, තනි පුද්ගලයකු සතු වතු හා හවුල් අයිතියක් ඇති වතු ලෙසින් දැක්විය හැකිවේ.

### වගු අංක 2.2.1
### අයිතිය අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය - 2014

| අයිතිය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
|---|---|---|
| රජයේ | 227 | 46,996 |
| අර්ධ රජයේ | 240 | 128,633 |
| වැවිලි සමාගම් | 498 | 461,216 |
| පුද්ගලික සමාගම් | 538 | 109,036 |
| පුද්ගලික තනි | 5,091 | 198,780 |
| පුද්ගලික හවුල් | 853 | 54,340 |
| මුළු ගණන | **7,447** | **999,001** |

වැඩිම වතු සංඛ්‍යාවක් අයත් වනුයේ තනි පුද්ගල වතු යටතට වන අතර එහි ප්‍රතිශත අගය 68.4% කී. නමුත් එම වතු යටතට අයත් බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශතය වනුයේ 19.9% කී. මෙහි වැඩිම බිම් ප්‍රමාණය අයත් වනුයේ වැවිලි සමාගම් යටතට වන අතර එහි ප්‍රතිශත අගය 46.2% කී. නමුත් වැවිලි සමාගම් යටතට අයත් වතු ප්‍රමාණයෙහි ප්‍රතිශත අගය 6.7% කී. වැවිලි සමාගම් යටතට අයත් වතු විශාල බිම් ප්‍රමාණයකින් යුක්ත වීම මෙහි දක්නට ලැබෙන විශේෂත්වයකි.

### රූප සටහන 2.2.1
### අයිතිය අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය 2014




මෙහිදී රජයේ හා අර්ධ රජයේ වතු සංඛ්‍යාව සැලකූ විට ආසන්නව සමාන බවක් දක්නට ලැබුන ද එම වතු වලට අයත් බිම් ප්‍රමාණ සැලකීමේදී පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. එමෙන්ම වැවිලි සමාගම් හා පුද්ගලික සමාගම් සතු වතු සංඛ්‍යාව සැලකූ විටද ආසන්නව සමාන බවක් දක්නට ලැබුන ද එම වතු වලට අයත් බිම් ප්‍රමාණ සැලකීමේදී විශාල පරතරයක් දක්නට ලැබේ.

## 2.3 වතු කාරකයින් පිළිබඳ තොරතුරු

ආර්ථික සංගණනය 2013/14 යටතේ වතු අංශයේ තොරතුරු රැස්කිරීමේදී, වතු කාරකයාගේ ස්ත්‍රී/පුරුෂ භාවය, වයස, තත්ත්වය, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ආදී තොරතුරු එක් රැස් කරන ලදී. එම තොරතුරු වලට අනුව වතු අංශයෙහි වතු කාරයින් සංඛ්‍යාව 7,447ක් වන බවට අනාවරණය විය.

### 2.3.1 ස්ත්‍රී/පුරුෂ භාවය අනුව

**වගු අංක 2.3.1.1**
**ස්ත්‍රී /පුරුෂ භාවය අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2002 සහ 2014**

| ස්ත්‍රී / පුරුෂ භාවය | වතු කාරකයින් | | | |
|---|---|---|---|---|
| | 2002 | | 2014 | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පුරුෂ | 6,197 | 94 | 6,892 | 93 |
| ස්ත්‍රී | 380 | 6 | 555 | 7 |
| මුළු ගණන | **6,577** | **100** | **7,447** | **100** |

මුළු වතු කාරයින්ගෙන් පුරුෂ වතු කාරයින් 93% ක් හා ස්ත්‍රී වතු කාරකයින් 7% ක ප්‍රතිශතයකින් යුක්තවේ. ඒ අනුව පුරුෂ වතු කාරයින් සංඛ්‍යාව ස්ත්‍රී වතු කාරකයින් සංඛ්‍යාව මෙන් දහතුන් ගුණයකටත් වඩා වැඩිවේ. 2002 වර්ෂය හා සැසදීමේදී 2014 වර්ෂයේදී මුළු වතු කාරයින්ගෙන් ස්ත්‍රී වතු කාරකයින්ගේ ප්‍රතිශත අගය 1% ප්‍රමාණයකින් ඉහල ගොස් ඇත. එමෙන්ම මුළු වතු කාරයින් සංඛ්‍යාව 13.2% ක ප්‍රතිශතයකින් වැඩිවී ඇත.

### 2.3.2 වයස් කාණ්ඩය අනුව

**වගු අංක 2.3.2.1**
**වයස් කාණ්ඩ අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2002 සහ 2014**

| වයස් කාණ්ඩය (අවුරුදු) | 2002 | | 2014 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 20 ට අඩු | 10 | 0 | 2 | 0 |
| 20 - 24 | 100 | 2 | 61 | 1 |
| 25 - 34 | 571 | 9 | 670 | 9 |
| 35 - 44 | 1,493 | 23 | 1,549 | 21 |
| 45 - 54 | 2,175 | 33 | 2,025 | 27 |
| 55 - 64 | 1,408 | 21 | 1,977 | 27 |
| 65 ට වැඩි | 820 | 12 | 1,163 | 16 |
| මුළු ගණන | **6,577** | **100** | **7,447** | **100** |

2002 වර්ෂය හා 2014 වර්ෂයන් දෙකෙහිදීම වැඩිම වතු කාරකයින් සංඛ්‍යාවක් අයත්ව ඇත්තේ අවුරුදු 45-54 වයස් කාණ්ඩය යටතේය. නමුත් 2002 වර්ෂයෙහි එම කාණ්ඩයෙහි ප්‍රතිශත අගයට වඩා 2014 වර්ෂයෙහිදි ප්‍රතිශත අගය 6% කින් පහල වැටී ඇති අතර 2014 වර්ෂයෙහිදී අවුරුදු 55-64 වයස් කාණ්ඩයෙහි ප්‍රතිශත අගය 6% කින් ඉහල ගොස් ඇත.

**රූප සටහන 2.3.2.1**

**වයස හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2014**




ස්ත්‍රී/පුරුෂ භාවය හා වයස් කාණ්ඩ සැලකීමේදී , ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයෙහිම අවුරුදු 45 - 54 වයස කාණ්ඩය යටතෙහි ඇති වතු කාරකයින් සංඛ්‍යාව ඉහල අගයක් ගනී.

## 2.3.3 තත්ත්වය අනුව

මෙහිදී වතු කාරකයින්ගේ තත්ත්වය; අයිතිකරු, වතු අධිකාරී, කළමණාකරු හා භාරකරු යනුවෙන් වර්ගීකරණයකට ලක් කරනු ලැබිණි.

**වගු අංක 2.3.3.1**
**තත්ත්වය අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2014**

| තත්ත්වය | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
|---|---|---|---|
| අයිතිකරු | 2,344 | 413 | 2,757 |
| වතු අධිකාරි | 687 | 4 | 691 |
| කළමනාකරු | 1,579 | 37 | 1,616 |
| භාරකරු | 2,282 | 101 | 2,383 |
| **මුළු ගණන** | **6,892** | **555** | **7,447** |

34% ක ප්‍රතිශතයක් පුරුෂ අයිතිකරුවන් වන අතර මුළු ස්ත්‍රී වතු කාරකයින්ගෙන් 74% ක ප්‍රතිශතයක් ස්ත්‍රී අයිතිකරුවන්වේ.

තත්ත්වය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව වතු කාරකයින් සැළකූ විට වැඩිම වතු කාරකයින් සංඛ්‍යාවක් අයත්ව ඇත්තේ අයිතිකරු තත්ත්වය යටතේය. මුළු පුරුෂ වතු කාරකයින්ගෙන්

## 2.3.4 අධ්‍යාපන සුදුසුකම් අනුව

ආර්ථික සංගණනයෙහි වතු අංශය පිළිබඳ ගණන් ගැනීමේදි රැස් කළ දත්ත මගින් වතු කාරකයින්ගේ අධ්‍යාපන මට්ටම වර්ගීකරණයකට ලක් කරනු ලැබිණි. එම වර්ගීකරණය කිසිදා පාසල් ගොස් නැති, 5 හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත්, 6 -10 දක්වා ශ්‍රේණියක් සමත්, අ.පො.ස. (සා.පෙ.) හෝ සමාන විභාගයක් සමත්, අ.පො.ස. (උ.පෙ.) හෝ සමාන විභාගයක් සමත් හා උපාධිය හෝ ඉහළ විභාගයක් සමත් ලෙස කාණ්ඩ ගත කොට දක්වන ලදි.

### වගු අංක 2.3.4.1
### අධ්‍යාපන සුදුසුකම් අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2002 සහ 2014

| අධ්‍යාපනික සුදුසුකම් | 2002 | | 2014 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කිසිදා පාසල් ගොස් නැති | 37 | 1 | 45 | 1 |
| 5 හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත් | 430 | 7 | 418 | 6 |
| 6 - 10 ශ්‍රේණියක් සමත් | 992 | 15 | 1,197 | 16 |
| අ.පො.ස. (සා.පෙ.) හෝ සමාන විභාගයක් සමත් | 2,427 | 37 | 1,708 | 23 |
| අ.පො.ස. (උ.පෙ.) හෝ සමාන විභාගයක් සමත් | 1,940 | 29 | 2,809 | 38 |
| උපාධිය හෝ ඊට ඉහළ විභාගයක් සමත් | 751 | 11 | 1,270 | 17 |
| **මුළු ගණන** | **6,577** | **100** | **7,447** | **100** |

2002 වර්ෂය හා සැසදීමේදී වතු කාරකයින්ගේ අධ්‍යාපනික මට්ටමෙහි කැපී පෙනෙන ලෙස ඉහල යාමක් දක්නට ඇත. 2002 වර්ෂයේදී අ.පො.ස. (සා.පෙ.) හෝ සමාන විභාගයක් සමත් කාණ්ඩය යටතේ ඉහලම ප්‍රතිශතයක් තිබූ අතර 2014 වර්ෂයේදී ඉහලම ප්‍රතිශතය අ.පො.ස. (උ.පෙ.) හෝ සමාන විභාගයක් සමත් කාණ්ඩයට අයත්ව ඇත. එමෙන්ම උපාධිය හෝ ඊට ඉහළ විභාගයක් සමත් කාණ්ඩයෙහිද 2014 වර්ෂයේදී ප්‍රතිශත අගයෙහි වැඩිවීමක් දක්නට ලැබේ.

### රූප සටහන 2.3.4.1
### අධ්‍යාපන සුදුසුකම් අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2014




රූප සටහනට අනුව වතු කාරකයින්ගේ අධ්‍යාපන මට්ටම උසස් මට්ටමකින් යුක්ත වන බව පෙන්නුම් කරයි. මුළු වතු කාරකයින්ගෙන් 55% ක ප්‍රතිශතයක් අ.පො.ස. (උ.පෙ.) හෝ සමාන විභාගයක් සමත් හෝ ඊට ඉහළ විභාගයක් සමතුන් වන අතර ඉන් 17% ක් උපාධිය හෝ ඊට ඉහළ විභාගයක් සමතුන් වේ.

## 2.3.5 වෘත්තීය සුදුසුකම් අනුව

ආර්ථික සංගණනයෙහි වතු අංශය පිළිබඳ ගණන් ගැනීමේදි රැස් කළ තොරතුරු මගින් වතු කාරකයින් වෘත්තීය සුදුසුකම් ලබා ඇද්ද යන්න පිළිබඳව හා එසේ ඔවුන් ලබා ඇති වෘත්තීය සුදුසුකම් ; කෘෂිකර්මය ආශ්‍රිත, පරිපාලන හා කළමණාකරණය ආශ්‍රිත, කෘෂිකර්මය සහ පරිපාලන හා කළමණාකරණය ආශ්‍රිත සහ වෙනත් වෘත්තීය සුදුසුකම් යනුවෙන් වර්ගීකරණයකට ලක් කර තොරතුරු එක් රැස් කරනු ලැබිණි.

**වගු අංක 2.3.5.1**

**වෘත්තීය සුදුසුකම් අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2002 සහ 2014**

| වෘත්තීය සුදුසුකම් | 2002 | | 2014 | |
|---|---|---|---|---|
| | වතු කාරකයින් | | වතු කාරකයින් | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| වෘත්තීය සුදුසුකම් සහිත | 1,399 | 21.3 | 3,061 | 41.1 |
| වෘත්තීය සුදුසුකම් රහිත | 5,178 | 78.7 | 4,386 | 58.9 |
| **මුළු ගණන** | **6,577** | **100.0** | **7,447** | **100.0** |

2002 වර්ෂය හා සැසදීමේදී වෘත්තීය සුදුසුකම් සහිත වතු කාරකයින්ගේ ප්‍රතිශතය මෙවර දෙගුණයකට ආසන්නව ඇත. නමුත් වතු කාරකයින් පස් දෙනෙකු සැලකුවහොත් ආසන්න වශයෙන් ඉන් තිදෙනෙකුම වෘත්තීය සුදුසුකම් නොමැත්තන් වන බව මින් පෙනි යයි.

**රූප සටහන 2.3.5.1**

**වෘත්තීය සුදුසුකම් අනුව වතු කාරකයින් සංඛ්‍යාව 2014**




වතු කාරකයා යනු කෘෂිකාර්මික බෝග වගාව හා මස්/කිරි/බිත්තර නිෂ්පාදනය සඳහා සතුන් ඇති කිරීම පිළිබඳ වගකීම් දරමින් එකී කටයුතු සම්බන්ධව තීරණ ගන්නා තැනැත්තාවේ. නමුත් ඉහත තොරතුරු වලට අනුව අනාවරණය වනුයේ වතු කාරකයින්ගෙන් 59% ක් ම කිසිදු වෘත්තීය සුදුසුකමක් ලබා නොමැති බවය. තවද කෘෂිකර්මය ආශ්‍රිත වෘත්තීය සුදුසුකම් ලබා ඇති වතු කාරකයින්ගේ ප්‍රතිශතය 20% ක් හා කෘෂිකර්මය සහ පරිපාලන හා කළමණාකරණය ආශ්‍රිත වෘත්තීය සුදුසුකම් ඇති වතු කාරකයින්ගේ ප්‍රතිශතය 1% වේ.

## 2.3.6 දිස්ත්‍රික්ක අනුව

### වගුඅංක 2.3.6.1
### දිස්ත්‍රික්ක සහ ස්ත්‍රී /පුරුෂ භාවය අනුව වතු කාරකයින් සංඛ්‍යාව - 2014

| දිස්ත්‍රික්කය | ස්ත්‍රී / පුරුෂ භාවය | | මුළු ගණන |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| කොළඹ | 112 | 13 | 125 |
| ගම්පහ | 400 | 45 | 445 |
| කළුතර | 312 | 21 | 333 |
| මහනුවර | 322 | 34 | 356 |
| මාතලේ | 267 | 14 | 281 |
| නුවරඑළිය | 251 | 5 | 256 |
| ගාල්ල | 246 | 18 | 264 |
| මාතර | 280 | 20 | 300 |
| හම්බන්තොට | 104 | 15 | 119 |
| යාපනය | 12 | 1 | 13 |
| මන්නාරම | 8 | - | 8 |
| වවුනියා | 8 | 1 | 9 |
| මුලතිව් | 35 | 7 | 42 |
| කිළිනොච්චිය | 161 | 15 | 176 |
| මඩකලපුව | 53 | 4 | 57 |
| අම්පාර | 32 | 1 | 33 |
| ත්‍රිකුණාමලය | 6 | 1 | 7 |
| කුරුණෑගල | 1,683 | 143 | 1,826 |
| පුත්තලම | 1,276 | 97 | 1,373 |
| අනුරාධපුරය | 64 | 6 | 70 |
| පොලොන්නරුව | 58 | 4 | 62 |
| බදුල්ල | 212 | 11 | 223 |
| මොණරාගල | 92 | 9 | 101 |
| රත්නපුර | 579 | 35 | 614 |
| කෑගල්ල | 319 | 35 | 354 |
| ශ්‍රීලංකාව | 6,892 | 555 | 7,447 |

වැඩිම වතු කාරයිකයින් සංඛ්‍යාව වාර්තා වනුයේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වන අතර ස්ත්‍රී/පුරුෂ භාවය අනුවද එලෙසින්ම දැකිය හැකිවේ. උතුරු හා නැගෙනහිර පළාත් වලට අයත් දිස්ත්‍රික්ක සැලකූ විට කිළිනොච්චිය දිස්ත්‍රික්කයෙහි වැඩි වතු කාරකයින් සංඛ්‍යාවක් දක්නට ඇති අතර මන්නාරම දිස්ත්‍රික්කයෙහි කිසිදු ස්ත්‍රී වතු කාරකයකු නොසිටීම මෙහි දැකිය හැකි විශේෂත්වයකි. තවද නුවරඑළිය හා අම්පාර දිස්ත්‍රික්ක වල මුළු වතුකාරකයින් හා සැළකිමේ දී ස්ත්‍රී දායකත්වය ඉතාමත් අඩුම මට්ටමකින් පැවතීමද දක්නට ලැබේ.

# 3 පරිච්ඡේදය

# වත්තෙහි නේවාසික ජන ගහනය හා සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

## 3.1 වත්තෙහි නේවාසික ජන ගහනය

ආර්ථික සංගණනයේ 2013/14 වතු අංශයේ තොරතුරු රැස්කිරීමේදී, වත්තෙහි නේවාසික ජන ගහනය පිළිබඳ තොරතුරු එක් රැස් කරන ලදී. මෙහිදී ඔවුන්ගේ ස්ත්‍රී/ පුරුෂ භාවය හා වයස අනුව තොරතුරු ලබා ගන්නා ලදී. එම තොරතුරු වලට අනුව වතු අංශයෙහි නේවාසික ජන සංඛ්‍යාව නොහොත් වතු ජන සංඛ්‍යාව 1,037,883 ක් වන බව අනාවරණය විය.

### 3.1.1 ස්ත්‍රී / පුරුෂ භාවය අනුව

**වගු අංක 3.1.1.1**

**ස්ත්‍රී/පුරුෂ භාවය අනුව වතු ජන සංඛ්‍යාව - 2002 හා 2014**

| ස්ත්‍රී / පුරුෂ | 2002 | | 2014 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පුරුෂ | 337,490 | 48.4 | 513,630 | 49.5 |
| ස්ත්‍රී | 359,958 | 51.6 | 524,253 | 50.5 |
| මුළු ගණන | 697,448 | 100.0 | 1,037,883 | 100.0 |

2014 වර්ෂයේදී වතු අංශයෙහි ස්ත්‍රී ජනගහනය පුරුෂ ජනගහනයට වඩා 10,623 කින් වැඩිවේ. 2002 වර්ෂය හා සැසඳීමේදී 2014 වර්ෂයේදී මුළු වතු ජනගහනයෙන් ස්ත්‍රී ජනගහනයෙහි ප්‍රතිශත අගය 1.1% ක ප්‍රමාණයකින් පහළ බැස ඇත. එමෙන්ම 2002 වර්ෂය හා සැසඳීමේදී මුළු වතු ජනගහනය 48.8% ක ප්‍රතිශතයකින් වැඩිවී ඇත.

### 3.1.2 වයස අනුව

**වගු අංක 3.1.2.1**

**වයස් කාණ්ඩ හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව වතු ජන සංඛ්‍යාව - 2014**

| වයස් කාණ්ඩ (අවුරුදු) | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුමිතිරි අනුපාතය |
|---|---|---|---|---|
| 5 ට අඩු | 45,297 | 47,960 | 93,257 | 94 |
| 5 - 15 | 93,821 | 99,907 | 193,728 | 94 |
| 16 - 60 | 311,163 | 315,643 | 626,806 | 99 |
| 60 ට වැඩි | 63,349 | 60,743 | 124,092 | 104 |
| **මුළු ගණන** | **513,630** | **524,253** | **1,037,883** | **98** |

වතු ජනගහනයෙහි වයස් කාණ්ඩ හා පුමිතිරි අනුපාතය සැලකූ විට වයස අවුරුදු 5 ට අඩු වයස් කාණ්ඩය හා වයස අවුරුදු 5 – 15 අතර වයස් කාණ්ඩ වලදී පුමිතිරි අනුපාතය 94 වේ. මෙයට ප්‍රධාන ලෙස බලපා ඇත්තේ ස්ත්‍රී උපත් සංඛ්‍යාව වැඩි වීමය. නමුත් ඉන් අනතුරුව පුමිතිරි අනුපාතයෙහි අගය වැඩිවීමක් දක්නට ලැබෙන අතර වයස අවුරුදු 60 ට වැඩි ජනගහනයෙහි එම අගය 104 ක් වේ. වතු ජනගහනය ගත් විට ස්ත්‍රීන් හා සැසඳීමේදී පුරුෂයින් ඉහළ ආයු අපේක්ෂාවක් ලබා ගැනීම ප්‍රධාන වශයෙන් බලපා ඇති බව කිව හැකිවේ.

**රූප සටහන 3.1.2.1**

**වයස් කාණ්ඩය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව වතු ජන සංඛ්‍යාව - 2014**




මුළු වතු ජනගහනයෙන් එක් එක් වයස් කාණ්ඩ අනුව ප්‍රතිශත සැළකූ විට වයස අවුරුදු 5 ට අඩු 9%, වයස අවුරුදු 5 – 15 අතර 19%, වයස අවුරුදු 16 – 60 අතර 60% හා අවුරුදු 60 ට වැඩි 12% ලෙස දැක්විය හැකිවේ.

## 3.1.3 දිස්ත්‍රික්ක අනුව

**වගු අංක 3.1.3.1**

**දිස්ත්‍රික්ක අනුව වතු ජන සංඛ්‍යාව - 2014**

| දිස්ත්‍රික්කය | ජනගහනය | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| කොළඹ | 6,699 | 0.6 |
| ගම්පහ | 7,382 | 0.7 |
| කළුතර | 40,862 | 3.9 |
| මහනුවර | 103,338 | 10.0 |
| මාතලේ | 27,695 | 2.7 |
| නුවරඑළිය | 455,570 | 43.9 |
| ගාල්ල | 15,277 | 1.5 |
| මාතර | 23,732 | 2.3 |
| හම්බන්තොට | 1,485 | 0.1 |
| යාපනය | 10 | 0.0 |
| මන්නාරම | 24 | 0.0 |
| වවුනියා | 73 | 0.0 |
| මුලතිව් | 66 | 0.0 |
| කිළිනොච්චිය | 38 | 0.0 |
| මඩකලපුව | 160 | 0.0 |
| අම්පාර | 104 | 0.0 |
| ත්‍රිකුණාමලය | 16 | 0.0 |
| කුරුණෑගල | 12,997 | 1.3 |
| පුත්තලම | 5,324 | 0.5 |
| අනුරාධපුරය | 2,461 | 0.2 |
| පොලොන්නරුව | 578 | 0.1 |
| බදුල්ල | 159,790 | 15.4 |
| මොණරාගල | 6,773 | 0.7 |
| රත්නපුර | 109,400 | 10.5 |
| කෑගල්ල | 58,029 | 5.6 |
| **ශ්‍රීලංකාව** | **1,037,883** | **100.0** |

වැඩිම වතු ජනගහනයක් වාර්තා වනුයේ තේ වගාව වැඩිපුරම සිදු කරනු ලබන නුවරඑළිය, බදුල්ල, රත්නපුර හා මහනුවර දිස්ත්‍රික්ක වලිනි. වතු ජනගහනයෙහි ඉහලම ප්‍රතිශතාත්මක අගය වන 43.9% වාර්තා වනුයේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. උතුරු පළාත, නැගෙනහිර පළාත, හම්බන්තොට දිස්ත්‍රික්කය හා පොළොන්නරුව දිස්ත්‍රික්කය වතු ජනගහනය අඩු ප්‍රදේශ ලෙස දැක්විය හැකිවේ.

## 3.2 වත්තේ නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාව

ආර්ථික සංගණනය 2013/14 යටතේ වතු අංශයේ තොරතුරු රැස්කිරීමේදී, වත්තෙහි නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු එක් රැස් කරන ලදී. මෙහිදී ඔවුන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය හා රැකියා ක්ෂේත්‍රය පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී. එම තොරතුරු වලට අනුව වතු අංශයෙහි නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාව 297,316 ක් වන බව අනාවරණය විය.

### 3.2.1 රැකියා ක්ෂේත්‍රය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව

**වගු අංක 3.2.1.1**

**රැකියා ක්ෂේත්‍රය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව නේවාසික හා අනේවාසික වතු සේවක සංඛ්‍යාව - 2014**

| රැකියා ක්ෂේත්‍රය | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
|---|---|---|---|
| කළමණාකරු | 3,741 | 205 | 3,946 |
| කාර්මික | 2,677 | 166 | 2,843 |
| ලිපිකරු | 1,819 | 2,230 | 4,049 |
| ක්ෂේත්‍ර පරිපාලක | 6,622 | 539 | 7,161 |
| ක්ෂේත්‍ර කම්කරු | 101,844 | 129,355 | 231,199 |
| කර්මාන්ත ශාලා පරිපාලක | 1,831 | 143 | 1,974 |
| කර්මාන්ත ශාලා කම්කරු | 10,815 | 10,586 | 21,401 |
| සුබසාධන, ප්‍රවාහන කටයුතු වල නියුතු | 3,293 | 1,328 | 4,621 |
| වෙනත් ආර්ථික කටයුතු වල නියුතු | 13,179 | 6,943 | 20,122 |
| **මුළු ගණන** | **145,821** | **151,495** | **297,316** |

මෙහි පුරුෂ නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාවෙහි ප්‍රතිශතය 49.0% ක් හා ස්ත්‍රී නේවාසික හා අනේවාසික සේවක සංඛ්‍යාවෙහි ප්‍රතිශතය 51.0% ක් වේ. මෙහි ස්ත්‍රී සංඛ්‍යාව පුරුෂ සංඛ්‍යාවට වඩා 5,674 කින් වැඩිවේ. වතු අංශයෙහි රැකියා ක්ෂේත්‍රය සැලකීමේදී 78% ප්‍රතිශතයක් අයත් වනුයේ ක්ෂේත්‍ර කම්කරු යටතටය. ක්ෂේත්‍ර කම්කරු ස්ත්‍රී හා පුරුෂ ප්‍රතිශත පිළිවෙලින් 85% හා70% වේ. වතු අංශයෙහි රැකියා ක්ෂේත්‍රයෙහි අඩුම සේවක සංඛ්‍යාවක් කර්මාන්ත ශාලා පරිපාලක ක්ෂේත්‍රයෙහි නියුතුවේ.

**රූප සටහන 3.2.1.1**

**රැකියා ක්ෂේත්‍රය අනුව නේවාසික හා අනේවාසික වතු සේවක සංඛ්‍යාව 2014**



## 3.2.2 දිස්ත්‍රික්කය අනුව

### වගු අංක 3.2.2.1

**දිස්ත්‍රික්කය හා ස්ත්‍රී /පුරුෂ භාවය අනුව නේවාසික හා අනේවාසික වතු සේවක සංඛ්‍යාව -2014**

| දිස්ත්‍රික්කය | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
|---|---|---|---|
| කොළඹ | 2,114 | 2,409 | 4,523 |
| ගම්පහ | 8,802 | 1,946 | 10,748 |
| කළුතර | 6,825 | 7,664 | 14,489 |
| මහනුවර | 11,086 | 12,527 | 23,613 |
| මාතලේ | 3,817 | 4,470 | 8,287 |
| නුවරඑළිය | 40,789 | 49,437 | 90,226 |
| ගාල්ල | 4,934 | 4,990 | 9,924 |
| මාතර | 6,355 | 6,437 | 12,792 |
| හම්බන්තොට | 916 | 300 | 1,216 |
| යාපනය | 22 | 13 | 35 |
| මන්නාරම | 419 | 4 | 423 |
| වවුනියා | 58 | 29 | 87 |
| මුලතිව් | 97 | 54 | 151 |
| කිළිනොච්චිය | 610 | 489 | 1,099 |
| මඩකලපුව | 270 | 119 | 389 |
| අම්පාර | 1,617 | 198 | 1,815 |
| ත්‍රිකුණාමලය | 219 | 63 | 282 |
| කුරුණෑගල | 6,662 | 4,864 | 11,526 |
| පුත්තලම | 3,727 | 2,145 | 5,872 |
| අනුරාධපුරය | 909 | 606 | 1,515 |
| පොලොන්නරුව | 1,063 | 499 | 1,562 |
| බදුල්ල | 16,135 | 19,650 | 35,785 |
| මොණරාගල | 2,753 | 7,738 | 10,491 |
| රත්නපුර | 15,572 | 15,451 | 31,023 |
| කෑගල්ල | 10,050 | 9,393 | 19,443 |
| මුළු ගණන | 145,821 | 151,495 | 297,316 |

වැඩිම වතු සේවක සංඛ්‍යාවක් වාර්තා වනුයේ තේ වගාව වැඩිපුරම සිදු කරනු ලබන නුවරඑළිය, බදුල්ල, රත්නපුර හා මහනුවර දිස්ත්‍රික්ක වලිනි. වතු සේවක සංඛ්‍යාවෙහි ඉහලම ප්‍රතිශතාත්මක අගය වන 30.3% වාර්තා වනුයේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. ශ්‍රී ලංකාවේ වතු සේවක සංඛ්‍යාව අඩු ප්‍රදේශ ලෙස උතුරු පළාත, නැගෙනහිර පළාත, හම්බන්තොට දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය හා පොළොන්නරුව දිස්ත්‍රික්කය දැක්විය හැකිවේ.

# 4 පරිච්ඡේදය තේ වගාව පිළිබඳ තොරතුරු

## 4.1 අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය

ශ්‍රී ලංකාවේ 2014 දී ප්‍රථම වරට පවත්වන ලද ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ අදියරේදී කුඩා ගොවිකාණ්ඩ අංශය මෙන්ම වතු අංශය ද ආවරණය වන පරිදි තොරතුරු එක්රැස් කරගන්නා ලදී. ඒ අනුව කුඩා ගොවිකාණ්ඩ අංශය යටතේ තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 309,791 ක් වූ අතර 1982 හා 2002 වර්ෂ වලදී තේ වගාකර ඇති බිම් ප්‍රමාණය පිළිවෙලින් අක්කර 95,180 ක් හා අක්කර 226,514 ක් විය. කුඩා ගොවිකාණ්ඩ අංශය තුළ තේ වගා කර ඇති බිම් ප්‍රමාණය 2002 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී අක්කර 83,277ක සැලකිය යුතු වර්ධනයක් දක්නට ඇත. එය පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සැසදීමේදී 36.8% ක වැඩි වීමකි.

**වගු අංක 4.1.1**

**අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය 1982, 2002, 2014**

| වර්ෂය | කුඩා ගොවිකාණ්ඩ අංශය | වතු අංශය | එකතුව |
|---|---|---|---|
| **1982** | 95,180 | 416,686 | **511,866** |
| **2002** | 226,514 | 293,938 | **520,452** |
| **2014** | 309,791 | 337,138 | **646,929** |

වතු අංශය තුළ 2014 වර්ෂය වන විට තේ වගාව සිදුකර ඇති බිම් ප්‍රමාණය අක්කර 337,138 කි. වර්ෂ 1982 දී වතු අංශයේ තේ වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 416,686 ක් වූ අතර 2002 වර්ෂයේදී එම ප්‍රමාණය අක්කර 293,938 ක් විය. වර්ෂ 2002 දි තේ වගා කරඇති බිම් ප්‍රමාණයට සාපේක්ෂව අක්කර 43,200 ක ප්‍රමාණයකින් බිම් ප්‍රමාණයේ වැඩිවීමක් 2014 දී දක්නට ඇති අතර එය ප්‍රතිශතාත්මකව 14.7% ක වර්ධනයකි.

සමස්තයක් ලෙස සලකාබැලූ විට එනම් කුඩා ගොවිකාණ්ඩ අංශය සහ වතු අංශය යන අංශ දෙකෙහිම තේ වගාව සිදුකර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් අක්කර 511,866, 520,452 හා 646,929 ක් ලෙස අඛණ්ඩ වර්ධනයක් දක්නට ඇත. තේ වගාකර ඇති සමස්ත බිම් ප්‍රමාණය 2002 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී 24.3% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**රූප සටහන 4.1.1**

**අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය 1982, 2002, 2014**




## 4.2. දිස්ත්‍රික්ක සහ අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව තේ වගාව ව්‍යාප්ත වී ඇති ආකාරය පිළිබඳව සැලකිමේදී දිස්ත්‍රික්14 ක පමණක් තේ වගාව සිදු කරනු ලබන අතර උතුරු හා නැගෙනහිර පලාත්, උතුරු මැද පලාත හා වයඹ පලාතේ පුත්තලම දිස්ත්‍රික්කයෙන් තේ වගාව සිදුනොකරයි.දිස්ත්‍රික්ක අනුව සලකා බැලිමේදී තේ වගාකර ඇති මුළු බිම් ප්‍රමාණයට නුවරඑළිය දිස්ත්‍රික්කය වැඩිම දායකත්වයක් ලබාදී ඇති අතර එය ප්‍රමාණාත්මකව අක්කර 136,754 කි. එමෙන්ම තේ වගාකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් තේ වගාව සඳහා අඩුම දායකත්වයක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ලබාදී ඇති අතර එය ප්‍රමාණාත්මකව අක්කර 522 කි.

වගු අංක **4.2.1**

**දිස්ත්‍රික්ක සහ අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය | කුඩා ගොවිකාණ්ඩ අංශය යටතේ තේ වගා කර ඇති බිම් ප්‍රමාණය | වතු අංශය යටතේ තේ වගා කර ඇති බිම් ප්‍රමාණය |
|---|---|---|---|
| කොළඹ | 1,291 | 962 | 329 |
| ගම්පහ | 522 | 290 | 232 |
| කළුතර | 32,209 | 28,965 | 3,244 |
| මහනුවර | 81,457 | 23,052 | 58,405 |
| මාතලේ | 13,905 | 1,854 | 12,051 |
| නුවරඑළිය | 136,754 | 11,080 | 125,674 |
| ගාල්ල | 71,273 | 64,396 | 6,877 |
| මාතර | 64,725 | 50,857 | 13,868 |
| හම්බන්තොට | 1,685 | 1,635 | 50 |
| කුරුණෑගල | 578 | 395 | 183 |
| බදුල්ල | 96,213 | 19,379 | 76,834 |
| මොණරාගල | 1,947 | 409 | 1,538 |
| රත්නපුරය | 113,874 | 84,524 | 29,350 |
| කෑගල්ල | 30,496 | 21,993 | 8,503 |
| ශ්‍රී ලංකාව | **646,929** | **309,791** | **337,138** |

කුඩා ගොවිකාණ්ඩ අංශය යටතේ තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 309,791 ක් ලෙස වාර්තා වන අතර එය තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 48% ප්‍රතිශතයකි. ඉන් වැඩිම දායකත්වයක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් ලබාදී ඇති අතර එය ප්‍රමාණාත්මකව අක්කර 84,524 කි. කුඩා ගොවිකාණ්ඩ අංශය තුළ තේ වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් අඩුම බිම් ප්‍රමාණය වන අක්කර 290 ක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ තේ වගා කර ඇති සමස්ත බිම් ප්‍රමාණයට වැඩි දායකත්වයක් වතු අංශයෙන් ලැබී ඇති අතර එය ප්‍රතිශතාත්මකව 52% කි. වතු අංශය යටතේ තේ වගාකර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 337,138 ක් වන අතර මින් වැඩිම බිම් ප්‍රමාණය වන අක්කර 125,674 නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. වතු අංශය තුළ තේ වගාකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් අඩුම බිම් ප්‍රමාණය හම්බන්තොට දිස්ත්‍රික්කය තුලින් වාර්තා වන අතර එය ප්‍රමාණාත්මකව අක්කර 50 කි.

**රූප සටහන 4.2.1.**

**අංශ අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය**




## 4.3. වගාවේ තත්ත්වය අනුව තේ වගාකර ඇති වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය

වතු පිළිබඳ රැස් කරන ලද තොරතුරුවලට අනුව තේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 1,801 ක් වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 337,138 කි. වැඩිම තේ වගා කර ඇති වතු සංඛ්‍යාව වන 411 රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර හම්බන්තොට හා කුරුණෑගල යන දිස්ත්‍රික් වලින් තේ වගාව සිදුකර ඇති අවම වතු ගණන (2) වාර්තා වේ.

**සිතියම් අංක 02 - වතු අංශය යටතේ දිස්ත්‍රික්ක අනුව තේ වගාකර ඇති බිම් ප්‍රමාණය සහ වතු සංඛ්‍යාව**



### වගු අංක 4.3.1

### වගාවේ තත්ත්වය අනුව තේ වගා කර ඇති වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | තේ වගා කර ඇති මුළු | | රිකිලි තේ වගා කර ඇති | | ඇට තේ වගා කර ඇති | | තවාන් ඇති | | තේ වගාව සඳහා බිම් සූදානම් කර ඇති | | තේ වගාව සඳහා යොදා ගත් දැනට අත්හැර දමා ඇති තේ පඳුරු සහිත | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 19 | 329 | 17 | 314 | 1 | 3 | - | - | 1 | 12 | - | - |
| ගම්පහ | 3 | 232 | 3 | 228 | - | - | 1 | 2 | - | - | 1 | 2 |
| කළුතර | 138 | 3,244 | 131 | 2,302 | 6 | 82 | 8 | 31 | 25 | 735 | 4 | 94 |
| මහනුවර | 262 | 58,405 | 243 | 19,720 | 139 | 12,087 | 41 | 112 | 83 | 16,512 | 78 | 9,974 |
| මාතලේ | 66 | 12,051 | 55 | 4,473 | 36 | 2,754 | 12 | 17 | 24 | 3,614 | 24 | 1,193 |
| නුවරඑළිය | 236 | 125,674 | 225 | 69,640 | 188 | 36,604 | 83 | 1,225 | 94 | 8,367 | 39 | 9,838 |
| ගාල්ල | 167 | 6,877 | 165 | 4,097 | 14 | 151 | 13 | 17 | 64 | 1,640 | 42 | 972 |
| මාතර | 190 | 13,868 | 186 | 7,230 | 52 | 1,366 | 18 | 531 | 65 | 3,630 | 27 | 1,111 |
| හම්බන්තොට | 2 | 50 | 2 | 16 | 1 | 18 | - | - | 1 | 16 | - | - |
| කුරුණෑගල | 2 | 183 | 2 | 48 | 1 | 35 | - | - | - | - | 1 | 100 |
| බදුල්ල | 139 | 76,834 | 119 | 16,296 | 118 | 29,180 | 32 | 830 | 51 | 18,483 | 39 | 12,045 |
| මොණරාගල | 4 | 1,538 | 3 | 285 | 2 | 457 | - | - | 1 | 358 | 2 | 438 |
| රත්නපුරය | 411 | 29,350 | 406 | 14,841 | 61 | 3,715 | 28 | 163 | 86 | 7,152 | 55 | 3,479 |
| කෑගල්ල | 162 | 8,503 | 155 | 6,126 | 17 | 559 | 11 | 38 | 32 | 1,032 | 15 | 748 |
| ශ්‍රී ලංකාව | **1,801** | **337,138** | **1,712** | **145,616** | **636** | **87,011** | **247** | **2,966** | **527** | **61,551** | **327** | **39,994** |

වගාවේ තත්ත්වය අනුව ශ්‍රී ලංකාවේ තේ වගා කර ඇති වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය පිළිබඳව සලකා බැලීමේදී රිකිලි තේ වගාකර ඇති මුළු වතු සංඛ්‍යාව 1,712 ක් වන අතර බිම් ප්‍රමාණය අක්කර 145,616 ක් වේ. තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක රිකිලි තේ වගාකර ඇති අතර එය 43% ක ප්‍රතිශතයකි. රිකිලි තේ වගාව සිදුකර ඇති දිස්ත්‍රික් අතරින් වැඩිම වතු සංඛ්‍යාව වාර්තා වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් වන අතර එය සංඛ්‍යාත්මකව 406 කි. වැඩිම බිම් ප්‍රමාණය අක්කර 69,640 නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. රිකිලි තේ වගාව සිදුකර ඇති දිස්ත්‍රික්ක අතරින් අඩුම වතු සංඛ්‍යාව හම්බන්තොට හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වන අතර එය සංඛ්‍යාත්මකව 2 කි. අඩුම බිම් ප්‍රමාණය අක්කර 16 හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

ඇට තේ වගා කර ඇති මුළු වතු ගණන 636 ක් වන අතර මුළු බිම් ප්‍රමාණය අක්කර 87,011 ක් වේ. ඇට තේ වගා කර ඇති බිම් ප්‍රමාණය තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 26% කි. වැඩියෙන්ම ඇට තේ වගා කර ඇති වතු ගණන හා බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය පිළිවෙලින් වතු 188 ක් සහ අක්කර 36,604 ක් වේ. ඇට තේ වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් කොළඹ, හම්බන්තොට හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුළ එක් වත්ත බැගින් වාර්තාවේ. එය ඇට තේ වගා කර ඇති අඩුම වතු සංඛ්‍යාවද වේ. කොළඹ දිස්ත්‍රික්කයෙන් ඇට තේ වගාකර ඇති අඩුම බිම් ප්‍රමාණය වාර්තා වන අතර එය අක්කර 3 කි. තේ වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ඇට තේ වගා කර ඇති වතු වාර්තා වී නැත.

තේ වගාව තුළ තේ තවාන් යටතේ ඇති මුළු වතු ගණන 247 ක් වන අතර බිම් ප්‍රමාණය අක්කර 2,966 කි. තේ වගාව යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 1% වැනි සුළු බිම් ප්‍රමාණයක් තේ තවාන් සඳහා යොදාගෙන ඇත. තේ වගාව තුළ තේ තවාන් යටතේ ඇති මුළු වතු ගණනින් වැඩිම වතු ගණන සහ බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය පිළිවෙලින් වතු 83 ක් සහ අක්කර 1,225 ක් වේ. ගම්පහ දිස්ත්‍රික්කයේ එක් වත්තක අක්කර 2 ක බිම් ප්‍රමාණයක තේ තවාන් සඳහා යොදා

ගෙන ඇති අතර එය තේ වගාව තුළ තේ තවාන් යටතේ ඇති අඩුම බිම් ප්‍රමාණයයි.තේ වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් කොළඹ, හම්බන්තොට, කුරුණෑගල හා මොණරාගල යන දිස්ත්‍රික් තුළ තේ තවාන් සහිත වතු වාර්තා වී නොමැත.

තේ වගාව සඳහා දැනටමත් බිම සුදානම් කර තිබූ මුළු බිම් ප්‍රමාණය අක්කර 61,551 ක් වන අතර එය තේ වගා කර ඇති සමස්ත බිම් ප්‍රමාණයෙන් 18% කි. තේ වගාව සඳහා දැනටමත් බිම සුදානම් කර තිබූ මුළු වතු ගණන 527 කි. ඉන් වැඩිම වතු ගණන වන වතු 94 නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර වැඩිම බිම් ප්‍රමාණය අක්කර 18,483 බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තේ වගාව සඳහා බිම සුදානම් කර තිබූ අඩුම වතු ගණන (1) කොළඹ, හම්බන්තොට සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇති අතර අඩුම බිම් ප්‍රමාණය අක්කර 12 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තේ වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික් වල තේ වගාව සඳහා බිම සුදානම් කර තිබූ වතු වාර්තා වී නොමැත.

තේ වගාව සඳහා යොදා ගෙන දැනට අත්හැර දමා ඇති තේ පඳුරු සහිත මුළු වතු ගණන 327 ක් වන අතර එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 39,994 කි. මෙම බිම් ප්‍රමාණය තේ වගා කර ඇති සමස්ත බිම් ප්‍රමාණයෙන් 12% ක ප්‍රතිශතයකි. තේ වගාව සඳහා යොදා ගෙන දැනට අත්හැර දමා ඇති තේ පඳුරු සහිත වැඩිම වතු සංඛ්‍යාව (78) මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම වතු සංඛ්‍යාව (1) ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. තේ වගාව සඳහා යොදා ගෙන දැනට අත්හැර දමා ඇති තේ පඳුරු සහිත වැඩිම බිම් ප්‍රමාණය වන අක්කර 12,045 ක් බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය ලෙස අක්කර 2 ක ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තේ වගාව සඳහා යොදා ගෙන දැනට අත්හැර දමා ඇති තේ පඳුරු සහිත වතු කොළඹ සහ හම්බන්තොට යන දිස්ත්‍රික් වලින් වාර්තා නොවේ.

**රූප සටහන 4.3.1.**

**වගාවේ තත්ත්වය අනුව තේ වගා කර ඇති බිම් ප්‍රමාණය**



## 4.4. ක්ලෝන වර්ගය අනුව තේ වතු හා බිම් ප්‍රමාණයන්හි ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ තේ වගාව සිදුකර ඇති වතු අතරින් රිකිළි තේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 1,712 ක් වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 145,616 කි. රිකිළි තේ වගා කර ඇති වතු වල යොදාගෙන ඇති ක්ලෝන වර්ගය අනුව වගාකර ඇති තේ වතු හා බිම් ප්‍රමාණයන්හි ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලිමේදී වැඩිම වතු සංඛ්‍යාවක් වන 1,627 ක් වගා කර ඇත්තේ ක්ලෝන 2000 කාණ්ඩය යටතේ වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 91,821 කි. මෙම ක්ලෝන කාණ්ඩය වගාකර ඇති බිම් ප්‍රමාණය රිකිළි තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 63% කි. ක්ලෝන 2000 කාණ්ඩය වගාකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් වැඩිම වතු සංඛ්‍යාව වන 406 රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර වැඩිම බිම් ප්‍රමාණය වන අක්කර 37,366 නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. මෙම ක්ලෝන කාණ්ඩය වගාකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් අඩුම වතු සංඛ්‍යාව වන වතු 1 සහ බිම් ප්‍රමාණය අක්කර 2 කුරුණෑගල දිස්ත්‍රිකයෙන් වාර්තා වේ.

### වගු අංක 4.4.1

### ක්ලෝන වර්ග අනුව වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | රිකිළි තේ වගා කර ඇති | | ක්ලෝන වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2000 කාණ්ඩය | | 3000 කාණ්ඩය | | 4000 කාණ්ඩය | | වෙනත් ක්ලෝන වර්ග | | ක්ලෝන වර්ගය නොදන්නා | |
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 17 | 314 | 8 | 48 | 2 | 179 | - | - | 5 | 62 | 6 | 25 |
| ගම්පහ | 3 | 228 | - | - | - | - | - | - | - | - | 3 | 228 |
| කළුතර | 131 | 2,302 | 107 | 1,530 | 10 | 96 | 14 | 367 | 26 | 231 | 15 | 78 |
| මහනුවර | 243 | 19,720 | 235 | 12,561 | 52 | 1,220 | 59 | 1,202 | 55 | 1,125 | 64 | 3,612 |
| මාතලේ | 55 | 4,473 | 50 | 3,045 | 11 | 245 | 5 | 52 | 10 | 222 | 25 | 909 |
| නුවරඑළිය | 225 | 69,640 | 210 | 37,366 | 137 | 4,613 | 121 | 6,328 | 188 | 12,987 | 115 | 8,346 |
| ගාල්ල | 165 | 4,097 | 158 | 3,456 | 28 | 130 | 43 | 191 | 10 | 177 | 15 | 143 |
| මාතර | 186 | 7,230 | 182 | 6,293 | 20 | 266 | 55 | 349 | 13 | 151 | 10 | 171 |
| හම්බන්තොට | 2 | 16 | - | - | - | - | - | - | - | - | 2 | 16 |
| කුරුණෑගල | 2 | 48 | 1 | 2 | - | - | - | - | 1 | 1 | 2 | 45 |
| බදුල්ල | 119 | 16,296 | 115 | 12,977 | 25 | 1,063 | 33 | 682 | 39 | 861 | 14 | 713 |
| මොණරාගල | 3 | 285 | 3 | 285 | - | - | - | - | - | - | - | - |
| රත්නපුරය | 406 | 14,841 | 406 | 10,520 | 48 | 1,889 | 54 | 598 | 34 | 437 | 57 | 1,397 |
| කෑගල්ල | 155 | 6,126 | 152 | 3,738 | 16 | 262 | 23 | 371 | 49 | 1,258 | 19 | 497 |
| **ශ්‍රී ලංකාව** | **1,712** | **145,616** | **1,627** | **91,821** | **349** | **9,963** | **407** | **10,140** | **430** | **17,512** | **347** | **16,180** |

ක්ලෝන 3000 කාණ්ඩය තේ වගා කර ඇති මුළු වතු ගණන 349 ක් වන අතර මුළු බිම් ප්‍රමාණය අක්කර 9,963 කි. මෙම බිම් ප්‍රමාණය රිකිළි තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 7% ප්‍රතිශතයකි. මෙම ක්ලෝන කාණ්ඩය වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් වැඩිම වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය පිළිවෙලින් වතු 137 ක් සහ අක්කර 4,613 ක් වේ. මෙම ක්ලෝන කාණ්ඩය වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් අඩුම වතු සංඛ්‍යාව වන වතු 2 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය වන අක්කර 96 කළුතර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

රිකිළි තේ වගාව සිදුකරන වතු අතරින් ක්ලෝන 4000 කාණ්ඩය තේ වගා කර ඇති මුළු වතු ගණන 407 ක් වන අතර මුළු බිම් ප්‍රමාණය අක්කර 10,140 කි. මෙම ක්ලෝන කාණ්ඩය තේ වගා කර ඇති බිම් ප්‍රමාණය රිකිළි තේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 7% කි. ක්ලෝන 4000 කාණ්ඩය තේ

වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් වැඩිම වතු ගණන හා බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය පිළිවෙලින් වතු 121 ක් සහ අක්කර 6,328 ක් වේ. මෙම ක්ලෝන කාණ්ඩය වගා කර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් අඩුම තේ වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය පිළිවෙලින් වතු 5 ක් සහ අක්කර 52 කි.

ඉහත සඳහන් කරන ලද ප්‍රධාන ක්ලෝන කාණ්ඩයන්ට අයත් නොවන වෙනත් ක්ලෝන වර්ගවල තේ වගාකර ඇති මුළු වතු සංඛ්‍යාව 430 ක් වන අතර ඊට අදාල මුළු බිම් ප්‍රමාණය අක්කර 17,512 ක් වේ. වෙනත් ක්ලෝන වර්ගවල තේ වගාකර ඇති බිම් ප්‍රමාණය රිකිළි තේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 12% ක ප්‍රතිශතයකි. වෙනත් ක්ලෝන වර්ග වගාකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් වැඩිම වතු ගණනත් වැඩිම බිම් ප්‍රමාණයත් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එම අගයන් පිළිවෙලින් වතු 188 ක් සහ අක්කර 12,987 කි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් වත්තක අක්කරයක බිම් ප්‍රමාණයක වෙනත් ක්ලෝන වර්ග වල තේ වගා කර ඇති අතර එය වෙනත් ක්ලොන වර්ග වල තේ වගාකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් අඩුම අගය වේ.

රිකිළි තේ වගාව සිදුකර ඇති නමුත් වගාකර ඇති තේ කුමන ක්ලෝන වර්ගයට අයත් දැයි කාරකයා නොදන්නා මුළු තේ වතු ගණන 347 ක් වන අතර එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 16,180 කි.මෙම බිම් ප්‍රමාණය රිකිළි තේ වගාකර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 11% කි. වගා කර ඇති ක්ලෝන කාණ්ඩය නොදන්නා වැඩිම තේ වතු ගණන සහ එහි බිම් ප්‍රමාණය පිළිවෙලින් වතු 115 ක් සහ අක්කර 8,346 ක් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. වගා කර ඇති ක්ලෝන කාණ්ඩය නොදන්නා තේ වගාව සිදුකර ඇති දිස්ත්‍රික්කයන්ගෙන් හම්බන්තොට සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල අඩුම තේ වතු ගණන වාර්තා වී ඇති අතර එය සංඛ්‍යාත්මකව 2 කි. මේ යටතේ අඩුම බිම් ප්‍රමාණය වන අක්කර 16 හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

**රූප සටහන 4.4.1.**

**ක්ලෝන වර්ග අනුව බිම් ප්‍රමාණය**



## 4.5. තේ දළු නෙළිමේදී භාවිතයට ගන්නා බහාළුම පිළිබඳ තොරතුරු

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාප්තව ඇති තේ වගාව සිදුකරන වතු වල තේ දළු නෙළන අවස්ථාවේදී තේ දළු දැමීම සඳහා භාවිතා කරන බහාළුම් වර්ග පිළිබඳ තොරතුරු එක්රැස් කර ගන්නා ලදී.

### වගු අංක 4.5.1

**තේ දළු නෙළිමේදී භාවිතයට ගන්නා බහාළුම පිළිබඳ තොරතුරු**

| දිස්ත්‍රික්කය | පොලිසැක් බෑගය | රෙදි උරය | ප්ලාස්ටික් කුඩය | බට කුඩය |
|---|---|---|---|---|
| කොළඹ | 18 | 1 | 2 | 2 |
| ගම්පහ | 3 | - | - | - |
| කළුතර | 138 | 26 | 27 | 1 |
| මහනුවර | 220 | 59 | 43 | 54 |
| මාතලේ | 51 | 11 | 9 | 8 |
| නුවරඑළිය | 211 | 97 | 88 | 236 |
| ගාල්ල | 133 | 77 | 21 | 10 |
| මාතර | 77 | 158 | 13 | 4 |
| හම්බන්තොට | 2 | - | - | - |
| කුරුණෑගල | 2 | - | 1 | - |
| බදුල්ල | 133 | 48 | 17 | 39 |
| මොණරාගල | 3 | 1 | 4 | 4 |
| රත්නපුරය | 410 | 223 | 45 | 23 |
| කෑගල්ල | 151 | 61 | 24 | 3 |
| ශ්‍රී ලංකාව | **1,552** | **762** | **294** | **384** |

මෙලෙස රැස්කරගන්නා ලද තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ තේ වගා කර ඇති වතු වල තේ දළු නෙළන අවස්ථාවේදී තේ දළු දැමීම සඳහා පොලිසැක් බෑගය බහුල වශයෙන් භාවිතා කරන බව සඳහන් කල හැකිය. පොලිසැක් බෑගය භාවිතා කරන මුළු වතු ගණන 1552 ක් වන අතර ඉන් වැඩිම වතු ගණන (410) රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එය පොලිසැක් බෑගය භාවිතා කරන මුළු වතු ගණනින් 26.4% කි. පොලිසැක් බෑගය භාවිතා කරන අඩුම වතු ගණන (2) හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික් වලින් වාර්තා වේ.

තේ දළු නෙළන අවස්ථාවේදි තේ දළු දැමීම සඳහා රෙදි උරය භාවිතා කරන මුළු වතු ගණන 762 කි. ඉන් වැඩිම වතු ගණන (223) රත්නපුර දිස්ත්‍රික්කයෙන් වන අතර රෙදි උරය භාවිතා කරන මුළු සංඛ්‍යාවෙන් 29.3% ප්‍රතිශතයකි. ගම්පහ, හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික් වල තේ දළු නෙළන අවස්ථාවේදි බහාළුමක් ලෙස රෙදි උරය භාවිතයට නොගනී.

තේ වගා කරන වතු වල තේ දළු නෙළන අවස්ථාවේ තේ දළු දැමීම සඳහා භාවිතා කරන බහාළුම් වර්ග අතුරින් ප්ලාස්ටික් කුඩය අඩුවෙන්ම භාවිතා කරන බව සඳහන් කල හැක. ප්ලාස්ටික් කුඩය භාවිතා කරන මුළු වතු ගණන 294 ක් වේ. ඉන් වැඩිම වතු සංඛ්‍යාව (88) නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර ප්ලාස්ටික් කුඩ භාවිතා කරන මුළු වතු සංඛ්‍යාවෙන් 29.9% කි. ගම්පහ සහ හම්බන්තොට දිස්ත්‍රික් වල තේ වගා කරන වතු වල තේ දළු නෙළන අවස්ථාවේ තේ දළු දැමීම සඳහා ප්ලාස්ටික් කුඩය භාවිතා කර නැත.

තේ දළු නෙළිමේදී දළු දැමීම සඳහා බට කූඩය යොදා ගන්නා වතු ගණන 384 කි. ඉන් වැඩිම වතු ගණන (236) නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තේ දළු නෙළන අවස්ථාවේදී තේ දළු දැමීම සඳහා බට කූඩය යොදා ගන්නා මුළු වතු ගණනින් හරිඅඩකට වඩා වැඩි වතු ප්‍රමාණයක් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතාත්මකව 61.5% කි. ගම්පහ, හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික් වල තේ දළු නෙළන අවස්ථාවේදී තේ දළු දැමීම සඳහා බට කූඩය භාවිතා කරන වතු වර්තා වී නැත.

**රූප සටහන 4.5.1.**

**තේ දළු නෙළිමේදී භාවිතයට ගන්නා බහාළුම**



# 5 පරිච්ඡේදය රබර් වගාව පිළිබඳ තොරතුරු

## 5.1. අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002, 2014

ආර්ථික සංගණනය 2013/14 අනුව රබර් වගාව පිළිබඳ තොරතුරු සලකා බැලීමේ දී 2014 වර්ෂයේ කුඩා ගොවි කාණ්ඩ අංශයේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 123,035 ක් වන අතර 1982 වර්ෂයේ අක්කර 146,935 ක් ලෙස ද 2002 වර්ෂයේ අක්කර 120,227 ක් ලෙස ද වාර්තා වී ඇත. ඉහත වර්ෂ අනුව බිම් ප්‍රමාණයන් පිළිබඳව සංසන්දනාත්මකව සලකාබැලීමේ දී පෙනීයන්නේ 1982 වර්ෂයට වඩා 2002 හා 2014 වර්ෂවල දී කුඩා ගොවි කාණ්ඩ අංශයේ රබර් වගා බිම් ප්‍රමාණයේ අඩුවීමක් වාර්තා වුවද 2002 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී රබර් වගා බිම් ප්‍රමාණය 2.3% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**වගු අංක 5.1.1**

**අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002, 2014**

| වර්ෂය | කුඩා ගොවිකාණ්ඩ අංශය | වතු අංශය | එකතුව |
|---|---|---|---|
| **1982** | 146,935 | 275,982 | **422,917** |
| **2002** | 120,227 | 163,150 | **283,377** |
| **2014** | 123,035 | 154,575 | **277,610** |

වතු අංශයේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982, 2002 හා 2014 වර්ෂ වල දත්ත වලට අනුව 1982 වර්ෂයේ සිට 2014 වර්ෂය වන විට ක්‍රමිකව අඩු වී ඇත. එය 1982 වර්ෂයේ රබර් වගා බිම් අක්කර 275,982 ක් ද 2002 වර්ෂයේ අක්කර 163,150 ක් හා 2014 වර්ෂයේ අක්කර 154,575 ක් ද වේ. ඒ අනුව 2002 වර්ෂයේ වතු අංශයේ රබර් වගා බිම් ප්‍රමාණයට වඩා 2014 වර්ෂයේ වතු අංශයේ රබර් වගා බිම් ප්‍රමාණය 5.3% කින් අඩු වී ඇත.

සමස්තයක් ලෙස අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණයන් පිළිබඳ දත්ත අධ්‍යයනය කිරීමේදී 1982 වර්ෂයේ කුඩා ගොවි කාණ්ඩය හා වතු යන අංශ දෙකේම එකතුව අක්කර 422,917 ක් වේ. 2002 වර්ෂය වන විට එම ප්‍රමාණය අක්කර 283,377 ක් වූ අතර 2014 ආර්ථික සංගණනය තුලින් රැස්කරන ලද තොරතුරු වලට අනුව එම ප්‍රමාණය අක්කර 277,610 ක් විය. මින් පෙනී යන්නේ අංශ අනුව රබර් වගා බිම් ප්‍රමාණයේ මුළු එකතුව 2002 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී 2.0% කින් අඩු වී ඇති බවයි.

**රූප සටහන 5.1.1**

**1982 , 2002, 2014 වර්ෂ වල අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය**




## 5.2. දිස්ත්‍රික්ක හා අංශ අනුව රබර් වගාකර ඇති බිම් ප්‍රමාණය

2014 ආර්ථික සංගණනය මගින් රැස්කරන ලද තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 19 ක රබර් වගා බිම් ව්‍යාප්ත වී ඇත. කුඩා ගොවි කාණ්ඩ අංශය යටතේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 123,035 ක් වන අතර එය සමස්ත රබර් වගා බිම් ප්‍රමාණයෙන් 44% ක ප්‍රතිශතයකි. එම අංශයේ වැඩිම බිම් ප්‍රමාණයක් වගා කර තිබෙන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙනි. එය අක්කර 35,555 ක් වන අතර එය කුඩා ගොවි කාණ්ඩ අංශය යටතේ රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 28.9% ක් වේ. මේ හැරුණු විට ප්‍රධාන වශයෙන් කළුතර (අක්කර 27,329), රත්නපුර (අක්කර 20,391) හා මොණරාගල (අක්කර 12,612) යන දිස්ත්‍රික්ක වල රබර් වගා කර ඇත.

## වගු අංක 5.2.1

### දිස්ත්‍රික්ක හා අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය | කුඩා ගොවිකාණ්ඩ අංශය යටතේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය | වතු අංශය යටතේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය |
|---|---|---|---|
| කොළඹ | 15,582 | 5,628 | 9,954 |
| ගම්පහ | 7,990 | 6,459 | 1,531 |
| කළුතර | 59,973 | 27,329 | 32,644 |
| මහනුවර | 4,063 | 2,921 | 1,142 |
| මාතලේ | 2,993 | 599 | 2,394 |
| නුවරඑළිය | 72 | 32 | 40 |
| ගාල්ල | 10,627 | 3,542 | 7,085 |
| මාතර | 7,785 | 3,791 | 3,994 |
| හම්බන්තොට | 500 | 469 | 31 |
| වව්නියාව | 51 | 29 | 22 |
| අම්පාර | 773 | 773 | - |
| කුරුණෑගල | 8,185 | 2,265 | 5,920 |
| පුත්තලම | 36 | 31 | 5 |
| අනුරාධපුරය | 100 | - | 100 |
| පොළොන්නරුව | 30 | - | 30 |
| බදුල්ල | 3,950 | 607 | 3,343 |
| මොණරාගල | 14,652 | 12,612 | 2,040 |
| රත්නපුරය | 54,772 | 20,391 | 34,381 |
| කෑගල්ල | 85,474 | 35,555 | 49,919 |
| ශ්‍රී ලංකාව | 277,610 | 123,035 | 154,575 |

දිස්ත්‍රික්ක මට්ටමින් කුඩා ගොවි කාණ්ඩ අංශය යටතේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණයන් පිළිබඳ සලකා බැලීමේ දී අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කයන් වල රබර් වගා බිම් වාර්තා නොවන අතර අවම රබර් වගා බිම් ප්‍රමාණයක් පවතින දිස්ත්‍රික්ක ලෙස වව්නියාව (අක්කර 29), පුත්තලම (අක්කර 31) හා නුවරඑළිය (අක්කර 32) වාර්තා වේ.

වතු අංශය යටතේ රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 154,575 ක් වන අතර එය සමස්ත රබර් වගා බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 56% ක් වේ. මෙයින් වැඩිම බිම් ප්‍රමාණය වාර්තා වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර එය අක්කර 49,919 කි. එය වතු අංශය යටතේ රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 32.2% ක් වේ. මේ හැරුණු විට රත්නපුර දිස්ත්‍රික්කයේ අක්කර 34,381 ක ද කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 32,644 ක ද රබර් වගා කර ඇත. වතු අංශය තුල අවම රබර් වගා බිම් ප්‍රමාණයක් වාර්තා වන්නේ නුවරඑළිය, හම්බන්තොට, වව්නියාව, පුත්තලම හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කවලිනි. එම ප්‍රමාණයන් අක්කර 100 ට වඩා අඩු වී ඇත. එමෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ කුඩා ගොවි කාණ්ඩ අංශයේ රබර් වගා බිම් වාර්තා වුවද වතු අංශය යටතේ රබර් වගා බිම් වාර්තා වී නොමැත.

ඉහත සඳහන් අංශ දෙක යටතේම රැස්කරගත් තොරතුරු වලට අනුව රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 277,610 ක් වේ. මින් වැඩිම රබර් බිම් ප්‍රමාණයක් වාර්තා වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර එය අක්කර 85,474 කි. ඊට අමතරව ප්‍රධාන වශයෙන් කළුතර (අක්කර

59,973), රත්නපුර (අක්කර 54,772), කොළඹ (අක්කර 15,582) හා මොණරාගල (අක්කර 14,652) යන දිස්ත්‍රික්ක වලින් රබර් වගා බිම් ප්‍රමාණයන් වාර්තා වේ.

අංශ දෙකටම අනුව අවම රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය වාර්තා වන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වන අතර එය අක්කර 30 ක් වේ. ඊට අමතරව අවම බිම් ප්‍රමාණයන් වාර්තා වන අනෙකුත් දිස්ත්‍රික්ක වන්නේ පුත්තලම (අක්කර 36), වව්නියාව (අක්කර 51) හා නුවරඑළිය (අක්කර 72) යන දිස්ත්‍රික්ක වේ.

**රූප සටහන 5.2.1**

**අංශ අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය**




## 5.3. වගාවේ තත්ත්වය අනුව රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

වතු ආශ්‍රිතව සිදු කරන ලද රබර් වගාව පිළිබඳ තොරතුරු රැස්කිරීමේ දී රබර් වගා කර ඇති සමස්ත වතු සංඛ්‍යාව 1,742 ක් ලෙස වාර්තා වන අතර එයට අදාල මුළු බිම් ප්‍රමාණය අක්කර 154,575 ක් වේ.

**සිතියම් අංක 03 - වතු අංශය යටතේ දිස්ත්‍රික්ක අනුව රබර් වගාකර ඇති බිම් ප්‍රමාණය සහ වතු සංඛ්‍යාව**



## වගු අංක 5.3.1

### වගාවේ තත්ත්වය අනුව රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | රබර් වගා කර ඇති | | ක්ලෝන විශේෂ යටතේ වගා කර ඇති | | ක්ලෝන විශේෂයන්ට අයත් නොවන | | තවාන් ඇති | | අත්හැර දමා ඇති රබර් ගස් සහිත | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු වතු සංඛ්‍යාව | මුළු බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | **103** | **9,954** | 94 | 9,588 | 2 | 23 | 7 | 40 | 14 | 303 |
| ගම්පහ | **55** | **1,531** | 55 | 1,439 | 4 | 25 | 1 | 23 | 7 | 44 |
| කළුතර | **302** | **32,644** | 290 | 31,349 | 5 | 91 | 19 | 110 | 49 | 1,094 |
| මහනුවර | **29** | **1,142** | 26 | 1,079 | 2 | 50 | 1 | 1 | 4 | 12 |
| මාතලේ | **41** | **2,394** | 38 | 1,848 | 10 | 419 | 4 | 53 | 5 | 74 |
| නුවරඑළිය | **3** | **40** | 3 | 23 | 1 | 10 | - | - | 3 | 7 |
| ගාල්ල | **153** | **7,085** | 140 | 5,712 | 4 | 30 | 7 | 914 | 21 | 429 |
| මාතර | **118** | **3,994** | 108 | 3,795 | 8 | 142 | 1 | 5 | 9 | 52 |
| හම්බන්තොට | **3** | **31** | 3 | 14 | - | - | 1 | 17 | - | - |
| වව්නියාව | **2** | **22** | 2 | 22 | - | - | - | - | - | - |
| කුරුණෑගල | **54** | **5,920** | 52 | 5,684 | 5 | 82 | 2 | 8 | 9 | 146 |
| පුත්තලම | **1** | **5** | 1 | 5 | - | - | - | - | - | - |
| අනුරාධපුරය | **2** | **100** | 2 | 95 | 1 | 5 | - | - | - | - |
| පොලොන්නරුව | **1** | **30** | 1 | 30 | - | - | - | - | - | - |
| බදුල්ල | **53** | **3,343** | 49 | 3,037 | - | - | - | - | 5 | 306 |
| මොණරාගල | **33** | **2,040** | 31 | 1,887 | 6 | 138 | 2 | 10 | 1 | 5 |
| රත්නපුරය | **435** | **34,381** | 426 | 32,157 | 9 | 151 | 22 | 329 | 51 | 1,744 |
| කෑගල්ල | **354** | **49,919** | 354 | 47,530 | 18 | 406 | 48 | 403 | 61 | 1,580 |
| **ශ්‍රී ලංකාව** | **1,742** | **154,575** | **1,675** | **145,294** | **75** | **1,572** | **115** | **1,913** | **239** | **5,796** |

රබර් වගාව සිදු කරන වැඩිම වතු සංඛ්‍යාව (435) වාර්තා වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයෙනි. මීට අමතරව වැඩි වශයෙන් රබර් වගාව සිදුකරන දිස්ත්‍රික්ක ලෙස කෑගල්ල (354), කළුතර (302), ගාල්ල (153) හා මාතර (118) යන දිස්ත්‍රික්ක සඳහන් කළ හැකිය. අවම රබර් වගා කර ඇති වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක ලෙස හම්බන්තොට (03), වව්නියාව(02), අනුරාධපුර(02), පොළොන්නරුව (01), පුත්තලම (01) ලෙස සඳහන් කළ හැකිය.

වතු ආශ්‍රිතව රබර් වගාව ව්‍යාප්ත වී ඇති භූමි ප්‍රමාණය සලකා බැලීමේදී වැඩිම භූමි ප්‍රමාණය වන අක්කර 49,919 කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය වතු අංශයේ මුළු රබර් වගා බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 32.2% කි. ඒ හැරුණු විට රත්නපුර (අක්කර 34,381), කළුතර (අක්කර 32,644) හා කොළඹ (අක්කර 9,954) යන දිස්ත්‍රික්ක වල වැඩි වශයෙන් රබර් වගා කර ඇති බව වාර්තා වී ඇත.

ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 1,675 ක් ලෙස වාර්තා වන අතර ඉන් වැඩිම වතු සංඛ්‍යාව (426) රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. ඊට අමතරව ක්ලෝන විශේෂ යටතේ රබර් වගාව සිදු කරන ප්‍රධාන දිස්ත්‍රික්ක ලෙස කෑගල්ල (354) හා කළුතර (290) යන දිස්ත්‍රික්ක සඳහන් කළ හැකිය. ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති වැඩිම භූමි ප්‍රමාණය වන අක්කර 47,530 කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 32.7% ක් වේ. එහි අවම අගයක් ගන්නා දිස්ත්‍රික්ක ලෙස පුත්තලම (අක්කර 5), හම්බන්තොට (අක්කර 14) හා වව්නියාව (අක්කර 22) යන දිස්ත්‍රික්ක සඳහන් කළ හැකිය.

ක්ලෝන විශේෂයන්ට අයත් නොවන රබර් වතු සංඛ්‍යාව සැලකිල්ලට ගැනීමේදී වැඩිම වතු සංඛ්‍යාව (18) කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එමෙන්ම ක්ලෝන විශේෂයන්ට අයත් නොවන වැඩිම රබර් බිම් ප්‍රමාණය (අක්කර 419) වාර්තා වන්නේ මාතලේ දිස්ත්‍රික්කයෙනි. ඒ හැරුණු විට කෑගල්ල (අක්කර 406), රත්නපුර (අක්කර 151) හා මාතර (අක්කර 142) යන දිස්ත්‍රික්ක වලින් ද වැඩිම රබර් බිම් ප්‍රමාණයන් වාර්තා වේ.

රබර් තවාන් සහිත වැඩිම වතු සංඛ්‍යාවක් (48) වාර්තා වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර රබර් තවාන් සඳහා භාවිතා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 914) ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. ඒ හැරුණු විට කෑගල්ල දිස්ත්‍රික්කයෙන් අක්කර 403 ක් ද රත්නපුර දිස්ත්‍රික්කයෙන් අක්කර 329 ක් ද වාර්තා වී ඇත.

වාර්තා වී ඇති තොරතුරු අනුව අත්හැර දමා ඇති රබර් ගස් සහිත වැඩිම වතු සංඛ්‍යාව (61) වාර්තා වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙනි. ඊට අමතරව රත්නපුර දිස්ත්‍රික්කයෙන් වතු 51 ක් ද කළුතර දිස්ත්‍රික්කයෙන් වතු 49 ක් ද වාර්තා වී ඇත. එමෙන්ම අත්හැර දමා ඇති වැඩිම රබර් වගා බිම් ප්‍රමාණය වාර්තා වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයෙනි. එය අක්කර 1,744 කි. එය මුළු අත්හැරදමා ඇති රබර් ගස් සහිත බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 30% ක් වේ. ඒ හැරුණු විට කෑගල්ල දිස්ත්‍රික්කයේ අක්කර 1,580 ක් ද කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 1,094 ක් ද වාර්තා වී ඇත.

**රූප සටහන 5.3.1**

**වගාවේ තත්ත්වය අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය**




## 5.4. රබර් වගා කර ඇති බිම් කාණ්ඩ අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

වතු අංශයේ රබර් වගාව කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 154,575 ක් වේ. දිස්ත්‍රික් මට්ටමින් රබර් වගාකර ඇති බිම් ප්‍රමාණය සැලකීමේ දී වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයෙනි. එය අක්කර 49,919 ක් වන අතර එය මුළු රබර් බිම් වලින් 32%ක් වේ. මේ හැරුණු විට රත්නපුර දිස්ත්‍රික්කයේ අක්කර 34,381 ක ද, කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 32,644 ක ද, කොළඹ දිස්ත්‍රික්කයේ අක්කර 9,954 ක ද, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්කර 7,085 ක හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 5,920 ක ද රබර් වගා කර ඇති බිම් ප්‍රමාණයන් වාර්තා වී ඇත. නුවරඑළිය, හම්බන්තොට, වව්නියාව, පුත්තලම, පොළොන්නරුව හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල අක්කර 1,000 කට වඩා අඩු බිම් ප්‍රමාණයන් වාර්තා වී ඇත.

## වගු අංක 5.4.1

### රබර් වගා කර ඇති බිම් කාණ්ඩ අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | අක්කර 20 හා 20 ට අඩු | | අක්කර 21 - 30 අතර | | අක්කර 31 - 50 අතර | | අක්කර 51 - 100 අතර | | අක්කර 101 - 250 අතර | | අක්කර 250 ට වැඩි | | මුළු | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 38 | 199 | 21 | 498 | 14 | 502 | 8 | 467 | 7 | 1,285 | 15 | 7,003 | **103** | **9,954** |
| ගම්පහ | 32 | 281 | 9 | 205 | 5 | 178 | 6 | 469 | 3 | 398 | - | - | **55** | **1,531** |
| කළුතර | 78 | 1,399 | 54 | 1,482 | 55 | 2,544 | 35 | 2,908 | 52 | 12,337 | 28 | 11,974 | **302** | **32,644** |
| මහනුවර | 14 | 76 | 3 | 69 | 5 | 185 | 4 | 278 | 2 | 263 | 1 | 271 | **29** | **1,142** |
| මාතලේ | 20 | 221 | 6 | 139 | 4 | 148 | 4 | 281 | 6 | 1,190 | 1 | 415 | **41** | **2,394** |
| නුවරඑළිය | 2 | 20 | 1 | 20 | - | - | - | - | - | - | - | - | **3** | **40** |
| ගාල්ල | 86 | 1,446 | 15 | 364 | 10 | 377 | 25 | 1,825 | 14 | 2,191 | 3 | 882 | **153** | **7,085** |
| මාතර | 63 | 567 | 14 | 336 | 14 | 442 | 16 | 849 | 9 | 1,191 | 2 | 609 | **118** | **3,994** |
| හම්බන්තොට | 3 | 31 | - | - | - | - | - | - | - | - | - | - | **3** | **31** |
| වව්නියාව | 2 | 22 | - | - | - | - | - | - | - | - | - | - | **2** | **22** |
| කුරුණෑගල | 20 | 303 | 5 | 106 | 5 | 197 | 8 | 601 | 11 | 2,082 | 5 | 2,631 | **54** | **5,920** |
| පුත්තලම | 1 | 5 | - | - | - | - | - | - | - | - | - | - | **1** | **5** |
| අනුරාධපුරය | - | - | 1 | 20 | - | - | 1 | 80 | - | - | - | - | **2** | **100** |
| පොලොන්නරුව | - | - | - | - | 1 | 30 | - | - | - | - | - | - | **1** | **30** |
| බදුල්ල | 17 | 98 | 11 | 268 | 7 | 279 | 4 | 289 | 11 | 1,548 | 3 | 861 | **53** | **3,343** |
| මොණරාගල | 11 | 149 | 7 | 196 | 5 | 230 | 6 | 540 | 3 | 670 | 1 | 255 | **33** | **2,040** |
| රත්නපුරය | 156 | 2,215 | 72 | 1,672 | 55 | 1,999 | 47 | 3,353 | 62 | 10,474 | 43 | 14,668 | **435** | **34,381** |
| කෑගල්ල | 98 | 812 | 42 | 1,299 | 55 | 2,388 | 29 | 2,700 | 55 | 10,491 | 75 | 32,229 | **354** | **49,919** |
| ශ්‍රී ලංකාව | **641** | **7,844** | **261** | **6,674** | **235** | **9,499** | **193** | **14,640** | **235** | **44,120** | **177** | **71,798** | **1,742** | **154,575** |

රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය සැලකිල්ලට ගැනීමේ දී අක්කර 21 - 30 ත් අතර ඇති වැඩිම වතු සංඛ්‍යාව වතු 72 රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එය අක්කර 21 - 30 ත් අතර ඇති මුළු වතු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 4% කි. අක්කර 31-50 ත් අතර රබර් වගා කර ඇති වැඩිම වතු සංඛ්‍යාව වතු 55 ක් ලෙස කළුතර හා කෑගල්ල දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ. අක්කර 51-100 ත් අතර රබර් වගා කර ඇති වතු වැඩි ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එය වතු 47 ක් වන අතර 51-100 ත් අතර රබර් වගා කර ඇති මුළු වතු සංඛ්‍යාවෙන් 10% කි. තවද අක්කර 101-250 අතර රබර් වගා කර ඇති වතු වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් වන අතර එය වතු 62 කි. මීට අමතරව අක්කර 250 ට වැඩි විශාල රබර් වතු වැඩිම සංඛ්‍යාව (75) තිබෙන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වන අතර එය 46% ක ප්‍රතිශතයකි. තවද වතු ආශ්‍රිතව අක්කර 20 ට අඩු රබර් වගා කර ඇති වතු 641 ක් වාර්තා වී ඇති අතර එහි බිම් ප්‍රමාණය අක්කර 7,844 ක් ලෙස වාර්තා වී ඇත. එම කාණ්ඩයේ වැඩිම රබර් වගා බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් වන අතර එය අක්කර 2,215 ක් වේ.

**රූප සටහන 5.4.1**

**බිම් කාණ්ඩ අනුව රබර් වගාව සඳහා භාවිත කර ඇති බිම් ප්‍රමාණය**




## 5.5 ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

රබර් වගාවේ ක්ලෝන විශේෂ යටතේ තොරතුරු රැස්කිරීමේදී වැඩිම රබර් වගා බිම් ප්‍රමාණයක් වාර්තා වන්නේ RRIC 121 ක්ලෝන විශේෂයෙන් වන අතර එම ප්‍රමාණය අක්කර 50,038 කි. එය ක්ලෝන විශේෂ අනුව රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 35% කි. මෙම කාණ්ඩයේ රබර් වගා කර ඇති වැඩිම වතු සංඛ්‍යාව රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එම වතු සංඛ්‍යාව 263 කි. ඊට අමතරව මෙම ක්ලෝන කාණ්ඩය යටතේ රබර් වගා කර ඇති වතු වැඩි වශයෙන් පවතින්නේ කළුතර (246), කෑගල්ල (244) යන දිස්ත්‍රික්කවල වේ.

## වගු අංක 5.5.1

### ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | ක්ලෝන විශේෂ අනුව වගා කර ඇති | | ක්ලෝන විශේෂය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | RRIC 121 | | RRIC 102 | | RRIC 100 | | PB 86 | | වෙනත් ක්ලෝන | |
| | මුළු වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 94 | 9,588 | 62 | 3,448 | 13 | 568 | 46 | 3,638 | 49 | 916 | 26 | 1,018 |
| ගම්පහ | 55 | 1,439 | 24 | 407 | 12 | 141 | 24 | 526 | 26 | 322 | 5 | 43 |
| කළුතර | 290 | 31,349 | 246 | 10,942 | 43 | 1,733 | 189 | 8,768 | 184 | 5,191 | 75 | 4,715 |
| මහනුවර | 26 | 1,079 | 16 | 785 | 6 | 67 | 8 | 62 | 7 | 132 | 3 | 33 |
| මාතලේ | 38 | 1,848 | 23 | 558 | 3 | 117 | 5 | 343 | 16 | 679 | 10 | 151 |
| නුවරඑළිය | 3 | 23 | 2 | 13 | 1 | 5 | - | - | 2 | 5 | - | - |
| ගාල්ල | 140 | 5,712 | 87 | 1,932 | 22 | 248 | 62 | 2,148 | 40 | 853 | 22 | 531 |
| මාතර | 108 | 3,795 | 64 | 1,023 | 13 | 217 | 39 | 1,406 | 35 | 896 | 18 | 253 |
| හම්බන්තොට | 3 | 14 | 2 | 7 | 2 | 5 | 1 | 2 | - | - | - | - |
| වව්නියාව | 2 | 22 | 2 | 22 | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 52 | 5,684 | 40 | 1,352 | 13 | 221 | 20 | 635 | 23 | 914 | 22 | 2,562 |
| පුත්තලම | 1 | 5 | 1 | 3 | 1 | 2 | - | - | - | - | - | - |
| අනුරාධපුරය | 2 | 95 | - | - | 1 | 67 | 1 | 23 | - | - | 1 | 5 |
| පොළොන්නරුව | 1 | 30 | 1 | 30 | - | - | - | - | - | - | - | - |
| බදුල්ල | 49 | 3,037 | 49 | 1,998 | 9 | 192 | 9 | 148 | 6 | 359 | 9 | 340 |
| මොණරාගල | 31 | 1,887 | 28 | 925 | 8 | 127 | 11 | 221 | 8 | 361 | 8 | 253 |
| රත්නපුරය | 426 | 32,157 | 263 | 12,936 | 59 | 2,453 | 179 | 10,812 | 150 | 4,499 | 64 | 1,457 |
| කෑගල්ල | 354 | 47,530 | 244 | 13,657 | 73 | 3,402 | 169 | 9,357 | 189 | 8,599 | 135 | 12,515 |
| ශ්‍රී ලංකාව | 1,675 | 145,294 | 1,154 | 50,038 | 279 | 9,565 | 763 | 38,089 | 735 | 23,726 | 398 | 23,876 |

RRIC 102 ක්ලෝන විශේෂය යටතේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 9,565 ක් ලෙස වාර්තා වන අතර එය ක්ලෝන විශේෂ අනුව රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 7% කි. එම ක්ලෝන විශේෂයට අයත් වතු සංඛ්‍යාව 279 ක් වන අතර මෙම කාණ්ඩය යටතේ වැඩිම රබර් වගා බිම් ප්‍රමාණය වන අක්කර 3,402 කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එම ක්ලෝන විශේෂය වැඩි වශයෙන් වගා කර ඇති අනිකුත් දිස්ත්‍රික්ක ලෙස පිළිවෙලින් රත්නපුර අක්කර (2,453) , කළුතර අක්කර (1,733) වන අතර හම්බන්තොට හා නුවර එළිය දිස්ත්‍රික්ක වල මෙම ක්ලෝන විශේෂය අඩුවෙන්ම වගා කර ඇත.

රබර් වගාවේ RRIC 100 කාණ්ඩයට අයත් ක්ලෝන රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 38,089 ක් හා එම ක්ලෝන විශේෂය වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 763 කි. මෙම කාණ්ඩයේ ක්ලෝන විශේෂය වැඩි වශයෙන්ම වගා කර ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කය තුල වන අතර එම ප්‍රමාණය අක්කර 10,812 කි. මෙම ක්ලෝන කාණ්ඩය යටතේ වැඩිම වතු සංඛ්‍යාව (189) කළුතර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

PB 86 ක්ලෝන කාණ්ඩය යටතේ වගා කර ඇති මුළු රබර් වගා බිම් ප්‍රමාණය අක්කර 23,726 කි. එම කාණ්ඩය යටතේ රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව 735 ක් වේ. මෙම ක්ලෝන කාණ්ඩය යටතේ වැඩිම රබර් වගා බිම් ප්‍රමාණය අක්කර 8,599 හා වැඩිම රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව (189) කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

වෙනත් ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය අක්කර 23,876 ක් වන අතර මේ යටතේ රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව 398 කි. වෙනත් ක්ලෝන විශේෂ යටතේ වැඩිම රබර්

වගා බිම් ප්‍රමාණය (අක්කර 12,515) හා වැඩිම වතු සංඛ්‍යාව (135) කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

### රූප සටහන 5.5.1

### ක්ලෝන විශේෂ යටතේ රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය



# 6 පරිච්ඡේදය පොල් වගාව පිළිබඳ තොරතුරු

## 6.1 අංශ අනුව පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002, 2014

ආර්ථික සංගණනය 2013/14 අනුව පොල් වගාව පිළිබඳ තොරතුරු සලකා බැලීමේ දී 2014 වර්ෂයේ කුඩා ගොවි කාණ්ඩ අංශයේ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 917,345 ක් වන අතර 1982 වර්ෂයේ අක්කර 773,746 ක් ලෙස ද 2002 වර්ෂයේ අක්කර 799,357 ක් ලෙස ද වාර්තා වී ඇත. ඉහත වර්ෂ අනුව බිම් ප්‍රමාණයන් පිළිබඳව සංසන්දනාත්මකව සලකා බැලීමේ දී පෙනීයන්නේ 1982 වර්ෂයට වඩා 2002 හා 2014 වර්ෂවල දී කුඩා ගොවි කාණ්ඩ අංශයේ පොල් වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කර ඇති බවයි.

**වගු අංක 6.1.1**

**අංශ අනුව පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982 , 2002, 2014**

| වර්ෂය | කුඩා ගොවි කාණ්ඩ අංශය | වතු අංශය | එකතුව |
|---|---|---|---|
| 1982 | 773,746 | 254,837 | 1,028,583 |
| 2002 | 799,357 | 176,302 | 975,659 |
| 2014 | 917,345 | 178,638 | 1,095,983 |

වතු අංශයේ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය 1982, 2002 හා 2014 වර්ෂ වල දත්ත වලට අනුව 1982 වර්ෂයේ සිට 2014 වර්ෂය වන විට ක්‍රමිකව අඩු වී ඇත. එය 1982 වර්ෂයේ පොල් වගා බිම් අක්කර 254,837 ක් ද 2002 වර්ෂයේ අක්කර 176,302 ක් හා 2014 වර්ෂයේ අක්කර 171,499 ක් ද වේ. ඒ අනුව 2002 වර්ෂයේ වතු අංශයේ පොල් වගා බිම් ප්‍රමාණයට වඩා 2014 වර්ෂයේ වතු අංශයේ පොල් වගා බිම් ප්‍රමාණය 1.3% කින් වැඩි වී ඇත.

සමස්තයක් ලෙස අංශ අනුව පොල් වගා කර ඇති බිම් ප්‍රමාණයන් පිළිබඳ දත්ත අධ්‍යයනය කිරීමේදී 1982 වර්ෂයේ කුඩා ගොවි කාණ්ඩය හා වතු යන අංශ දෙකේම එකතුව අක්කර 1,028,583 ක් වේ. 2002 වර්ෂය වන විට එම ප්‍රමාණය අක්කර 975,659 ක් වූ අතර 2014 ආර්ථික සංගණනය තුළින් රැස්කරන ලද තොරතුරු වලට අනුව එම ප්‍රමාණය අක්කර 1,095,983 ක් විය. මින් පෙනී යන්නේ අංශ අනුව පොල් වගා බිම් ප්‍රමාණයේ මුළු එකතුව 1982 වර්ෂයට සාපේක්ෂව 2002 වර්ෂයේ දී 5.1% කින් අඩු වී නැවතත් 2002 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී 12.3% කින් වැඩි වී ඇති බවකි.

**රූප සටහන 6.1.1**

**1982, 2002, 2014 වර්ෂ වල අංශ අනුව පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය**




## 6.2 පොල් වගා කර ඇති වතුවල ව්‍යාප්තිය

ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික තොරතුරු රැස් කිරිමේ අදියරේදී වතු අංශය පිළිබඳව ද තොරතුරු රැස් කළ අතර ඒ යටතේ පොල් වගා කර ඇති වතු පිළිබඳව මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කරනු ඇත. පොල් වගා කර ඇති වතු යන්න තුළ සම්පූර්ණයෙන් පොල් වගා කර ඇති වතු සහ වෙනත් බෝග වගාකර ඇති වතු තුළ පොල් වගා කර ඇති වතු ද ඇතුළත් බව අවධාරණය කළ යුතුය. ඒ අනුව වාර්තාවී ඇති පොල් වගාකර ඇති මුළු වතු සංඛ්‍යාව 5,390 කි.

පොල් වගා කර ඇති වතු සංඛ්‍යාවෙන් වැඩිම වතු සංඛ්‍යාව (වතු 2994) වයඹ පළාතෙන් වාර්තාවී ඇති අතර එය පොල් වගා කර ඇති මුළු වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 55.5% කි. එමෙන්ම අඩුම පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව (72) වාර්තාවී ඇත්තේ නැගෙනහිර පළාතෙන් වන අතර එය පොල් වගා කර ඇති මුළු වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 1.3% කි. බස්නාහිර පළාතෙන් පොල් වගා කර ඇති වතු 665 ක් ද දකුණු පළාතෙන් පොල් වගා කර ඇති වතු 516 ක් ද වාර්තාවී ඇත. ඊට අමතරව සබරගමු පළාතෙන් පොල් වගා කර ඇති වතු 451 ක් ද මධ්‍යම පළාතෙන් පොල් වගා කර ඇති වතු 291 ක් ද උතුරු පළාතෙන් පොල් වගා කර ඇති වතු 223 ක් ද වාර්තාවී ඇති අතර ඌව සහ උතුරු මැද පළාත් වලින් වාර්තාවී ඇත්තේ පොල් වගා කර ඇති වතු 100 ට වඩා අඩු සංඛ්‍යාවකි.

දිස්ත්‍රික්ක අනුව පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු කරන විට වැඩියෙන්ම පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව වාර්තාවී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එය සංඛ්‍යාත්මකව 1,761 ක් වන අතර පොල් වගා කර ඇති මුළු වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 32.7% කි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් පොල් වගා කර ඇති අඩුම වතු සංඛ්‍යාව වාර්තාවී ඇති අතර එය සංඛ්‍යාත්මකව 4 කි. එය පොල් වගා කර ඇති මුළු වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 0.1% කි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් පොල් වගා කර ඇති වතු 417 ක් ද රත්නපුර දිස්ත්‍රික්යෙන් පොල් වගා කර ඇති වතු 296 ක් ද මාතර දිස්ත්‍රික්කයෙන් පොල් වගා කර ඇති වතු 232 ක් ද වාර්තාවී ඇත.

## වගු අංක 6.2.1

### පොල් වගා කර ඇති වතුවල ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | පොල් වගාකර ඇති මුළු වතු සංඛ්‍යාව | ක්‍රමවත් වගාව යටතේ පොල් වගාකර ඇති වතු සංඛ්‍යාව | විසිරි වගාව යටතේ පොල් වගාකර ඇති වතු සංඛ්‍යාව |
|---|---|---|---|
| කොළඹ | 83 | 50 | 51 |
| ගම්පහ | 417 | 386 | 144 |
| කළුතර | 165 | 109 | 95 |
| මහනුවර | 124 | 34 | 120 |
| මාතලේ | 156 | 107 | 91 |
| නුවරඑළිය | 11 | 5 | 7 |
| ගාල්ල | 179 | 82 | 137 |
| මාතර | 232 | 96 | 201 |
| හම්බන්තොට | 105 | 63 | 54 |
| යාපනය | 8 | 4 | 4 |
| මන්නාරම | 8 | 6 | 2 |
| වව්නියාව | 9 | 5 | 5 |
| මුලතිව් | 41 | 27 | 18 |
| කිලිනොච්චිය | 157 | 76 | 81 |
| මඩකළපුව | 50 | 31 | 28 |
| අම්පාර | 18 | 15 | 5 |
| ත්‍රිකුණාමලය | 4 | 3 | - |
| කුරුණෑගල | 1,761 | 1,620 | 483 |
| පුත්තලම | 1,233 | 1,106 | 252 |
| අනුරාධපුරය | 55 | 29 | 46 |
| පොලොන්නරුව | 34 | 25 | 13 |
| බදුල්ල | 31 | 10 | 28 |
| මොණරාගල | 58 | 47 | 21 |
| රත්නපුරය | 296 | 119 | 221 |
| කෑගල්ල | 155 | 87 | 100 |
| **ශ්‍රී ලංකාව** | **5,390** | **4,142** | **2,207** |

## සිතියම් අංක 04 - වතු අංශය යටතේ දිස්ත්‍රික්ක අනුව පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව



## 6.3 ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

පොල් වගා කර ඇති වතු, ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු ලෙස හා විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති වතු ලෙස වර්ගීකරණයකට ලක් කොට ලබාගත් තොරතුරු ද මෙහිදී ගෙන හැර දැක්විය හැකිය. එහිදි ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු කාණ්ඩය යටතේ වතු 4,142 ක් සමස්ත ශ්‍රී ලංකාවෙන්ම වාර්තාවී ඇත. එම කාණ්ඩයේ වැඩිම වතු සංඛ්‍යාව කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර එය 1,620 ක අගයක් ගනී. එය ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට 39.1% කි. එම කාණ්ඩය යටතේ වාර්තාවන අඩුම වතු සංඛ්‍යාව 3 ක් වන අතර එය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. එය ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස සැලකූ විට 0.01% කි.

### වගු අංක 6.3.1

**ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | ක්‍රමවත් වගාව යටතේ | | | |
|---|---|---|---|---|
| | මුළු වතු සංඛ්‍යාව | ඵල දරණ බිම් ප්‍රමාණය | ඵල නොදරණ බිම් ප්‍රමාණය | |
| | | | අළුත් වගාව යටතේ | යටි වගාව යටතේ |
| කොළඹ | 50 | 964 | 246 | 62 |
| ගම්පහ | 386 | 13,730 | 2,053 | 742 |
| කළුතර | 109 | 957 | 90 | 127 |
| මහනුවර | 34 | 916 | 83 | 41 |
| මාතලේ | 107 | 3,454 | 389 | 430 |
| නුවරඑළිය | 5 | 10 | - | 4 |
| ගාල්ල | 82 | 1,332 | 159 | 118 |
| මාතර | 96 | 1,449 | 115 | 81 |
| හම්බන්තොට | 63 | 1,017 | 318 | 348 |
| යාපනය | 4 | 132 | 17 | 12 |
| මන්නාරම | 6 | 152 | - | 40 |
| වව්නියාව | 5 | 14 | - | 19 |
| මුලතිව් | 27 | 803 | 16 | 278 |
| කිලිනොච්චිය | 76 | 1,188 | 73 | 1,170 |
| මඩකළපුව | 31 | 433 | 88 | 278 |
| අම්පාර | 15 | 463 | 33 | 62 |
| ත්‍රිකුණාමලය | 3 | 3 | - | 41 |
| කුරුණෑගල | 1,620 | 67,683 | 12,257 | 4,107 |
| පුත්තලම | 1,106 | 36,543 | 5,066 | 4,004 |
| අනුරාධපුරය | 29 | 439 | 58 | 178 |
| පොළොන්නරුව | 25 | 1,468 | 732 | 397 |
| බදුල්ල | 10 | 291 | 30 | 22 |
| මොණරාගල | 47 | 458 | 134 | 160 |
| රත්නපුරය | 119 | 1,006 | 113 | 246 |
| කෑගල්ල | 87 | 1,308 | 135 | 114 |
| **ශ්‍රී ලංකාව** | **4,142** | **136,213** | **22,205** | **13,081** |

ක්‍රමවත් වගාව යටතේ පොල් වගා කර ඇති පොල් වතු එල දරණ බිම් ප්‍රමාණය සහ එල නොදරණ බිම් ප්‍රමාණය යටතේ නැවත වර්ග කොට තොරතුරු දැක්විය හැකිය. ඒ අනුව ක්‍රමවත් වගාව යටතේ එල දරණ මුළු බිම් ප්‍රමාණය අක්කර 136,213 ක් ලෙසින් වාර්තාවී ඇත. ඉන් වැඩිම බිම් ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයෙනුත් අඩුම බිම් ප්‍රමාණය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙනුත් වාර්තාවී ඇත. එම බිම් ප්‍රමාණ පිළිවෙලින් අක්කර 67,683 ක් හා අක්කර 3 ක් වේ. ක්‍රමවත් වගාව යටතේ එල දරණ බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස එම අගයන් 49.7% ක් හා 0.002% ක් වේ.

එල නොදරණ බිම් ප්‍රමාණය යන්න අළුත් වගාව යටතේ බිම් ප්‍රමාණය හා යටි වගාව යටතේ බිම් ප්‍රමාණය ලෙස වර්ග කර තොරතුරු දැක්විය හැකිය. අළුත් වගාව යටතේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 22,205 කි. එයින් ද වැඩිම බිම් ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර ප්‍රමාණාත්මකව අක්කර 12,257 ක් වේ. අළුත් වගාව යටතේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස 55.2% කි. එම කාණ්ඩය යටතේ නුවරඑළිය, මන්නාරම, වව්නියාව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලින් කිසිදු බිම් ප්‍රමාණයක් වාර්තාවී නොමැත. යටි වගාව යටතේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 13,081 කි. කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ම එම කාණ්ඩය යටතේ ද වැඩිම බිම් ප්‍රමාණය වාර්තාවී ඇති අතර එය අක්කර 4,107 කි. එම බිම් ප්‍රමාණය යටි වගාව යටතේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 31.4% කි. යටි වගාව යටතේ වාර්තාවී ඇති අඩුම බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර එය ප්‍රමාණාත්මකව අක්කර 4 කි. යටි වගාව යටතේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 0.03% කි. කුරුණෑගල දිස්ත්‍රික්කය හැරුණු විට යටි වගාව යටතේ අක්කර 1000 ට වැඩි බිම් ප්‍රමාණයක් වගා කර ඇති දිස්ත්‍රික්ක ලෙස පුත්තලම දිස්ත්‍රික්කය (අක්කර 4,004) හා කිළිනොච්චි දිස්ත්‍රික්කය (අක්කර 1,170) වාර්තාවී ඇත.

## 6.4 විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා පොල් ගස් ප්‍රමාණය

ශ්‍රී ලංකාව තුළ විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති මුළු පොල් වතු සංඛ්‍යාව 2,207 ක් ලෙස වාර්තාවී ඇති අතර ඉන් වැඩිම වතු සංඛ්‍යාව කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර ප්‍රමාණාත්මකව වතු 483 ක් වේ. එය විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති පොල් වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 21.9% කි. එම කාණ්ඩයේ යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් කිසිදු පොල් වත්තක් වාර්තාවී නැත. පුත්තලම දිස්ත්‍රික්කයෙන් පොල් වගා කර ඇති වතු 252 ක්, රත්නපුර දිස්ත්‍රික්කයෙන් පොල් වගා කර ඇති වතු 221 ක් හා මාතර දිස්ත්‍රික්කයෙන් පොල් වගා කර ඇති වතු 201 ක් එම කාණ්ඩය යටතේ වාර්තාවී ඇත.

### වගු අංක 6.4.1

**විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා පොල් ගස් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | විසිරි වගාව යටතේ | | | |
|---|---|---|---|---|
| | පොල් වගාකර ඇති වතු සංඛ්‍යාව | මුළු ගස් ගණන | ඵල දරණ ගස් ගණන | ඵල නොදරණ ගස්/ පැල ගණන |
| කොළඹ | 51 | 22,907 | 16,058 | 6,849 |
| ගම්පහ | 144 | 126,816 | 101,291 | 25,525 |
| කළුතර | 95 | 15,338 | 11,530 | 3,808 |
| මහනුවර | 120 | 18,418 | 14,903 | 3,515 |
| මාතලේ | 91 | 30,160 | 21,093 | 9,067 |
| නුවරඑළිය | 7 | 300 | 191 | 109 |
| ගාල්ල | 137 | 57,288 | 39,546 | 17,742 |
| මාතර | 201 | 83,543 | 73,359 | 10,184 |
| හම්බන්තොට | 54 | 38,689 | 32,264 | 6,425 |
| යාපනය | 4 | 1,634 | 1,190 | 444 |
| මන්නාරම | 2 | 213 | - | 213 |
| වව්නියාව | 5 | 374 | 330 | 44 |
| මුලතිව් | 18 | 10,077 | 6,787 | 3,290 |
| කිලිනොච්චිය | 81 | 6,004 | 5,231 | 773 |
| මඩකළපුව | 28 | 11,402 | 6,461 | 4,941 |
| අම්පාර | 5 | 277 | 122 | 155 |
| ත්‍රිකුණාමලය | - | - | - | - |
| කුරුණෑගල | 483 | 687,149 | 537,656 | 149,493 |
| පුත්තලම | 252 | 236,729 | 188,524 | 48,205 |
| අනුරාධපුරය | 46 | 7,280 | 4,107 | 3,173 |
| පොළොන්නරුව | 13 | 3,324 | 1,258 | 2,066 |
| බදුල්ල | 28 | 5,889 | 4,287 | 1,602 |
| මොණරාගල | 21 | 2,817 | 203 | 2,614 |
| රත්නපුරය | 221 | 17,137 | 12,405 | 4,732 |
| කෑගල්ල | 100 | 31,683 | 29,720 | 1,963 |
| **ශ්‍රී ලංකාව** | **2,207** | **1,415,448** | **1,108,516** | **306,932** |

විසිරි වගාව යටතේ පොල් වගා කර ඇති වතුවලින් වාර්තාවී ඇති මුළු පොල් ගස් සංඛ්‍යාව 1,415,448 කි. ඉන් පොල් ගස් 687,149 කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර විසිරි වගාව යටතේ වාර්තාවී ඇති මුළු පොල් ගස් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 48.5% කි. පොල් ගස් 500 ට අඩුවෙන් වාර්තාවී ඇති දිස්ත්‍රික්ක ලෙස මන්නාරම (213), අම්පාර (277), නුවරඑළිය (300), වව්නියාව (374) යන දිස්ත්‍රික්ක පෙන්වා දිය හැකිය.

විසිරි වගාව යටතේ වාර්තාවී ඇති මුළු පොල් ගස් සංඛ්‍යාවෙන් පොල් ගස් 1,108,516 ක් ඵල දරණ පොල් ගස් වේ. ඵල දරණ පොල් ගස්වලින් වැඩිම ගස් ප්‍රමාණය වාර්තාවී ඇත්තේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ම වන අතර එය සංඛ්‍යාත්මකව 537,656 කි. විසිරි වගාව යටතේ මන්නාරම දිස්ත්‍රික්කයෙන් වාර්තා වන වතු තුළ ඵල දරණ පොල් ගස් වාර්තාවී නොමැත. අම්පාර (122),

නුවරඑළිය (191), මොණරාගල (203), වව්නියාව (330) යන දිස්ත්‍රික්කවලින් එල දරණ පොල් ගස් 500ට වඩා අඩුවෙන් වාර්තාවී ඇත.

විසිරි වගාව යටතේ වාර්තාවී ඇති මුළු පොල් ගස් සංඛ්‍යාවෙන් පොල් ගස් 306,932 ක් එල නොදරණ ගස්/පැල වේ. මෙම කාණ්ඩය යටතේ ද වැඩිම පොල් ගස් සංඛ්‍යාව වන පොල් ගස් 149,493 වාර්තාවී ඇත්තේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්මය. එය එල නොදරණ ගස්/පැල සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 48.7% කි. එල නොදරණ ගස්/පැල 500ට වඩා අඩුවෙන් වාර්තාවී ඇති දිස්ත්‍රික්ක ලෙස වව්නියාව (44), නුවරඑළිය (109), අම්පාර (155), මන්නාරම (213), යාපනය (444) යන දිස්ත්‍රික්ක පෙන්වා දිය හැකිය.

**රූප සටහන 6.4.1**

**විසිරි වගාව යටතේ එල දරණ පොල් ගස් හා එල නොදරණ පොල් ගස්/පැල ගණන**




## 6.5 වගා කර ඇති පොල් ගස් වර්ග අනුව වතු සංඛ්‍යාව හා ගස් ගණන

කෘෂිකාර්මික තොරතුරු රැස් කිරිමේ අදියරේදී, වගා කර ඇති පොල් ගස් වර්ගය අනුව ද තොරතුරු රැස් කරන ලදි. එහිදි වගා කර ඇති පොල් ගස් වැඩි දියුණු කළ ප්‍රභේද, මල් මදින, තැඹිලි, තවාන් යටතේ ඇති ලෙස වර්ගීකරණය කර තොරතුරු රැස් කිරිම සිදු කරන ලදි.

## වගු අංක 6.5.1

### වගා කර ඇති පොල් ගස් වර්ග අනුව වතු සංඛ්‍යාව හා ගස් ගණන

| දිස්ත්‍රික්කය | වගා කර ඇති පොල් ගස් වර්ග | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩි දියුණු කල ප්‍රභේද | | මල් මදින | | තැඹිලි | | තවාන් යටතේ ඇති | | මුළු | |
| | වතු ගණන | ගස් ගණන | වතු ගණන | ගස් ගණන | වතු ගණන | ගස් ගණන | වතු ගණන | ගස් ගණන | වතු ගණන | ගස් ගණන |
| කොළඹ | 27 | 19,938 | - | - | 52 | 1,309 | 6 | 821 | 63 | 22,068 |
| ගම්පහ | 151 | 130,318 | 3 | 770 | 275 | 4,604 | 43 | 58,366 | 315 | 194,058 |
| කළුතර | 55 | 17,398 | 1 | 100 | 71 | 1,324 | 4 | 196 | 100 | 19,018 |
| මහනුවර | 61 | 18,539 | - | - | 57 | 401 | 7 | 325 | 82 | 19,265 |
| මාතලේ | 39 | 79,115 | 1 | 4 | 62 | 1,836 | 5 | 1,917 | 86 | 82,872 |
| නුවරඑළිය | 5 | 454 | - | - | 4 | 18 | 1 | 5 | 6 | 477 |
| ගාල්ල | 82 | 13,937 | 1 | 300 | 77 | 1,177 | 7 | 468 | 102 | 15,882 |
| මාතර | 66 | 19,142 | - | - | 155 | 3,548 | 11 | 1,490 | 169 | 24,180 |
| හම්බන්තොට | 38 | 40,117 | - | - | 33 | 478 | 12 | 13,173 | 50 | 53,768 |
| යාපනය | - | - | - | - | 1 | 15 | - | - | 1 | 15 |
| මන්නාරම | 5 | 4,118 | - | - | - | - | 1 | 52 | 5 | 4,170 |
| වව්නියාව | 4 | 351 | - | - | 1 | 25 | 4 | 39 | 5 | 415 |
| මුලතිව් | - | - | - | - | 5 | 49 | 6 | 92 | 10 | 141 |
| කිලිනොච්චිය | 61 | 36,385 | 3 | 7 | 4 | 75 | 5 | 26 | 71 | 36,493 |
| මඩකළපුව | 47 | 45,134 | 1 | 38 | 4 | 187 | 6 | 210 | 47 | 45,569 |
| අම්පාර | 5 | 6,073 | - | - | 4 | 95 | 4 | 930 | 8 | 7,098 |
| ත්‍රිකුණාමලය | 1 | 320 | - | - | - | - | - | - | 1 | 320 |
| කුරුණෑගල | 607 | 1,068,195 | 5 | 357 | 936 | 11,977 | 126 | 380,766 | 1256 | 1,461,295 |
| පුත්තලම | 348 | 267,624 | 7 | 733 | 386 | 3,812 | 55 | 53,662 | 552 | 325,831 |
| අනුරාධපුරය | 34 | 15,212 | - | - | 29 | 486 | 8 | 733 | 47 | 16,431 |
| පොලොන්නරුව | 14 | 24,016 | - | - | 10 | 242 | - | - | 21 | 24,258 |
| බදුල්ල | 6 | 2,411 | - | - | 12 | 50 | - | - | 13 | 2,461 |
| මොණරාගල | 22 | 15,129 | 2 | 93 | 19 | 441 | 4 | 1,730 | 33 | 17,393 |
| රත්නපුරය | 103 | 15,232 | - | - | 138 | 1,789 | 7 | 282 | 182 | 17,303 |
| කෑගල්ල | 42 | 27,154 | - | - | 73 | 1,402 | 1 | 4 | 93 | 28,560 |
| **ශ්‍රී ලංකාව** | **1,823** | **1,866,312** | **24** | **2,402** | **2,408** | **35,340** | **323** | **515,287** | **3,318** | **2,419,341** |

එම වර්ගීකරණය යටතේ වාර්තාවී ඇති මුළු වැඩි දියුණු කළ ප්‍රභේදය සහිත පොල් වතු 1,823 ක් වන අතර කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් එම ප්‍රභේදය යටතේ වැඩිම පොල් වතු සංඛ්‍යාව (607) වාර්තාවී ඇත. එය වැඩි දියුණු කළ ප්‍රභේදය සහිත පොල් වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස සැලකූ විට 33.3% කි. යාපනය හා මුලතිව් යන දිස්ත්‍රික්කවල එම කාණ්ඩය යටතේ පොල් වතු වාර්තාවී නොමැත. ඒ වැඩි දියුණු කළ ප්‍රභේදය සහිත පොල් ගස් සංඛ්‍යාව පිළිබඳව සලකා බැලූ විට වාර්තාවී ඇති මුළු පොල් ගස් 1,866,312 ක් වේ. ඉන් වැඩිම පොල් ගස් සංඛ්‍යාව (1068195) වාර්තා වන්නේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ම වන අතර එය වැඩි දියුණු කළ ප්‍රභේදය සහිත පොල් ගස් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 57.2% කි. එම ප්‍රභේදය යටතේ පොල් වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් අඩුම පොල් ගස් සංඛ්‍යාවක් වාර්තාවී ඇත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් වන අතර එය සංඛ්‍යාත්මකව 320 කි.

මල් මදින පොල් ගස් සහිත වතු වාර්තාවී ඇත්තේ දිස්ත්‍රික්ක 9 කින් පමණක් වන අතර එම දිස්ත්‍රික්ක වලින් වාර්තාවී ඇති මුළු වතු සංඛ්‍යාව 24 කි. ඉන් වැඩිම වතු සංඛ්‍යාව වන වතු 7 වාර්තා වන්නේ පුත්තලම දිස්ත්‍රික්කයෙන් වන අතර එය මල් මදින පොල් ගස් සහිත වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 29.2% කි. එම කාණ්ඩය යටතේ අඩුම වතු සංඛ්‍යාව වාර්තාවී ඇත්තේ කළුතර, මාතලේ, ගාල්ල

හා මඩකලපුව යන දිස්ත්‍රික්කවලිනි. එම දිස්ත්‍රික්කවලින් මල් මදින පොල් වතු 1 බැගින් වාර්තාවී ඇත. වතු අංශය යටතේ වාර්තාවී ඇති මල් මදින පොල් ගස් 2,402 ක් වන අතර ඉන් වැඩිම ගස් සංඛ්‍යාව ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. මල් මදින පොල් ගස් 770 ක් එම දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර එය මුළු මල් මදින පොල් ගස් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 32% කි. එම කාණ්ඩය යටතේ වාර්තාවන අඩුම පොල් ගස් සංඛ්‍යාව (4) වාර්තාවී ඇත්තේ මාතලේ දිස්ත්‍රික්කයෙනි.

තැඹිලි ගස් සහිත වතු 2,408 ක් වතු අංශයෙන් වාර්තාවී ඇති අතර ඉන් වැඩිම වතු සංඛ්‍යාව (වතු 936) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. මන්නාරම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලින් තැඹිලි වතු වාර්තා නොවන අතර තැඹිලි වතු වාර්තාවන දිස්ත්‍රික්ක අතරින් අඩුම වතු සංඛ්‍යාව වාර්තාවී ඇත්තේ යාපනය හා වව්නියාව දිස්ත්‍රික්කවලිනි. එම දිස්ත්‍රික්කවලින් තැඹිලි වතු 1 බැගින් වාර්තාවී ඇත. වාර්තාවී ඇති මුළු තැඹිලි ගස් සංඛ්‍යාව 35,340 ක් වන අතර ඉන් වැඩිම ගස් සංඛ්‍යාව (11,977) වාර්තා වන්නේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ම වන අතර එය වාර්තාවී ඇති මුළු තැඹිලි ගස් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස එය 33.9% කි. තැඹිලි වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් අඩුම තැඹිලි ගස් සංඛ්‍යාව (15) වාර්තාවී ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයෙනි.

තවාන් යටතේ ඇති පොල් ගස් සහිත වතු 323 ක් වතු අංශයෙන් වාර්තාවී ඇති අතර කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් එම කාණ්ඩය යටතේ වැඩිම වතු සංඛ්‍යාව (වතු 126) වාර්තා වන අතර එය තවාන් යටතේ ඇති පොල් ගස් සහිත මුළු වතු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 39% කි. යාපනය, ත්‍රිකුණාමලය, පොලොන්නරුව හා බදුල්ල යන දිස්ත්‍රික්ක වලින් මෙම කාණ්ඩය යටතේ පොල් වතු වාර්තාවී නොමැති අතර තවාන් යටතේ ඇති පොල් ගස් සහිත වතු වාර්තාවී ඇති දිස්ත්‍රික්ක අතුරින් අඩුම පොල් වතු සංඛ්‍යාවක් (වතු 1) වාර්තාවී ඇත්තේ මන්නාරම දිස්ත්‍රික්කයෙනි. තවාන් යටතේ ඇති මුළු පොල් ගස් සංඛ්‍යාව 515,287ක් ලෙස වාර්තාවී ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් තවාන් යටතේ වැඩිම පොල් ගස් සංඛ්‍යාවක් වාර්තාවී ඇති අතර එය සංඛ්‍යාත්මකව 380,766 කි. එය තවාන් යටතේ ඇති මුළු පොල් ගස් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස 73.9% කි. තවාන් යටතේ ඇති අඩුම පොල් ගස් සංඛ්‍යාව කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති අතර එය සංඛ්‍යාත්මකව 4 කි.

**රූප සටහන 6.5.1**

**වගා කර ඇති පොල් ගස් වර්ග අනුව ගස් ගණන**



# 7 පරිච්ඡේදය වෙනත් ස්ථිර බෝග වගාව පිළිබඳ තොරතුරු

ස්ථිර බෝග වන තේ, රබර් හා පොල් වගාවන් පිළිබඳව මීට ඉහත පරිච්ඡේද වලදී තොරතුරු ඉදිරිපත් කරන ලද අතර මෙම පරිච්ඡේදය තුළදී ප්‍රධාන වශයෙන්ම තේ, රබර් හා පොල් හැරුණු විට වෙනත් ස්ථිර බෝග එනම් අපනයන කෘෂිකර්ම බෝග, පළතුරු බෝග සහ අනෙකුත් සථිර බෝග වගාවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

## 7.1 අපනයන කෘෂිකර්ම බෝග වගාව පිළිබඳ තොරතුරු

ආර්ථික සංගණනයේ වතු ආශ්‍රිත තොරතුරු රැස්කිරීම අනුව අපනයන කෘෂිකර්ම බෝග වගාව පිළිබඳව ද තොරතුරු එක්රැස් කරන ලද අතර අපනයන කෘෂිකර්ම බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණයන් ඒක් එක් අපනයන කෘෂිකර්ම බෝගය යටතේ ගණන් ගන්නා ලදී. ප්‍රධාන වශයෙන්ම ගම්මිරිස්, කෝපි, කුරුඳු, කොකෝවා, කරදමුංගු, කරාබුනැටි, සාදික්කා, බුලත් හා පුවක් යන අපනයන කෘෂිකර්ම බෝග වගාවන් පිළිබඳ තොරතුරු ක්‍රමවත් වගාව යටතේ සහ විසිරි වගාව යටතේ එක්රැස් කරන ලදී.

### 7.1.1 දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත් වගාව යටතේ සුළු අපනයන බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

ක්‍රමවත් වගාව ලෙස හඳුන්වනු ලබන්නේ අක්කරයකට නියමිත ගස්/ වැල්/ පැළ ගණන ක්‍රමානුකූලව වගාකොට පවත්වාගෙන යනු ලබන වගාවන්ටය. ඒ අනුව ක්‍රමවත් වගාව යටතේ ඉහත සඳහන් කරන ලද අපනයන කෘෂිකර්ම බෝග වගාව පිළිබඳව මෙහිදී විමසා බලයි.

දිස්ත්‍රික්ක මට්ටමින් සලකා බැලීමේ දී ක්‍රමවත්ව වගා කරන ලද ගම්මිරිස් වගාව සහිත වතු 553 ක් වාර්තා වී ඇති අතර ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය අක්කර 3,114 වේ. එම බිම් ප්‍රමාණයෙන් අක්කර 2,259 ක් ඵල දරණ බිම් වන අතර අක්කර 855 ක් ඵල නොදරණ පැල සහිත බිම් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව වතු ආශ්‍රිතව ක්‍රමවත්ව ගම්මිරිස් වගා කර ඇති බිම් ප්‍රමාණයෙන් 72.54% ක් ඵල දරණ බිම් වේ. ක්‍රමවත්ව ගම්මිරිස් වගා කර ඇති වතු වැඩිම සංඛ්‍යාව (147) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය සමස්ත ගම්මිරිස් වගා සහිත වතු ගණනින් 27% ක් වේ. ගම්මිරිස් වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 1,132) වාර්තා වන්නේ මාතලේ දිස්ත්‍රික්කයෙන් වන අතර එය ක්‍රමවත් ව වගා කරන ලද ගම්මිරිස් වගාව සහිත වතු බිම් ප්‍රමාණයෙන් 36% ක් වේ. මාතලේ දිස්ත්‍රික්කයේ ගම්මිරිස් වගා කර ඇති බිම් ප්‍රමාණයෙන් අක්කර 944 ක් ඵල දරණ බිම් වන අතර අක්කර 188 ඵල නොදරණ පැල සහිත බිම් වේ. ගම්මිරිස් වගාව සහිත අඩුම වතු සංඛ්‍යාව සහ අඩුම බිම් ප්‍රමාණය අනුරාධපුරය හා අම්පාර යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. ඒ වතු එකක් සහ බිම් ප්‍රමාණය අක්කර 1 ක් වශයෙනි.

වතු ආශ්‍රිත තොරතුරු වලට අනුව කෝපි වගාකර ඇති වතු සංඛ්‍යාව 103 ක් ලෙස වාර්තා වන අතර බිම් ප්‍රමාණය අක්කර 712 කි. එම බිම් ප්‍රමාණයෙන් අක්කර 557 ක් ඵල දරණ වගාවන් සහිත බිම් හා අක්කර 155 ඵල නොදරණ පැල සහිත බිම් ලෙස වාර්තා වී ඇත. කෝපි වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (20) මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කෝපි වගාව සහිත මුළු වතු සංඛ්‍යාවෙන් 19.4% කි. වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 215) නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය සමස්ත කෝපි වගා සහිත බිම් ප්‍රමාණයෙන් 30% ක් වේ. එම බිම් ප්‍රමාණයෙන් අක්කර 209 ක් ඵල දරණ කෝපි වගාව සහිත හා අක්කර 6 ක් ඵල නොදරණ පැල සහිත කෝපි වගාවෙන් යුක්ත

වේ. කෝපි වගාකර ඇති අඩුම වතු සංඛ්‍යාව (01) ගාල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 01) වාර්තා වන්නේ මොණරාගල දිස්ත්‍රික්කයෙනි.

කුරුඳු වගාව සලකා බැලීමේ දී කුරුඳු වගා කර ඇති වතු සංඛ්‍යාව 846 ක් ලෙස හා බිම් ප්‍රමාණය අක්කර 8,220 ක් ලෙස වාර්තා වී ඇත. එම බිම් ප්‍රමාණයෙන් 78% ක් එනම් අක්කර 6,384 ක මේරූ මට්ටමේ කුරුඳු වගාවෙන් යුක්ත වන අතර අක්කර 1,836 ක එනම් මුළු කුරුඳු වගා බිම් ප්‍රමාණයෙන් 22% ක පැල සහිත කුරුඳු වගාවෙන් යුක්තය. වැඩිම කුරුඳු වතු සංඛ්‍යාවක් (164) ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය මුළු කුරුඳු වතු සංඛ්‍යාවෙන් 19% ක් වේ. අඩුම වතු සංඛ්‍යාව (01) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. කුරුඳු වගා සහිත වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 1,959) වාර්තා වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර එය සමස්ත වතු ආශ්‍රිත කුරුඳු වගා බිම් ප්‍රමාණයෙන් 24% කි. එම බිම් ප්‍රමාණයෙන් අක්කර 1,640 ක මේරූ කුරුඳු වගාව දක්නට ලැබෙන අතර අක්කර 319 ක පැල මට්ටමේ කුරුඳු වගාව දක්නට ලැබේ. අඩුම කුරුඳු වතු සංඛ්‍යාව (01) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 15) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

කොකෝවා වගාකර ඇති වතු දිස්ත්‍රික්ක 07 ක පමණක් ව්‍යාප්ත වී ඇති අතර එම දිස්ත්‍රික්ක හත තුළ වතු 64 ක අක්කර 1,358 ක කොකෝවා වගාකර ඇති බව වාර්තා වේ. එම බිම් ප්‍රමාණයෙන් 93% ක් වූ අක්කර 1,263 ක ඵල දරණ කොකෝවා වගාව ද අක්කර 95 ක් එනම් 7% ඵල නොදරණ පැල සහිත වගාව ද දක්නට ලැබේ. කොකෝවා වගාව සහිත වැඩිම වතු ප්‍රමාණයක් (32) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය සමස්ථ වතු සංඛ්‍යාවෙන් 50% ප්‍රතිශතයක් ගනී. වගා කර ඇති බිම් ප්‍රමාණය අනුව ද ඉහළම වගා බිම් ප්‍රමාණය එනම් අක්කර 971 වාර්තා වන්නේ ද මාතලේ දිස්ත්‍රික්කයෙනි. එම බිම් ප්‍රමාණයෙන් අක්කර 929 ක් ඵල දරණ කොකෝවා වගා සහිත වන අතර අක්කර 42 ක් ඵල නොදරණ පැළ වගාවන් වේ. වතු අංශය යටතේ කොකෝවා වගාකර ඇති අඩුම වතු සංඛ්‍යාව (03) ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එම වතු 03 හි ඇති අක්කර 04 බිම් ප්‍රමාණය කොකෝවා වගාකර ඇති අඩුම බිම් ප්‍රමාණය ලෙස ද වාර්තා වේ.

වතු ආශ්‍රිත තොරතුරු වලට අනුව කරදමුංගු ක්‍රමවත් වගාව යටතේ වතු 56 ක වගාකර ඇති බවත් වගා බිම් ප්‍රමාණය අක්කර 2,330 ක් ලෙසත් වාර්තා වී ඇත. එම වගා බිම් ප්‍රමාණයෙන් 93% වූ අක්කර 2,159 ක බිම් ප්‍රමාණයක ඵල දරණ කරදමුංගු වගාවෙන් යුක්ත වන අතර අක්කර 171 ක එනම් මුළු කරදමුංගු වගාබිම් ප්‍රමාණයෙන් 7% ප්‍රතිශතය ඵල නොදරණ වගාවෙන් යුක්ත වේ. කරදමුංගු වගාකර ඇති වතු වැඩිම සංඛ්‍යාවක් (15) මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර කරදමුංගු වගාකර ඇති අඩුම වතු සංඛ්‍යාව (02) මාතර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. කරදමුංගු වගාව සහිත වතු වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 858) මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. එය මුළු කරදමුංගු වගාකර ඇති බිම් ප්‍රමාණයෙන් 37% ක් වේ. එම අක්කර 858 තුළ අක්කර 816 ක් ඵල දරණ වගාවෙන් ද අක්කර 42 ක් ඵල නොදරණ පැල සහිත වගාවෙන් ද යුක්ත වේ. කරදමුංගු වගාකර ඇති අඩුම බිම් ප්‍රමාණය (අක්කර 04) මොණරාගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එහි අක්කර 02 ක් ඵලදාව ලබා ගන්නා හා අක්කර 02 ක් තවමත් ඵලදාව නොගන්නා කරදමුංගු වගාවෙන් යුක්ත වේ.

ක්‍රමවත් ව වගා කරන ලද කරාබු වගාව සහිත වතු 47 ක් දිවයිනේ දිස්ත්‍රික්ක 11 ක ඇති අතර එම වතු වල බිම් ප්‍රමාණය අක්කර 250 ලෙස වාර්තා වේ. එම බිම් ප්‍රමාණයෙන් 95% ක් වූ අක්කර 237 ක් ඵල දරණ වගාව සහිත කරාබු වතු ලෙස පෙන්වා දිය හැකිය. කරාබු වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව (12) මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර කරාබු වගාව සහිත වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 98) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. එම සමස්ත බිම් ප්‍රමාණයම ඵලදාව ලබා ගන්නා වගාවන් වේ. ගම්පහ, ගාල්ල, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වල කරාබු වගා සහිත අඩුම වතු සංඛ්‍යාව (01) වාර්තා වේ. එමෙන්ම එම දිස්ත්‍රික්ක 04 අතරින් ගාල්ල හා බදුල්ල යන දිස්ත්‍රික්ක 02 හි අඩුම බිම්

ප්‍රමාණය (අක්කර 01) වාර්තා වන අතර ගාල්ල දිස්ත්‍රික්කයෙහි අක්කර 01 ක බිම් ප්‍රමාණය ඵල දරණ වගාවකින් ද, බදුල්ල දිස්ත්‍රික්කයෙ හි අක්කර 01 ක බිම් ප්‍රමාණය ඵල නොදරණ වගාවකින් ද යුක්ත වේ.

අපනයන කෘෂිකර්ම බෝග යටතේ සාදික්කා වගාකර ඇති වතු සැලකා බැලිමේ දී, දිස්ත්‍රික්ක 07 ක වතු 18 ක සාදික්කා වගාව ව්‍යාප්ත වී ඇති බව සංගණන තොරතුරු අනුව පැහැදිලි වේ. එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 65 ක් වන අතර ඉන් අක්කර 22 ක බිම් ප්‍රමාණයක් ඵල දරණ වගාවෙන් ද අක්කර 43 ක බිම් ප්‍රමාණයක් ඵල නොදරණ වගාවෙන් ද යුක්ත වේ. ක්‍රමවත්ව වගා කරන ලද සාදික්කා වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (07) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය මුළු සාදික්කා වගාව සහිත වතු සංඛ්‍යාවෙන් 39% ක ප්‍රතිශතයකි. අඩුම වතු සංඛ්‍යාව (වතු 01) ගම්පහ, කළුතර හා මාතර යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. සාදික්කා වගාව සහිත වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 42) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය මුළු සාදික්කා බිම් ප්‍රමාණයෙන් 65% කි. අඩුම බිම් ප්‍රමාණය (අක්කර 01) ගම්පහ හා මාතර යන දිස්ත්‍රික්ක දෙකෙන් වාර්තා වන අතර එම දිස්ත්‍රික්ක දෙකෙන් ම වාර්තා වන බිම් ප්‍රමාණ ඵල නොදරණ පැල සහිත වගාවන්ගෙන් සමන්විත වේ.

ක්‍රමවත් ලෙස වගා කරන ලද බුලත් වගාව සහිත වතු ගම්පහ, අම්පාර, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්ක 04 හි පමණක් වාර්තා වන අතර වතු සංඛ්‍යාව 41 ක් හා බිම් ප්‍රමාණය අක්කර 104 ක් ලෙස වාර්තා වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ බුලත් වගාව ඇති වැඩිම වතු සංඛ්‍යාව (31) වාර්තා වන අතර බුලත් වගාව සහිත වැඩිම බිම් ප්‍රමාණය ද (අක්කර 83) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. අඩුම බුලත් වතු සංඛ්‍යාව (01) පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 05) අම්පාර හා පුත්තලම දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ.

ආර්ථික සංගණනය හි තොරතුරු වලට අනුව පුවක් වගාව සහිත වතු 59 ක් වාර්තා වී ඇති අතර බිම් ප්‍රමාණය අක්කර 208 ක් වාර්තා වී ඇත. ඉන් අක්කර 115 ක් ඵල දරණ වගාවන් වන අතර අක්කර 93 ක් ඵල නොදරණ පැල සහිත වගාවන් වේ. ඒ අනුව වතු ආශ්‍රිතව ක්‍රමවත්ව වගා කරන ලද පුවක් වගා බිම් ප්‍රමාණයෙන් 55% ක ප්‍රමාණයක් ඵල දරණ බිම් ලෙස වාර්තා වී ඇත. පුවක් වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාවක් (15) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය මුළු වතු සංඛ්‍යාවෙන් 25% ක් වේ. නමුත් පුවක් වගාව සහිත වතු වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 51) වාර්තා වන්නේ මාතලේ දිස්ත්‍රික්කයෙනි. එම බිම් ප්‍රමාණය ඵල දරණ වගාව අක්කර 29 කින් හා ඵල නොදරණ පැල සහිත වගාව අක්කර 22 කින් යුක්ත වේ. කොළඹ, ගාල්ල, මාතර, හම්බන්තොට, වව්නියාව, පුත්තලම, බදුල්ල, මොණරාගල යන දිස්ත්‍රික්ක 08 හි වතු 01 බැගින් පුවක් වගාව සහිත අඩුම වතු සංඛ්‍යාව වාර්තා වන අතර කොළඹ, ගාල්ල, වවුනියාව, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වල අක්කර 01 බැගින් පුවක් වගාව සහිත අඩුම බිම් ප්‍රමාණය වාර්තා වී ඇත.

## වගු අංක 7.1.1

### දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද සුළු අපනයන බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | ගම්මිරිස් | | | | කෝපි | | | | කුරුඳු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | 10 | 30 | 2 | 32 | - | - | - | - | 13 | 9 | 34 | 43 |
| ගම්පහ | 72 | 147 | 27 | 174 | 9 | 7 | 2 | 9 | 41 | 172 | 37 | 209 |
| කළුතර | 16 | 13 | 7 | 20 | - | - | - | - | 101 | 726 | 76 | 802 |
| මහනුවර | 42 | 233 | 95 | 328 | 20 | 80 | 49 | 129 | 22 | 105 | 29 | 134 |
| මාතලේ | 91 | 944 | 188 | 1,132 | 19 | 102 | 14 | 116 | 44 | 98 | 164 | 262 |
| නුවරඑළිය | 6 | 6 | 3 | 9 | 17 | 209 | 6 | 215 | 9 | 77 | 8 | 85 |
| ගාල්ල | 9 | 11 | 6 | 17 | - | - | - | - | 164 | 1,640 | 319 | 1,959 |
| මාතර | 14 | 21 | 6 | 27 | 1 | - | 5 | 5 | 135 | 1,451 | 471 | 1,922 |
| හම්බන්තොට | 10 | 35 | 17 | 52 | - | - | - | - | 13 | 32 | 4 | 36 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | 1 | - | 1 | 1 | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 147 | 350 | 103 | 453 | 19 | 25 | 33 | 58 | 58 | 61 | 74 | 135 |
| පුත්තලම | 12 | 29 | 12 | 41 | - | - | - | - | 7 | 6 | 10 | 16 |
| අනුරාධපුරය | 1 | - | 1 | 1 | - | - | - | - | 1 | 10 | 5 | 15 |
| පොළොන්නරුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බදුල්ල | 28 | 130 | 211 | 341 | 8 | 74 | 17 | 91 | 28 | 237 | 129 | 366 |
| මොණරාගල | 9 | 47 | 11 | 58 | 1 | 1 | - | 1 | 4 | 61 | 8 | 69 |
| රත්නපුරය | 45 | 150 | 148 | 298 | 2 | 20 | 25 | 45 | 156 | 1,487 | 287 | 1,774 |
| කෑගල්ල | 40 | 113 | 17 | 130 | 7 | 39 | 4 | 43 | 50 | 212 | 181 | 393 |
| ශ්‍රී ලංකාව | 553 | 2,259 | 855 | 3,114 | 103 | 557 | 155 | 712 | 846 | 6,384 | 1,836 | 8,220 |

### වගු අංක 7.1.1

### දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද සුළු අපනයන බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | කොකෝවා | | | | කරදමුංගු | | | | කරාබු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගම්පහ | 3 | 4 | - | 4 | - | - | - | - | 1 | - | 2 | 2 |
| කළුතර | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මහනුවර | 8 | 57 | 2 | 59 | 15 | 816 | 42 | 858 | 12 | 32 | 8 | 40 |
| මාතලේ | 32 | 929 | 42 | 971 | 8 | 315 | 107 | 422 | 6 | 98 | - | 98 |
| නුවරඑළිය | - | - | - | - | 13 | 294 | 20 | 314 | 3 | 6 | - | 6 |
| ගාල්ල | - | - | - | - | - | - | - | - | 1 | 1 | - | 1 |
| මාතර | - | - | - | - | 2 | 76 | - | 76 | 3 | 2 | - | 2 |
| හම්බන්තොට | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 9 | 112 | 26 | 138 | - | - | - | - | 5 | 6 | 1 | 7 |
| පුත්තලම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අනුරාධපුරය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පොළොන්නරුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බදුල්ල | 4 | 35 | 10 | 45 | - | - | - | - | 1 | - | 1 | 1 |
| මොණරාගල | 4 | 77 | 13 | 90 | 4 | 2 | 2 | 4 | 1 | 2 | - | 2 |
| රත්නපුරය | - | - | - | - | 8 | 312 | - | 312 | 4 | 18 | 1 | 19 |
| කෑගල්ල | 4 | 49 | 2 | 51 | 6 | 344 | - | 344 | 10 | 72 | - | 72 |
| ශ්‍රී ලංකාව | 64 | 1,263 | 95 | 1,358 | 56 | 2,159 | 171 | 2,330 | 47 | 237 | 13 | 250 |

## වගු අංක 7.1.1

### දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද සුළු අපනයන බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | සාදික්කා | | | | බුලත් | | | | පුවක් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | - | - | - | - | - | - | - | - | 1 | 1 | - | 1 |
| ගම්පහ | 1 | - | 1 | 1 | 7 | 11 | - | 11 | 9 | 21 | 29 | 50 |
| කළුතර | 1 | 2 | - | 2 | - | - | - | - | 2 | 4 | - | 4 |
| මහනුවර | 3 | 4 | 6 | 10 | - | - | - | - | 4 | 1 | 4 | 5 |
| මාතලේ | 7 | 9 | 33 | 42 | - | - | - | - | 7 | 29 | 22 | 51 |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | 3 | 28 | 16 | 44 |
| ගාල්ල | - | - | - | - | - | - | - | - | 1 | - | 1 | 1 |
| මාතර | 1 | - | 1 | 1 | - | - | - | - | 1 | 1 | 1 | 2 |
| හම්බන්තොට | - | - | - | - | - | - | - | - | 1 | 8 | - | 8 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | 1 | - | 1 | 1 |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | 2 | 5 | - | 5 | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 2 | 5 | - | 5 | 31 | 78 | 5 | 83 | 15 | 9 | 13 | 22 |
| පුත්තලම | - | - | - | - | 1 | 5 | - | 5 | - | - | - | - |
| අනුරාධපුරය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පොළොන්නරුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බදුල්ල | - | - | - | - | - | - | - | - | 1 | - | 1 | 1 |
| මොණරාගල | - | - | - | - | - | - | - | - | 1 | - | 1 | 1 |
| රත්නපුරය | - | - | - | - | - | - | - | - | 3 | 5 | - | 5 |
| කෑගල්ල | 3 | 2 | 2 | 4 | - | - | - | - | 9 | 8 | 4 | 12 |
| ශ්‍රී ලංකාව | 18 | 22 | 43 | 65 | 41 | 99 | 5 | 104 | 59 | 115 | 93 | 208 |

### 7.1.2 දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව යටතේ සුළු අපනයන බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

විසිරි වගාව ලෙස හඳුන්වනු ලබන්නේ බිම් ප්‍රමාණය තුළ ගස්/ වැල්/ පැළ අක්‍රමවත් ලෙස වගාකොට පවත්වාගෙන යනු ලබන වගාවන්ටය. ඒ අනුව විසිරි වගාව යටතේ ඉහත සඳහන් කරන ලද අපනයන කෘෂිකර්ම බෝග වගාව පිළිබඳව මෙහිදී විමසා බලයි.

දිස්ත්‍රික් මට්ටමේ තොරතුරු සලකා බැලීමේ දී විසිරි වගාව යටතේ ඇති ගම්මිරිස් වගාව සහිත වතු 2,976 ක් වාර්තා වන එම වතු වල ඇති මුළු වැල් සංඛ්‍යාව 4,160 කි. එම වැල් සංඛ්‍යාවෙන් 2,868 ක් එල දරණ වැල් හා 1,292 ක් එල නොදරණ වැල් වේ. ඒ අනුව විසිරි වගාව යටතේ ඇති වැල් සංඛ්‍යාවෙන් 69% ක් එල දරණ වගාව වේ. විසිරි වගාව යටතේ වැඩිම ගම්මිරිස් වගාව සහිත වතු සංඛ්‍යාව (730) මෙන්ම වැඩිම විසිරි වැල් ගණන (876) ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 24.52% වන අතර වැඩිම වැල් ගණන මුළු වැල් ගණනින් 21% ක ප්‍රතිශතයක් ගනී. අඩුම වතු ගණන (02) හා අඩුම වැල් ගණන (02) ද එලදාව සහිත වැල් 02 ක් ලෙස කිළිනොච්චි දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව විසිරි වගාව යටතේ ඇති කෝපි වතු 1,014 ක ඇති අතර කෝපි ගස් 577,827 ක් බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත. එම ගස් සංඛ්‍යාව ගස් 468,548 ක් එල දරණ හා ගස් 109,279 ක් එල නොදරණ වගාව ලෙස පෙන්වා දිය හැකිය. එය ප්‍රතිශත වශයෙන් පිළිවෙලින් 81% ක් හා 19% ක් වේ. විසිරි වගාව යටතේ වැඩිම කෝපි වගාව සහිත වතු සංඛ්‍යාව (244) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු වතු සංඛ්‍යාවෙන් 24% කි. වැඩිම කෝපි ගස් ගණන (160,975) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය එල දරණ ගස් 147,527 කින් හා එල නොදරණ ගස් 13,448 කින් යුක්ත වේ. වැඩම ගස් ගණන මුළු ගස් ගණනින් 28% ප්‍රතිශතයක් ගනී. වව්නියාව, කිළිනොච්චිය හා අම්පාර යන දිස්ත්‍රික්කයන් හි කෝපි වගාව සහිත වතු 01 ක බැගින් අඩුම වතු ගණන වාර්තා වන අතර වව්නියාව දිස්ත්‍රික්කයෙන් අඩුම කෝපි ගස් සංඛ්‍යාව (01) වාර්තා වේ.

විසිරි වගාව ලෙස වතු 352 ක කුරුඳු වගාව ව්‍යාප්ත ව ඇති අතර ඒ යටතේ එල දරණ ගස් 935,013 ක් හා එල නොදරණ ගස් 374,174ක් ලෙස, සමස්ත කුරුඳු ගස් ගණන 1,309,187 ක් වේ. ඒ අනුව 71.42% ක් හා 28.58% ක් ලෙස පිළිවෙළින් එල දරණ වගාව හා එල නොදරණ වගාව මුළු ගස් ගණනින් ප්‍රතිශත ලෙස දැක්විය හැකිය. විසිරි වගාව යටතේ මාතර දිස්ත්‍රික්කයේ වැඩිම කුරුඳු වගාව සහිත වතු සංඛ්‍යාව (60) වාර්තා වන විට අඩුම වතු සංඛ්‍යාව (01) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. විසිරි වගාව යටතේ වැඩිම කුරුඳු වතු සංඛ්‍යාව මුළු වතු ගණනින් 17% කි. වැඩිම ගස් ගණන 384,450 ක් ලෙසට ගාල්ල දිස්ත්‍රික්කයෙන් තොරතුරු ලැබී ඇති අතර එය මුළු ගස් ගණනින් 29% ක ප්‍රතිශතයක් ගනී. අඩුම වතු ගණන (01) මෙන්ම අඩුම ගස් ගණන (06) ද අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

වතු 125 ක විසිරි වගාව ලෙස ඇති කොකෝවා වගාව ඇති බව සංගණන වාර්තා පෙන්වා දෙන අතර ඒ යටතේ මුළු ගස් ගණන 183,893 කි. එල දරණ ගස් 142,838 ක්, මුළු ගස් ගණනින් 77.67% ක් හා එල නොදරණ ගස් 41,055 ක්, මුළු ගස් ගණනින් 22.33% ක් ලෙස එය පෙන්වා දිය හැකිය. විසිරි වගාව සහිත කොකෝවා වැඩිම වතු සංඛ්‍යාව (27) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන විට හම්බන්තොට, අනුරාධපුරය හා රත්නපුරය යන දිස්ත්‍රික්ක 03 හි වතු 01 බැගින් අඩුම වතු සංඛ්‍යාව වාර්තා වී ඇත. වැඩිම ගස් සංඛ්‍යාව (123,699) මාතලේ දිස්ත්‍රික්කයෙන් හා අඩුම ගස් ගණන (03) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. වැඩිම ගස් සංඛ්‍යාව එල දරණ ගස් 103,669 හා එල

නොදරණ ගස් 20,030 ලෙස වේ. වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 23.6% ප්‍රතිශතයක් ගන්නා අතර වැඩිම ගස් ගණන මුළු ගස් ගණනින් 67.3% කි.

සංගණනයෙ හි වතු ආශ්‍රිත තොරතුරු වලට අනුව විසිරි වගාව යටතේ ඇති කරදමුංගු වගාව ඵල දරණ කරදමුංගු ගස් 9,830 ක් හා තවමත් ඵල නොදරණ පැළ 4,450 ක් ලෙස මුළු ගස් 14,280 ක් වතු 35 ක ව්‍යාප්තව ඇත. එයින් ඵලදාව ලබා දෙන ගස් ගණන මුළු ගස් සංඛ්‍යාවෙන් 68.83% ක ප්‍රතිශතයක් ගනී. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වැඩිම වතු සංඛ්‍යාව 07 ක් ලෙස ද වැඩිම ගස් සංඛ්‍යාව 7,532 ක් ලෙස මහනුවර දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වී ඇත. මේවා මුළු වතු ගණනින් 20% ක් හා මුළු ගස් ගණනින් 52.74% ලෙස පෙන්වා දිය හැකිය. පුත්තලම දිස්ත්‍රික්කයෙන් වතු 01 ක් ලෙස අඩුම කරදමුංගු වගාව සහිත වතු සංඛ්‍යාව ද එම දිස්ත්‍රික්කයේ ම ඵල දරණ ගස් 03 ක් ලෙස අඩුම ගස් සංඛ්‍යාව ද වාර්තා වී ඇත.

කරාබු වගාව සලකා බැලීමේ දී විසිරි වගාව සහිත වතු 411 ක් වන අතර එම වතු වල ගස් 35,853 ක් වාර්තා වී ඇත. එම ගස් ගණනින් 89% ක් වූ, ගස් 31,971 ඵල දරණ ගස් වන විට 11% ක් වූ, ගස් 3,882 ක් ඵල නොදරණ පැල සහිත වගාව වේ. කරාබු වගා කර ඇති වතු වැඩිම සංඛ්‍යාව (107) මහනුවර දිස්ත්‍රික්කයෙන් ද, අඩුම වතු සංඛ්‍යාව (02) පුත්තලම දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වන අතර වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 26% ක ප්‍රතිශතයක් ලෙස දැක්විය හැකිය. මහනුවර දිස්ත්‍රික්කයෙන් ම වැඩිම කරාබු ගස් සංඛ්‍යාව (15,042) වාර්තා වන අතර අඩුම කරබු ගස් සංඛ්‍යාව (34) පුත්තලම දිස්ත්‍රික්කයෙ හි ඇති බවට සංගණන තොරතුරු පෙන්වා දෙයි. වැඩිම ගස් සංඛ්‍යාව මුළු ගස් සංඛ්‍යාවෙන් 42% ක ප්‍රතිශතයකි.

සුළු අපනයන බෝග යටතේ විසිරි වගාව අනුව සාදික්කා වගාව විසිරි වගාව දිස්ත්‍රික්ක 12 ක, වතු 110 ක ව්‍යාප්ත වී ඇති බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත. එහි මුළු ගස් ගණන 6,374 වන අතර ඉන් 32% ක් වූ අඩු ගස් ගණන (2,059) ඵලදාව සහිත වගාව ද ගස් 4,315 ක් එනම් 68% ක් ඵල නොදරණ වගාව ද ලෙස දැක්විය හැකිය. විසිරි වගා සහිත සාදික්කා වතු වැඩිම සංඛ්‍යාවක් (43) මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන විට වැඩිම ගස් සංඛ්‍යාව (4,803) මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. ඒවා මුළු වතු සංඛ්‍යාවෙන් 39% ක් හා මුළු ගස් ගණනින් 75% ක් ලෙස පෙන්වා දිය හැකිය. කළුතර, හම්බන්තොට හා බදුල්ල යන දිස්ත්‍රික්ක 03 හි වතු වතු අඩුම ගණන (01) ද ගාල්ල දිස්ත්‍රික්කයෙ හි අඩුම ගස් ගණන (05) ද වාර්තා වේ .

විසිරි වගාව යටතේ සළකා බලන විට බුලත් වගාව සහිත වතු 112 ක් වාර්තා වන අතර එම වතු ආශ්‍රිතව බුලත් වැල් 40,576 ක් ඇති බව වාර්තා වී ඇත. විසිරි බුලත් වගාව වැඩිම වතු ගණන ද (42) වැඩිම වැල් ගණන ද (26,176) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වන අතර ඒවා පිළිවෙලින් 37.5% හා 64.5% ලෙස සමස්ත වතු සංඛ්‍යාවෙන් හා මුළු වැල් ගණනින් ප්‍රතිශත ලෙස පෙන්වා දිය හැකිය. වතු ආශ්‍රිත බුලත් වගාව අඩුම වතු ගණන (01) මොණරාගල හා අඩුම වැල් ගණන වැල් 04 ක් ලෙස ගාල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

දිවයිනේ විසිරි පුවක් වගාව සහිත වතු 811 ක් වාර්තා වී ඇත.එම වතු ආශ්‍රිතව පුවක් ගස් 242,684 ක් ඇති බව ද වාර්තා පෙන්වා දෙන අතර එය ඵලදාව සහිත ගස් 128,735 කින් හා ඵලදාව රහිත ගස් 113,949 කින් එය සමන්විතය. පුවක් වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (170) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන විට එය සමස්ත වතු ගණනින් 21% ක් ද වැඩිම ගස් ගණන (62,198) මහනුවර දිස්ත්‍රික්කයෙන් ද එය මුළු ගස් ගණනින් 25.62% ක් ද වන බව පෙන්වා දිය හැකිය. අඩුම වතු ගණන (01) මෙන් ම අඩුම ගස් ගණන (03) ද අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

## වගු අංක 7.1.2

## දිස්ත්‍රික්ක මට්ටමින් සුළු අපනයන බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන (විසිරි වගාව)

| දිස්ත්‍රික්කය | ගම්මිරිස් | | | | කෝපි | | | | කුරුඳු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 103 | 73 | 36 | 109 | 25 | 1,815 | 1,105 | 2,920 | 12 | 56,012 | 21,600 | 77,612 |
| ගම්පහ | 403 | 367 | 132 | 499 | 113 | 27,114 | 6,992 | 34,106 | 35 | 8,499 | 899 | 9,398 |
| කළුතර | 114 | 84 | 32 | 116 | 29 | 2,226 | 3,072 | 5,298 | 30 | 79,355 | 6,160 | 85,515 |
| මහනුවර | 216 | 431 | 190 | 621 | 131 | 123,611 | 16,988 | 140,599 | 20 | 2,072 | 28,102 | 30,174 |
| මාතලේ | 223 | 291 | 134 | 425 | 78 | 147,527 | 13,448 | 160,975 | 22 | 25,507 | 23,790 | 49,297 |
| නුවරඑළිය | 68 | 54 | 24 | 78 | 12 | 1,048 | 975 | 2,023 | 4 | 1,576 | 11,050 | 12,626 |
| ගාල්ල | 141 | 110 | 49 | 159 | 46 | 5,455 | 6,250 | 11,705 | 44 | 257,680 | 126,770 | 384,450 |
| මාතර | 195 | 265 | 102 | 367 | 99 | 52,608 | 14,107 | 66,715 | 60 | 322,392 | 30,832 | 353,224 |
| හම්බන්තොට | 34 | 25 | 16 | 41 | 9 | 421 | 1,142 | 1,563 | 5 | 25,246 | 15,300 | 40,546 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 9 | 8 | 5 | 13 | 1 | 1 | - | 1 | - | - | - | - |
| මුලතිව් | 3 | - | 3 | 3 | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | 2 | 2 | - | 2 | 1 | 100 | - | 100 | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | 3 | 2 | - | 2 | 1 | 6 | - | 6 | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 730 | 574 | 302 | 876 | 244 | 53,592 | 19,118 | 72,710 | 41 | 18,231 | 69,729 | 87,960 |
| පුත්තලම | 93 | 69 | 31 | 100 | 33 | 4,373 | 2,016 | 6,389 | 11 | 4,266 | 746 | 5,012 |
| අනුරාධපුරය | 17 | 7 | 12 | 19 | 2 | 28 | 15 | 43 | 1 | 6 | - | 6 |
| පොළොන්නරුව | 16 | 14 | 7 | 21 | 5 | 257 | 42 | 299 | 2 | 51 | - | 51 |
| බදුල්ල | 80 | 57 | 36 | 93 | 23 | 21,715 | 17,732 | 39,447 | 5 | 480 | 635 | 1,115 |
| මොණරාගල | 28 | 20 | 10 | 30 | 9 | 2,414 | 325 | 2,739 | 4 | 1,404 | 51 | 1,455 |
| රත්නපුරය | 268 | 223 | 102 | 325 | 91 | 13,982 | 1,920 | 15,902 | 32 | 63,245 | 9,890 | 73,135 |
| කෑගල්ල | 230 | 192 | 69 | 261 | 62 | 10,255 | 4,032 | 14,287 | 24 | 68,991 | 28,620 | 97,611 |
| ශ්‍රී ලංකාව | 2,976 | 2,868 | 1,292 | 4,160 | 1,014 | 468,548 | 109,279 | 577,827 | 352 | 935,013 | 374,174 | 1,309,187 |

## වගු අංක 7.1.2

### දිස්ත්‍රික්ක මට්ටමින් සුළු අපනයන බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන (විසිරි වගාව)

| දිස්ත්‍රික්කය | කොකෝවා | | | | කරදමුංගු | | | | කරාබු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 3 | 6 | 11 | 17 | 3 | 11 | 10 | 21 | 8 | 48 | 15 | 63 |
| ගම්පහ | 17 | 952 | 1 | 953 | 5 | 84 | 1 | 85 | 35 | 327 | 198 | 525 |
| කළුතර | 4 | 651 | 50 | 701 | 2 | 9 | - | 9 | 9 | 59 | 48 | 107 |
| මහනුවර | 21 | 10,165 | 7,816 | 17,981 | 4 | 6,206 | 1,326 | 7,532 | 107 | 13,987 | 1,055 | 15,042 |
| මාතලේ | 27 | 103,669 | 20,030 | 123,699 | 3 | 1,420 | 300 | 1,720 | 52 | 11,473 | 1,329 | 12,802 |
| නුවරඑළිය | - | - | - | - | 7 | 1,830 | 2,130 | 3,960 | 14 | 590 | 618 | 1,208 |
| ගාල්ල | - | - | - | - | - | - | - | - | 6 | 87 | 2 | 89 |
| මාතර | 9 | 5,059 | 5,009 | 10,068 | - | - | - | - | 50 | 1,418 | 52 | 1,470 |
| හම්බන්තොට | 1 | - | 25 | 25 | - | - | - | - | 3 | 3 | 32 | 35 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 25 | 17,536 | 4,547 | 22,083 | 3 | 50 | 2 | 52 | 39 | 1,430 | 230 | 1,660 |
| පුත්තලම | 2 | 20 | 15 | 35 | 1 | 3 | - | 3 | 2 | 27 | 7 | 34 |
| අනුරාධපුරය | 1 | 3 | - | 3 | - | - | - | - | - | - | - | - |
| පොළොන්නරුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බදුල්ල | 5 | 1,606 | 3,050 | 4,656 | 2 | 82 | 380 | 462 | 8 | 282 | 130 | 412 |
| මොණරාගල | 6 | 3,158 | 501 | 3,659 | - | - | - | - | - | - | - | - |
| රත්නපුරය | 1 | 4 | - | 4 | 3 | 60 | 1 | 61 | 31 | 458 | 52 | 510 |
| කෑගල්ල | 3 | 9 | - | 9 | 2 | 75 | 300 | 375 | 47 | 1,782 | 114 | 1,896 |
| ශ්‍රී ලංකාව | 125 | 142,838 | 41,055 | 183,893 | 35 | 9,830 | 4,450 | 14,280 | 411 | 31,971 | 3,882 | 35,853 |

## වගු අංක 7.1.2

## දිස්ත්‍රික්ක මට්ටමින් සුළු අපනයන බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන (විසිරි වගාව)

| දිස්ත්‍රික්කය | සාදික්කා | | | | බුලත් | | | | පුවක් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/ පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/ පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 5 | 1 | 42 | 43 | 4 | 16 | 40 | 56 | 31 | 1,867 | 1,373 | 3,240 |
| ගම්පහ | 6 | 17 | - | 17 | 15 | 11,075 | 65 | 11,140 | 129 | 10,745 | 6,332 | 17,077 |
| කළුතර | 1 | - | 10 | 10 | 3 | 11 | - | 11 | 29 | 908 | 704 | 1,612 |
| මහනුවර | 43 | 316 | 416 | 732 | 3 | 14 | - | 14 | 87 | 26,027 | 36,171 | 62,198 |
| මාතලේ | 23 | 1,363 | 3,440 | 4,803 | 2 | 7 | 4 | 11 | 61 | 21,033 | 24,342 | 45,375 |
| නුවරඑළිය | 3 | 12 | 8 | 20 | - | - | - | - | 6 | 570 | 486 | 1,056 |
| ගාල්ල | 2 | 4 | 1 | 5 | 3 | 4 | - | 4 | 25 | 4,989 | 972 | 5,961 |
| මාතර | - | - | - | - | 8 | 322 | - | 322 | 68 | 4,036 | 1,963 | 5,999 |
| හම්බන්තොට | 1 | - | 15 | 15 | 4 | 11 | - | 11 | 7 | 136 | 2,120 | 2,256 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | 2 | 12 | 11 | 23 | 5 | 75 | 115 | 190 |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | 3 | - | 43 | 43 |
| කිලිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | 1 | 3 | - | 3 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 17 | 89 | 175 | 264 | 42 | 22,875 | 3,301 | 26,176 | 170 | 27,985 | 15,032 | 43,017 |
| පුත්තලම | - | - | - | - | 9 | 2,423 | 50 | 2,473 | 14 | 122 | 140 | 262 |
| අනුරාධපුරය | - | - | - | - | 2 | 1 | 50 | 51 | 8 | 30 | 1,398 | 1,428 |
| පොළොන්නරුව | - | - | - | - | 2 | 12 | - | 12 | 5 | 93 | 65 | 158 |
| බදුල්ල | 1 | - | 200 | 200 | 4 | 22 | 2 | 24 | 15 | 4,186 | 9,141 | 13,327 |
| මොණරාගල | - | - | - | - | 1 | 4 | - | 4 | 4 | 230 | 180 | 410 |
| රත්නපුරය | 3 | 212 | - | 212 | 4 | 12 | 100 | 112 | 85 | 13,223 | 4,094 | 17,317 |
| කෑගල්ල | 5 | 45 | 8 | 53 | 4 | 132 | - | 132 | 58 | 12,477 | 9,278 | 21,755 |
| ශ්‍රී ලංකාව | 110 | 2,059 | 4,315 | 6,374 | 112 | 36,953 | 3,623 | 40,576 | 811 | 128,735 | 113,949 | 242,684 |

## 7.2 පළතුරු බෝග වගාව පිළිබඳ තොරතුරු

ආර්ථික සංගණනයේ වතු ආශ්‍රිත තොරතුරු රැස්කිරීම අනුව පළතුරු බෝග වගාව පිළිබඳව ද තොරතුරු එක්රැස් කරන ලද අතර පළතුරු බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණයන් ඒක් එක් පළතුරු බෝගය යටතේ ගණන් ගන්නා ලදී. ප්‍රධාන වශයෙන්ම අඹ, කෙසෙල්, පැපොල්, අන්නාසි, රඹුටන්, දෙළුම්, අලිගැටපේර, කිලෝපේර, දූරියන්, දොඩම්, දෙහි, මැංගුස් හා මිදි යන පළතුරු බෝග වගාවන් පිළිබඳ තොරතුරු ක්‍රමවත් වගාව යටතේ සහ විසිරි වගාව යටතේ එක්රැස් කරන ලදී.

### 7.2.1 දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත් වගාව යටතේ පළතුරු බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

ආර්ථික සංගණනය 2013/14 කෘෂිකාර්මික තොරතුරු ගණන් ගැනීම යටතේ, වතු අංශයේ පළතුරු බෝග පිළිබඳ ව තොරතුරු එක් රැස් කරන ලද අතර පළතුරු බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ වගා කර ඇති බිම් ප්‍රමාණයන් එක් එක් පළතුරු බෝගය යටතේ ගණන් ගන්නා ලදී. ඒ අනුව ප්‍රධාන වශයෙන් අඹ, කෙසෙල්, පැපොල්, අන්නාසි, රඹුටන්, දෙළුම්, අලිගැටපේර, කිලෝපේර, දූරියන්, දොඩම්, දෙහි, මැංගුස් හා මිදි වගාවන් පිළිබඳ තොරතුරු ක්‍රමවත් වගාව යටතේ එක්රැස් කරන ලදී.

අඹ වගාව සහිත වතු පිළිබඳ සලකා බැලීමේ දී වතු 268 ක අක්කර 1,862 බිම් ප්‍රමාණයක අඹ වගා කර ඇති බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත. මෙයින් අක්කර 1,294 ක් එනම් මුළු බිම් ප්‍රමාණයෙන් 69.5% ඵලදාව සහිත වගාවන් වන අතර ඉතිරි අක්කර 568 ඵල නොදරණ පැළ සහිත වගාව වේ. අඹ වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව (77) මෙන්ම වැඩිම බිම් ප්‍රමාණය ද (අක්කර 295) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. මේවා මුළු වතු සංඛ්‍යාවෙන් 28.7% ක් හා මුළු බිම් ප්‍රමාණයෙන් 16% ක ප්‍රතිශතයන් ගනී.එමෙන්ම එම බිම් ප්‍රමාණය ඵලදාව සහිත අක්කර 274 ක් හා ඵල නොදරණ පැළ සහිත අක්කර 21 ලෙස ද පෙන්වා දිය හැකිය. මුලතිව් දිස්ත්‍රික්කයේ අක්කර 01 ක අඹ වගා කර ඇති බිම් ප්‍රමාණයක් සහිත එක් වත්තක් ඇති බව වාර්තා වී ඇති අතර එය අඩුම වතු ගණන මෙන්ම අඩුම බිම් ප්‍රමාණය ද වේ.

වතු 547 ක, අක්කර 3,252 ක බිම් ප්‍රමාණයක ක්‍රමවත් කෙසෙල් වගාව ව්‍යාප්තව ඇති අතර මෙම බිම් ප්‍රමාණයෙන් 84.65% වූ බිම් ප්‍රමාණයක (අක්කර 2,753) දැනට ඵල දරණ වගාවන් ලෙස වාර්තා වේ. කෙසෙල් වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව (181) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාර්තා වන නමුත් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 877) මොණරාගල දිස්ත්‍රික්කයේ ඇති බවට සංගණන තොරතුරු පෙන්වා දේ. වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 33% ක හා වැඩිම බිම් ප්‍රමාණය, මුළු බිම් ප්‍රමාණයෙන් 26.96% ක ප්‍රතිශතයන් ගනී. මුලතිව්, කිළිනොච්චි හා මඩකලපුව යන දිස්ත්‍රික්ක තුනෙ හි අඩුම වතු සංඛ්‍යාව (01) වාර්තා වී ඇති අතර ඉන් කිළිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්ක දෙකෙ හි අඩුම බිම් ප්‍රමාණය (අක්කර 02) වාර්තා වේ. යාපනය හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි පිහිටි වතුවල ක්‍රමවත්ව කෙසෙල් වගා කර නොමැති වීමද කැපී පෙනෙන ලක්ෂණයකි.

සංගණන තොරතුරු වලට අනුව පැපොල් වගාව සහිත වතු 126 ක් ද ඒ යටතේ පැපොල් වගාව සහිත බිම් ප්‍රමාණය අක්කර 265 ක් ද වේ. මෙයින් 72.45% වූ අක්කර 192 ක ඵල දරණ වගාව ද 27.55% වූ අක්කර 73 ක තවමත් ඵල නොදරණ වගාව ඇති බව ද සංගණන තොරතුරු පෙන්වා දෙයි. වතු 45 ක් වූ, මුළු වතු සංඛ්‍යාවෙන් 35.7% ක ප්‍රතිශතය හා අක්කර 95 ක් වූ මුළු බිම් ප්‍රමාණයෙන් 35.8% ක ප්‍රතිශතය, වැඩිම වතු ගණන හා වැඩිම බිම් ප්‍රමාණය ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. කළුතර, අම්පාර, ත්‍රිකුණාමලය හා බදුල්ල යන දිස්ත්‍රික්ක 04 හි වතු 01 ක් බැගින් අඩුම වතු සංඛ්‍යාව වාර්තා වන අතර මහනුවර, වව්නියාව හා බදුල්ල යන දිස්ත්‍රික්ක තුනෙහි අක්කර 01 බැගින් අඩුම බිම් ප්‍රමාණය වාර්තා වේ.

ක්‍රමවත් අන්නාසි වගාව සහිත වතු 272 ක් වාර්තා වී ඇති අතර මුළු බිම් ප්‍රමාණය ලෙස අක්කර 1,659 ක් ද ඉන් අක්කර 1,153 ක් වූ, මුළු බිම් ප්‍රමාණයෙන් 69.5% ක බිම් ප්‍රමාණයක ඵල දරණ වගාවන් හා අක්කර 506 ක් ඵල නොදරණ වගා සහිත බිම් වේ. වැඩිම වතු සංඛ්‍යාව වතු 118, මුළු වතු සංඛ්‍යාවෙන් 43.3%, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද වැඩිම අන්නාසි වගා බිම් ප්‍රමාණය අක්කර 601 ක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ ද ඇති බව සංගණන වාර්තා පෙන්වා දෙයි. වැඩිම බිම් ප්‍රමාණය ඵලදාව සහිත අක්කර 414 කින් හා ඵල නොදරණ බිම් අක්කර 187 කින් සමන්විතය. අඩුම වතු සංඛ්‍යාව (01) කිළිනොච්චිය, අනුරාධපුරය හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල ද අඩුම බිම් ප්‍රමාණය අක්කර 01 ලෙස වව්නියාව දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වේ.

සංගණන තොරතුරු වලට අනුව රඹුටන් වගාව පිළිබඳ ව සලකා බැලීමේ දී වතු 118 ක රඹුටන් වගාව ඇති බව ද ඒ යටතේ අක්කර 722 ක බිම් ප්‍රමාණයක වගාව ව්‍යාප්තව ඇති බව ද සඳහන් වේ. මෙම බිම් ප්‍රමාණයෙන් අක්කර 624 ක් එනම් 86.4% ක් ඵල දරණ බිම් ප්‍රමාණයෙන් යුක්ත වන අතර 13.6% ක් අක්කර 98 ක් තවමත් ඵල නොදරණ බිම් ප්‍රමාණයෙන් යුක්ත වේ. රඹුටන් වතු වැඩිම සංඛ්‍යාව (23) ගම්පහ,රත්නපුරය හා කෑගල්ල දිස්ත්‍රික්කවලින් ද වතු අඩුම සංඛ්‍යාව (01) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද ඇති බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත.වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 19.5% කි. දැනට ඵල දරණ අක්කර 179 ක් හා තවමත් ඵල නොදරණ අක්කර 14 ක් සහිතව, වැඩිම බිම් ප්‍රමාණය වූ අක්කර 193 ද, වැඩිම වතු ගණනක් වාර්තා වූ ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. එය මුළු බිම් ප්‍රමාණයෙන් 26.7% කි. රඹුටන් වගාව ඇති අඩුම බිම් ප්‍රමාණය අක්කර 01 ක බිම් ප්‍රමාණයක් ලෙස මහනුවර දිස්ත්රික්කයේ ඇති බවට සංගණනය තොරතුරු ලබා දී ඇත.

ක්‍රමවත් ලෙස දෙළුම් වගාව සහිත වතු දිවයිනේ දිස්ත්‍රික්ක 10 කට සීමා වී ඇති අතර එම දිස්ත්‍රික්ක 10 හි වතු 33 ක් ඇත. ඒ යටතේ අක්කර 56 ක බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇති අතර එය අක්කර 32 ක් වූ ඵලදාව ලබා ගන්නා බිම් ප්‍රමාණයකින් සහ තවමත් ඵලදාව ලබා ගත නොහැකි අක්කර 24 කින් යුක්ත වේ. සමස්ථ වතු අතරින් දෙළුම් වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (10) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද, දෙළුම් වගාව සහිත වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 19) පුත්තලම දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වන අතර එම බිම් ප්‍රමාණය ඵල දරණ අක්කර 14 කින් හා ඵල නොදරණ අක්කර 05 කින් යුක්ත වේ. වැඩිම වතු ගණන මුළු වතු ගණනින් 30.3% ක හා වැඩිම බිම් ප්‍රමාණය මුළු බිම් ප්‍රමාණයෙන් 33.9% ක ප්‍රතිශත ගනී. ගම්පහ, මහනුවර, මාතලේ හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 04 හි වතු 01 බැගින් දෙළුම් වගාව සහිත අඩුම වතු සංඛ්‍යාව ද, මාතලේ දිස්ත්‍රික්කයේ අක්කර 01 ක් ලෙස අඩුම වගා බිම් ප්‍රමාණය ද ඇති බව වාර්තා වේ.

ක්‍රමවත්ව වගා කරන ලද අලිගැටපේර වගාව ද ව්‍යාප්තව ඇත්තේ දිවයිනේ දිස්ත්‍රික්ක 05 ක වන අතර එම දිස්ත්‍රික්ක වල වතු සංඛ්‍යාව 09 ක් වේ. අලිගැටපේර වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 13 කි. එම අක්කර 13, ඵලදාව සහිත අක්කර 03 ක් හා ඵල නොදරණ අක්කර 10 ලෙස වාර්තා වී ඇත. එනම් 76.9% වූ වැඩි ප්‍රතිශතය පැළ සහිත බිම් ප්‍රමාණය වේ. අලිගැටපේර වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (03) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද, අඩුම වතු සංඛ්‍යාව (01) කළුතර හා අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වල ද පිහිටා ඇත. වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 33.3% ක් වේ. අඩුම බිම් ප්‍රමාණය (අක්කර 01), ඵල දරණ අක්කර 01 හා ඵල නොදරණ අක්කර 01 වශයෙන්, පිළිවෙලින් එම දිස්ත්‍රික්ක දෙකෙන් ම වාර්තා වී ඇත.

සංගණන තොරතුරු වලට අනුව වතු ආශ්‍රිත ව ක්‍රමවත් කිලෝපේර වගාව, වතු 33 ක ව්‍යාප්ත වී ඇත. එමෙන්ම එම වතු 33 ට අදාලව වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 118 ක් වේ. ඉන් වැඩි ප්‍රමාණයක් වූ අක්කර 90, මුළු වතු ගණනින් 76.27% ක් දැනටමත් ඵල දරණ වගාව ඇති බව සඳහන් වේ. කිලෝපේර වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව (12) වූ මුළු වතු සංඛ්‍යාවෙන් 36.4% පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වන විට අඩුම වතු සංඛ්‍යාව (01), ගම්පහ, කළුතර, හම්බන්තොට, ත්‍රිකුණාමලය

හා රත්නපුරය යන දිස්ත්‍රික්ක 05 න් හා ගම්පහ හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 02 න් අඩුම බිම් ප්‍රමාණය වන අක්කර 01 ක එලදාව සහිත වගාව වාර්තා වේ.

වතු ආශ්‍රිත ව ඇති දූරියන් වගාව පිළිබඳ සලකා බැලීමේ දී, දිස්ත්‍රික්ක 09 ක, වතු 13 ක් ආශ්‍රිත ව අක්කර 32 ක බිම් ප්‍රමාණයක, දූරියන් වගාව ක්‍රමවත්ව වගා කර ඇත. එම අක්කර 32 ක බිම් ප්‍රමාණයෙහි අක්කර 22 ක් වූ මුළු බිම් ප්‍රමාණයෙන් 68.75% ක් ඵල දරණ වගාව ද, අක්කර 10 ක් ඵල නොදරණ වගාව ද ඇත. දූරියන් වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව (03) රත්නපුරය හා කෑගල්ල දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ. එය මුළු වතු සංඛ්‍යාවෙන් 23% කි. දිස්ත්‍රික්ක 07 ක වතු 01 බැගින් වාර්තා වන විට, අඩුම බිම් ප්‍රමාණය අක්කර 01 බැගින් ගම්පහ, මහනුවර හා මාතර දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

ක්‍රමවත් දොඩම් වගාව, වතු 79 ක හා ඊට අයත් අක්කර 165 ක භූමි ප්‍රමාණයක ව්‍යාප්තව ඇත. මෙයින් අක්කර 105 ක, මුළු බිම් ප්‍රමාණයෙන් 63.63%, තවමත් ඵල නොදරණ වගාවකින් යුතු වන අතර අක්කර 60 ක භූමිය ඵල දරණ වගාව ඇති බව පෙන්වා දිය හැකිය. කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්ක දෙකෙහි දොඩම් වගා කර ඇති වැඩිම වතු සංඛ්‍යාව (14) ද, මොණරාගල දිස්ත්‍රික්කයෙන් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 33) ද වාර්තා වේ. මේවා පිළිවෙලින් වැඩිම වතු ගණනින් 17.7% ක් හා වැඩිම බිම් ප්‍රමාණයෙන් 20% ක් යන ප්‍රතිශත ගනී. ක්‍රමවත් දොඩම් වගාව සහිත වතු අඩුම (01), දිස්ත්‍රික්ක 04 කින් වාර්තා වී ඇති අතර කළුතර, මාතර, අම්පාර හා පොළොන්නරුව එම දිස්ත්‍රික්ක වේ. අවම බිම් ප්‍රමාණය ද අක්කර 01 බැගින් කළුතර, ගාල්ල, අම්පාර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

දෙහි වගාව පිළිබඳ ව තොරතුරු වලට අනුව වතු 38 ක හා ඒ යටතේ අක්කර 86 ක බිම් වපසරියක ක්‍රමවත්ව දෙහි වගාව ඇති බව වාර්තා වේ. මෙයින් අක්කර 54 ක, එනම් මුළු බිම් ප්‍රමාණයෙන් 62.8% ක ඵල දරණ වගාව හා අක්කර 32 ක තවමත් ඵල නොදරණ වගාව ඇත. ක්‍රමවත් දෙහි වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (7) හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ද වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 23) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වී ඇත. එම අගයන්, මුළු වතු සංඛ්‍යාවෙන් 18.42% ක් ද මුළු බිම් ප්‍රමාණයෙන් 26.7% ක් ද වශයෙන් දැක්විය හැකිය. මුළු බිම් ප්‍රමාණයම ඵලදාව සහිත වගාවක් වේ. කළුතර, මාතර, වව්නියාව හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක ක්‍රමවත් දෙහි වගාව සහිත වතු අඩුම සංඛ්‍යාවක් (01) හා අඩුම බිම් ප්‍රමාණයක් (අක්කර 01) සහිත දිස්ත්‍රික්ක ලෙස සංගණන තොරතුරු පෙන්වා දෙයි.

වතු වගාව ආශ්‍රිතව ක්‍රමවත් මැංගුස් වගාව දිවයිනේ කළුතර, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක 03 හි පමණක් ව්‍යාප්ත ව ඇති අතර වතු 05 ක අක්කර 16 ක බිම් ප්‍රමාණයක ඇති බව වාර්තා වේ. මෙයින් අක්කර 15 ක ඵල දරණ මැංගුස් වගාව ව්‍යාප්තව ඇති අතර එය මුළු බිම් ප්‍රමාණයෙන් 93.75% ක වැඩි ප්‍රතිශතයකි. කළුතර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල වතු 02 බැගින් ද රත්නපුර දිස්ත්‍රික්කයෙ හි එක් වත්තක් ඇති බවට ද වාර්තා වන විට, වැඩිම බිම් ප්‍රමාණය, ඵලදාව සහිත අක්කර 08 ක බිම් ප්‍රමාණයක් සහිතව, අක්කර 09 ලෙසට කළුතර දිස්ත්‍රික්කයේ ද අඩුම බිම් ප්‍රමාණය අක්කර 02 ලෙසට රත්නපුර දිස්ත්‍රික්යේ ද පෙන්වා දිය හැකිය. වැඩිම මැංගුස් බිම් ප්‍රමාණය මුළු මැංගුස් බිම් ප්‍රමාණයෙන් 56% ක ප්‍රතිශතයකි.

ක්‍රමවත්ව මිදි වගා කර ඇති වතු දිස්ත්‍රික්ක 04 වාර්තා වී ඇත. කොළඹ, හම්බන්තොට, පුත්තලම හා අනුරාධපුරය එම දිස්ත්‍රික්ක වේ. එම දිස්ත්‍රික්ක වලින් වතු 07 ක මිදි වගාව වාර්තා වන විට, ඵල දරණ අක්කර 08 ක් හා ඵල නොදරණ අක්කර 05 ක් ලෙස සමස්ත බිම් ප්‍රමාණය අක්කර 13 කි. වැඩිම මිදි වතු සංඛ්‍යාව සමස්ත මිදි වතු සංඛ්‍යාවෙන් 42.8% ක් ලෙස වතු 03 ක් ලෙස පුත්තලම දිස්ත්‍රික්කයේ ද, වතු 01 ලෙස අඩුම වතු සංඛ්‍යාව කොළඹ හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල ද, අක්කර 07 ක් වූ, මුළු මිදි වගා බිම් ප්‍රමාණයෙන් 53.8% ක් ලෙස වැඩිම මිදි වගා බිම් ප්‍රමාණය පුත්තලම දිස්ත්‍රික්කයේ ද, අක්කර 01 වූ අඩුම ක්‍රමවත් මිදි වගා බිම් ප්‍රමාණය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ද ඇති බව ට සංගණන තොරතුරු පෙන්වා දේ.

## වගු අංක 7.2.1

## දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | අඹ | | | | කෙසෙල් | | | | පැපොල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | 3 | 2 | 1 | 3 | 13 | 30 | 1 | 31 | 2 | 3 | - | 3 |
| ගම්පහ | 5 | 9 | 7 | 16 | 56 | 116 | 28 | 144 | 3 | 4 | - | 4 |
| කළුතර | 3 | 20 | - | 20 | 17 | 26 | 7 | 33 | 1 | 2 | - | 2 |
| මහනුවර | 4 | 6 | - | 6 | 15 | 39 | 5 | 44 | 2 | 1 | - | 1 |
| මාතලේ | 22 | 115 | 26 | 141 | 36 | 208 | 28 | 236 | 8 | 11 | 3 | 14 |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | - | - | - | - | 4 | 5 | 1 | 6 | - | - | - | - |
| මාතර | 2 | 1 | 5 | 6 | 12 | 18 | 11 | 29 | 3 | 2 | 3 | 5 |
| හම්බන්තොට | 19 | 227 | 47 | 274 | 22 | 68 | 35 | 103 | 14 | 18 | 5 | 23 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | 3 | 1 | 16 | 17 | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | 3 | 3 | - | 3 | 3 | 1 | - | 1 |
| මුලතිව් | 1 | 1 | - | 1 | 1 | - | 2 | 2 | - | - | - | - |
| කිළිනොච්චිය | 4 | 6 | 10 | 16 | 1 | 2 | - | 2 | - | - | - | - |
| මඩකළපුව | 2 | - | 4 | 4 | 1 | - | 10 | 10 | - | - | - | - |
| අම්පාර | 1 | 7 | - | 7 | 2 | 11 | - | 11 | 1 | 3 | - | 3 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | 2 | 17 | - | 17 | 1 | 2 | - | 2 |
| කුරුණෑගල | 77 | 274 | 21 | 295 | 181 | 381 | 207 | 588 | 45 | 70 | 25 | 95 |
| පුත්තලම | 40 | 134 | 39 | 173 | 82 | 679 | 57 | 736 | 23 | 34 | 20 | 54 |
| අනුරාධපුරය | 20 | 200 | 85 | 285 | 8 | 36 | 12 | 48 | 4 | 7 | 7 | 14 |
| පොළොන්නරුව | 12 | 80 | 145 | 225 | 10 | 113 | 15 | 128 | 6 | 17 | 6 | 23 |
| බදුල්ල | 7 | 56 | 103 | 159 | 6 | 21 | 7 | 28 | 1 | - | 1 | 1 |
| මොණරාගල | 31 | 135 | 74 | 209 | 29 | 854 | 23 | 877 | 9 | 17 | 3 | 20 |
| රත්නපුරය | 12 | 19 | 1 | 20 | 21 | 46 | 8 | 54 | - | - | - | - |
| කෑගල්ල | 3 | 2 | - | 2 | 22 | 79 | 26 | 105 | - | - | - | - |
| ශ්‍රී ලංකාව | 268 | 1,294 | 568 | 1,862 | 547 | 2,753 | 499 | 3,252 | 126 | 192 | 73 | 265 |

## වගු අංක 7.2.1

### දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | අන්නාසි | | | | රඹුටන් | | | | දෙළුම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | 12 | 67 | 33 | 100 | 10 | 74 | 5 | 79 | - | - | - | - |
| ගම්පහ | 68 | 414 | 187 | 601 | 23 | 179 | 14 | 193 | 1 | 1 | 1 | 2 |
| කළුතර | 8 | 27 | 2 | 29 | 11 | 32 | 1 | 33 | - | - | - | - |
| මහනුවර | - | - | - | - | 2 | 1 | - | 1 | 1 | - | 6 | 6 |
| මාතලේ | 3 | 1 | 5 | 6 | 2 | 1 | 5 | 6 | 1 | 1 | - | 1 |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | 4 | - | 3 | 3 | 2 | 2 | - | 2 | - | - | - | - |
| මාතර | 5 | 7 | 8 | 15 | 3 | 4 | - | 4 | - | - | - | - |
| හම්බන්තොට | 4 | 3 | 4 | 7 | - | - | - | - | 1 | 1 | 1 | 2 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 2 | 1 | - | 1 | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිලිනොච්චිය | 1 | 4 | - | 4 | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 118 | 420 | 151 | 571 | 14 | 46 | 10 | 56 | 10 | 6 | 4 | 10 |
| පුත්තලම | 22 | 87 | 46 | 133 | - | - | - | - | 9 | 14 | 5 | 19 |
| අනුරාධපුරය | 1 | - | 2 | 2 | 1 | 2 | - | 2 | 3 | 4 | 3 | 7 |
| පොළොන්නරුව | 1 | 20 | - | 20 | - | - | - | - | 2 | 1 | 2 | 3 |
| බදුල්ල | 2 | 15 | 13 | 28 | 2 | - | 18 | 18 | - | - | - | - |
| මොණරාගල | 5 | 30 | 1 | 31 | 2 | - | 8 | 8 | 3 | 3 | 1 | 4 |
| රත්නපුරය | 5 | 11 | 1 | 12 | 23 | 129 | 10 | 139 | 2 | 1 | 1 | 2 |
| කෑගල්ල | 11 | 46 | 50 | 96 | 23 | 154 | 27 | 181 | - | - | - | - |
| ශ්‍රී ලංකාව | 272 | 1,153 | 506 | 1,659 | 118 | 624 | 98 | 722 | 33 | 32 | 24 | 56 |

## වගු අංක 7.2.1

### දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | අලිගැටපේර | | | | කිලෝපේර | | | | දූරියන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | - | - | - | - | - | - | - | - | 1 | - | 4 | 4 |
| ගම්පහ | 2 | 1 | 3 | 4 | 1 | 1 | - | 1 | 1 | - | 1 | 1 |
| කළුතර | 1 | 1 | - | 1 | 1 | 2 | - | 2 | 1 | 3 | - | 3 |
| මහනුවර | 2 | 1 | 2 | 3 | - | - | - | - | 1 | 1 | - | 1 |
| මාතලේ | - | - | - | - | 2 | 2 | 2 | 4 | - | - | - | - |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මාතර | - | - | - | - | - | - | - | - | 1 | 1 | - | 1 |
| හම්බන්තොට | - | - | - | - | 1 | 4 | - | 4 | - | - | - | - |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | 1 | 1 | - | 1 | - | - | - | - |
| කුරුණෑගල | 3 | - | 4 | 4 | 6 | 5 | 10 | 15 | - | - | - | - |
| පුත්තලම | - | - | - | - | 12 | 10 | 9 | 19 | - | - | - | - |
| අනුරාධපුරය | 1 | - | 1 | 1 | 4 | 27 | 2 | 29 | 1 | 1 | 1 | 2 |
| පොළොන්නරුව | - | - | - | - | 2 | 31 | - | 31 | - | - | - | - |
| බදුල්ල | - | - | - | - | 2 | 7 | 2 | 9 | 1 | - | 3 | 3 |
| මොණරාගල | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| රත්නපුරය | - | - | - | - | 1 | - | 3 | 3 | 3 | 15 | - | 15 |
| කෑගල්ල | - | - | - | - | - | - | - | - | 3 | 1 | 1 | 2 |
| ශ්‍රී ලංකාව | 9 | 3 | 10 | 13 | 33 | 90 | 28 | 118 | 13 | 22 | 10 | 32 |

වගු අංක 7.2.1

දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත්ව වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | දොඩම් | | | | දෙහි | | | | මැංගුස් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගම්පහ | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කළුතර | 1 | 1 | - | 1 | 1 | 1 | - | 1 | 2 | 8 | 1 | 9 |
| මහනුවර | 3 | 5 | - | 5 | 2 | - | 5 | 5 | - | - | - | - |
| මාතලේ | 3 | 10 | - | 10 | 5 | 4 | - | 4 | - | - | - | - |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | 2 | - | 1 | 1 | - | - | - | - | - | - | - | - |
| මාතර | 1 | 3 | 2 | 5 | 1 | 1 | - | 1 | - | - | - | - |
| හම්බන්තොට | 3 | - | 8 | 8 | 7 | 13 | 5 | 18 | - | - | - | - |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වවුනියාව | - | - | - | - | 1 | - | 1 | 1 | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | 1 | - | 1 | 1 | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 14 | 9 | 2 | 11 | 6 | 23 | - | 23 | - | - | - | - |
| පුත්තලම | 14 | 16 | 8 | 24 | 5 | 3 | 2 | 5 | - | - | - | - |
| අනුරාධපුරය | 6 | 15 | 14 | 29 | 5 | 2 | 6 | 8 | - | - | - | - |
| පොළොන්නරුව | 1 | - | 1 | 1 | 1 | 1 | - | 1 | - | - | - | - |
| බදුල්ල | 9 | 8 | 19 | 27 | - | - | - | - | - | - | - | - |
| මොණරාගල | 12 | 30 | 3 | 33 | 2 | 5 | 5 | 10 | - | - | - | - |
| රත්නපුරය | 6 | 6 | - | 6 | 2 | 1 | 8 | 9 | 1 | 2 | - | 2 |
| කෑගල්ල | 3 | 2 | 1 | 3 | - | - | - | - | 2 | 5 | - | 5 |
| ශ්‍රී ලංකාව | 79 | 105 | 60 | 165 | 38 | 54 | 32 | 86 | 5 | 15 | 1 | 16 |

| දිස්ත්‍රික්කය | ඉදු | | | |
|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | 1 | 2 | - | 2 |
| ගම්පහ | - | - | - | - |
| කළුතර | - | - | - | - |
| මහනුවර | - | - | - | - |
| මාතලේ | - | - | - | - |
| නුවරඑළිය | - | - | - | - |
| ගාල්ල | - | - | - | - |
| මාතර | - | - | - | - |
| හම්බන්තොට | 1 | 1 | - | 1 |
| යාපනය | - | - | - | - |
| මන්නාරම | - | - | - | - |
| වව්නියාව | - | - | - | - |
| මුලතිව් | - | - | - | - |
| කිලිනොච්චිය | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - |
| අම්පාර | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - |
| කුරුණෑගල | - | - | - | - |
| පුත්තලම | 3 | 3 | 4 | 7 |
| අනුරාධපුරය | 2 | 2 | 1 | 3 |
| පොළොන්නරුව | - | - | - | - |
| බදුල්ල | - | - | - | - |
| මොණරාගල | - | - | - | - |
| රත්නපුරය | - | - | - | - |
| කෑගල්ල | - | - | - | - |
| ශ්‍රී ලංකාව | 7 | 8 | 5 | 13 |

### 7.2.2 දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව යටතේ පළතුරු බෝග වගාකර ඇති සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

වතු අංශයේ තොරතුරු ගණන් ගැනීමේ දී පළතුරු බෝග, විසිරි වගාව ලෙස වගා කර ඇති වතු සංඛ්‍යාව හා ඒ අනුව ඇති ගස් ගණන දිස්ත්‍රික් මට්ටමින් ගණන් ගන්නා ලදී.

විසිරි වගාව ලෙස අඹ වගා කර ඇති වතු 3,352 ක, අඹ ගස් 68,413 ක් ඇති බවත් ඒවායින් ගස් 14,603 ක් වූ 21.34% ක ඵල නොදරණ වගාව ලෙසත් පෙන්වා දිය හැකිය. ගස් 53,810 ක් වූත් 78.65% වූත් ගස් ගණන ඵල දරණ ගස් වේ. විසිරි අඹ වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (1,073) කුරුණෑගල දිස්ත්‍රික්කයේත් වතු 03 ක් වූ අඩුම වතු සංඛ්‍යාව මන්නාරම දිස්ත්‍රික්කයේත් පිහිටා ඇති බවට සංගණන තොරතුරු පෙන්වා දේ. වැඩිම අඹ ගස් සංඛ්‍යාව (24,481) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර තවමත් ඵල නොදරණ පැළ 4,532 කින් සහ ඵල දරණ ගස් 19,949 කින් එය යුක්ත වේ. අඩුම ගස් ගණන (98) වාර්තා වන්නේ මන්නාරම දිස්ත්‍රිකකයෙනි. වැඩිම වතු ගණන, මුළු වතු ගණනින් 32% ක් හා වැඩිම ගස් ගණන, මුළු ගස් ගණනින් 35.78% ක ප්‍රතිශතයන් ගනී.

කෙසෙල් වගාව පිළිබඳ තොරතුරු වලට අනුව දිවයිනේ වතු 1,830 ක විසිරි වගාව ලෙස කෙසෙල් වගා කර ඇත. මෙම වතු වල කෙසෙල් පඳුරු 216,564 ක් වාර්තා වන අතර ඉන් 150,152 ක් වූ 69.33% ක් ඵල දරණ වගාව වේ. විසිරි වගාව යටතේ වැඩිම වතු සංඛ්‍යාව (570), මුළු වතු සංඛ්‍යාවෙන් 31% ක හා වැඩිම පඳුරු ගණන (87,433) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. වැඩිම පඳුරු ගණන මුළු පඳුරු ගණනින් 40.37% ක් ලෙස ද එය, ඵල දරණ පඳුරු 63,129 ඵල නොදරණ පඳුරු 24,304 ක් ලෙස ද වෙන් කර දැක්විය හැකිය. අඩුම වතු සංඛ්‍යාව (01) හා අඩුම පඳුරු ගණන (10) මන්නාරම දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

වතු 868 ක විසිරි වගාව ලෙස පැපොල් වගා කළ වතු ඇති අතර මෙම වතු අශ්‍රිතව එලදරණ ගස් 28,222 ක් හා එල නොදරණ පැළ 16,451 ක් වූ ද ලෙස, සමස්තය ගස් 44,673 ක් වාර්තා වී ඇත. එල නොදරණ ප්‍රතිශතය මුළු ගස් සංඛ්‍යාවෙන් 36.82% කි. වතු වැඩිම සංඛ්‍යාව (250) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එය මුළු වතු සංඛ්‍යාවෙන් 29% ක් වන විට අඩුම වතු සංඛ්‍යා වතු 01 ක් වශයෙන් වව්නියාව දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. පැපොල් ගස් වැඩිම ගණන (26,600) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද, ගස් 04 ලෙස අඩුම ගස් ගණන යාපනය දිස්ත්‍රික්කයේ ද ඇති බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත. මේ අනුව වැඩිම ගස් ගණන මුළු ගස් ගණනින් 59.54% කි.

අන්නාසි වගාව පිළිබඳ ව ද වතු අංශයේ විසිරි වගාව යටතේ තොරතුරු වලට අනුව, වතු 366 ක වාර්තා වන අතර මුළු අන්නාසි ගස් ගණන 549,306 කි. ඊට එල දරණ ගස් 314,448 ක් හා එල නොදරණ පැළ 234,858 ක් අයත් ය. ඒවා පිළිවෙලින් මුළු ගස් ගණනින් 57.24% ක් හා 42.75% ක් වේ. විසිරි වගාව යටතේ අන්නාසි වගා කර ඇති වතු වැඩිම සංඛ්‍යාව (120) ද අන්නාසි ගස් වැඩිම සංඛ්‍යාව (253,786) ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. එම සංඛ්‍යාව එලදාව සහිත ගස් 122,218 කින් හා එලදාව නොමැති ගස් 131,568 කින් සමන්විත වේ. වැඩිම වතු ගණන මුළු වතු ගණනින් 32.8% ක ප්‍රතිශතයක් හා වැඩිම ගස් ගණන මුළු ගස් ගණනින් 46.2% ප්‍රතිශතයක් ගනී. විසිරි වගාව යටතේ අන්නාසි වගා කර ඇති වතු අඩුම සංඛ්‍යාව (01) මුලතිව් දිස්ත්‍රික්කයෙන් ද අඩුම ගස් ගණන (05) එල දරණ ගස් ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

විසිරි වගාව ලෙස රඹුටන් වගා කර ඇති වතු 1,018 ක් පිළිබඳ ව සංගණන තොරතුරු වාර්තා කරන අතර ඒ යටතේ රඹුටන් ගස් 15,889 ක් ඇති බව වාර්තා වී ඇත. ඉන් 65% ක් වූ ගස් 10,332 වූ එල දරණ වගාව වේ. විසිරි වගාව යටතේ රඹුටන් වගා කර ඇති වතු වැඩිම සංඛ්‍යාව (180) ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය මුළු වතු ගණනින් 17.7% ක් හා වැඩිම ගස් ගණන (4,000), මුළු ගස් ගණනින් 25.17% ක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. වැඩිම ගස් ගණන එල දරණ ගස් 2,835 කින් හා එල නොදරණ පැළ 1,165 කින් යුක්ත වේ. රඹුටන් වතු අඩුම සංඛ්‍යාව (01) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හා අඩුම ගස් සංඛ්‍යාව එල දරණ ගස් 02 ක් හා එල නොදරණ පැළ 02 ක් ලෙස ගස් 04 හම්බන්තොට දිස්ත්‍රික්කයේ බවට සංගණන තොරතුරු පෙන්වා දෙයි.

මන්නාරම හා යාපනය හැර අනෙකුත් දිස්ත්‍රික්කයන් හි ඇති වතු 559 ක විසිරි වගාව යටතේ දෙළුම් වගාව ව්‍යාප්ත වී ඇත. මෙහි දී දෙළුම් ගස් 9,677 ක් ඇති බවත් ඊට එල දරණ ගස් 5,209 ක් හා එල නොදරණ ගස් 4,468 ක් අයත් බවත් තොරතුරු වාර්තා වේ. මුළු වතු සංඛ්‍යාවෙන් 26.3% ක් වූ ප්‍රතිශතයක් සහිත ව වතු වැඩිම සංඛ්‍යාව (147) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් හා මුළු ගස් සංඛ්‍යාවෙන් 42.94% ක් වූ ප්‍රතිශතයක් සහිත ව වැඩිම ගස් සංඛ්‍යාව (4,156) අම්පාර දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වන විට වව්නියාව දිස්ත්‍රික්කයෙන් අඩුම වතු සංඛ්‍යාව වතු 02 ලෙස ද ගාල්ල දිස්ත්‍රික්කයෙන් අඩුම ගස් ගණන, ගස් 11 ලෙස ද තොරතුරු ලැබී ඇත.

විසිරි වගාව යටතේ අලිගැටපේර වගාව ද වතු 860 ක ව්‍යාප්තව ඇති බවට ද, ඒ යටතේ අලිගැටපේර ගස් 6,622 ක්, එල දරණ ගස් 4,514 ක් හා එල නොදරණ පැළ 2,108 ක් ලෙස ඇති බවට ද පෙන්වා දිය හැකිය. එල දරණ හා නොදරණ සංඛ්‍යා මුළු ගස් සංඛ්‍යාවෙන් පිළිවෙලින් 68.16% ක් හා 31.8% වේ. වැඩිම විසිරි වගාව යටතේ ඇති අලිගැටපේර වතු සංඛ්‍යාව (198) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම වතු සංඛ්‍යාව (01) මන්නාරම, කිළිනොච්චිය හා අම්පාර යන දිස්ත්‍රික්කවලින් වාර්තා වේ. වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 23% කි. වැඩිම අලිගැටපේර ගස් ගණන වාර්තා වන්නේ මාතලේ දිස්ත්‍රික්කයෙන් වන අතර ගස් ගණන 2,338 කි. එය මුළු අලිගැටපේර ගස් ගණනින් 35.3% වේ. අම්පාර දිස්ත්‍රික්කයෙන් අලිගැටපේර විසිරි වගාව යටතේ අඩුම ගස් ගණන 02 ක් ලෙස වාර්තා කරමින් අඩුම ගස් ගණන වාර්තා වී ඇත.

කිලෝපේර වගාව විසිරි වගාවක් ලෙස වතු 313 ක ඇති අතර ඒ යටතේ ගස් 13,118 ක් වාර්තා වේ. එම ගස් සංඛ්‍යාවෙන් 39.32% ක් වූ, ගස් 13,118 ක් ඵල නොදරණ ගස් වන අතර ගස් 7,932 ක් දැනට ඵල දරණ කිලෝපේර ගස් ය. වැඩිම කිලෝපේර වගාව සහිත වතු සංඛ්‍යාව (83) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද අඩුම වතු සංඛ්‍යාව (01)මන්නාරම මුලතිව් හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වලින් ද වාර්තා වී ඇත. විසිරි වගාව යටතේ වැඩිම ගස් ගණනක් (9,817) පුත්තලම දිස්ත්‍රික්කයෙන් හා අඩුම ගස් ගණන (01) මුලතිව් දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වේ. ඒ අනුව වැඩිම වතු සංඛ්‍යාව මුළු වතු සංඛ්‍යාවෙන් 26.5% ක ප්‍රතිශතයක් හා වැඩිම කිලෝපේර ගස් ගණන මුළු කිලෝපේර ගස් ගණනින් 74.43% ප්‍රතිශතයක් පෙන්වයි.

විසිරි වගාවක් ලෙස ඇති දූරියන් වගාව පිළිබඳ ව සලකා බැලීමේ දී වතු 424 ක ගස් 3,002 ක් ඇති බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත. මෙය ඵල දරණ ගස් 900 ක්, එනම් සමස්ත ගස් ගණනින් 29.98% ක් හා සමස්තයෙන් 70% වූ ගස් 2,102 ක ප්‍රමාණයක් ඵල නොදරණ පැළ වේ. විසිරි වගාවක් ලෙස දූරියන් වගා කර ඇති වතු වැඩිම සංඛ්‍යාව (86) හා වැඩිම ගස් ගණන (1,189) වාර්තා වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙ නි. ඒවා මුළු දූරියන් වතු සංඛ්‍යාවෙන් 20.2% ක හා මුළු දූරියන් ගස් සංඛ්‍යාවෙන් 39.6% ක ප්‍රතිශත ගනී. අවම වතු ගණන වතු එකක් ලෙස දිස්ත්‍රික්ක 04 කින් වාර්තා වී ඇත. එම දිස්ත්‍රික්ක 04 නම් වව්නියාව, අම්පාර, අනුරාධපුරය හා පොළොන්නරුවයි. වව්නියාව, අම්පාර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වලින් ගස් 02 ක් ලෙස අවම ගස් ගණන වාර්තා වී ඇත.

සංගණන තොරතුරු වලට අනුව දොඩම් වගාව විසිරි වගාවක් ලෙස දිවයිනේ වතු 785 ක ව්‍යාප්ත වී ඇති බවට වාර්තා වී ඇත. එම වතු වල ගස් 15,316 ක් වගා කර ඇති අතර ඵල දරණ ගස් 9,411 ක් හා තවමත් ඵල නොදරණ ගස් 5,905 ක් ලෙස දැක්විය හැකිය. විසිරි දොඩම් වගාවෙහි වැඩිම ව්‍යාප්තිය වතු 196 ක්, මුළු දොඩම් වගා කර ඇති වතු සංඛ්‍යාවෙන් 25% ක්, පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වුවද වැඩිම ගස් ගණන (3,474) වාර්තා වී ඇත්තේ, මුළු දොඩම් ගස් ගණනින් 22.68% ක් ලෙස පුත්තලම දිස්ත්‍රික්කයෙනි. කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ගස් 04 ක් එක් වත්තක වාර්තා වන අතර එය අඩුම දොඩම් වගා කර ඇති වතු ගණන මෙන්ම අඩුම දොඩම් ගස් ගණන ද වේ.

වතු ආශ්‍රිත ව විසිරි වගාව යටතේ දෙහි වගාව සහිත වතු 1,034 ක් හා දෙහි ගස් 13,041 ක් ඇත.මෙයින් දෙහි ගස් 7,836 ක් වූ 60.08% ක් ඵල දරණ ගස් ලෙස වාර්තා වන අතර දෙහි ගස් 5,205 ක් තවමත් ඵල නොදරණ ගස් වේ. දෙහි වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව ද, වැඩිම දෙහි ගස් ගණන ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර පිළිවෙලින් 325 ක් හා 3,745 ක් ද වේ. එම අගයන් පිළිවෙලින් 31.4% හා 28.7% ලෙස මුළු දෙහි වගාව සහිත වතු ගණනින් හා මුළු දෙහි ගස් ගණනින් ප්‍රතිශත ලෙස දැක්විය හැකිය. දෙහි වගාව සහිත වතු අඩුම සංඛ්‍යාව (02) නුවරඑළිය, යාපනය හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක තුනෙන් ද අඩුම ගස් ගණන (02) නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වී ඇත.

විසිරි වගාව යටතේ මැංගුස් වගාව සලකා බැලීමේ දී දිස්ත්‍රික්ක 13 ක වතු 344 ක් පුරා මැංගුස් වගාව ව්‍යාප්තව ඇති බව පෙන්වා දිය හැකිය. මේ යටතේ වැඩිම මැංගුස් ගස් 1,734 ක් ඇති අතර ඉන් 80% ක් වූ, ගස් 1,390 ක් ඵල දරණ ගස් වේ. ගස් 344 ක් තවමත් ඵල නොදරණ මැංගුස් වගාව ලෙස හැදින්විය හැකිය. මේ යටතේ වැඩිම මැංගුස් වගාව සහිත වතු සංඛ්‍යාව (55) ගම්පහ දිස්ත්‍රික්කයේ ද වැඩිම මැංගුස් ගස් ගණන (314) කොළඹ දිස්ත්‍රික්කයේ ද වේ. වැඩිම වතු සංඛ්‍යාව 16% ක් හා වැඩිම ගස් සංඛ්‍යාව 18.1% ලෙස මුළු මැංගුස් වගාව සහිත වතු සංඛ්‍යාවෙන් හා මුළු මැංගුස් ගස් සංඛ්‍යාවෙන් ප්‍රතිශත දැකිවිය හැකිය. අඩුම මැංගුස් ගස් සහිත වතු ගණන 03ක් වන විට අඩුම ගස් ගණන 08 ක් ලෙස ට නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක දෙකෙන් වාර්තා වේ.

මිදි වගාව පිළිබඳ ව සැළකීමේ දී වතු 43 ක විසිරි වැල් 943 ක් ලෙසට ව්‍යාප්ත වී ඇත. මෙය ඵල දරණ වැල් 629 ක් වූ, මුළු වැල් ගණනින් 66.7% ක් හා ඵල නොදරණ වැල් 314 ක් ලෙස වේ. මිදි විසිරි වගාව සහිත වතු වැඩිම සංඛ්‍යාව (15), මුළු වතු ගණනින් 34.88% ක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්

වාර්තා වේ. වැඩිම වැල් ගණන (530), මුළු වැල් ගණනින් 56.2% ක් ලෙස මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. මිදි වගාව සහිත අඩුම වතු දිස්ත්‍රික්ක 5 කින් වාර්තා වන අතර එම දිස්ත්‍රික්ක වලින් වතු 01 බැගින් වාර්තා වී ඇත. අඩුම වැල් ගණන (8) කැගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

**වගු අංක 7.2.2**
**දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව ලෙස වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන**

| දිස්ත්‍රික්කය | අඹ | | | | කෙසෙල් | | | | පැපොල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 58 | 1,194 | 134 | 1,328 | 47 | 2,604 | 1,122 | 3,726 | 25 | 364 | 30 | 394 |
| ගම්පහ | 283 | 3,036 | 639 | 3,675 | 203 | 16,027 | 4,483 | 20,510 | 104 | 1,279 | 780 | 2,059 |
| කළුතර | 87 | 713 | 160 | 873 | 64 | 3,220 | 586 | 3,806 | 36 | 724 | 392 | 1,116 |
| මහනුවර | 161 | 3,676 | 1,188 | 4,864 | 104 | 4,240 | 2,891 | 7,131 | 37 | 1,206 | 758 | 1,964 |
| මාතලේ | 120 | 7,557 | 2,170 | 9,727 | 66 | 9,338 | 10,543 | 19,881 | 32 | 2,378 | 1,042 | 3,420 |
| නුවරඑළිය | 19 | 193 | 509 | 702 | 5 | 120 | 90 | 210 | 4 | 52 | 10 | 62 |
| ගාල්ල | 88 | 738 | 140 | 878 | 99 | 3,038 | 823 | 3,861 | 54 | 438 | 98 | 536 |
| මාතර | 148 | 1,170 | 264 | 1,434 | 132 | 10,472 | 8,212 | 18,684 | 66 | 459 | 406 | 865 |
| හම්බන්තොට | 41 | 859 | 97 | 956 | 14 | 944 | 1,042 | 1,986 | 4 | 15 | 82 | 97 |
| යාපනය | 4 | 55 | 77 | 132 | - | - | - | - | 2 | - | 4 | 4 |
| මන්නාරම | 3 | 39 | 59 | 98 | 1 | 3 | 7 | 10 | 2 | 15 | 10 | 25 |
| වව්නියාව | 4 | 99 | 50 | 149 | 3 | 510 | 523 | 1,033 | 1 | 40 | 16 | 56 |
| මුලතිව් | 23 | 510 | 107 | 617 | 7 | 143 | 73 | 216 | 3 | 16 | 1 | 17 |
| කිළිනොච්චිය | 103 | 798 | 159 | 957 | 8 | 70 | 280 | 350 | 2 | 5 | 10 | 15 |
| මඩකළපුව | 30 | 377 | 362 | 739 | 11 | 111 | 149 | 260 | 7 | 248 | 110 | 358 |
| අම්පාර | 12 | 98 | 95 | 193 | 7 | 483 | 930 | 1,413 | 4 | 37 | 111 | 148 |
| ත්‍රිකුණාමලය | 4 | 153 | 53 | 206 | 2 | 80 | 150 | 230 | 2 | 75 | 12 | 87 |
| කුරුණෑගල | 1,073 | 19,949 | 4,532 | 24,481 | 570 | 63,129 | 24,304 | 87,433 | 250 | 16,871 | 9,729 | 26,600 |
| පුත්තලම | 702 | 7,161 | 2,013 | 9,174 | 211 | 14,744 | 5,397 | 20,141 | 116 | 2,333 | 2,469 | 4,802 |
| අනුරාධපුරය | 39 | 1,318 | 610 | 1,928 | 19 | 1,179 | 1,398 | 2,577 | 16 | 313 | 90 | 403 |
| පොළොන්නරුව | 23 | 552 | 572 | 1,124 | 19 | 2,550 | 1,066 | 3,616 | 7 | 144 | 120 | 264 |
| බදුල්ල | 40 | 845 | 233 | 1,078 | 19 | 4,290 | 31 | 4,321 | 11 | 446 | 10 | 456 |
| මොණරාගල | 24 | 317 | 75 | 392 | 14 | 845 | 200 | 1,045 | 5 | 36 | 21 | 57 |
| රත්නපුරය | 184 | 1,626 | 182 | 1,808 | 136 | 5,941 | 1,156 | 7,097 | 61 | 540 | 107 | 647 |
| කෑගල්ල | 79 | 777 | 123 | 900 | 69 | 6,071 | 956 | 7,027 | 17 | 188 | 33 | 221 |
| ශ්‍රී ලංකාව | 3,352 | 53,810 | 14,603 | 68,413 | 1,830 | 150,152 | 66,412 | 216,564 | 868 | 28,222 | 16,451 | 44,673 |

## වගු අංක 7.2.2
## දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව ලෙස වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

| දිස්ත්‍රික්කය | අන්නාසි | | | | රඹුටන් | | | | දෙළුම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 13 | 396 | 1,103 | 1,499 | 54 | 679 | 418 | 1,097 | 15 | 22 | 14 | 36 |
| ගම්පහ | 23 | 15,194 | 8,632 | 23,826 | 180 | 2,835 | 1,165 | 4,000 | 30 | 98 | 22 | 120 |
| කළුතර | 17 | 5,304 | 2,919 | 8,223 | 72 | 790 | 139 | 929 | 9 | 18 | 26 | 44 |
| මහනුවර | 12 | 3,670 | 492 | 4,162 | 61 | 267 | 170 | 437 | 32 | 222 | 137 | 359 |
| මාතලේ | 7 | 229 | 147 | 376 | 28 | 72 | 424 | 496 | 19 | 276 | 141 | 417 |
| නුවරඑළිය | - | - | - | - | 6 | 21 | 16 | 37 | - | - | - | - |
| ගාල්ල | 25 | 3,319 | 2,419 | 5,738 | 68 | 386 | 100 | 486 | 9 | 9 | 2 | 11 |
| මාතර | 44 | 7,140 | 6,358 | 13,498 | 112 | 482 | 198 | 680 | 28 | 42 | 36 | 78 |
| හම්බන්තොට | 8 | 399 | 1,906 | 2,305 | 2 | 2 | 2 | 4 | 9 | 82 | 38 | 120 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 2 | 2,100 | 1,100 | 3,200 | 2 | 1 | 24 | 25 | 2 | 130 | 103 | 233 |
| මුලතිව් | 1 | 20 | - | 20 | - | - | - | - | 4 | 5 | 8 | 13 |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | 6 | 30 | 102 | 132 |
| මඩකළපුව | 4 | - | 2,070 | 2,070 | - | - | - | - | 11 | 224 | 23 | 247 |
| අම්පාර | 4 | 53 | 500 | 553 | 3 | 3 | 6 | 9 | 4 | 43 | 65 | 108 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | 3 | 50 | 20 | 70 |
| කුරුණෑගල | 120 | 122,218 | 131,568 | 253,786 | 177 | 1,845 | 466 | 2,311 | 147 | 698 | 890 | 1,588 |
| පුත්තලම | 30 | 131,827 | 47,941 | 179,768 | 33 | 96 | 65 | 161 | 143 | 2,448 | 1,708 | 4,156 |
| අනුරාධපුරය | 5 | 5 | 329 | 334 | - | - | - | - | 23 | 438 | 271 | 709 |
| පොළොන්නරුව | 2 | 5 | - | 5 | 1 | - | 5 | 5 | 11 | 141 | 356 | 497 |
| බදුල්ල | 6 | 232 | 120 | 352 | 12 | 208 | 41 | 249 | 9 | 49 | 155 | 204 |
| මොණරාගල | 7 | 20,551 | 20,017 | 40,568 | 3 | 7 | 2 | 9 | 9 | 125 | 99 | 224 |
| රත්නපුරය | 30 | 539 | 212 | 751 | 140 | 1,151 | 435 | 1,586 | 23 | 33 | 239 | 272 |
| කෑගල්ල | 6 | 1,247 | 7,025 | 8,272 | 64 | 1,487 | 1,881 | 3,368 | 13 | 26 | 13 | 39 |
| ශ්‍රී ලංකාව | 366 | 314,448 | 234,858 | 549,306 | 1,018 | 10,332 | 5,557 | 15,889 | 559 | 5,209 | 4,468 | 9,677 |

## වගු අංක 7.2.2
## දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව ලෙස වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

| දිස්ත්‍රික්කය | අලිගැටපේර | | | | කිලෝපේර | | | | දූරියන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 28 | 67 | 41 | 108 | 9 | 12 | 15 | 27 | 14 | 28 | 35 | 63 |
| ගම්පහ | 116 | 241 | 317 | 558 | 22 | 89 | 55 | 144 | 86 | 221 | 968 | 1,189 |
| කළුතර | 34 | 153 | 39 | 192 | 9 | 58 | 1 | 59 | 25 | 61 | 142 | 203 |
| මහනුවර | 124 | 899 | 166 | 1,065 | 19 | 189 | 11 | 200 | 54 | 122 | 65 | 187 |
| මාතලේ | 49 | 1,705 | 633 | 2,338 | 10 | 183 | 52 | 235 | 21 | 35 | 45 | 80 |
| නුවරඑළිය | 11 | 151 | 42 | 193 | 2 | 100 | - | 100 | 6 | 6 | 18 | 24 |
| ගාල්ල | 35 | 78 | 34 | 112 | 5 | 8 | 5 | 13 | 15 | 29 | 16 | 45 |
| මාතර | 75 | 214 | 107 | 321 | 8 | 49 | 4 | 53 | 42 | 73 | 51 | 124 |
| හම්බන්තොට | 7 | 9 | 3 | 12 | 3 | 2 | 1 | 3 | - | - | - | - |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | 1 | 30 | - | 30 | 1 | - | 10 | 10 | - | - | - | - |
| වව්නියාව | 4 | 27 | 36 | 63 | - | - | - | - | 1 | - | 2 | 2 |
| මුලතිව් | - | - | - | - | 1 | 1 | - | 1 | - | - | - | - |
| කිළිනොච්චිය | 1 | 3 | - | 3 | 2 | 6 | 23 | 29 | - | - | - | - |
| මඩකළපුව | 4 | 11 | 10 | 21 | 9 | 34 | 61 | 95 | - | - | - | - |
| අම්පාර | 1 | - | 2 | 2 | 4 | 36 | 51 | 87 | 1 | - | 2 | 2 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | 1 | - | 20 | 20 | - | - | - | - |
| කුරුණෑගල | 198 | 459 | 331 | 790 | 83 | 904 | 253 | 1,157 | 42 | 76 | 91 | 167 |
| පුත්තලම | 46 | 80 | 190 | 270 | 79 | 5,571 | 4,246 | 9,817 | 6 | 15 | 53 | 68 |
| අනුරාධපුරය | 3 | - | 23 | 23 | 14 | 378 | 233 | 611 | 1 | - | 10 | 10 |
| පොළොන්නරුව | 4 | 7 | 8 | 15 | 3 | - | 100 | 100 | 1 | - | 2 | 2 |
| බදුල්ල | 16 | 98 | 13 | 111 | 4 | 130 | 23 | 153 | 2 | 2 | 3 | 5 |
| මොණරාගල | 3 | 9 | 12 | 21 | 9 | 152 | 2 | 154 | - | - | - | - |
| රත්නපුරය | 60 | 157 | 53 | 210 | 7 | 16 | 13 | 29 | 58 | 98 | 159 | 257 |
| කෑගල්ල | 40 | 116 | 48 | 164 | 9 | 14 | 7 | 21 | 49 | 134 | 440 | 574 |
| ශ්‍රී ලංකාව | 860 | 4,514 | 2,108 | 6,622 | 313 | 7,932 | 5,186 | 13,118 | 424 | 900 | 2,102 | 3,002 |

## වගු අංක 7.2.2
## දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව ලෙස වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

| දිස්ත්‍රික්කය | දොඩම් | | | | දෙහි | | | | මැංගුස් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 11 | 67 | 31 | 98 | 18 | 114 | 8 | 122 | 24 | 290 | 24 | 314 |
| ගම්පහ | 37 | 129 | 89 | 218 | 89 | 720 | 127 | 847 | 55 | 230 | 33 | 263 |
| කළුතර | 17 | 39 | 67 | 106 | 29 | 99 | 63 | 162 | 39 | 179 | 122 | 301 |
| මහනුවර | 59 | 1,087 | 190 | 1,277 | 47 | 466 | 35 | 501 | 27 | 89 | 11 | 100 |
| මාතලේ | 36 | 821 | 304 | 1,125 | 38 | 673 | 92 | 765 | 9 | 40 | - | 40 |
| නුවරඑළිය | 4 | 12 | 25 | 37 | 2 | 2 | - | 2 | 3 | 7 | 1 | 8 |
| ගාල්ල | 38 | 143 | 534 | 677 | 34 | 93 | 116 | 209 | 31 | 84 | 22 | 106 |
| මාතර | 36 | 237 | 312 | 549 | 51 | 250 | 481 | 731 | 49 | 119 | 20 | 139 |
| හම්බන්තොට | 12 | 59 | 198 | 257 | 16 | 231 | 78 | 309 | - | - | - | - |
| යාපනය | - | - | - | - | 2 | - | 25 | 25 | - | - | - | - |
| මන්නාරම | 2 | 2 | 5 | 7 | 4 | 4 | 100 | 104 | - | - | - | - |
| වව්නියාව | 3 | 50 | 44 | 94 | 4 | 48 | 39 | 87 | - | - | - | - |
| මුලතිව් | 2 | 20 | - | 20 | 7 | 24 | 15 | 39 | - | - | - | - |
| කිළිනොච්චිය | 1 | 1 | 3 | 4 | 5 | 13 | 24 | 37 | - | - | - | - |
| මඩකළපුව | 12 | 59 | 76 | 135 | 11 | 27 | 37 | 64 | - | - | - | - |
| අම්පාර | 5 | 148 | 217 | 365 | 4 | 30 | 70 | 100 | - | - | - | - |
| ත්‍රිකුණාමලය | 3 | - | 80 | 80 | 2 | 5 | 30 | 35 | - | - | - | - |
| කුරුණෑගල | 182 | 1,606 | 822 | 2,428 | 325 | 2,053 | 1,692 | 3,745 | 30 | 111 | 13 | 124 |
| පුත්තලම | 196 | 2,183 | 1,291 | 3,474 | 213 | 1,625 | 1,507 | 3,132 | 9 | 5 | 10 | 15 |
| අනුරාධපුරය | 27 | 241 | 255 | 496 | 23 | 350 | 216 | 566 | - | - | - | - |
| පොළොන්නරුව | 13 | 129 | 366 | 495 | 13 | 86 | 93 | 179 | - | - | - | - |
| බදුල්ල | 19 | 1,605 | 618 | 2,223 | 13 | 197 | 210 | 407 | 3 | 3 | 5 | 8 |
| මොණරාගල | 12 | 589 | 104 | 693 | 15 | 386 | 50 | 436 | - | - | - | - |
| රත්නපුරය | 35 | 103 | 237 | 340 | 52 | 309 | 93 | 402 | 47 | 199 | 64 | 263 |
| කෑගල්ල | 23 | 81 | 37 | 118 | 17 | 31 | 4 | 35 | 18 | 34 | 19 | 53 |
| ශ්‍රී ලංකාව | 785 | 9,411 | 5,905 | 15,316 | 1,034 | 7,836 | 5,205 | 13,041 | 344 | 1,390 | 344 | 1,734 |

## වගු අංක 7.2.2

### දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව ලෙස වගා කරන ලද පළතුරු බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

| දිස්ත්‍රික්කය | මිදි | | | |
|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 2 | 9 | 10 | 19 |
| ගම්පහ | 6 | 17 | 9 | 26 |
| කළුතර | - | - | - | - |
| මහනුවර | 4 | 6 | 4 | 10 |
| මාතලේ | 1 | 393 | 137 | 530 |
| නුවරඑළිය | 1 | 46 | 24 | 70 |
| ගාල්ල | - | - | - | - |
| මාතර | - | - | - | - |
| හම්බන්තොට | 1 | 8 | 5 | 13 |
| යාපනය | - | - | - | - |
| මන්නාරම | | | | - |
| වව්නියාව | | | | - |
| මුලතිව් | | | | - |
| කිළිනොච්චිය | | | | - |
| මඩකළපුව | | | | - |
| අම්පාර | | | | - |
| ත්‍රිකුණාමලය | | | | - |
| කුරුණෑගල | 15 | 54 | 46 | 100 |
| පුත්තලම | 9 | 83 | 58 | 141 |
| අනුරාධපුරය | | | | - |
| පොළොන්නරුව | | | | - |
| බදුල්ල | | | | - |
| මොණරාගල | 1 | 3 | 7 | 10 |
| රත්නපුරය | 1 | 7 | 9 | 16 |
| කෑගල්ල | 2 | 3 | 5 | 8 |
| ශ්‍රී ලංකාව | 43 | 629 | 314 | 943 |

## 7.3 වෙනත් ස්ථිර බෝග වගාව පිළිබඳ තොරතුරු

ආර්ථික සංගණනයේ වතු ආශ්‍රිත තොරතුරු රැස්කිරීම අනුව වෙනත් ස්ථිර බෝග වගාව පිළිබඳව ද තොරතුරු එක්රැස් කරන ලද අතර වෙනත් ස්ථිර බෝග වගාකර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණයන් ඒක් එක් බෝගය යටතේ ගණන් ගන්නා ලදී. ප්‍රධාන වශයෙන්ම කජු, උක් හා කොස් යන ස්ථිර බෝග වගාවන් පිළිබඳ තොරතුරු ක්‍රමවත් වගාව යටතේ සහ විසිරි වගාව යටතේ එක්රැස් කරන ලදී.

### 7.3.1 දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත් වගාව යටතේ වෙනත් ස්ථිර බෝග වගා කර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

ආර්ථික සංගණනය 2013/14, යටතේ වතු ආශ්‍රිත තොරතුරු ලබා ගැනීමේ අදියරයේ දී වෙනත් ස්ථිර බෝග ක්‍රමවත් ව වගා කර ඇති වතු හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය පිළිබඳ ව තොරතුරු ලබා ගන්නා ලද අතර ඒ අනුව කජු, උක් හා කොස්, වගාවන් පිළිබඳ ව තොරතුරු රැස් කරන ලදී.

වතු අංශයේ කජු වගාව පිළිබඳ ව සලකා බැලීමේ දී වතු 444 ක අක්කර 8,238 බිම් ප්‍රමාණයක් පුරා කජු වගාව ව්‍යාප්ත ව ඇති බව කිව හැකිය. මෙයින් අක්කර 5,689 ක් මුළු බිම් ප්‍රමාණයෙන් 69% ක ප්‍රතිශතය, ඵලදාව ලබා ගන්නා කජු වගාව ලෙස වාර්තා වී ඇත. ඉතිරි අක්කර 2,549 ක බිම් ප්‍රමාණය තවමත් ඵලදාව ලබා ගත නොහැකි වගාවන් වේ. ක්‍රමවත් වගාව යටතේ කජු වැඩියෙන් ම වගා කර ඇති වතු වාර්තා වී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයෙනි. එය වතු 244 ක් වන අතර මුළු වතු සංඛ්‍යාවෙන් 55% ක් වේ. එමෙන්ම වැඩිම බිම් ප්‍රමාණය ද පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය ඵලදාව ලබා ගන්නා අක්කර 3,770 ක් හා ඵලදාව නොගන්නා අක්කර 682 ක් ලෙස, බිම් ප්‍රමාණය අක්කර 4,452 කි. මුළු බිම් ප්‍රමාණයෙන් 54% කි. කජු වගාව අඩුවෙන් ම ව්‍යාප්තව ඇත්තේ මාතර දිස්ත්‍රික්කයේ වන අතර එය අක්කර 02 ක බිම් ප්‍රමාණයකි. අඩුම කජු වගා කර ඇති වතු ගණන (01) වව්නියාව දිස්ත්‍රික්කයේ වේ.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 05 ක වතු 20 ක උක් වගා කර ඇති බව සංගණන වාර්තා පෙන්වා දෙන අතර එය බිම් ප්‍රමාණ වශයෙන් අක්කර 4,881 කි. එහි ඵලදාව ලබා ගන්නා අක්කර 4,468 ක මුළු බිම් ප්‍රමාණයෙන් 91.5% ක බිම් ප්‍රමාණයක් හා අළුත් වගාව අක්කර 413 ක් ඇති බව පෙන්වා දිය හැකිය. ක්‍රමවත් වගාව යටතේ උක් වගාව වැඩිම ව්‍යාප්තිය පෙන්වන දිස්ත්‍රික්කය මොණරාගල වන අතර එම දිස්ත්‍රික්කයෙ හි වතු 15 ක අක්කර 4,323 ක බිම් ප්‍රමාණයක් තුළ උක් වගා කර ඇති අතර මෙම වගාවෙන් 96.16% ක භූමියක් එනම් අක්කර 4,157 දැනටමත් ඵලදාව ගබා ගන්නා වගාව වේ. මෙම උක් වගා කර ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය, මුළු උක් වගා කර ඇති වතු සංඛ්‍යාවෙන් හා මුළු බිම් ප්‍රමාණයෙන් පිළිවෙලින් 75% ක හා 88.6% ක ප්‍රතිශතයන් ගනී. අම්පාර, ත්‍රිකුණාමලය හා රත්නපුරය යන දිස්ත්‍රික්ක වල අඩුම උක් වගා කර ඇති වතු සංඛ්‍යාව (01) වාර්තා වන අතර අඩුම උක් වගා බිම් ප්‍රමාණය (අක්කර 02) වාර්තා වී ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයෙනි.

ක්‍රමවත් වගාව යටතේ වතු අංශයේ කොස් වගා ව්‍යාප්තිය, දිස්ත්‍රික්ක 12 ක වතු 42 ක් පුරා ඇති බව සංගණන තොරතුරු පෙන්වා දී ඇත. මෙම වතු 12 හි අක්කර 260 ක භූමියක ක්‍රමවත් කොස් වගාව ඇති අතර එම භූමි ප්‍රමාණයෙන් 80% ක් වූ අක්කර 209 ක ඵලදාව ලබා ගන්නා කොස් වගාවක් ඇත. ඉතිරි අක්කර 51 ක, එනම් 20% ක භූමිය තවමත් පැල තත්වයේ ඇති කොස් වගාව බවට වාර්තා වේ. කොස් වගා කර ඇති වතු වැඩිම සංඛ්‍යාව (08) වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එය මුළු වතු සංඛ්‍යාවෙන් 19% ක් වන අතර වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 83), එනම් මුළු බිම් ප්‍රමාණයෙන් 31.92% වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. මෙම අක්කර 83 වූ වතු බිම් ප්‍රමාණය ම ඵලදාව සහිත වතු වේ. කොස් වතු අඩුම සංඛ්‍යාව වාර්තා වන්නේ ද අඩුම බිම් ප්‍රමාණය වාර්තා වන්නේ ද නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි.වතු සංඛ්‍යාව 01 ක් වන අතර බිම් ප්‍රමාණය අක්කර 01 කි.

## වගු අංක 7.3.1

### දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවත් ලෙස වගා කරන ලද වෙනත් ස්ථිර බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | කජු | | | | උක් | | | | කොස් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව | වතු ගණන | ඵල දරණ බිම් ප්‍රමාණය (අක්කර) | ඵල නොදරණ පැල සහිත බිම් ප්‍රමාණය (අක්කර) | එකතුව |
| කොළඹ | - | - | - | - | - | - | - | - | 2 | 83 | - | 83 |
| ගම්පහ | 5 | 7 | 5 | 12 | - | - | - | - | 5 | 29 | 7 | 36 |
| කළුතර | 2 | 1 | 2 | 3 | - | - | - | - | 2 | 2 | - | 2 |
| මහනුවර | - | - | - | - | - | - | - | - | 4 | - | 30 | 30 |
| මාතලේ | 15 | 220 | 59 | 279 | - | - | - | - | 5 | 62 | - | 62 |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | 1 | 1 | - | 1 |
| ගාල්ල | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මාතර | 2 | 2 | - | 2 | - | - | - | - | - | - | - | - |
| හම්බන්තොට | 9 | 9 | 40 | 49 | - | - | - | - | - | - | - | - |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | 2 | 300 | 800 | 1,100 | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 1 | - | 3 | 3 | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | 3 | 29 | 10 | 39 | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | 9 | 3 | 62 | 65 | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | 4 | 300 | 269 | 569 | - | - | - | - | - | - | - | - |
| අම්පාර | 4 | 87 | 19 | 106 | 1 | 148 | 245 | 393 | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | 1 | 23 | - | 23 | - | - | - | - |
| කුරුණෑගල | 101 | 842 | 179 | 1,021 | - | - | - | - | 8 | 15 | 1 | 16 |
| පුත්තලම | 244 | 3,770 | 682 | 4,452 | - | - | - | - | 3 | 1 | 1 | 2 |
| අනුරාධපුරය | 10 | 43 | 208 | 251 | - | - | - | - | 2 | 6 | 1 | 7 |
| පොළොන්නරුව | 5 | 5 | 160 | 165 | - | - | - | - | - | - | - | - |
| බදුල්ල | 5 | 22 | - | 22 | 2 | - | 2 | 2 | - | - | - | - |
| මොණරාගල | 17 | 47 | 44 | 91 | 15 | 4,157 | 166 | 4,323 | 2 | 2 | - | 2 |
| රත්නපුරය | 6 | 2 | 7 | 9 | 1 | 140 | - | 140 | 3 | 2 | 11 | 13 |
| කෑගල්ල | - | - | - | - | - | - | - | - | 5 | 6 | - | 6 |
| ශ්‍රී ලංකාව | 444 | 5,689 | 2,549 | 8,238 | 20 | 4,468 | 413 | 4,881 | 42 | 209 | 51 | 260 |

### 7.3.2 : දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව යටතේ වෙනත් ස්ථිර බෝග වගා කර ඇති වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

වතු ආශ්‍රිත තොරතුරු ලබා ගැනීමේ අදියරයේ දී වෙනත් ස්ථි බෝග විසිරි වගාව ලෙස වගා කර ඇති වතු හා ඒ යටතේ ඇති ගස් ගණන පිළිබඳ ව තොරතුරු ලබා ගන්නා ලද අතර ඒ අනුව කජු, උක් හා කොස් වගාවන් පිළිබඳ ව තොරතුරු එක්රැස් කරන ලදී.

විසිරි වගාව ලෙස කජු වගාව පිළිබඳ ව සලකා බැලීමේ දී වතු 1,914 කට අයත් භූමියේ කජු වගා කර ඇති බව සංගණන වාර්තා පෙන්වා දී ඇත. ඒ අනුව එම වතු වල කජු ගස් 102,359 ක් ඇති බවත් එම ගස් සංඛ්‍යාවෙන් 78.39% වූ ගස් 80,244 ක් ඵල දරණ කජු වගාව බවත් වාර්තා වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වතු 783 ක කජු වගා කර ඇති අතර එය වැඩිම වතු සංඛ්‍යාව වේ. එය මුළු වතු සංඛ්‍යාවෙන් 41% ප්‍රතිශතයකි. වැඩිම කජු ගස් ගණන වාර්තා වී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයෙන් වන අතර එය ගස් 36,424 ක් හා මුළු කජු ගස් ගණනින් 35.6% ප්‍රතිශතයක් ගනී. එයට ඵලදාව සහිත කජු ගස් 30,775 ක් අයත් වේ. විසිරි වගා ලෙස කජු වගා කර ඇති වතු අඩුම සංඛ්‍යාව (01) නුවරඑළිය හා අම්පාර දිස්ත්‍රික්ක වලින් වාර්තා වන අතර නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් අඩුම ගස් ගණන (01) වාර්තා වේ.

උක් වගාව ද විසිරි වගාවක් ලෙස වතු 79 ක ඇති බවට වාර්තා වී ඇත. එම වතු වල ගස් 550 ක් වාර්තා වී ඇති අතර ඉන් ගස් 507 ක් වූ 92.18% ක් ඵල දරණ උක් වගාව ලෙස සඳහන් වේ. විසිරි වගාව යටතේ උක් වගාව සහිත වතු වැඩියෙන් ම ඇති දිස්ත්‍රික්කය ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය ලෙස වාර්තා වන අතර වතු සංඛ්‍යාව 27 කි. එය මුළු උක් වගා කර ඇති වතු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස 34% ක් වේ. වැඩිම උක් ගස් ගණන ලෙස ගස් 150 ක් එනම් මුළු ගස් ගණනින් 27% ක් වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. වතු 01 වශයෙන් අඩුම වතු සංඛ්‍යාව දිස්ත්‍රික්ක 08 ක වාර්තා වන අතර අඩුම ගස් ගණන (01) මුලතිව් දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

සංගණනයේ දී ලබා ගන්නා ලද තොරතුරු වලට අනුව වතු ආශ්‍රිත විසිරි වගාවක් ලෙස කොස් වගාව වතු 2,839 ක ඇති අතර ගස් ගණන 88,248 ක් වේ. මෙම ගස් ගණනින් 75% ක ගස් 66,490 ක් ඵල දරණ ගස් ලෙස ව්‍යාප්තව ඇති අතර ගස් 21,758 ක් එනම් 25% ඵල නොදරණ පැළ සහිත අළුත් වගාව වේ. විසිරි කොස් වගාව සහිත වැඩිම වතු සංඛ්‍යාව (888) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති අතර එය මුළු වතු සංඛ්‍යාවෙන් 31% ක් වන විට වැඩිම ගස් ගණන ලෙස ගස් 28,518 ක් වූ, මුළු ගස් ගණනින් 32.31% ක් වාර්තා වන්නේ මාතර දිස්ත්‍රික්කයෙනි. අඩුම වතු සංඛ්‍යාව (01) මෙන්ම අඩුම ගස් ගණන ද (03) යාපනය දිස්ත්‍රික්කයේ ඇති බවට පෙන්වා දිය හැකිය.

## වගු අංක 7.3.2

### දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වගාව ලෙස වගා කරන ලද වෙනත් ස්ථිර බෝග සහිත වතු සංඛ්‍යාව හා ඒ යටතේ ඇති ගස් ගණන

| දිස්ත්‍රික්කය | කජු | | | | උක් | | | | කොස් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව | වතු ගණන | ඵල දරණ ගස්/වැල්/පඳුරු ගණන | ඵල නොදරණ ගස්/වැල්/පඳුරු ගණන | එකතුව |
| කොළඹ | 21 | 69 | 25 | 94 | 2 | 2 | 3 | 5 | 67 | 2,170 | 369 | 2,539 |
| ගම්පහ | 216 | 2,438 | 355 | 2,793 | 7 | 11 | - | 11 | 338 | 5,816 | 834 | 6,650 |
| කළුතර | 29 | 94 | 28 | 122 | 3 | 14 | - | 14 | 96 | 1,641 | 376 | 2,017 |
| මහනුවර | 16 | 363 | 327 | 690 | 3 | 4 | 5 | 9 | 179 | 12,422 | 1,336 | 13,758 |
| මාතලේ | 37 | 3,442 | 1,995 | 5,437 | 1 | 10 | - | 10 | 121 | 10,742 | 1,057 | 11,799 |
| නුවරඑළිය | 1 | 1 | - | 1 | 1 | 150 | - | 150 | 18 | 803 | 52 | 855 |
| ගාල්ල | 20 | 104 | 39 | 143 | 6 | 30 | - | 30 | 114 | 1,776 | 191 | 1,967 |
| මාතර | 38 | 20,466 | 246 | 20,712 | 6 | 52 | - | 52 | 174 | 13,292 | 15,226 | 28,518 |
| හම්බන්තොට | 26 | 344 | 100 | 444 | - | - | - | - | 35 | 506 | 84 | 590 |
| යාපනය | - | - | - | - | - | - | - | - | 1 | - | 3 | 3 |
| මන්නාරම | 2 | 11 | - | 11 | - | - | - | - | 2 | 8 | - | 8 |
| වව්නියාව | 2 | 21 | 31 | 52 | 1 | 10 | 5 | 15 | 4 | 65 | 19 | 84 |
| මුලතිව් | 11 | 119 | 53 | 172 | 1 | 1 | - | 1 | 11 | 18 | 4 | 22 |
| කිළිනොච්චිය | 13 | 95 | 11 | 106 | 1 | 2 | - | 2 | 21 | 59 | 105 | 164 |
| මඩකළපුව | 17 | 567 | 1,167 | 1,734 | 1 | - | 2 | 2 | 10 | 5 | 48 | 53 |
| අම්පාර | 1 | 10 | - | 10 | 2 | - | 20 | 20 | 6 | 19 | 50 | 69 |
| ත්‍රිකුණාමලය | 3 | - | 130 | 130 | 1 | 60 | - | 60 | 2 | 5 | 8 | 13 |
| කුරුණෑගල | 783 | 16,991 | 11,266 | 28,257 | 27 | 73 | 7 | 80 | 888 | 8,848 | 892 | 9,740 |
| පුත්තලම | 550 | 30,775 | 5,649 | 36,424 | 5 | 6 | - | 6 | 359 | 1,585 | 226 | 1,811 |
| අනුරාධපුරය | 26 | 3,129 | 175 | 3,304 | 3 | 4 | 1 | 5 | 31 | 461 | 97 | 558 |
| පොළොන්නරුව | 7 | 36 | 226 | 262 | - | - | - | - | 9 | 47 | 72 | 119 |
| බදුල්ල | 6 | 133 | - | 133 | 2 | 2 | - | 2 | 28 | 671 | 33 | 704 |
| මොණරාගල | 10 | 509 | 42 | 551 | - | - | - | - | 18 | 208 | 26 | 234 |
| රත්නපුරය | 50 | 401 | 221 | 622 | 5 | 61 | - | 61 | 202 | 2,985 | 514 | 3,499 |
| කෑගල්ල | 29 | 126 | 29 | 155 | 1 | 15 | - | 15 | 105 | 2,338 | 136 | 2,474 |
| ශ්‍රී ලංකාව | 1,914 | 80,244 | 22,115 | 102,359 | 79 | 507 | 43 | 550 | 2,839 | 66,490 | 21,758 | 88,248 |

# 8 පරිච්ඡේදය කාලීන බෝග පිළිබඳ තොරතුරු

## 8.1 වී වගාව

වතු පිළිබඳ තොරතුරු රැස්කිරිමේ අදියරේදී වී වගාව පිළිබඳ රැස් කරන ලද තොරතුරු වලට අනුව වී වගාව සඳහා බිම් සුදානම් කර තිබූ (අස්වද්දන ලද) කුඹුරු සහිත මුළු වතු සංඛ්‍යාව 1,522 ක් වන අතර බිම් ප්‍රමාණය අක්කර 6,175 ක් ලෙසින් වාර්තා වී ඇත. මේ යටතේ වී වගාව සඳහා අස්වද්දන ලද වැඩිම කුඹුරු සහිත වතු (722) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශතාත්මකව ගත් කල අස්වද්දන ලද කුඹුරු සහිත වතු සංඛ්‍යාවෙන් 47.43% කි. මෙහිදී වාර්තා වන අඩුම අස්වද්දන ලද කුඹුරු සහිත වතු සංඛ්‍යාව (2) නුවරඑළිය , මන්නාරම හා මඩකළපුව යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. වී වගාව සඳහා අස්වද්දන ලද වැඩිම බිම් ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය අක්කර 2,475 කි. එය වී වගාව සඳහා අස්වද්දන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 40% කි. මෙහිදී අස්වද්දන ලද අඩුම බිම් ප්‍රමාණය වන අක්කර 5 වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වන අතර එය අස්වද්දන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 0.08% කි.

### වගු අංක 8.1.1

**දිස්ත්‍රික් මට්ටමින් වී වගාව යටතේ අස්වද්දන ලද හා වගා කරන ලද වතු සංඛ්‍යාවෙහි හා බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | අස්වද්දන ලද | | වගාකරන ලද | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2013/14 මහ කන්නය | | 2014 යල කන්නය | |
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 31 | 55 | 31 | 55 | 31 | 55 |
| ගම්පහ | 70 | 180 | 54 | 172 | 33 | 94 |
| කළුතර | 46 | 170 | 38 | 156 | 31 | 124 |
| මහනුවර | 14 | 25 | 12 | 22 | 9 | 13 |
| මාතලේ | 50 | 241 | 44 | 229 | 23 | 115 |
| නුවරඑළිය | 2 | 5 | 2 | 4 | 1 | 1 |
| ගාල්ල | 62 | 215 | 47 | 213 | 30 | 126 |
| මාතර | 112 | 381 | 91 | 370 | 87 | 345 |
| හම්බන්තොට | 40 | 250 | 33 | 250 | 20 | 134 |
| මන්නාරම | 2 | 17 | - | - | - | - |
| වව්නියාව | 6 | 54 | 6 | 53 | 4 | 18 |
| මුලතිව් | 8 | 50 | 8 | 50 | 4 | 25 |
| කිලිනොච්චිය | 45 | 258 | 40 | 257 | 19 | 113 |
| මඩකළපුව | 2 | 8 | 1 | 8 | - | - |
| අම්පාර | 4 | 32 | 3 | 29 | 2 | 17 |
| ත්‍රිකුණාමලය | 4 | 128 | 4 | 115 | 3 | 78 |
| කුරුණෑගල | 722 | 2,475 | 526 | 2,470 | 454 | 2,039 |
| පුත්තලම | 92 | 335 | 72 | 329 | 37 | 157 |
| අනුරාධපුරය | 33 | 404 | 25 | 321 | 19 | 174 |
| පොළොන්නරුව | 23 | 312 | 20 | 308 | 10 | 121 |
| බදුල්ල | 12 | 45 | 10 | 42 | 4 | 21 |
| මොණරාගල | 47 | 285 | 44 | 285 | 27 | 158 |
| රත්නපුරය | 65 | 168 | 43 | 164 | 21 | 95 |
| කෑගල්ල | 30 | 82 | 21 | 59 | 14 | 38 |
| **ශ්‍රී ලංකාව** | **1,522** | **6,175** | **1,175** | **5,961** | **883** | **4,061** |

**සිතියම් අංක 05 - වතු අංශය යටතේ 2013/14 මහ කන්නයේ දිස්ත්‍රික්ක අනුව වී වගා කර ඇති බිම් ප්‍රමාණය**



සිතියම් අංක 06 - වතු අංශය යටතේ 2014 යල කන්නයේ දිස්ත්‍රික්ක අනුව වී වගා කර ඇති බිම් ප්‍රමාණය



වතු ආශ්‍රිතව අස්වද්දන ලද කුඹුරුවල 2013/14 මහ කන්නයේදි වතු 1,175 ක අක්කර 5,961 ක් තුළ වී වගා කොට ඇත. මෙම කන්නයේ දී වී වගා කර ඇති වැඩිම වතු සංඛ්‍යාව (526) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර අඩුම වතු සංඛ්‍යාව (1) මඩකළපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. වී වගා කොට ඇති බිම් ප්‍රමාණ අනුව සළකා බැලීමේ දී වී වගාව සඳහා වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 2,470) යොදා ගෙන ඇත්තේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එය මහ කන්නයේ වී වගා කර ඇති සමස්ත බිම් ප්‍රමාණයෙන් 41.43% ක් ලෙස දැක්විය හැකිය. මෙම කන්නයේදී වී වගාව සඳහා භාවිත කර ඇති අඩුම බිම් ප්‍රමාණය වන අක්කර 4 නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය වී වගා කර ඇති සමස්ත බිම් ප්‍රමාණයෙන් 0.06% කි. මන්නාරම දිස්ත්‍රික්කයේ අස්වද්දන ලද කුඹුරු වල මහ කන්නයේදී වී වගා කර නොමැති බව වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2014 යල කන්නයේදී වතු 883 ක අක්කර 4,061 ක වී වගා කර ඇති බව වාර්තා වේ. එයින් වැඩිම වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය පිළිවෙලින් වතු 454 ක් හා අක්කර 2,039 කි. එය 2014 යල කන්නයේ දී වී වගා කළ සමස්ත බිම් ප්‍රමාණයෙන් 50.2% කි. අඩුම වතු සංඛ්‍යාව (1) හා බිම් ප්‍රමාණය (අක්කර 1) නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය 2014 යල කන්නයේ වී වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 0.02% කි. මන්නාරම හා මඩකළපුව යන දිස්ත්‍රික්කවල 2014 යල කන්නයේදී වී වගාව සිදු කර නොමැත.

ඒ අනුව සමස්තයක් ලෙස ගත් කල 2013/2014 වගා වර්ෂය සැළකිමේදී වතු ආශ්‍රිතව වැඩි වශයෙන් වී වගාව සඳහා යොමු වී ඇති කන්නය මහ කන්නය වන අතර එය 59% ක ප්‍රතිශතයකි. යල කන්නයේ වී වගා කිරිමේ ප්‍රතිශතය 41% ක් ලෙස දැකිය හැක.

**රූප සටහන 8.1**

**කන්න අනුව වී වගා කර ඇති බිම් ප්‍රමාණය - 2013/2014**



## 8.2 වෙනත් කාලීන බෝග වගාව

ආර්ථික සංගණනය 2013/14, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී වතු අංශය යටතේ වෙනත් කාලීන බෝග වගාව පිළිබඳ සංඛ්‍යාති ද රැස් කරන ලදී. ඒ යටතේ 2013/14 මහ කන්නය හා 2014 යල කන්නය තුළ වගා කරන ලද ප්‍රධාන කාලීන බෝග වර්ග, එළවළු වර්ග හා පලා වර්ග පිළිබඳ සංඛ්‍යාති මෙම පරිච්ඡේදයේදී විස්තර කරනු ලැබේ.

### 8.2.1. ප්‍රධාන කාලීන බෝග වර්ග

### 8.2.1.1 දිස්ත්‍රික්ක මට්ටමින් 2013/14 මහ කන්නයේ ප්‍රධාන කාලීන බෝග වගාව

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ සිදු කර ඇති ප්‍රධාන කාලීන බෝග යටතේ වැඩියෙන්ම වගා කර ඇති බෝගය වන්නේ මඤ්ඤොක්කා වන අතර මඤ්ඤොක්කා වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 3,115 ක් ලෙස වාර්තා වී ඇත. එය ප්‍රධාන කාලීන බෝග වගාව යටතේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 73.92% කි. මඤ්ඤොක්කා වගාව සඳහා භාවිත කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 726) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර මඤ්ඤොක්කා වගා කරන දිස්ත්‍රික්ක අතුරින් අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) යාපනය, මන්නාරම, වව්නියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ මිරිස් වගාව සිදු කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 472 කි. මිරිස් වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 129) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර මිරිස් වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) ගම්පහ, නුවරඑළිය, මන්නාරම, වව්නියාව හා මුලතිව් යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

දිස්ත්‍රික්ක 3 ක වතු ආශ්‍රිතව රතු ළූණු වගා කර ඇති අතර මුළු බිම් ප්‍රමාණය අක්කර 55 කි. යාපනය (අක්කර 30), පුත්තලම (අක්කර 24) හා කුරුණෑගල (අක්කර 1) යන දිස්ත්‍රික්ක රතු ළූණු වගා කර ඇති දිස්ත්‍රික්ක ලෙස හඳුනාගත හැකිය.

ප්‍රධාන කාලීන බෝග වගාව යටතේ වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ වාර්තා වී ඇති බඩ ඉරිඟු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 75 කි. බඩ ඉරිඟු වගාව සඳහා භාවිත කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 22) බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) ගම්පහ හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ.

නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක දෙකෙහි පමණක් වතු ආශ්‍රිතව අර්තාපල් වගාව සම්බන්ධව තොරතුරු වාර්තා වන අතර එහි බිම් ප්‍රමාණය පිළිවෙලින් අක්කර 29 ක් හා අක්කර 37 ක් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව වතු ආශ්‍රිතව අර්තාපල් වගා කරන මුළු බිම් ප්‍රමාණය අක්කර 66 කි.

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ කුරක්කන් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 73 ක් වන අතර එහි වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 42) වාර්තා වන්නේ පොලොන්නරුව දිස්ත්‍රික්කයෙනි. කුරක්කන් වගා කර ඇති අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) මාතලේ, නුවරඑළිය, වව්නියාව හා අනුරාධපුර යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව මුං ඇට වගාව සම්බන්ධව වාර්තා වී ඇති තොරතුරු වලට අනුව මුං ඇට වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 86 කි. මෙහිදී මුං ඇට වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය අක්කර 38 ක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය අක්කර 1 ක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

දිස්ත්‍රික්ක 4 ක පමණක් වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ තල වගා කර ඇති අතර තල වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 59 ක් ලෙස වාර්තා වී ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 35 ක් ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 13 ක් ද, රත්නපුර දිස්ත්‍රික්කයේ අක්කර 10 ක් ද හා පුත්තලම දිස්ත්‍රික්කයේ අක්කර 1 ක් ද ලෙස තල වගා කර ඇති බව වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ රටකජු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 58 ක් ලෙස වාර්තා වී ඇත. රටකජු වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 23) මුලතිව් දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වව්නියාව හා පොලොන්නරුව යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ.

වතු ආශ්‍රිතව 2013/14 වගා වර්ෂයේ දී මහ කන්නය තුළ තොරතුරු රැස් කිරීමේ අදියරේදී ඉහත සඳහන් ප්‍රධාන කාලීන බෝග වලට අමතරව ලොකු ළූණු, කව්පි, උඳු, කහ, ඉඟුරු, සෝයා බෝංචි, බතල හා දුම්කොළ යන ප්‍රධාන කාලීන බෝග පිළිබඳව වාර්තා වී ඇති තොරතුරු වලට අනුව සැළකිය යුතු බිම් ප්‍රමාණයන් පිළිබඳව වාර්තා වී නොමැත.

### වගු අංක 8.2.1.1

### 2013/14 මහ කන්නය තුළ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රධාන කාලීන බෝග වගාව යටතේ ඇති බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | මිරිස් | රතු ළූණු | ලොකු ළූණු | බඩ ඉරිඟු | අර්තාපල් | කුරක්කන් | මුං ඇට | කව්පි | තල | උඳු | කහ | ඉඟුරු | සෝයා බෝංචි | රටකජු | මඤ්ඤොක්කා | බතල | දුම්කොළ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර |
| කොළඹ | 5 | - | - | - | - | - | - | - | - | - | 2 | - | - | - | 190 | 1 | - |
| ගම්පහ | 1 | - | - | 1 | - | - | - | - | - | - | - | - | - | - | 325 | 1 | - |
| කළුතර | 8 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 148 | - | - |
| මහනුවර | 4 | - | 2 | 6 | - | 3 | - | - | - | - | 15 | 3 | - | - | 130 | - | 1 |
| මාතලේ | 9 | - | 8 | 8 | - | 1 | - | - | - | - | - | - | - | - | 145 | 1 | - |
| නුවරඑළිය | 1 | - | - | - | 29 | 1 | - | - | - | - | 1 | - | - | - | 8 | - | - |
| ගාල්ල | 28 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 172 | - | - |
| මාතර | 13 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 222 | - | - |
| හම්බන්තොට | 20 | - | 2 | 1 | - | 3 | 38 | 3 | 13 | - | - | - | 2 | 4 | 105 | - | - |
| යාපනය | 40 | 30 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1 | - | - |
| මන්නාරම | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1 | - | - |
| වව්නියාව | 1 | - | - | - | - | 1 | - | - | - | 8 | - | - | - | 1 | 1 | - | - |
| මුලතිව් | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 23 | 1 | - | - |
| කිලිනොච්චිය | 30 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2 | - | - |
| මඩකලපුව | 26 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 6 | - | - |
| අම්පාර | 12 | - | - | - | - | - | - | 12 | - | - | - | - | - | - | 8 | - | - |
| ත්‍රිකුණාමලය | 2 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1 | - | - |
| කුරුණෑගල | 129 | 1 | - | 10 | - | - | 11 | - | 35 | - | - | 3 | - | 15 | 726 | - | - |
| පුත්තලම | 10 | 24 | 1 | 7 | - | 21 | - | 4 | 1 | 4 | - | - | - | 6 | 451 | - | - |
| අනුරාධපුර | 9 | - | - | 5 | - | 1 | 1 | - | - | 38 | - | - | 7 | - | 96 | - | - |
| පොලොන්නරුව | 27 | - | - | 15 | - | 42 | 2 | 1 | - | - | - | - | - | 1 | 151 | - | - |
| බදුල්ල | 31 | - | - | 22 | 37 | - | - | - | - | - | - | - | - | - | 18 | 1 | - |
| මොණරාගල | 42 | - | - | - | - | - | 32 | 8 | - | - | - | - | - | - | 31 | - | 2 |
| රත්නපුර | 12 | - | - | - | - | - | 2 | 11 | 10 | - | - | - | - | 8 | 25 | - | - |
| කෑගල්ල | 10 | - | - | - | - | - | - | - | - | - | 5 | 8 | - | - | 151 | - | - |
| **ශ්‍රී ලංකාව** | **472** | **55** | **13** | **75** | **66** | **73** | **86** | **39** | **59** | **50** | **23** | **14** | **9** | **58** | **3,115** | **4** | **3** |

### 8.2.1.2 දිස්ත්‍රික්ක මට්ටමින් 2014 යල කන්නයේ ප්‍රධාන කාලීන බෝග වගාව

වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ සිදු කර ඇති ප්‍රධාන කාලීන බෝග යටතේ වැඩිම බිම් ප්‍රමාණයක වගා කර ඇති බෝගය මඤ්ඤොක්කා වන අතර මඤ්ඤොක්කා වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 690 කි. මඤ්ඤොක්කා වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් වැඩිම බිම් ප්‍රමාණය අක්කර 478 ක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) හම්බන්තොට, වව්නියාව හා මොණරාගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ මිරිස් වගාව සඳහා අක්කර 682 ක බිම් ප්‍රමාණයක් භාවිත කර ඇති බව වාර්තා වී ඇත. මිරිස් වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 92) පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) නුවරඑළිය, මාතර, වව්නියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ.

වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ ලොකු ළූණු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 67 ක් වන අතර ලොකු ළූණු වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 28) වාර්තා වන්නේ මාතලේ දිස්ත්‍රික්කයෙනි. වතු ආශ්‍රිතව ලොකු ළූණු වගා කර ඇති අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) මහනුවර හා පුත්තලම යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ බඩ ඉඟුරු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 300 ක් ලෙස වාර්තා වී ඇත. බඩ ඉඟුරු වගා කරන දිස්ත්‍රික්ක අතුරින් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 73) බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක දෙකෙහි පමණක් වතු ආශ්‍රිතව අර්තාපල් වගාව සම්බන්ධව තොරතුරු වාර්තා වන අතර එහි බිම් ප්‍රමාණය පිළිවෙලින් අක්කර 132 ක් හා අක්කර 8 ක් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව වතු ආශ්‍රිතව අර්තාපල් වගා කරන මුළු බිම් ප්‍රමාණය අක්කර 140 කි.

2014 යල කන්නය තුළ මුං ඇට වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 55 ක් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව මුං ඇට වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් වැඩිම බිම් ප්‍රමාණය අක්කර 18 කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 2) රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

ප්‍රධාන කාලීන බෝග යටතේ වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ දී තල වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 378 කි. ඒ අනුව තල වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 196) අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 2) වාර්තා වන්නේ පුත්තලම දිස්ත්‍රික්කයෙනි.

වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ වාර්තා වී ඇති රටකජු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 61 කි. රටකජු වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 22) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වාර්තා වන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙනි.

2013/14 වගා වර්ෂයේ දී 2014 යල කන්නය තුළ වතු ආශ්‍රිතව තොරතුරු රැස් කිරීමේ අදියරේදී ඉහත සඳහන් ප්‍රධාන කාලීන බෝග වලට අමතරව රතු ළූණු, කුරක්කන්, කව්පි, උඳු, කහ, ඉඟුරු, සෝයා බෝංචි, බතල හා දුම්කොළ යන ප්‍රධාන කාලීන බෝග පිළිබඳව සැළකිය යුතු බිම් ප්‍රමාණයන් පිළිබඳව වාර්තා වී නොමැත.

**වගු අංක 8.2.1.2**

**2014 යල කන්නය තුළ දිස්ත්‍රික් මට්ටමින් වෙනත් කාලීන බෝග වගාව යටතේ බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | මිරිස් | රතු ළූණු | ලොකු ළූණු | බඩ ඉරිඟු | අර්තාපල් | කුරක්කන් | මුං ඇට | කව්පි | තල | උඳු | කහ | ඉඟුරු | සෝයා බෝංචි | රටකජු | මඤ්ඤෝක්කා | බතල | දුම්කොළ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය |
| කොළඹ | 9 | - | - | - | - | - | - | - | - | - | 2 | - | - | - | 30 | 1 | - |
| ගම්පහ | 56 | - | - | 1 | - | - | - | - | - | - | 1 | 4 | - | - | 51 | 1 | - |
| කළුතර | 48 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 4 | - | - |
| මහනුවර | 44 | - | 1 | 7 | - | - | - | 1 | - | - | - | 1 | - | - | 13 | - | - |
| මාතලේ | 6 | - | 28 | 51 | - | - | - | - | - | - | 1 | 3 | - | - | 3 | 3 | 3 |
| නුවරඑළිය | 1 | - | - | - | 132 | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | 38 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 5 | - | - |
| මාතර | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 3 | - | - |
| හම්බන්තොට | 6 | 1 | 6 | 4 | - | 1 | 14 | 8 | 5 | 1 | - | - | 1 | 6 | 1 | - | - |
| යාපනය | 5 | 22 | | | | 1 | | | | | | | | | | | |
| මන්නාරම | 5 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 1 | - | 5 | - | - | - | - | - | - | 1 | - | - | - | 3 | 1 | - | - |
| මුලතිව් | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 4 | - | - | - |
| කිලිනොච්චිය | 88 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකලපුව | 6 | - | - | 6 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | 8 | - | - | - | - | - | - | 2 | - | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | 1 | - | - | 11 | - | - | - | - | - | - | - | - | - | 1 | 2 | - | - |
| කුරුණෑගල | 77 | 1 | 12 | 13 | - | 2 | 18 | - | 64 | 4 | - | 19 | - | 22 | 478 | 2 | - |
| පුත්තලම | 92 | 20 | 1 | 13 | - | - | - | 3 | 2 | 3 | - | 2 | - | 14 | 43 | - | - |
| අනුරාධපුර | 70 | - | 7 | 71 | - | 2 | 9 | - | 196 | - | - | - | 21 | - | - | - | - |
| පොලොන්නරුව | 61 | - | 7 | 19 | - | - | 9 | 4 | 4 | - | - | - | 1 | 3 | 30 | 1 | 1 |
| බදුල්ල | 2 | - | - | 73 | 8 | 1 | - | - | 60 | - | - | - | - | - | - | - | - |
| මොණරාගල | 32 | - | - | 31 | - | - | 3 | 3 | 25 | - | 1 | 1 | - | - | 1 | - | - |
| රත්නපුර | 2 | - | - | - | - | 2 | 2 | 3 | 22 | - | - | - | - | 8 | 25 | 1 | - |
| කෑගල්ල | 22 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **ශ්‍රී ලංකාව** | **682** | **44** | **67** | **300** | **140** | **9** | **55** | **24** | **378** | **9** | **5** | **30** | **23** | **61** | **690** | **9** | **4** |

## 8.2.2 එළවළු වර්ග

### 8.2.2.1 දිස්ත්‍රික්ක මට්ටමින් 2013/14 මහ කන්නයේ එළවළු වගාව

වතු ආශ්‍රිත එළවළු වගාව සැළකිමේදී 2013/14 මහ කන්නය තුළ වැඩිම බිම් ප්‍රමාණයක් වගා කර ඇත්තේ වම්බටු වන අතර එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 1,378 කි. වම්බටු වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 824) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) කොළඹ, මන්නාරම හා අනුරාධපුර යන දිස්ත්‍රික්කවලින් ද වාර්තා වී ඇත.

2013/14 මහ කන්නය තුළ වතු ආශ්‍රිතව දෙවනුවට වැඩිම බිම් ප්‍රමාණයක් වගා කර ඇත්තේ බණ්ඩක්කා වන අතර එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 1,337 කි. බණ්ඩක්කා වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 902) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) නුවරඑළිය, වව්නියාව, අම්පාර හා බදුල්ල යන දිස්ත්‍රික්කවලින් ද වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නයේදි තෙවනුවට වැඩියෙන්ම වගා කර ඇති එළවළුව වන්නේ තක්කාලි වන අතර එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 1,077 කි. තක්කාලි වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 624) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) නුවරඑළිය, මාතර හා මන්නාරම යන දිස්ත්‍රික්කවලින් ද වාර්තා වී ඇත.

දිස්ත්‍රික්ක 4 ක බෝංචි වගාව සම්බන්ධව තොරතුරු වාර්තා වන අතර බෝංචි වගා කරන මුළු බිම් ප්‍රමාණය අක්කර 235 කි. නුවරඑළිය (අක්කර 128), මාතලේ (අක්කර 46), මහනුවර (අක්කර 42) හා බදුල්ල (අක්කර 19) යන දිස්ත්‍රික්ක වල වතු ආශ්‍රිතව බෝංචි වගාව වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නයේ අක්කර 178 ක කැරට් වගා කර ඇති බව වාර්තා වී ඇත. කැරට් වගා කර ඇති දිස්ත්‍රික්ක ලෙස නුවරඑළිය, බදුල්ල හා මහනුවර යන දිස්ත්‍රික්ක වල පිළිවෙලින් අක්කර 171 ක්, අක්කර 4 ක් හා අක්කර 3 ක් ලෙස වාර්තා වී ඇත.

පුත්තලම, මහනුවර, නුවරඑළිය, හා බදුල්ල යන දිස්ත්‍රික්කවල වතු ආශ්‍රිතව ලික්ස් වගාව සම්බන්ධව තොරතුරු වාර්තා වී ඇත. ලික්ස් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 212 ක් වන අතර ඉහත කී දිස්ත්‍රික්කවල පිළිවෙලින් අක්කර 98 ක්, අක්කර 96 ක්, අක්කර 10 ක් හා අක්කර 8 ක් ලෙස ලික්ස් වගා කර ඇති බව වාර්තා වේ.

වතු ආශ්‍රිතව ගෝවා වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 211 ක් වන අතර නුවරඑළිය (අක්කර 156), මාතලේ (අක්කර 25), පුත්තලම (අක්කර 22), මහනුවර (අක්කර 5) හා බදුල්ල (අක්කර 3) යන දිස්ත්‍රික්කවල ගෝවා වගා කර ඇති බව වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව මාළුමිරිස් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 801 ක් ලෙස වාර්තා වී ඇත. මාළුමිරිස් වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 541) වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වාර්තා වන්නේ ගම්පහ, මන්නාරම, වව්නියාව, අනුරාධපුර හා බදුල්ල යන දිස්ත්‍රික්ක වලිනි.

වට්ටක්කා වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 615 ක් ලෙස වාර්තා වි ඇති අතර වට්ටක්කා වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය අක්කර 308 ක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. වට්ටක්කා වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් අඩුම බිම් ප්‍රමාණය අක්කර 1 ක් ලෙස අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

පතෝල වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 174 ක් ලෙස වාර්තා වි ඇති අතර පතෝල වගා කර ඇති වැඩිම බිම් ප්රමාණය අක්කර 66 ක් ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වි ඇත. අඩුම බිම් ප්‍රමාණය අක්කර 1 ක් ලෙස වාර්තා වන්නේ මාතලේ, මාතර, අම්පාර හා පොලොන්නරුව යන දිස්ත්‍රික්ක වලිනි.

වතු ආශ්‍රිතව වැටකොළු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 129 ක් ලෙස වාර්තා වන අතර වැටකොළු වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 49) රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) කළුතර, මාතලේ, මාතර, අම්පාර, පුත්තලම හා බදුල්ල යන දිස්ත්‍රික්ක වලින් ද වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ තොරතුරු රැස් කිරිමේ අදියරේදී ඉහත සඳහන් කල එළවළු වලට අමතරව බීට්රූට් හා රාබු යන එළවළු පිළිබඳව සැළකිය යුතු බිම් ප්‍රමාණයන් පිළිබඳව වාර්තා වී නොමැත. මීට අමතරව ගාල්ල, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ එළවළු වගාව සම්බන්ධ තොරතුරු වාර්තා වී නොමැත.

### වගු අංක 8.2.2.1

**දිස්ත්‍රික්ක මට්ටමින් 2013/14 මහ කන්නයේ එළවළු වගාව යටතේ ඇති වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | බෝංචි | කැරට් | බීට්රූට් | ලික්ස් | ගෝවා | මාළු මිරිස් | තක්කාලි | වම්බටු | බණ්ඩක්ක | වට්ටක්කා | රාබු | පතෝල | වැටකොළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය | බිම් ප්‍රමාණය |
| කොළඹ | - | - | - | - | - | - | - | 1 | - | - | 6 | - | - |
| ගම්පහ | - | - | - | - | - | 1 | - | - | - | - | - | - | - |
| කළුතර | - | - | - | - | - | 36 | 82 | 121 | 180 | 5 | - | 2 | 1 |
| මහනුවර | 42 | 3 | - | 96 | 5 | 45 | 124 | 99 | 22 | 5 | 5 | 2 | 2 |
| මාතලේ | 46 | - | - | - | 25 | 18 | 35 | 12 | 3 | 5 | 1 | 1 | 1 |
| නුවරඑළිය | 128 | 171 | 51 | 10 | 156 | 2 | 1 | - | 1 | - | 2 | - | - |
| ගාල්ල | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මාතර | - | - | - | - | - | - | 1 | 82 | 62 | 3 | - | 1 | 1 |
| හම්බන්තොට | - | - | - | - | - | - | - | 90 | 10 | 83 | - | 45 | 21 |
| යාපනය | | | | | | | | | | | | | |
| මන්නාරම | - | - | - | - | - | 1 | 1 | 1 | - | 3 | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | 1 | - | 2 | 1 | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - | 2 | - | - | - |
| කිලිනොච්චිය | - | - | - | - | - | - | - | 2 | - | 2 | - | - | - |
| මඩකලපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | 1 | 1 | - | 1 | 1 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | - | - | 2 | - | - | 541 | 624 | 824 | 902 | 308 | 5 | 6 | 22 |
| පුත්තලම | - | - | - | 98 | 22 | 126 | 89 | 10 | 3 | 9 | - | - | 1 |
| අනුරාධපුර | - | - | - | - | - | 1 | - | 1 | 2 | 25 | - | - | 3 |
| පොලොන්නරුව | - | - | - | - | - | 2 | 3 | 5 | 2 | 7 | - | 1 | 2 |
| බදුල්ල | 19 | 4 | - | 8 | 3 | 1 | 6 | 3 | 1 | - | - | - | 1 |
| මොණරාගල | - | - | - | - | - | - | - | 2 | - | 9 | - | - | - |
| රත්නපුර | - | - | - | - | - | - | 35 | 48 | 81 | 76 | 21 | 49 | 49 |
| කෑගල්ල | - | - | - | - | - | 26 | 76 | 75 | 66 | 72 | 1 | 66 | 24 |
| **ශ්‍රී ලංකාව** | **235** | **178** | **53** | **212** | **211** | **801** | **1,077** | **1,378** | **1,337** | **615** | **41** | **174** | **129** |

### 8.2.2.2 යල කන්නයේ එළවළු වගාව

2014 යල කන්නය තුළ වතු ආශ්‍රිතව එළවළු වගාව පිළිබඳ සැළකිමේදී වැඩිපුරම වගා කර ඇති බෝගය වන්නේ වම්බටු වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 1,419 කි. වම්බටු වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් වැඩිම බිම් ප්‍රමාණයක එනම් අක්කර 678 ක වම්බටු වගා කර ඇති දිස්ත්‍රික්කය ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වාර්තා වන්නේ ගම්පහ, ගාල්ල හා මුලතිව් යන දිස්ත්‍රික්ක වලිනි.

යල කන්නය තුළ දෙවනුවට වැඩියෙන්ම වගා කර ඇති බෝගය වන්නේ බණ්ඩක්කා වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 1,393 කි. බණ්ඩක්කා වගා කර ඇති දිස්ත්‍රික්ක අතුරින් වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 824) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වාර්තා වන්නේ කොළඹ, නුවරඑළිය හා ගාල්ල යන දිස්ත්‍රික්ක වලිනි.

වතු ආශ්‍රිතව 2014 යල කන්නය තුළ තෙවනුවට වැඩියෙන්ම වගා කර ඇති බෝගය වන්නේ තක්කාලි වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 1,150 කි. තක්කාලි වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර

425) වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) ගම්පහ, නුවරඑළිය හා ගාල්ල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

දිස්ත්‍රික්ක 4 ක බෝංචි වගාව සම්බන්ධව තොරතුරු වාර්තා වන අතර බෝංචි වගා කරන මුළු බිම් ප්‍රමාණය අක්කර 543 කි. නුවරඑළිය (අක්කර 220), බදුල්ල (අක්කර 175), මාතලේ (අක්කර 120) හා මහනුවර (අක්කර 28) යන දිස්ත්‍රික්ක වතු ආශ්‍රිතව බෝංචි වගා කරන දිස්ත්‍රික්ක ලෙස වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2014 යල කන්නයේ අක්කර 702 ක කැරට් වගා කර ඇති බව වාර්තා වී ඇත. කැරට් වගා කර ඇති දිස්ත්‍රික්ක ලෙස නුවරඑළිය, බදුල්ල හා මහනුවර යන දිස්ත්‍රික්ක වල පිළිවෙලින් අක්කර 697 ක්, අක්කර 3 ක් හා අක්කර 2 ක් ලෙස කැරට් වගාව සම්බන්ධව තොරතුරු වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව ගෝවා වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 234 ක් වන අතර නුවරඑළිය (අක්කර 142), මාතලේ (අක්කර 78), පුත්තලම (අක්කර 8) හා මහනුවර (අක්කර 6) යන දිස්ත්‍රික්කවල ගෝවා වගා කර ඇති බව වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව මාළුමිරිස් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 963 ක් ලෙස වාර්තා වී ඇත. මාළුමිරිස් වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 296) වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වාර්තා වන්නේ ගම්පහ හා යාපනය යන දිස්ත්‍රික්ක වලිනි.

වට්ටක්කා වගා කර ඇති මුළු බිම් ප්රමාණය අක්කර 424 ක් ලෙස වාර්තා වි ඇති අතර වට්ටක්කා වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය අක්කර 281 ක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. වට්ටක්කා වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් අඩුම බිම් ප්‍රමාණය අක්කර 1 ක් ලෙස කොළඹ, කළුතර, නුවරඑළිය, අම්පාර, ත්‍රිකුණාමලය හා මොණරාගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව රාබු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 175 ක් ලෙස වාර්තා වී ඇත. රාබු වගා කර ඇති දිස්ත්‍රික්ක අතරින් වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 151) වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) වාර්තා වන්නේ මාතලේ හා ගාල්ල යන දිස්ත්‍රික්ක වලිනි.

පතෝල වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 231 ක් ලෙස වාර්තා වි ඇති අතර පතෝල වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය අක්කර 126 ක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වි ඇත. අඩුම බිම් ප්‍රමාණය අක්කර 1 ක් ලෙස වාර්තා වන්නේ කළුතර, මාතලේ හා මාතර යන දිස්ත්‍රික්ක වලිනි.

වතු ආශ්‍රිතව වැටකොළු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 179 ක් ලෙස වාර්තා වන අතර වැටකොළු වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 126) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද අඩුම බිම් ප්‍රමාණය (අක්කර 1) මාතලේ හා පොලොන්නරුව යන දිස්ත්‍රික්ක වලින් ද වාර්තා වී ඇත.

වතු ආශ්‍රිතව 2013/14 වගා වර්ෂයේ දී 2014 යල කන්නය තුළ තොරතුරු රැස් කිරිමේ අදියරේදී ඉහත සඳහන් කල එළවළු වලට අමතරව බීට්රූට් හා ලික්ස් යන එළවළු පිළිබඳව සැළකිය යුතු බිම් ප්‍රමාණයන් පිළිබඳව වාර්තා වී නොමැත. මීට අමතරව 2014 යල කන්නයදී වතු ආශ්‍රිතව මන්නාරම, වව්නියාව, කිලිනොච්චිය හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වල ඉහත කී එළවළු වර්ග කිසිවක් වගා කර නොමැති බව වාර්තා වී ඇත.

## වගු අංක 8.2.2.2

### දිස්ත්‍රික්ක මට්ටමින් 2014 යල කන්නයේ එළවළු වගාව යටතේ ඇති වතු සංඛ්‍යාවෙහි හා බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | බෝංචි | කැරට් | බීට්රූට් | ලික්ස් | ගෝවා | මාළු මිරිස් | තක්කාලි | වම්බටු | බණ්ඩක්කා | වට්ටක්කා | රාබු | පතෝල | වැටකොළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] |
| කොළඹ | - | - | - | - | - | - | 12 | 12 | 1 | 1 | 6 | - | - |
| ගම්පහ | - | - | - | - | - | 1 | 1 | 1 | - | 4 | - | - | - |
| කළුතර | - | - | - | - | - | 5 | 8 | 9 | 18 | 1 | - | 1 | - |
| මහනුවර | 28 | 2 | - | 1 | 6 | 3 | 15 | 4 | 4 | 2 | 5 | 3 | - |
| මාතලේ | 120 | - | - | - | 78 | 62 | 21 | 32 | 48 | 6 | 1 | 1 | 1 |
| නුවරඑළිය | 220 | 697 | 42 | 36 | 142 | 21 | 1 | - | 1 | 1 | - | - | - |
| ගාල්ල | - | - | - | - | - | 2 | 1 | 1 | 1 | - | 1 | - | - |
| මාතර | - | - | - | - | - | - | 36 | 18 | 31 | 8 | 6 | 1 | 3 |
| හම්බන්තොට | - | - | - | - | - | 181 | 165 | 115 | 176 | 3 | 5 | 42 | 8 |
| යාපනය | - | - | - | - | - | 1 | - | - | - | | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - | - | 1 | - | - | - | - | - |
| කිලිනොච්චිය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකලපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - | - | 1 | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | 1 | - | - | - |
| කුරුණෑගල | - | - | - | - | - | 296 | 425 | 678 | 824 | 281 | 151 | 126 | 126 |
| පුත්තලම | - | - | - | - | 8 | 235 | 326 | 371 | 102 | 10 | - | - | - |
| අනුරාධපුර | - | - | - | - | - | - | - | 22 | 3 | 2 | - | - | - |
| පොලොන්නරුව | - | - | - | - | - | - | - | - | - | 2 | - | - | 1 |
| බදුල්ල | 175 | 3 | - | 3 | - | 12 | - | 2 | - | - | - | - | - |
| මොණරාගල | - | - | - | - | - | - | - | - | - | 1 | - | - | - |
| රත්නපුර | - | - | - | - | - | 62 | 78 | 92 | 86 | 28 | - | 36 | 18 |
| කෑගල්ල | - | - | - | - | - | 82 | 61 | 61 | 98 | 72 | - | 21 | 22 |
| **ශ්‍රී ලංකාව** | **543** | **702** | **42** | **40** | **234** | **963** | **1,150** | **1,419** | **1,393** | **424** | **175** | **231** | **179** |

## 8.2.3 පලා වර්ග

### 8.2.3.1 2013/14 මහ කන්නයේ පලා වගාව

### වගු අංක 8.2.3.1

**දිස්ත්‍රික්ක මට්ටමින් 2013/14 මහ කන්නයේ පලා වගාව යටතේ ඇති වතු සංඛ්‍යාවෙහි හා බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | 1 | | 2 | | 3 | | 4 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොටුකොළ | | මුකුණුවැන්න | | කංකුන් | | නිවිති | |
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 2 | 5 | 1 | 3 | 1 | 3 | 1 | 3 |
| මාතලේ | 1 | 1 | 1 | 1 | 1 | 1 | - | - |
| නුවරඑළිය | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 |
| කුරුණෑගල | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 |
| පුත්තලම | 1 | 1 | - | - | - | - | - | - |
| පොලොන්නරුව | - | - | - | - | 1 | 2 | 1 | 2 |
| බදුල්ල | 1 | 1 | - | - | - | - | - | - |
| ශ්‍රී ලංකාව | 7 | 11 | 4 | 6 | 5 | 8 | 4 | 7 |

වතු ආශ්‍රිතව 2013/14 මහ කන්නය තුළ පලා වර්ග වගාව පිළිබඳ සැළකිමේදී කොළඹ, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, පුත්තලම, පොලොන්නරුව හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල වතු ආශ්‍රිතව පලා වගාව පිළිබඳ තොරතුරු වාර්තා වන අතර ගොටුකොළ, මුකුණුවැන්න, කංකුන් හා නිවිති වගා කර ඇති වතු සංඛ්‍යාව පිළිවෙලින් 7, 4, 5 හා 4 ක් ලෙසින් එම දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. එම වගාවන් සඳහා වෙන් වී ඇති බිම් ප්‍රමාණයන් පිළිවෙලින් අක්කර 11 ක්, අක්කර 6 ක්, අක්කර 8 ක් හා අක්කර 7 ක් ලෙස දැක්විය හැකි වේ.

### 8.2.3.2 2014 යල කන්නයේ පලා වර්ග

### වගු අංක 8.2.3.2

**දිස්ත්‍රික්ක මට්ටමින් 2014 යල කන්නයේ පලා වර්ග වගාවේ ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | 1 | | 2 | | 3 | | 4 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොටුකොළ | | මුකුණුවැන්න | | කංකුන් | | නිවිති | |
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 2 | 5 | 1 | 3 | 1 | 3 | 1 | 3 |
| මහනුවර | 1 | 1 | - | - | 1 | 1 | - | - |
| නුවරඑළිය | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 2 |
| බදුල්ල | 1 | 1 | - | - | - | - | - | - |
| ශ්‍රී ලංකාව | 5 | 8 | 2 | 4 | 3 | 6 | 2 | 5 |

2014 යල කන්නය තුළ වතු ආශ්‍රිතව වගා කරන ලද පලා වර්ග පිළිබඳ සැළකිමේදී කොළඹ, මහනුවර, නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල පමණක් පලා වගාව පිළිබඳ තොරතුරු වාර්තා වේ. ගොටුකොළ, මුකුණුවැන්න, කංකුන් හා නිවිති වගා කර ඇති වතු සංඛ්‍යාව පිළිවෙලින් 5, 2, 3 හා 2 ක් වන අතර එම වගාවන් සඳහා වෙන් වී ඇති බිම් ප්‍රමාණයන් පිළිවෙලින් අක්කර 8 ක්, අක්කර 4 ක්, අක්කර 6 ක් හා අක්කර 5 ක් ලෙස එම දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

# 9 පරිච්ඡේදය පොහොර, පලිබෝධනාශක සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය

## 9.1 දිස්ත්‍රික්ක අනුව පොහොර භාවිතය

2014 වර්ෂයේ පැවැත්වූ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම යටතේ වතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේදී වතු අංශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර සහ පලිබෝධනාශක භාවිත කළ ආකාරය පිළිබඳව තොරතුරු එක්රැස් කරන ලදී.

ඒ අනුව මුළු වතු සංඛ්‍යාවෙන් 79% ක් එනම් වතු 5,865 ක් කෘෂිකාර්මික කටයුතු සිදුකිරීමේ දී පොහොර භාවිතකර ඇති බවත් මුළු වතු සංඛ්‍යාවෙන් 21% ක් එනම් වතු 1,582 ක් පොහොර භාවිතකර නොමැති බවත් වාර්තා වී ඇත. දිස්ත්‍රික්ක මට්ටමින් සලකා බැලීමේදී කෘෂිකාර්මික කටයුතු සඳහා වැඩියෙන්ම පොහොර භාවිතාකර ඇති වතු සංඛ්‍යාව වාර්තා වන්නේ කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලින් වන අතර එම අගයන් පිළිවෙලින් වතු 1,440 ක් සහ 1,026 ක් වේ.

**වගු අංක 9.1.1**

**දිස්ත්‍රික්කය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කළ පොහොර වර්ගය අනුව වතු සංඛ්‍යාව - 2014**

| දිස්ත්‍රික්කය | වතු සංඛ්‍යාව | පොහොර භාවිතය | | භාවිතා කළ පොහොර වර්ගය | | |
|---|---|---|---|---|---|---|
| | | භාවිතා කළ | භාවිතා නොකළ | රසායනික පොහොර පමණක් | කාබනික පොහොර පමණක් | රසායනික හා කාබනික පොහොර |
| කොළඹ | 125 | 99 | 26 | 71 | 7 | 21 |
| ගම්පහ | 445 | 377 | 68 | 188 | 21 | 168 |
| කළුතර | 333 | 275 | 58 | 217 | 12 | 46 |
| මහනුවර | 356 | 285 | 71 | 191 | 16 | 78 |
| මාතලේ | 281 | 181 | 100 | 109 | 30 | 42 |
| නුවරඑළිය | 256 | 241 | 15 | 190 | 4 | 47 |
| ගාල්ල | 264 | 251 | 13 | 196 | 3 | 52 |
| මාතර | 300 | 266 | 34 | 204 | 7 | 55 |
| හම්බන්තොට | 119 | 73 | 46 | 35 | 7 | 31 |
| යාපනය | 13 | 4 | 9 | 1 | - | 3 |
| මන්නාරම | 8 | 4 | 4 | 2 | - | 2 |
| වව්නියාව | 9 | 9 | - | 1 | 1 | 7 |
| මුලතිව් | 42 | 20 | 22 | 10 | 3 | 7 |
| කිළිනොච්චිය | 176 | 56 | 120 | 25 | 5 | 26 |
| මඩකළපුව | 57 | 29 | 28 | 9 | 8 | 12 |
| අම්පාර | 33 | 16 | 17 | 8 | 1 | 7 |
| ත්‍රිකුණාමලය | 7 | 7 | - | 3 | - | 4 |
| කුරුණෑගල | 1,826 | 1,440 | 386 | 861 | 168 | 411 |
| පුත්තලම | 1,373 | 1,026 | 347 | 625 | 71 | 330 |
| අනුරාධපුරය | 70 | 48 | 22 | 16 | 5 | 27 |
| පොළොන්නරුව | 62 | 44 | 18 | 24 | 1 | 19 |
| බදුල්ල | 223 | 197 | 26 | 125 | 23 | 49 |
| මොණරාගල | 101 | 83 | 18 | 46 | 4 | 33 |
| රත්නපුරය | 614 | 535 | 79 | 470 | 7 | 58 |
| කෑගල්ල | 354 | 299 | 55 | 248 | 12 | 39 |
| **ශ්‍රී ලංකාව** | **7,447** | **5,865** | **1,582** | **3,875** | **416** | **1,574** |

කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර භාවිතා නොකළ වතු පිළිබඳව සලකා බැලීමේ දී ද වැඩිම වතු සංඛ්‍යාව පිළිවෙලින් වතු 386 සහ වතු 347 වාර්තා වන්නේ ද කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලිනි. වව්නියාව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල පිහිටි වතු සඳහා පොහොර භාවිතාකළ බව වාර්තා වී නොමැත.

භාවිතා කළ පොහොර වර්ගය අනුව රසායනික පොහොර පමණක් භාවිතා කරන ලද වැඩිම වතු සංඛ්‍යාව කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලින් වාර්තාවී ඇත. එම වතු පිළිවෙලින් වතු 861 ක් සහ වතු 625 ක් වේ. රසායනික පොහොර පමණක් භාවිතා කරන ලද අඩුම වතු සංඛ්‍යාව යාපනය (1) සහ වව්නියාව (1) දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

කාබනික පොහොර පමණක් භාවිතා කරන ලද වැඩිම වතු සංඛ්‍යාව ද (168) වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. යාපනය, මන්නාරම සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල පිහිටි වතු සඳහා කෘෂිකාර්මික කටයුතු වලදී කාබනික පොහොර භාවිතාකළ බව වාර්තාවී නැත.

රසායනික සහ කාබනික යන පොහොර වර්ග දෙකම භාවිතා කරන ලද වැඩිම වතු සංඛ්‍යාව ද වාර්තාවී ඇත්තේ කුරුණෑගල (441) සහ පුත්තලම (330) යන දිස්ත්‍රික්ක වලිනි.

### 9.1.2. කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කළ පොහොර වර්ගය

කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදූ පොහොර වර්ගය සැලකීමේදී රසායනික සහ කාබනික යන පොහොර වර්ග වැඩිවශයෙන්ම භාවිත කර ඇත්තේ ද කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල පිහිටි වතු සඳහාය. යාපනය මන්නාරම යන දිස්ත්‍රික්කවල පිහිටි වතු වලින් කාබනික පොහොර පමණක් භාවිතාකළ වතු වාර්තා වී නොමැත.

**රූප සටහන 9.1.2.**

**භාවිතා කළ පොහොර වර්ගය අනුව වතු සංඛ්‍යාව (%)**




කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර භාවිතකළ වතු සංඛ්‍යාව සැලකීමේ දී ඉන් වතු 3,875 ක් (66%) භාවිතා කර ඇත්තේ රසායනික පොහොර පමණක් වන අතර වතු 416 ක් (7%) භාවිතා කර ඇත්තේ කාබනික පොහොර පමණි. වතු 1,574 ක් (27%) රසායනික සහ කාබනික යන පොහොර වර්ග දෙකම භාවිතාකර ඇත.

### 9.1.2 පළිබෝධනාශක භාවිතය

වතු අංශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා පලිහෝධනාශක භාවිත කළ ආකාරය පිළිබඳව සලකා බැලීමේදී මුළු වතු සංඛ්‍යාවෙන් 84% ක් එනම් වතු 6,236 ක් පලිහෝධනාශක භාවිතකර ඇති බවත් මුළු වතු සංඛ්‍යාවෙන් 16% ක් එනම් වතු 1,211 ක් පලිහෝධනාශක භාවිතකර නැති බවත් වාර්තාවේ. දිස්ත්‍රික්ක මට්ටමින් සලකා බැලීමේ දී කෘෂිකාර්මික කටයුතු සඳහා වැඩියෙන්ම පලිහෝධනාශක භාවිතාකර ඇති වතු සංඛ්‍යාව වාර්තා වන්නේ කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලින් වන අතර එම අගයන් පිළිවෙලින් වතු 1,495 ක් සහ 1,091ක් වේ.

වගු අංක 9.1.2.

**දිස්ත්‍රික්කය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කළ පළිබෝධනාශකවල ස්වභාවය අනුව වතු සංඛ්‍යාව - 2014**

| දිස්ත්‍රික්කය | මුළු වතු සංඛ්‍යාව | පළිබෝධනාශක භාවිත කළ වතු | පළිබෝධනාශක භාවිත නොකළ වතු | පළිබෝධනාශක වල ස්වභාවය | | |
|---|---|---|---|---|---|---|
| | | | | රසායණික පළිබෝධනාශක පමණි | කාබණික පළිබෝධනාශක පමණි | රසායණික හා කාබණික පළිබෝධනාශක |
| කොළඹ | 125 | 103 | 22 | 63 | 5 | 35 |
| ගම්පහ | 445 | 364 | 81 | 243 | 5 | 116 |
| කළුතර | 333 | 278 | 55 | 185 | 9 | 84 |
| මහනුවර | 356 | 308 | 48 | 271 | 6 | 31 |
| මාතලේ | 281 | 233 | 48 | 199 | 7 | 27 |
| නුවරඑළිය | 256 | 245 | 11 | 184 | 2 | 59 |
| ගාල්ල | 264 | 235 | 29 | 213 | 6 | 16 |
| මාතර | 300 | 261 | 39 | 235 | 1 | 25 |
| හම්බන්තොට | 119 | 95 | 24 | 88 | 1 | 6 |
| යාපනය | 13 | 11 | 2 | 11 | - | - |
| මන්නාරම | 8 | 7 | 1 | 7 | - | - |
| වව්නියාව | 9 | 9 | - | 4 | - | 5 |
| මුලතිව් | 42 | 35 | 7 | 35 | - | - |
| කිලිනොච්චිය | 176 | 149 | 27 | 124 | 1 | 24 |
| මඩකළපුව | 57 | 44 | 13 | 43 | 1 | - |
| අම්පාර | 33 | 28 | 5 | 26 | 1 | 1 |
| ත්‍රිකුණාමලය | 7 | 7 | - | 6 | - | 1 |
| කුරුණෑගල | 1,826 | 1,495 | 331 | 1,407 | 20 | 68 |
| පුත්තලම | 1,373 | 1,091 | 282 | 1,047 | 2 | 42 |
| අනුරාධපුරය | 70 | 60 | 10 | 46 | 1 | 13 |
| පොළොන්නරුව | 62 | 52 | 10 | 45 | 1 | 6 |
| බදුල්ල | 223 | 199 | 24 | 175 | 9 | 15 |
| මොණරාගල | 101 | 89 | 12 | 74 | 1 | 14 |
| රත්නපුරය | 614 | 534 | 80 | 514 | 2 | 18 |
| කෑගල්ල | 354 | 304 | 50 | 272 | 3 | 29 |
| ශ්‍රී ලංකාව | **7,447** | **6,236** | **1,211** | **5,517** | **84** | **635** |

කෘෂිකාර්මික කටයුතු සඳහා පලිහෝධනාශක භාවිතා නොකළ වතු පිළිබඳව සලකා බැලීමේ දී ද වැඩිම වතු සංඛ්‍යාව පිළිවෙලින් වතු 331 සහ වතු 282 වාර්තා වන්නේද කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලිනි. වව්නියාව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලින් පලිහෝධනාශක භාවිතා නොකළ වතු වාර්තා වී නොමැත.

### 9.1.2. කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කළ පලිබෝධනාශකවල ස්වභාවය

කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගත් පලිහෝධනාශක වල ස්වභාවය අනුව සලකාබලන විට සෑම දිස්ත්‍රික්කයකින්ම රසායනික පලිහෝධනාශක පමණක් භාවිත කළ වතු වාර්තාවන අතර උතුරු සහ නැගෙනහිර පළාත්වල කිලිනොච්චි, අම්පාර සහ මඩකලපුව හැර එම පළාත්වල අනෙකුත් දිස්ත්‍රික්ක වලින් කාබනික පලිහෝධනාශක පමණක් භාවිත කළ වතු වාරතා නොවේ.

**රූප සටහන 9.2.1.**

**භාවිතා කළ පලිහෝධනාශක වර්ගය අනුව වතු සංඛ්‍යාව (%) – 2014**

කෘෂිකාර්මික කටයුතු සඳහා පලිහෝධනාශක භාවිතාකළ වතු සංඛ්‍යාව සැලකීමේ දී ඉන් වතු 5,517 ක් (89%) භාවිතා කර ඇත්තේ රසායනික පලිහෝධනාශක පමණක් වන අතර වතු 84 ක් (1%) භාවිත කර ඇත්තේ කාබනික පලිහෝධනාශක පමණි. වතු 635 ක් (10%) රසායනික සහ කාබනික යන පලිහෝධනාශක වර්ග දෙකම භාවිතාකර ඇති බව වාර්තාවේ.




## 9.2 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය

### 9.2.1 දිස්ත්‍රික්ක අනුව කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරිමේ අදියර යටතේ වතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේ දී වතු ආශ්‍රිතව කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ භාවිතාකළ ආකාරය පිළිබඳව තොරතුරු රැස්කරන ලදී. ඒ අනුව වැඩි වශයෙන් යන්ත්‍රෝපකරණ භාවිතාකළ වතු වාර්තා වන්නේ කුරුණෑගල (වතු 1,370) සහ පුත්තලම (වතු 919) දිස්ත්‍රික්ක වලිනි. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ අඩුවෙන්ම භාවිතාකළ වතු වාර්තා වන්නේ යාපනය සහ මන්නාරම දිස්ත්‍රික්ක වලිනි.

කෘෂිකාර්මික කටයුතු වලදී භාවිතාකරනු ලබන යන්ත්‍රෝපකරණ වර්ග 15 ක් පිළිබඳ තොරතුරු ද මෙම අදියරේදී රැස්කරන ලදී. එහිදී 2014.06.30 දිනට ඒ ඒ වතු සතුව තිබූ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ද රැස්කර ඇත.

ඒ අනුව අදාළ දිනයට රෝද දෙකේ සහ රෝද හතරේ ට්‍රැක්ටර් වැඩි වශයෙන්ම පැවති බවට වාර්තා වන්නේ කුරුණෑගල (817) සහ පුත්තලම (558) යන දිස්ත්‍රික්කවල පිහිටි වතු ආශ්‍රිතවය. යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල වතු වලින් රෝද හතරේ ට්‍රැක්ටර් භාවිතා කරන බව වාර්තාවී නැත.

අතින් ක්‍රියාකරන දියර ඉසින යන්ත්‍ර වැඩි වශයෙන්ම පැවති බවට වාර්තා වන්නේ නුවරඑළිය (5,810) සහ බදුල්ල (2,470) දිස්ත්‍රික්කවල පිහිටි වතු වලින්ය. බලයෙන් ක්‍රියාකරන දියර ඉසින යන්ත්‍රය ද වැඩි වශයෙන්ම පැවති බවට වාර්තා වන්නේ ද එම දිස්ත්‍රික්කවලින් ය.

2014.06.30 දිනට වත්ත සතුව වැඩිපුරම කොළ මඩින යන්ත්‍ර, වී හුලං කරන යන්ත්‍ර සහ වී හුලං කිරීම සමඟ කොළ මඩින යන්ත්‍ර යන යන්ත්‍ර වර්ග තුන පැවති බවට වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එම යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව පිළිවෙලින් 20, 11 සහ 10 ක් ලෙස වාර්තා වී ඇත. උතුරු සහ නැගෙනහිර පළාතෙන් වව්නියාව, අම්පාර සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්ක වලින් වී හුළං කරන යන්ත්‍ර සහ කොළ මඩින යන්ත්‍ර වාර්තාවී නැත. බදුල්ල දිස්ත්‍රික්කයෙන් ද අදාල දිනට වි හුළං කරන සහ කොළ මඩින යන්ත්‍ර වාර්තාවී නැත.

කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නා වතුර පොම්ප වැඩි වශයෙන් පැවති බවට වාර්තා වන්නේ කුරුණෑගල (973) සහ පුත්තලම (722) යන දිස්ත්‍රික්කවල වතු ආශ්‍රිතවය. සංයුක්ත අස්වැන්න නෙලීමේ යන්ත්‍ර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වතු වලද (7) ද පැළ හිටවන යන්ත්‍ර අනුරාධපුරය දිස්ත්‍රික්කයේ වතුවල ද (7) ද ගොයම් කපන යන්ත්‍ර (10), කුරුණෑගල දිස්ත්‍රික්කයේ වතු වලද වැඩි වශයෙන් පැවති බව වාර්තා වේ.

කිරි දොවන යන්ත්‍ර (106) වැඩි වශයෙන් පැවති බව වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතවය.

කෘෂි කාර්මික කටයුතු සඳහා භාවිත කරන තණකොළ කපන යන්ත්‍ර (832) සහ බැකෝ යන්ත්‍ර (102) වැඩි වශයෙන්ම පැවති බවට වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි වතුවල ය. තේ දළු නෙලන යන්ත්‍ර වැඩි වශයෙන්ම (2,952) පැවති බවට වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි වතුවලය.

කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනු ලබන වතුර පොම්ප සැලකියයුතු සංඛ්‍යාවක් සෑම දිස්ත්‍රික්කයකින්ම වාර්තාවී ඇත.

වගුව 9.2.1
යන්ත්‍රෝපකරණ වර්ග අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ භාවිතාකළ වතු සංඛ්‍යාව සහ යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | මුළු වතු සංඛ්‍යාව | යන්ත්‍ර සූත්‍ර භාවිත කළ වතු සංඛ්‍යාව | 2014.06.30 දිනට වත්ත සතුව තිබූ යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රෝද හතරේ ට්‍රැක්ටර් | රෝද දෙකේ ට්‍රැක්ටර් | අතින් ක්‍රියාකරන දියර ඉසින යන්ත්‍ර | බලයෙන් ක්‍රියාකරන දියර ඉසින යන්ත්‍ර | කොළ මඩින යන්ත්‍ර (ධ සුළං කිරීම සමග) | කොළ මඩින යන්ත්‍ර | ධ සුළං කරන යන්ත්‍ර | වතුර පොම්ප (කෘෂි කාර්මික කටයුතු සඳහා) | සංයුක්ත අස්වැන්න නෙළීමේ යන්ත්‍ර | පැළ සිටවන යන්ත්‍ර | ගොයම් කපන යන්ත්‍ර | කිරි දොවන යන්ත්‍ර | තණකොළ කපන යන්ත්‍ර (කෘෂි කාර්මික කටයුතු) | බැකෝ යන්ත්‍ර (කෘෂි කාර්මික කටයුතු සඳහා) | තේ දළු නෙලන යන්ත්‍ර |
| කොළඹ | 125 | 74 | 46 | 34 | 155 | 30 | 1 | 2 | 2 | 66 | - | - | - | - | 79 | 10 | - |
| ගම්පහ | 445 | 336 | 220 | 145 | 243 | 32 | 2 | 2 | - | 185 | - | - | 2 | 6 | 200 | 27 | - |
| කළුතර | 333 | 178 | 106 | 41 | 375 | 44 | 3 | 2 | 2 | 156 | - | - | - | 1 | 79 | 11 | 6 |
| මහනුවර | 356 | 242 | 106 | 48 | 1,992 | 154 | 1 | 2 | 2 | 147 | 2 | 1 | 1 | 10 | 83 | 15 | 138 |
| මාතලේ | 281 | 148 | 57 | 35 | 396 | 38 | 7 | 1 | 4 | 147 | 2 | 2 | 4 | 19 | 86 | 6 | 1 |
| නුවරඑළිය | 256 | 217 | 232 | 15 | 5,810 | 663 | 1 | - | - | 41 | 1 | 2 | - | 106 | 222 | 88 | 2,952 |
| ගාල්ල | 264 | 169 | 66 | 30 | 415 | 50 | 2 | 1 | - | 61 | - | 3 | - | 1 | 43 | 22 | 31 |
| මාතර | 300 | 217 | 99 | 45 | 634 | 79 | 5 | 3 | 5 | 98 | - | - | 1 | 4 | 131 | 18 | 8 |
| හම්බන්තොට | 119 | 88 | 67 | 45 | 76 | 25 | 2 | 2 | 2 | 61 | 2 | 1 | 2 | - | 56 | 7 | - |
| යාපනය | 13 | 4 | 2 | - | 1 | - | - | - | - | 6 | - | - | - | - | - | - | - |
| මන්නාරම | 8 | 5 | 6 | 1 | 22 | 2 | - | - | - | 15 | - | - | - | - | 2 | - | - |
| වව්නියාව | 9 | 9 | 10 | 10 | 17 | 3 | 2 | - | - | 16 | 1 | 1 | 2 | - | 3 | - | - |
| මුලතිව් | 42 | 33 | 6 | - | 3 | - | - | - | - | 16 | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | 176 | 84 | 42 | 5 | 12 | 4 | - | - | - | 72 | 1 | - | - | - | 3 | 1 | - |
| මඩකළපුව | 57 | 23 | 10 | 6 | 15 | 5 | - | - | - | 28 | - | - | - | 1 | 4 | - | - |
| අම්පාර | 33 | 18 | 13 | 6 | 17 | 6 | - | 1 | - | 24 | - | - | - | - | 7 | - | - |
| ත්‍රිකුණාමලය | 7 | 7 | 19 | 12 | 9 | 2 | 1 | - | - | 5 | - | - | - | - | 2 | 1 | - |
| කුරුණෑගල | 1,826 | 1,370 | 817 | 632 | 882 | 99 | 20 | 11 | 10 | 973 | 3 | 1 | 10 | 14 | 832 | 102 | 2 |
| පුත්තලම | 1,373 | 919 | 558 | 246 | 426 | 76 | - | 1 | 3 | 722 | - | 1 | 2 | 6 | 390 | 46 | 3 |
| අනුරාධපුරය | 70 | 57 | 70 | 64 | 95 | 30 | 9 | 2 | 1 | 132 | 3 | 7 | 6 | 5 | 32 | 6 | - |
| පොළොන්නරුව | 62 | 52 | 73 | 33 | 75 | 41 | 1 | 1 | 1 | 92 | 7 | 1 | - | 3 | 43 | 49 | - |
| බදුල්ල | 223 | 160 | 108 | 15 | 2,470 | 194 | - | - | - | 81 | 1 | - | 1 | 1 | 49 | 8 | 829 |
| මොණරාගල | 101 | 78 | 73 | 40 | 129 | 32 | 7 | 1 | - | 101 | 2 | 2 | 2 | - | 39 | 6 | - |
| රත්නපුරය | 614 | 353 | 121 | 47 | 1,396 | 91 | 3 | 1 | 1 | 110 | 3 | 1 | - | 2 | 78 | 15 | 140 |
| කෑගල්ල | 354 | 207 | 142 | 53 | 762 | 81 | 1 | - | - | 72 | 1 | - | - | 3 | 93 | 16 | 2 |
| **ශ්‍රී ලංකාව** | **7,447** | **5,041** | **3,069** | **1,608** | **16,427** | **1,781** | **68** | **33** | **33** | **3,427** | **29** | **23** | **33** | **182** | **2,556** | **454** | **4,112** |

## 9.2.2 වතු අංශය සතුව තිබූ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව (2014.06.30 දිනට)

කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතාකරන යන්ත්‍රෝපකරණ පිළිබඳව සලකා බැලීමේ දී 2014.06.30 දිනට වතු ආශ්‍රිතව වැඩි වශයෙන්ම පැවති කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ වර්ගය වන්නේ අතින් ක්‍රියාකරන දියර ඉසින යන්ත්‍රයයි. එම යන්ත්‍ර සංඛ්‍යාව 16,427 කි. මීළගට වැඩි වශයෙන් පැවති කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ වර්ග වන්නේ තේ දළු නෙලන යන්ත්‍ර (4,112) සහ රෝද හතරේ ට්‍රැක්ටරයයි (3,069). අඩුවෙන්ම පැවති කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ වර්ග වන්නේ පැළ සිටවන යන්ත්‍ර (23) සහ සංයුක්ත අස්වැන්න නෙළීමේ යන්ත්‍රයි (29).

**රූප සටහන 9.2.2.**

**කෘෂිකාර්මික කටයුතු සඳහා වතු අංශය සතුව තිබූ යන්ත්‍රෝපකරණ (2014.06.30 දිනට) - 2014**



# 10 පරිච්ඡේදය සත්ත්ව පාලනය පිළිබඳ තොරතුරු

ආර්ථික සංගණනය 2013/14 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීමේ අදියරේදී වතු අංශය යටතේ සත්ත්ව පාලනය පිළිබඳ තොරතුරු ද රැස්කරන ලදී. ඒ යටතේ රැස්කරන ලද මස්, කිරි හා බිත්තර ලබා ගැනීම පිණිස ඇති කරන සතුන් පිළිබඳ සංඛ්‍යාති එනම් ගව පාලනය, එළු පාලනය, ඌරු පාලනය, කුකුළු පාලනය සහ කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ද මෙම පරිච්ඡේදයේදී විස්තර කරණු ලැබේ.

## 10.1 ගව පාලනය පිළිබඳ තොරතුරු

### වගු අංක 10.1

### ගව පාලනය පිළිබඳ තොරතුරු 2002/2014

| සතුන් වර්ගය | 2002 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | වැඩි දියුණු කළ | එකතුව | දේශීය | වැඩි දියුණු කළ | එකතුව |
| එළ ගවයින් | 28,951 | 19,270 | 48,221 | 13,087 | 15,239 | 28,326 |
| මී ගවයින් | 2,837 | 3,135 | 5,972 | 3,848 | 4,664 | 8,512 |
| **එකතුව** | **31,788** | **22,405** | **54,193** | **16,935** | **19,903** | **36,838** |

ගව පාලනය පිළිබඳ තොරතුරු වලදී ප්‍රධාන වශයෙන් එළ ගව පලනය සහ මී ගව පාලනය සම්බන්ද තොරතුරු එක්රැස් කළ අතර එහිදී දේශීය සහ වැඩි දියුණු කරන ලද වර්ගයන් යටතේ පිරිමි සහ ගැහැණු සතුන් පිළිබඳ තොරතුරු රැස් කර ඇත. ඒ අනුව වාර්තාවී ඇති මුළු ගවයින් සංඛ්‍යාව 36,838 කි. එම සතුන් සංඛ්‍යාවෙන් 77% ක් එළ ගවයින් වන අතර 23% ක් මී ගවයින් ය. ගව පාලනය යටතේ වාර්තාවී ඇති දේශිය සතුන් සංඛ්‍යාව 16,935 කි. එය මුළු සතුන් සංඛ්‍යාවෙන් 46% ක ප්‍රතිශතයක් වන අතර වැඩි දියුණු කළ සතුන් සංඛ්‍යාව 19,903 කි. එය මුළු සතුන් සංඛ්‍යාවෙන් 54% කි. පසුගිය සංගණන වර්ෂය සමග සසඳන විට වතු අංශයෙන් වාර්තාවී ඇති එළ ගවයින් සංඛ්‍යාව 70% ක අඩුවීමක් පෙන්නුම් කරන අතර මී ගවයින් සංඛ්‍යාව 30% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

## 10.1.1 එළ ගව පාලනය

### වගු අංක 10.1.1.1

### ස්ත්‍රී පුරුෂ භාවය සහ වර්ග අනුව එළ ගවයින් සංඛ්‍යාව 2002/2014

| වර්ගය | 2002 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | වැඩි දියුණු කළ | එකතුව | දේශීය | වැඩි දියුණු කළ | එකතුව |
| **ගැහැණු සතුන්** | **21,018** | **14,656** | **35,674** | **9,963** | **12,350** | **22,313** |
| දැනට කිරි ගනිමින් සිටින | 7,054 | 4,902 | 11,956 | 2,025 | 5,023 | **7,048** |
| දැනට කිරි නොගන්නා | 5,426 | 3,212 | 8,638 | 4,147 | 2,653 | **6,800** |
| තවමත් පැටවකු බිහිනොකළ | 2,620 | 2,312 | 4,932 | 1,949 | 1,559 | **3,508** |
| වයස අවුරුදු 2ට අඩු පැටවුන් | 4,942 | 4,041 | 8,983 | 1,179 | 2,846 | **4,025** |
| වෙනත් සතුන් (මහළු/ආබාධිත වැනි) | 976 | 189 | 1,165 | 663 | 269 | **932** |
| **පිරිමි සතුන්** | **7,933** | **4,614** | **12,547** | **3,124** | **2,889** | **6,013** |
| වැඩට යොදා ගන්නා (බර ඇදීමට/ සී සෑමට) | 975 | 318 | 1,293 | 506 | 100 | **606** |
| පට්ටි ගොනුන් | 1,499 | 484 | 1,983 | 966 | 451 | **1,417** |
| අවුරුදු 2 ට අඩු පැටවුන් | 4,642 | 3,098 | 7,740 | 928 | 2,244 | **3,172** |
| **වෙනත් (මහළු/ ආබාධිත)** | **817** | **714** | **1,531** | **724** | **94** | **818** |
| **මුළු සතුන් සංඛ්‍යාව** | **28,951** | **19,270** | **48,221** | **13,087** | **15,239** | **28,326** |

එළ ගව පාලනය යටතේ වාර්තාවී ඇති සතුන් සංඛ්‍යාව 28,326 කි. එම සතුන් සංඛ්‍යාවෙන් 46% ක් දේශීය සතුන් වන අතර 54% ක් වැඩි දියුණු කළ වර්ග වලට අයත්

සතුන්වේ. 2013/14 ආර්ථික සංගණනයට අනුව වාර්තාවී ඇති මුළු ගැහැණු එළ ගවයින් සංඛ්‍යාව 22,313 ක් වන අතර එය මුළු එළ ගවයින් සංඛ්‍යාවෙන් 79% ක ප්‍රතිශතයක් ගනී. වාර්තා වී ඇති පිරිමි එළ ගවයින් සංඛ්‍යාව 6,013ක් වන අතර එය මුළු එළ ගවයින් සංඛ්‍යාවෙන් 21% ක ප්‍රතිශතයකි.

### රූප සටහන 10.1.1.1

### ගැහැණු එළ ගවයින් සංඛ්‍යාව




වාර්තාවී ඇති ගැහැණු එළ ගවයින් සංඛ්‍යාව සැලකූ විට වැඩිම සතුන් සංඛ්‍යාවක් (7,048) වාර්තාවී ඇත්තේ කිරි ගනිමින් සිටින සතුන් කාණ්ඩය යටතේය. එයින් ද 71% ක වැඩිම ප්‍රතිශතය වාර්තාවී ඇත්තේ වැඩි දියුණු කරන ලද සතුන්ගෙනි.

මුළු ගැහැණු එළ ගවයින් සංඛ්‍යාවෙන් වැඩිම සතුන් සංඛ්‍යාවක් වාර්තාවී ඇත්තේ දැනට කිරි ගනිමින් සිටින සතුන් කාණ්ඩය යටතේ වන අතර එය මුළු ගැහැණු එළ ගවයින් සංඛ්‍යාවෙන් 32% ක ප්‍රතිශතයකි. දැනට කිරි නොගන්නා කාණ්ඩය යටතේ වාර්තාවී ඇති සතුන් සංඛ්‍යාව මුළු ගැහැණු එළ ගවයින් සංඛ්‍යාවෙන් 30% කි. මුළු ගැහැණු එළ ගවයින් සංඛ්‍යාවෙන් 16% ක් තවමත් පැටවකු බිහි නොකළ සතුන් ද 18% ක් වයස අවුරුදු 2 ට අඩු පැටවුන් ලෙසද වාර්තාවී ඇති අතර අඩුම සතුන් සංඛ්‍යාවක් (4%) වාර්තාවී ඇත්තේ වෙනත් සතුන් කාණ්ඩය යටතේය.

### රූප සටහන 10.1.1.2

### පිරිමි එළ ගවයින් සංඛ්‍යාව




වතු අංශයේ එළ ගව පාලනය යටතේ වාර්තාවී ඇති පිරිමි සතුන් සංඛ්‍යාව 6,013 ක් වන අතර එයින් වැඩිම සංඛ්‍යාවක් (3,172) ක් වයස අවුරුදු 2 ට වඩා අඩු පැටවුන්ය. වාර්තාවී ඇති මුළු පිරිමි සතුන්ගෙන් 52% ක් දේශිය සතුන් වන අතර 48% ක් වැඩි දියුණු කරන ලද සතුන් කාණ්ඩයට අයත්වේ.

මුළු පිරිමි එළ ගවයින් සංඛ්‍යාව සැලකූ විට එයින් 53% ක් වයස අවුරුදු 2 ට වඩා අඩු පැටවුන් වන අතර 23% ක් පට්ටි ගොනුන් කාණ්ඩයට අයත්වේ. වැඩට යොදා ගන්නා සතුන් කාණ්ඩය යටතේ වාර්තාවී ඇති සතුන් සංඛ්‍යාව මුළු පිරිමි එළ ගවයින් සංඛ්‍යාවෙන් 10% ක් වන අතර වෙනත් (මහළු /ආබාධිත) සතුන් සංඛ්‍යාව මුළු පිරිමි එළ ගවයින් සංඛ්‍යාවෙන් 14% ක ප්‍රතිශතයක් ගෙන ඇත.

## වගු අංක 10.1.1.2

### දිස්ත්‍රික්කය අනුව එළ ගවයින් සංඛ්‍යාව - 2014

| දිස්ත්‍රික්කය | දේශීය | | | වැඩි දියුණු කළ | | | මුළු එළ ගවයින් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| කොළඹ | 89 | 62 | 151 | 34 | 25 | 59 | 123 | 87 | 210 |
| ගම්පහ | 831 | 308 | 1,139 | 614 | 120 | 734 | 1,445 | 428 | 1,873 |
| කළුතර | 78 | 29 | 107 | 66 | 52 | 118 | 144 | 81 | 225 |
| මහනුවර | 172 | 84 | 256 | 364 | 82 | 446 | 536 | 166 | 702 |
| මාතලේ | 178 | 72 | 250 | 316 | 33 | 349 | 494 | 105 | 599 |
| නුවරඑළිය | 306 | 78 | 384 | 4,466 | 1,108 | 5,574 | 4,772 | 1,186 | 5,958 |
| ගාල්ල | 10 | 6 | 16 | 23 | 11 | 34 | 33 | 17 | 50 |
| මාතර | 30 | 37 | 67 | 73 | 9 | 82 | 103 | 46 | 149 |
| හම්බන්තොට | 54 | 15 | 69 | 55 | 29 | 84 | 109 | 44 | 153 |
| යාපනය | 5 | 2 | 7 | - | - | - | 5 | 2 | 7 |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 5 | 3 | 8 | 26 | 11 | 37 | 31 | 14 | 45 |
| මුලතිව් | 85 | 3 | 88 | 6 | 4 | 10 | 91 | 7 | 98 |
| කිළිනොච්චිය | 86 | 15 | 101 | 4 | 7 | 11 | 90 | 22 | 112 |
| මඩකළපුව | 115 | 43 | 158 | 321 | 35 | 356 | 436 | 78 | 514 |
| අම්පාර | 83 | 9 | 92 | 20 | 2 | 22 | 103 | 11 | 114 |
| ත්‍රිකුණාමලය | 47 | 7 | 54 | - | - | - | 47 | 7 | 54 |
| කුරුණෑගල | 3,910 | 1,116 | 5,026 | 3,472 | 731 | 4,203 | 7,382 | 1,847 | 9,229 |
| පුත්තලම | 2,505 | 883 | 3,388 | 808 | 205 | 1,013 | 3,313 | 1,088 | 4,401 |
| අනුරාධපුරය | 453 | 119 | 572 | 313 | 92 | 405 | 766 | 211 | 977 |
| පොළොන්නරුව | 427 | 73 | 500 | 1,011 | 255 | 1,266 | 1,438 | 328 | 1,766 |
| බදුල්ල | 279 | 117 | 396 | 68 | 19 | 87 | 347 | 136 | 483 |
| මොණරාගල | 107 | 14 | 121 | 78 | 16 | 94 | 185 | 30 | 215 |
| රත්නපුරය | 50 | 10 | 60 | 26 | 10 | 36 | 76 | 20 | 96 |
| කෑගල්ල | 58 | 19 | 77 | 186 | 33 | 219 | 244 | 52 | 296 |
| **ශ්‍රී ලංකාව** | **9,963** | **3,124** | **13,087** | **12,350** | **2,889** | **15,239** | **22,313** | **6,013** | **28,326** |

2013/14 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරන ලද කාල සීමාවට අදාලව ශ්‍රී ලංකාවේ වතු අංශය තුළ එළ ගව පාලනය යටතේ වැඩිම සතුන් සංඛ්‍යාව (9,229) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවන අතර එය වතු අංශයේ මුළු එළ ගවයන් සංඛ්‍යාවෙන් 32% ක ප්‍රතිශතයකි. මීළඟට වැඩිම සතුන් සංඛ්‍යාව පිළිවෙළින් නුවරඑළිය (5,958) සහ පුත්තලම (4,401) දිස්ත්‍රික්කවලින් වාර්තාවන අතර මුළු එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශත ලෙස දක්වන විට 21% ක් සහ 15% ක් වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති සතුන්ගෙන් වැඩි ප්‍රතිශතය (54%) දේශීය සතුන් වන අතර නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති සතුන්ගෙන් වැඩි ප්‍රතිශතය (94%) වැඩි දියුණු කළ සතුන් වීම ද විශේෂයෙන් සඳහන් කළ හැකිය. මීට අමතරව ගම්පහ (1,873) සහ පොළොන්නරුව (1,766) දිස්ත්‍රික්ක වලින් ද සැලකිය යුතු එළ ගවයින් සංඛ්‍යාවක් වාර්තාවී ඇත.

මන්නාරම දිස්ත්‍රික්කයෙන් එළ ගව පාලනය යටතේ සතුන් වාර්තාවී නොමැති අතර යාපනය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලින් වැඩි දියුණු කළ සතුන් වාර්තාවී නොමැත.

## 10.1.2 මී ගව පාලනය

වතු අංශයේ එක් රැස් කරන ලද මී ගව පාලනය පිළිබඳ තොරතුරු යටතේදී ද දේශීය සහ වැඩි දියුණු කළ වර්ග යටතේ මෙන්ම ගැහැණු පිරිමි ලෙසද සතුන් සංඛ්‍යාව වාර්තා කර ඇත. වාර්තාවී ඇති මුළු මී

ගවයින් සංඛ්‍යාව 8,512 ක්වන අතර එයින් 74% ක් ගැහැණු සතුන් ද 26% ක් පිරිමි සතුන් ද වේ. එමෙන්ම මුළු සතුන් සංඛ්‍යාවෙන් 45% ක් දේශීය සතුන් සහ 55% ක් වැඩි දියුණු කළ සතුන් ද ලෙස වර්ගකර දැක්විය හැකිය.

### වගු අංක 10.1.2.1

### ස්ත්‍රී පුරුෂ භාවය සහ වර්ග අනුව මී ගවයින් සංඛ්‍යාව - 2014

| වර්ගය | දේශීය | වැඩි දියුණු කළ | එකතුව |
|---|---|---|---|
| **ගැහැණු සතුන්** | **2,735** | **3,602** | **6,337** |
| දැනට කිරි ගනිමින් සිටින | 727 | 1,098 | 1,825 |
| දැනට කිරි නොගන්නා | 719 | 985 | 1,704 |
| තවමත් පැටවකු බිහිනොකළ | 727 | 684 | 1,411 |
| වයස අවුරුදු 2ට අඩු පැටවුන් | 368 | 622 | 990 |
| වෙනත් සතුන් (මහළු/ආබාධිත වැනි) | 194 | 213 | 407 |
| **පිරිමි සතුන්** | **1,113** | **1,062** | **2,175** |
| වැඩට යොදා ගන්නා (බර ඇදීමට/ සී සෑමට) | 352 | 271 | 623 |
| පට්ටි ගොනුන් | 325 | 309 | 634 |
| අවුරුදු 2 ට අඩු පැටවුන් | 274 | 415 | 689 |
| වෙනත් (මහළු/ ආබාධිත) | 162 | 67 | 229 |
| **මුළු සතුන් සංඛ්‍යාව** | **3,848** | **4,664** | **8,512** |

මුළු ගැහැණු මී ගවයින් සංඛ්‍යාවෙන් 29% ක් දැනට කිරි ගනිමින් සිටින සතුන් කාණ්ඩයටත් 27% ක් දැනට කිරි නොගන්නා සතුන් කාණ්ඩයටත් අයත්වන අතර තවමත් පැටවකු බිහි නොකල සතුන් සංඛ්‍යාව 22% ක ප්‍රතිශතයකි. මුළු ගැහැණු මී ගවයින් සංඛ්‍යාවෙන් 16% ක් වයස අවුරුදු 2 ට අඩු පැටවුන් වන අතර 6% ක් වෙනත් (මහළු/ආබාධිත) සතුන් කාණ්ඩයට අයත්වේ.

මුළු පිරිමි මී ගවයින් සංඛ්‍යාව සැලකූ විට වැඩට යොදා ගන්නා සතුන් සංඛ්‍යාව සහ පට්ටි ගෙනුන් සංඛ්‍යාව මුළු පිරිමි මී ගවයින් සංඛ්‍යාවෙන් 29% බැගින් වේ. වයස අවුරුදු 2 ට අඩු පැටවුන් සංඛ්‍යාව 32% ක් ද වෙනත් (මහළු/ආබාධිත) සතුන් 10% ක් ද ලෙස වාර්තාවී ඇත.

## වගු අංක 10.1.2.2

## දිස්ත්‍රික්කය අනුව මී ගවයින් සංඛ්‍යාව - 2014

| දිස්ත්‍රික්කය | දේශීය | | | වැඩි දියුණුකළ | | | මුළු මී ගවයන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| කොළඹ | 22 | 8 | 30 | - | - | - | 22 | 8 | 30 |
| ගම්පහ | 127 | 60 | 187 | 230 | 42 | 272 | 357 | 102 | 459 |
| කළුතර | - | - | - | - | - | - | - | - | - |
| මහනුවර | 65 | 28 | 93 | 126 | 34 | 160 | 191 | 62 | 253 |
| මාතලේ | 141 | 20 | 161 | 106 | 40 | 146 | 247 | 60 | 307 |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | 4 | 1 | 5 | - | - | - | 4 | 1 | 5 |
| මාතර | 25 | 5 | 30 | 69 | 14 | 83 | 94 | 19 | 113 |
| හම්බන්තොට | 157 | 64 | 221 | 520 | 118 | 638 | 677 | 182 | 859 |
| යාපනය | - | - | - | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | 8 | - | 8 | - | - | - | 8 | - | 8 |
| මුලතිව් | - | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | 16 | 2 | 18 | - | - | - | 16 | 2 | 18 |
| අම්පාර | - | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | 12 | 5 | 17 | 12 | 5 | 17 |
| කුරුණෑගල | 1,075 | 386 | 1,461 | 843 | 336 | 1,179 | 1,918 | 722 | 2,640 |
| පුත්තලම | 504 | 243 | 747 | 276 | 75 | 351 | 780 | 318 | 1,098 |
| අනුරාධපුරය | 118 | 63 | 181 | 114 | 84 | 198 | 232 | 147 | 379 |
| පොළොන්නරුව | 462 | 227 | 689 | 739 | 238 | 977 | 1,201 | 465 | 1,666 |
| බදුල්ල | - | - | - | - | - | - | - | - | - |
| මොණරාගල | 7 | 4 | 11 | 558 | 73 | 631 | 565 | 77 | 642 |
| රත්නපුරය | 4 | 2 | 6 | - | - | - | 4 | 2 | 6 |
| කෑගල්ල | - | - | - | 9 | 3 | 12 | 9 | 3 | 12 |
| **ශ්‍රී ලංකාව** | **2,735** | **1,113** | **3,848** | **3,602** | **1,062** | **4,664** | **6,337** | **2,175** | **8,512** |

ශ්‍රී ලංකාවේ වතු අංශය තුළ 2013/14 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරන ලද කාල සීමාවට අදාලව මී ගව පාලනය යටතේ වාර්තාවී ඇති සතුන් සංඛ්‍යාව 8,512 ක් වන අතර දිස්ත්‍රික්ක මට්ටමින් වැඩිම සතුන් සංඛ්‍යාව 2,640 කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. දෙවනුවට වැඩිම සතුන් සංඛ්‍යාව වාර්තාවී ඇත්තේ පොළොන්නරුව (1,666) දිස්ත්‍රික්කයෙන් වන අතර පුත්තලම දිස්ත්‍රික්කයෙන් සතුන් 1,098 ක් වාර්තාවී ඇත. මී ගව පාලනය යටතේ වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාවෙන් 64% ක්ම වාර්තාවී ඇත්තේ මෙම දිස්ත්‍රික්ක වලිනි. මීට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ද සතුන් 859 ක් වාර්තාවී ඇත.

වව්නියාව හැර උතුරු පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක වලින් මී ගව පාලනය යටතේ සතුන් වාර්තාවී නොමැති අතර කළුතර, නුවරඑළිය, අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්ක වලින් ද මී ගවයින් වාර්තා නොවේ.

## 10.2 එළු පාලනය පිළිබඳ තොරතුරු

වතු ආශ්‍රිතව සිදුකරන ලද එළු පාලනය පිළිබඳ තොරතුරු රැස් කිරීමේදී දිස්ත්‍රික්ක මට්ටමින් දේශිය සහ වැඩි දියුණු කරන ලද සතුන් සංඛ්‍යාව, ස්ත්‍රි පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව සතුන් සංඛ්‍යාව යන තොරතුරු එක් රැස් කරන ලදී.

එම තොරතුරු වලට අනුව සංගණනයේ තොරතුරු රැස්කළ දිනයට අදාලව වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාව 6,444 කි. දිස්ත්‍රික්ක අනුව වැඩිම සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ කුරුණෑගල (1,645) දිස්ත්‍රික්කයෙනි. පිළිවෙළින් දෙවනුවට සහ තෙවනුවට වැඩිම සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ පුත්තලම (1,467) සහ මහනුවර (558) දිස්ත්‍රික්ක වලිනි. අඩුම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ යාපනය (5) සහ මුලතිව් (9) දිස්ත්‍රික්ක වලිනි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් එළු පාලනය යටතේ සතුන් සංඛ්‍යාවක් වාර්තාවී නැත.

### වගු අංක 10.2.1

**දිස්ත්‍රික්කය, ස්ත්‍රි පුරුෂ භාවය සහ වර්ගයන් අනුව ඇතිකරන ලද එළුවන් සංඛ්‍යාව - 2014**

| දිස්ත්‍රික්කය | ගැහැණු | | පිරිමි | | එකතුව |
|---|---|---|---|---|---|
| | දේශිය | වැඩි දියුණුකළ | දේශිය | වැඩි දියුණුකළ | |
| කොළඹ | 34 | 3 | 29 | 2 | 68 |
| ගම්පහ | 110 | 132 | 46 | 62 | 350 |
| කළුතර | 24 | 24 | 2 | 4 | 54 |
| මහනුවර | 77 | 303 | 49 | 129 | 558 |
| මාතලේ | 45 | 58 | 21 | 20 | 144 |
| නුවරඑළිය | 50 | 113 | 41 | 39 | 243 |
| ගාල්ල | 3 | 17 | 1 | 5 | 26 |
| මාතර | 3 | 87 | - | 14 | 104 |
| හම්බන්තොට | 171 | 20 | 3 | - | 194 |
| යාපනය | 4 | - | 1 | - | 5 |
| මන්නාරම | 40 | - | 6 | - | 46 |
| වව්නියාව | - | 11 | - | 6 | 17 |
| මුලතිව් | 4 | - | 5 | - | 9 |
| කිළිනොච්චිය | 36 | 1 | 3 | 1 | 41 |
| මඩකළපුව | 16 | 20 | 5 | 19 | 60 |
| අම්පාර | 9 | - | 3 | - | 12 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - |
| කුරුණෑගල | 483 | 661 | 276 | 225 | 1,645 |
| පුත්තලම | 977 | 137 | 298 | 55 | 1,467 |
| අනුරාධපුරය | 190 | 12 | 88 | 3 | 293 |
| පොළොන්නරුව | 20 | 292 | 42 | 137 | 491 |
| බදුල්ල | 114 | 8 | 182 | 5 | 309 |
| මොණරාගල | 9 | 6 | 5 | | 20 |
| රත්නපුරය | 28 | 28 | 18 | 7 | 81 |
| කෑගල්ල | 34 | 134 | 11 | 28 | 207 |
| **ශ්‍රී ලංකාව** | **2,481** | **2,067** | **1,135** | **761** | **6,444** |

**රූප සටහන 10.3.1**

**වර්ගයන් අනුව ඇතිකරන ලද එළුවන් සංඛ්‍යාව - 2014**




එළු පාලනය යටතේ වාර්තාවී ඇති මුළු ගැහැණු සතුන් සංඛ්‍යාව 4,548 ක් වන අතර එය මුළු එළුවන් සංඛ්‍යාවෙන් 70% කි. පිරිමි සතුන් 1,896 ක් වාර්තාවී ඇති අතර එය මුළු එළුවන් සංඛ්‍යාවෙන් 30% කි. දේශිය සහ වැඩි දියුණු කරන ලද වර්ග අනුව සලකා බලනවිට මුළු සතුන් සංඛ්‍යාවෙන් 56% ක් දේශීය සතුන් ද 44% ක් වැඩි දියුණු කළ සතුන් ද වේ. සතුන්ගේ වයස් කාණ්ඩ අනුව සලකා බලනවිට අදාල තොරතුරු රැස්කළ දිනයට මාස හයට අඩු සතුන් 1,731ක් (27%) ද මාස 6 හා ඊට වැඩි සතුන් 4,713 ක් (73%) ද වාර්තාවී ඇත.

## 10.3 ඌරු පාලනය පිළිබඳ තොරතුරු

වතු ආශ්‍රිතව සිදුකරන ලද ඌරු පාලනය පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී ද දිස්ත්‍රික්ක මට්ටමින් ඇතිකරන ලද දේශීය සහ වැඩි දියුණු කරන ලද සතුන් සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ භාවය අනුව සහ බෝකිරීම හා තර කිරීම පිණිස ඇති කරන ලද සතුන් සංඛ්‍යාව යන තොරතුරු එක් රැස් කරන ලදී.

**වගු අංක 10.3.1.**

**දිස්ත්‍රික්කය සහ වර්ගයන් අනුව ඇතිකරන ලද ඌරන් සංඛ්‍යාව - 2014**

| දිස්ත්‍රික්කය | බෝ කිරීම | | | තරකිරීම | | | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | දේශීය | වැඩි දියුණුකළ | එකතුව | දේශීය | වැඩි දියුණුකළ | එකතුව | | |
| කොළඹ | 276 | - | 276 | 700 | - | 700 | 400 | 1,376 |
| ගම්පහ | 20 | 496 | 516 | - | 1,563 | 1,563 | 298 | 2,377 |
| කළුතර | 332 | - | 332 | 282 | - | 282 | 50 | 664 |
| මහනුවර | 31 | 161 | 192 | 40 | 637 | 677 | 161 | 1,030 |
| මාතලේ | - | - | - | - | - | - | - | - |
| නුවරඑළිය | - | - | - | - | - | - | - | - |
| ගාල්ල | - | - | - | - | - | - | - | - |
| මාතර | - | 7 | 7 | - | 3 | 3 | - | 10 |
| හම්බන්තොට | - | 8 | 8 | - | - | - | - | 8 |
| යාපනය | - | - | - | | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - | - | - |
| වව්නියාව | - | 13 | 13 | - | 1 | 1 | 1 | 15 |
| මුලතිව් | - | - | - | - | - | - | - | - |
| කිළිනොච්චිය | - | - | - | - | - | - | - | - |
| මඩකළපුව | - | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 167 | 625 | 792 | 173 | 724 | 897 | 163 | 1,852 |
| පුත්තලම | 403 | 372 | 775 | 852 | 127 | 979 | 178 | 1,932 |
| අනුරාධපුරය | 64 | 22 | 86 | 102 | 11 | 113 | 23 | 222 |
| පොළොන්නරුව | - | 21 | 21 | 63 | 17 | 80 | 66 | 167 |
| බදුල්ල | - | - | - | - | - | - | - | - |
| මොණරාගල | - | - | - | - | - | - | - | - |
| රත්නපුරය | - | 26 | 26 | - | 14 | 14 | 12 | 52 |
| කෑගල්ල | - | - | - | - | - | - | - | - |
| ශ්‍රී ලංකාව | **1,293** | **1,751** | **3,044** | **2,212** | **3,097** | **5,309** | **1,352** | **9,705** |

වාර්තාවී ඇති තොරතුරු වලට අනුව සංගණනයේ තොරතුරු රැස්කළ දිනයට අදාලව වාර්තාවී ඇති මුළු ඌරන් සංඛ්‍යාව 9,705 කි. ඌරන් පාලනය බහුලව සිදුකරන බව වාර්තාවී ඇත්තේ වයඹ සහ බස්නාහිර යන පළාත්වලය. මීට අමතරව මහනුවර, අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ද ඌරු පාලනය සුළු වශයෙන් පැවති බව වාර්තාවේ.

දිස්ත්‍රික්ක අනුව වැඩිම සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ ගම්පහ (2,377) දිස්ත්‍රික්කයෙනි. පිළිවෙළින් දෙවනුවට සහ තෙවනුවට වැඩිම සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ පුත්තලම (1,932) සහ කුරුණෑගල (1,852) දිස්ත්‍රික්ක වලිනි. අඩුම සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ හම්බන්තොට (8) දිස්ත්‍රික්කයෙන් වන අතර නැගෙනහිර සහ ඌව පළාත් ද ඇතුළුව දිස්ත්‍රික්ක 13 කින් ම සංගණනයේ තොරතුරු රැස්කළ දිනයට අදාලව ඌරු පාලනය යටතේ සතුන් සංඛ්‍යාවක් වාර්තාවී නොමැත.

ඌරු පාලනය යටතේ බෝකිරීම සඳහා ඇතිකරන ලද වැඩිම සතුන් සංඛ්‍යාව කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද තර කිරීම සඳහා ඇති කරන ලද වැඩිම සතුන් සංඛ්‍යාව ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද වාර්තාවී ඇත.

**රූප සටහන 10.3.2**

**වර්ගයන් අනුව ඇතිකරන ලද ඌරන් සංඛ්‍යාව - 2014**




වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාවෙන් 55% ක් තර කිරීම සඳහාත් 31% ක් බෝකිරීම සඳහාත් ඇතිකළ බවට වාර්තාවී ඇති අතර වෙනත් සතුන් 14% කි. දේශීය සහ වැඩි දියුණු කරන ලද වර්ග අනුව සලකා බලනවිට වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාවෙන් 36% ක් (3,505) දේශීය සතුන් වන අතර 50% ක් (4,848) ක් වැඩි දියුණු කරන ලද සතුන්ය. ඌරු පාලනය යටතේ බෝකිරීම සඳහා ඇති කරන ලද සතුන් සංඛ්‍යාව 3,044 ක් වූ අතර එයින් 79% ක් ගැහැණු සතුන් ද 21% ක් පිරිමි සතුන් ද වේ. තර කිරීම පිණිස ඇති කරන ලද සතුන් සංඛ්‍යාව 5,309 කි.

## 10.4 කුකුළු පාලනය පිළිබඳ තොරතුරු

වතු ආශ්‍රිතව සිදුකරන ලද කුකුළු පාලනය පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේ දී බෝ කිරීම (අභිජනනය) බිත්තර පිණිස, මස් පිණිස සහ නිදැල්ලේ ඇති කරන සතුන් යනුවෙන් කාණ්ඩකර තොරතුරු රැස්කරන ලදී.

**වගුව 10.4.1**

**වතු ආශ්‍රිතව ඇති කරන ලද කුකුළන්/කිකිළියන් සංඛ්‍යාව - 2002/2014**

| වර්ගය | 2002 | 2014 |
|---|---|---|
| **බෝකිරීම සහ බිත්තර සඳහා වැඩි දියුණු කරන ලද** | **808,636** | **1,928,651** |
| බිත්තර දමන කිකිළියන් | 591,507 | 1,503,997 |
| පැටවුන් සහ වැඩෙන කිකිළියන් | 217,129 | 424,654 |
| **දේශීය (ගම්බද නිදැල්ලේ ඇතිකරන)** | **163,569** | **7,070** |
| බිත්තර දමන කිකිළියන් | 56,960 | 3,664 |
| කුකුළන් ඇතුළු අනෙකුත් සියළු | 106,609 | 3,406 |
| **මස් පිණිස වැඩි දියුණු කරන ලද** | **381,972** | **4,606,137** |
| **මුළු සතුන් සංඛ්‍යාව** | **1,354,177** | **6,541,858** |

ශ්‍රී ලංකාවේ වතු අංශය ආශ්‍රිතව කුකුළු පාලනය යටතේ වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාව මිලියන 6.5 ක් වන අතර වැඩිම සතුන් සංඛ්‍යාවක් වාර්තාවී ඇත්තේ මස් පිණිස දියුණු කරන ලද වර්ග වලිනි. එය වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාවෙන් 70.4% ක ප්‍රතිශතයකි. බෝකිරීම සහ බිත්තර සඳහා වැඩි දියුණු කරන ලද සතුන් සංඛ්‍යාව මුළු සතුන් සංඛ්‍යාවෙන් 29.5% ක ප්‍රතිශතයකි. අඩුම සතුන් සංඛ්‍යාවක් අයත් වන්නේ දේශීය (ගම්බද නිදැල්ලේ ඇතිකරන) සතුන් කාණ්ඩයට වන අතර එය මුළු සතුන් සංඛ්‍යාවෙන් 0.1% ක ප්‍රතිශතයකි.

පසුගිය සංගණන වර්ෂයට සාපේක්ෂව මස් පිණිස දියුණු කරන ලද සතුන් 92% කින් ද බෝකිරීම සහ බිත්තර සඳහා වැඩි දියුණු කරන ලද සතුන් සංඛ්‍යාව 58% කින් ද වර්ධනයවී ඇති අතර දේශිය (ගම්බද නිදැල්ලේ ඇතිකරන) සතුන් සංඛ්‍යාව 7,070 ක් දක්වා අඩුවී ඇත. කුකුළු පාලනය යටතේ ඇතිකරන ලද මුළු සතුන් සංඛ්‍යාව 79% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

## වගු අංක 10.4.1

### දිස්ත්‍රික්ක අනුව වතු ආශ්‍රිතව ඇති කරන ලද සතුන් සංඛ්‍යාව - 2014

| දිස්ත්‍රික්කය | බෝ කිරීම | | බිත්තර සඳහා යොදාගන්නා | | මස් පිණිස දියුණු කරන ලද | ගම්බද නිදැල්ලේ ඇති කරන | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | බිත්තර දමන කිකිළියන් | පැටවුන් සහ වැඩෙන කිකිළියන් | බිත්තර දමන කිකිළියන් | පැටවුන් සහ වැඩෙන කිකිළියන් | | බිත්තර දමන කිකිළියන් | කුකුළන් ඇතුළු අනෙකුත් සියළු | |
| කොළඹ | 68,405 | 36,577 | 2,967 | 1,199 | 202,843 | 10 | 9 | 312,010 |
| ගම්පහ | 125,188 | 61,445 | 46,796 | 1,391 | 556,084 | 875 | 441 | 792,220 |
| කළුතර | 139,811 | 54,963 | - | - | 837,189 | 225 | 122 | 1,032,310 |
| මහනුවර | 132,876 | 25,890 | 2,299 | 411 | 360,546 | 29 | 20 | 522,071 |
| මාතලේ | 40,513 | 13,012 | 28,700 | 1,000 | 19,010 | 14 | 11 | 102,260 |
| නුවරඑළිය | - | - | 120,219 | 30,035 | - | 249 | 215 | 150,718 |
| ගාල්ල | 5 | - | - | - | 5 | - | - | 10 |
| මාතර | 1,325 | 264 | 325 | 464 | 4,500 | 12 | - | 6,890 |
| හම්බන්තොට | - | - | 22,300 | 100 | 100 | 38 | 118 | 22,656 |
| යාපනය | - | - | - | 200 | - | 20 | 3 | 223 |
| මන්නාරම | - | - | - | - | 240 | 63 | 30 | 333 |
| වව්නියාව | - | - | 350 | - | 25 | - | - | 375 |
| මුලතිව් | - | - | - | - | - | 28 | 44 | 72 |
| කිළිනොච්චිය | - | - | - | - | 800 | 105 | 57 | 962 |
| මඩකළපුව | - | - | 2,010 | - | 4,000 | 53 | 19 | 6,082 |
| අම්පාර | - | - | - | 50 | - | - | - | 50 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - |
| කුරුණෑගල | 123,188 | 23,013 | 207,817 | 57,305 | 1,591,911 | 536 | 427 | 2,004,197 |
| පුත්තලම | 121,582 | 55,850 | 273,755 | 46,485 | 634,600 | 821 | 516 | 1,133,609 |
| අනුරාධපුරය | 8,037 | 3,170 | 1,660 | 100 | 114,512 | 9 | 5 | 127,493 |
| පොළොන්නරුව | - | - | 28,659 | 10,800 | 167,022 | 18 | 105 | 206,604 |
| බදුල්ල | 37 | 49 | 4,138 | - | 6,000 | 292 | 303 | 10,819 |
| මොණරාගල | 72 | - | 20 | 15 | - | 171 | 877 | 1,155 |
| රත්නපුරය | - | 270 | 180 | 121 | 106,750 | 89 | 81 | 107,491 |
| කෑගල්ල | 135 | - | 628 | 475 | - | 7 | 3 | 1,248 |
| **ශ්‍රී ලංකාව** | **761,174** | **274,503** | **742,823** | **150,151** | **4,606,137** | **3,664** | **3,406** | **6,541,858** |

වතු අංශයේ වාර්තාවී ඇති වැඩිම සතුන් සංඛ්‍යාව වයඹ පලාතෙන් වාර්තාවන අතර එය වතු අංශය තුළ වාර්තාවී ඇති මුළු සතුන් සංඛ්‍යාවෙන් 48% ක ප්‍රතිශතයකි. දෙවනුවට වැඩිම සතුන් සංඛ්‍යාව බස්නාහිර පළාතෙන් වාර්තාවී ඇති අතර එය මුළු සතුන් සංඛ්‍යාවෙන් 36% අගයකි.

කුකුළු පාලනය යටතේ බෝ කිරීම සඳහා ඇතිකරන ලද මුළු සතුන් සංඛ්‍යාව 1,035,677 කි. එයින් වැඩි සංඛ්‍යාවක් (194,844) වාර්තාවී ඇත්තේ කළුතර දිස්ත්‍රික්කයෙන් වන අතර උතුර සහ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක වලින් ද පොළොන්නරුව සහ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද බෝ කිරීම සඳහා ඇතිකරන ලද සතුන් වාර්තා නොවේ.

බිත්තර ලබා ගැනීමේ අරමුණින් ඇති කරන ලද සතුන් 892,974 න් 83% ක් බිත්තර දමන කිකිළියන් ද 17% ක් පැටවුන් සහ වැඩෙන කිකිළියන් ද ලෙස වාර්තාවී ඇත. බිත්තර ලබා ගැනීමේ අරමුණින් ඇති කරන ලද කිකිළියන් වැඩිම සංඛ්‍යාව (320,240) පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත.

කුකුළු පාලනය යටතේ මස් පිණිස ඇති කරන ලද සතුන්ගෙන් 35% ක ප්‍රතිශතයක් වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වන අතර කළුතර දිස්ත්‍රික්කයෙන් මස් පිණිස ඇති කරන ලද සතුන්ගෙන් 18% ක ප්‍රතිශතයක් වාර්තාවී ඇත. නුවරඑළිය, යාපනය, මුලතිව්, අම්පාර, ත්‍රිකුණාමලය, මොණරාගල සහ කෑගල්ල දිස්ත්‍රික්ක වලින් කුකුළු පාලනය යටතේ මස් පිණිස ඇති කරන ලද සතුන් වාර්තාවී නොමැත. ගම්බදව නිදැල්ලේ ඇතිකරන සතුන් 7,070 ක් වාර්තාවී ඇති අතර එයින් වැඩිම සංඛ්‍යාව 1,337 පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. ගම්බදව නිදැල්ලේ ඇතිකරන සතුන්ගෙන් 52% ක් බිත්තර දමන කිකිළියන් ද 48% ක් කුකුළන් ඇතුළු අනෙකුත් සතුන් ද වේ .

